කවිකුලතිලකායමානවූ මෛත්‍රෙය මහානෙත්‍ර ප්‍රාසාදමූල
විදාගම මහාස්ථවිර පාදයාණන් වහන්සේ විසින් විරචිත

# බුදුගුණ අලංකාරය

පිළිබඳ

## වලාණේ සන්නය.

---

පානදුරේ සෞගත විද්‍යාලයාධිශ්වරව වැඩිසූ
අති ගෞරවාර්හ ශාසනවංශාලඞ්කාර කවිධ්වජ විනයාචාර්‍ය
**වැලිගම ශ්‍රී සුමඞ්ගල මහානායක ස්ථවිර**
**පාදයාණන්වහන්සේගේ හා**
මෙකල එම විද්‍යාලයෙහි ප්‍රධානාචාර්‍යවූ
ගරු පණ්ඩිතාචාර්‍ය පානදුරේ
**ශ්‍රී ඥානවිමලතිෂ්‍ය මහාස්ථවිරපාදයාණන් වහන්සේගේත්**
ධර්මාන්තෙවාසීවූ
මොරටුවේ ලක්ෂපතියේ ක්ෂේත්‍රාරාමාධිපති ගෞරවාර්හ
**ආචාර්‍ය වැලිගම සිරිසඞ්ඝානන්ද මහා ස්ථවිරපාදයන්**
**වහන්සේගේ**
ශිෂ්‍යවූ
පානදුරේ වලාණේ සරණපාලාරාම මහාවිහාරාධිපති
චිත්‍රභාණක සිරි සද්ධම්මාචරිය
**වලාණේ ධම්මානන්ද ස්වාමින්වහන්සේ විසින්**
ලියනලදී.

---


**ආර්. ඩබ්ලිව්. ඩී. සල්මන් අප්පුහාමි විසින්**
**දෙවෙනි වරට**
කොළඹ දෙවෙනි මරදානේ "සේව්‍යශ්‍රී යන්ත්‍රාලයෙහි"
මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරනලදී.

---

**ශ්‍රී බු. ව. 2469.**

---

ක්‍රි. ව. 1926.

# සංඥාපනය.

සකල ලෝකශිඛාකරවූ අප සර්වඥයන්වහන්සේගේ අරහාදි බුදු ගුණ සම්බන්ධවූ විස්තරය බුදුගුණඅලංකාර නම්. තත්ප්‍රකාශක ග්‍රන්ථයද අනේකෝපචාරයෙන් ප්‍රථම වේ. මෙම කාව්‍යය දිශානුදිශාවන්හි පතළාවූ කීර්තිරාවයෙන් යුක්තව වැඩවිසූ ව්‍යජ්ජන කල්‍යාණමිත්‍ර මෛත්‍රෙය මහා නෙත්‍ර ප්‍රාසාදමූල වීදාගම මහාස්ථවිරයන්වහන්සේ විසින් ශ්‍රීබුද්ධවර්ෂයෙන් 2015ස් වැන්නෙහි* ගෙවත් කෝට්ටේ රජකළ හයවෙනි භුවනෛකබාහු රජහුගේ රාජ්‍යාභිෂේකයෙන් තුන්වැනි වර්ෂයෙහි රචනාකරනලදබැවි කාව්‍යාවසානයෙහි ප්‍රකාශිතයි. හිසර හංස යන සංදේශහා ලෝවැඩසඟරාව, කාව්‍යලක්ෂණ මිණිමාලාව, දහම් ගැට මාලාව යන කාව්‍යයෝද මුන්වහන්සේ විසින්ම රචනා කරන ලදහ. මහාකාව්‍යයක්මෙන් පුරවර්ණනාදීන්ගෙන් සරසනලද මෙම කාව්‍යයද මධුර කොමල ලලිතාදීවූ කාව්‍යරසයෙන්හා අර්ථරසයෙන්ද අනූනයි එබැවින් කාව්‍යරසාස්වාදනාභිලාෂීවූ පණ්ඩිතයන් විසින් සම්භාවිත මේකාව්‍යය උද්ග්‍රහණධාරණ වශයෙන් පරිශීලනය කරන ආධුනිකයන්ගේ සුඛාවබෝධය පිණිස මිට සන්නයක් ලියුවහොත් මැනවැයි පානදුරේ රන්කොත්වෙහෙර වැඩවිසූ සාරානන්ද මහා ස්ථවිරයන්වහන්සේ විසින් කළ ආරාධනය පිළිගත් අප විසින් මිටතුදුන් වර්ෂයකට පෙර ලියනලද මෙම සන්නය පානදුරේ සුචරිතෝදය යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරන අතර භාෂාපරිවර්තක ධුරන්ධරවූ නානා ශාස්ත්‍ර ප්‍රවීන "ඩබ්ලිව්. ඇ.fජ්. ගුණවර්ධන මුදලි මන්ත්‍රීශ්වරයන්ගේ මෙහෙයීමෙන් ක්‍රිස්තුවර්ෂ 1903 දී පානදුරේ සෞගතවිද්‍යාලයෙහි ශිෂ්‍යයන්ට තෑගිදීමපිණිස පැමිණි වංශාධිපති හුළුගල්ලේ සේමසිංහ නවරත්න වාසනිනායක සේන්කෝරලේ දිශාපතිධුරන්ධර උඩරට හිංපු මන්ත්‍රීශ්වරයාණන්ට මුද්‍රිත පෝර්ම් කීපයකුත් සමඟ පිළිගන්වනලදි. ඉක්බිති මෙම පොතට සන්නයක් නැතිපාඩුව පිරිමසාලන අටියෙන් පටන්ගත් අපේ එම සන්නයේ මුද්‍රණයෙහි වැඩ දෙකොන්කොටසකට ස්වල්පයක්අඩුතරම් නිමවපවන්නාතර නවත් සන්නයක් මුද්‍රණය කරනිබෙතුදුක මනෝඥතාසාහයට පැමිණීමෙන්ප්‍රමාද කරන්ට සිදුවිය. එදුවූ ආර් ඩබ්ලිව්. ඩී. සල්මන්අප්පුහාමි මේ දුනාඉ තිරි කොටසත් මුද්‍රණයකරවා ගැණීම පිණිස සකස්කාර දෙනලෙස අයැදිමයෙන් එයඅප විසින් ඉෂ්ටකරනලදී, නිර්දෝෂවූවක් ලොව නැතිබැවින් අපගේ ප්‍රමාදයෙන් ජනිතවූ එබඳු දෝෂයන්ගැණ පණ්ඩිතයෝ සමාධිය භජනය කෙරෙත්වා.

මෙය දෙවෙනිවර මුද්‍රණය කිරීමේදී විස්තරකළයුතු තැන් කීපයක් විස්තරකෙළෙමු. තෙවෙනි වර මුද්‍රණයෙහිදී වැඩි විස්තරයක් කිරීමට බලාපොරොත්තුවන බවද කරුණාවෙන් නිවේදනය කරමු.

මෙයට,

පානදුරේ වලානේ සරණපාලාරාම මහාවිහාරාධිපති
විද්‍යාභාණක සිරිසද්ධම්මාචරිය

වලානේ ධම්මානන්ද ස්ථවිර වම්හ.
DHAMMANANDA, Walana.

---

* මෙම රාජ වර්ෂය මහාවංශයේ ක්‍රමයට වඩා ඉතා වෙනස්වපෙනේ.

ලිච්ඡවී කථාව හා භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවරට වැඩමවා රතනසූත්‍රය දෙශනාකළ අන්දමත් මෙහි ප්‍රකාශවේ,

අතීත කාලයෙහි වනාහි බරණැස් නුවර බරණැස් නම් රජෙක් විය. එතුමාගේ අගමෙහෙසිනියගේ කුසෙහි දරු ගැබක් පිහිටියේය. ඕ තොමෝ ඒ දැන රජහට නිවේදනයකළා. රජතෙමේද ඈට ගැබ් පෙරහර දුන්නේය. මනාව පරිහරණය කරනු ලබන්නාවූ ඕ තොමෝ ගැබ මුහුකුරායියකලැ තිඹිරිගෙට හෙවත් වදනගෙට පිවිසියාය. පිණැත්තියන්ගේ ගෘභීතපනතිය වනාහි බොහෝ සෙයින්ම අලුගම් කාලයෙහි වන්නේය එසේ හෙයින් මෝ තොමෝද පිණැත්තියන් අතුරෙන් එක්තරා තැනැත්තියක්වූවා. උදයම ලාකඩපටලයක් වැනිවූ දේහෝ නොහොත් බඳුවදමල්දමක් වැනිවූ මස්වැදැල්ලක් වැදී. ඉක්බිත්තෙන් ඕ තොමෝ මෙසේ සිතන්නී අවශෙෂ දේවීහු රන්පිළිබිඹුවැනි දරුවන්ම වදන්නෝය.

අගමෙහෙසී තොමෝ මස්වැදූල්ලක් වැදීයයි රජු ඉදිරියෙහි මාගේ අගුණ පහළ කරවන්නේයයි සිතා ඒ අගුණ ප්‍රකාශයට භයින් මස්වැදූල්ල එක් බඳුනක බහවා පියන්පතින් වස්වා රාජමුද්‍රයෙන් සලකුණුකොට ගඟදිය සැඩපහරෙහි බහාලූවා ඒ ඇසිල්ලෙහිම දෙවතාවෝ මොනවට අරග්ගත්තු. මෙහි බරණැස් රජහුගේ අගමෙහෙසිනියගේ දරුවෝ යයිද දූහිගුලෙන් ලියනලද රන්පතක්ද බැන්දේ. ඉක්බිති ඒ බඳුන රළ ආදී කිසිවකින් උපද්‍රවයක් නැතිව ගඟදිය සැඩපහරින් ගසායන්නේ එකල එක්තරා තවුස්පාණ කෙනෙක් ගොපලු කුලයක් නිසා ගං ඉවුරෙහිවසන්නෙහෝ උදයම මුව දෙවීම් ආදී යම්කිසි කටයුත්තක් සඳහා ගඟට බැස්සෝ පාව එන්නාවූ ඒ බඳුන දැක පාංශුකූල සංඥාවෙන් ( අයිතිකාරයෙක් නැත යන අදහසින් ) ඇරගත්තෝය. නැවතද එහි තිබූ පතහා රාජ මුද්‍රයද දැක මුද බැලූකලැ එහි තිබූ මස්වැදූල්ල දුටුවෝය. දැකද ඕහට මෙබඳු සිතක් පහළවිය. එකාන්තයෙන්ම මෙය වනාහි දරුගැබක් වන්නේය. එසේද වුවත් කිසියම් දුගඳයක් හෝ කුණුබවක් හෝ නැත්තේය'යි අසපුවට ගෙන ගොස් පිරිසිදු අවකාශස්ථානයක තැබූහෝය. ඉක්බිති පසළොස් දිනක් ඇවෑමෙන් මස්වැදූලි දෙකක්වූහු. තවුස්පාණෝ එය දැක ඉතා සුරැකිව තැබූහෝය. ඊට පසළොස් දිනකින් එකී එකී මස්වැදූල්ලෙක්හි අත් පා හිස ආදී අවයවයන් සඳහා පිළකා පස පස බැගින් වූහ. නැවතත් ඒ දැක වැඩියක්ම සුරැකිව තැබූහෝය. යළිත් ඊටත් අඩමසකින් මස්වැදලි දෙක රන්පිළිබිඹුවැනිවූ දරුවෙක් හා දැරියක්ද වූහු. ඔවුන් කෙරෙහි තවුස් පාණන්ට දරු සිනෑහැ පහළවිය. ඔහුගේ ඇඟිල්ලෙහි කිරිද එරිණ. එතැන් පටන් කිරිබත් ලැබූවෝ වළඳ දරු දෙදෙනාගේ මුඛයෙහි කිරිවත්කරති. ඔවුන්ගේ කුසට යමක් යමක් ප්‍රවිෂ්ට

වේද ඒසියල්ල මිණිමුවා බඳුනෙක්හි බහාලන්නාක්මෙන් පැණෙයි.
මෙසෙයින් සිව්රහිතවූවාක්මෙන් පේණෙත්ව වන. අනික් කෙනෙ
කුන්ගේ මතයෙහි වසාතුබූවාක්මෙන් ලිනවූ සිව් ඇතිවිය. එහෙ
යින් හෝ සිව්රහිතවූවාක් වෙන්විය යන මතය හෝ ගෙන ඔව්හු
ලිච්ඡවිහුයයි ප්‍රකටවූහු. තවුස්පාණෝ දරුවන් පොෂණය කරත්
තෝ ඉතා දහවල්ව පිඬුපිණිස ගම්වදිති. ඉතා දහවල්වම පෙරළාද
වඩිති. ඔහුගේ ඒ ව්‍යාපාරයදුටු ගොපල්ලෝ මෙසේ සැලකළෝ
හිමියනි, පැවිද්දනට දරුවන් පොෂණය පළිබෝධයක්වෙයි. ඒ
නිසා අපට දරුවන් දුනමැනවව්'යයි කියායි. තවුස් පාණෝද ඊට
සතුටුව මැනවැයි පිළිවදන් දුන්නු ගොපල්ලෝද දෙවෙනි දිනයෙහි
මග සමකොට ලද පස්මල් විසුරුවා දද කොඩි නන්වා මේ ගැජුන්
සෙයින් යුත් පසගතුරු රැවින් අසපුවකරා එළඹ වැද එකත්පස්ව
සිටියෝ, එකල්හි තවුස්පාණෝ මේ දරුවෝ මහපිණැත්තෝය. එ
හෙයින් මොවුන් නොපමාව පොෂණය කරව්, පොෂණය කොටද
මොහු දෙදෙනම සමගි සංවාසයෙහි යොදවව්, පස්ගෝරසයෙන්
රජුසතුටුකොට බිම්පෙදෙසක් ඉල්වාගෙන නුවරක් මවව්. එහි මේ
කුමරු රජකරවව්යයි' දරුවන් පාවා දුන්නෝය. ගොපල්ලෝද
මැනවයි පිළිවදන්දී දරුවන් ගෙනගොස් ඇතිදැඩිකළෝ. දරුවෝද
වැඩිවිය පැමිණ කෙළින්නෝ ඔවුනොවුන් අතර විවාද උපන්කලැ
ගොපලු දරුවන්ට අතින් පයින් තලා වෙහෙසත්.එයින් පීඩ.වට පැ
මිණියාවූ ඔවුන් හඬනකල තෙප් කුමට හඬව්දැයි මව්පියන් විසින්
අසනලද්දහු අම්මා අප්පා නැති තාපසයන් විසින් රක්නාලද මූලා
අපට පීඩාකෙරෙත්යයි කියති. එහෙයින් ඔවුන්ගේ මව්පියෝ මොව්
හු අද දරුවන්ට වෙහෙස කෙරෙත්. දුක් උපදවත්. එහෙයින් මො
වුන්ට සංග්‍රහ නොකටයුතුයයිද මොවුන් මෙයින් බැහැරකටයුතු
යයිද කීවෝය. එතැන් පටන් ඒ ප්‍රදේශය (වජ්ජිතබ්බා'යි) කීවව
නය ගෙන වජ්ජියයි ප්‍රකටවනු ලැබීය. ඒ පෙදෙස වනාහි තුන්සිය
යොජුන් පමණවෙයි. ඉක්බිති ඒ පෙදෙස ගොපල්ලෝ රජුසතුටු
කොටැ ඉල්වාගෙන එහි නුවරක් ගොඩනගා සොළසැවිරිදි වයස්වූ
කුමරු අභිෂෙකයෙන් රජකළෝද.සිය නැගණියන්ම අගමෙහෙසිනිය
කොට බැහැරින් දැරියක් මෙයට නොගෙන ආයුතුයයිද මිත්දැරියක්
බැහැරට නොදියයුතු යයිද කතිකාවතුදු කළෝ. ඔවුන් දෙදෙනා
ගේ පළමු සංවාසයෙන්ම දුවක්ද පිතෙක්දැයි නිවුන් දරු දෙදෙ
නෙක්ද වැදී. මෙසේ සොළොස් වරක්ම දෙදෙනා බැගින් නිවුන්
දරුවන්ම වැදීය. එසේ පිළිවෙළින් වැඩෙන්නාවූ ඒ දරුවන්ට
ආරාම උද්‍යාන වාසස්ථාන ආදිය හා පිරිවර සම්පත් ආදිය ගැණීමටද
නොපොහොනාහු ඒ නුවර තුන්වරක්ම අතරින් ගවු ගවු පමණව

පවුරුවලින් පිරිකෙව් කළෝ. ඒ නුවර තමා නැවත නැවත විශාල කළ හෙයින් වෙසාලි යයිද නම්විය. මේ විශාලාමහනුවර පිළිබඳ කථාව වන්නීය.

මේ නුවර වනාහි සර්වඥයන් වහන්සේගේ උත්පත්තිකාලයෙහි ධනධාන්‍යාදි අනේක සම්පත්තීන් සමෘද්ධවූයේ මහත් යසඉසුරෙන් විපුල බවට පැමිණියේ එහි මහ රජුන්ම හත්දස් හත්සිය හත්දෙනෙක්වූහු. යුවරද සෙනෙවි භාණ්ඩාගාරිකාදීහුද එසේමවූහු. එහෙයින් කියා. එසමයෙහි වනාහි විසල්පුර ධනධාන්‍යාදීන් සමෘද්ධවූයේ සැපඇතිවූයේ බොහෝ මිනිසුන්ගෙන් ගහණවූයේ සුලභවූ කෑබිම් ඇතිවූයේ හද්දස් හත්සිය හතක් මහරජ පායෙන් යුක්තවූවාහුද හද්දස් හත්සිය හතක් කුළුගෙවලින් යුක්තවූවාහුද හද්දස් හත්සිය හතක් පුෂ්පාරාමාදි අරමින් යුක්තවූවාහුද එපමණම පස්පියුම්වන් සැඩුම්ලද පොකුණින් යුක්තවූවාහුද වෙත්යයි කියති. ඒ විශාලාමහනගරයෙහි මෑතකාලයෙහි වර්ෂාව මඳවීමෙන් ශස්‍ය විනාශබවට පැමිණ මහත් බියසුළු දුර්භික්ෂයෙක් හටගත්තේය. එසේකල අහර නොලැබීමෙන් දිළින්දෝ මැරෙත්වෙත. ඔවුන්ගේ මළ සිරුරු බැහැර දැමීමෙන් ඒ කුණුගඳින් අමනුෂ්‍යයෝද නුවරට වන්නුය. ඒ අමනුෂ්‍යයන්ගේ පැමිණීමෙන් හටගත් උවදුරු කරණකොටගෙනද ඉතා වැඩියක්ම මැරෙන්ටවිය. ඉන් හට ගත් පිළිකුලින්ද සත්නට අහිවාතකනම් මාරක රෝගයෙක්ද වැළඳුනේය. මෙසේ භය තුනකින් උපද්‍රවයට පැමිණියාවූ විසල්පුර වැසියෝ රජකරා එළඹ මහරජාණනි, මෙනුවර භයතුනකින් උපද්‍රුතවිය. මින්පෙර සත්වන රජකුල පරපුර කොතෙක්වත් මෙබඳු උවදුරෙක් ඇතිවූයේ නොවෙති. මිට හේතුව නුඹවහන්සේලාගේ අධර්ම පැවතුම් වියයුතුයයි මුරගා කීවෝ. රජදරුවෝද සියල්ලවුන් සන්ථාගාර ශාලාවට රැස්කරවා අපගේ පෙර රාජධර්මයට වෙනස්වූ යම්කිසිවක් ඇත්තාහු නම් සොයව්යයි කීහ. ඔව් රජදරුවන්ගේ ප්‍රවේණි ධර්ම සොයන්නාවූ කිසිකෙනෙක් කිසි අධර්මයක් නුදුටුවෝ වැලිරජුන්ගේ වරදක් නොදැක මිට පිළියම් කවරනයි සොයන්නෝ ඉන් එකෙක් මෙසේ කියති. බුත්වහන්සේලා මෙනුවරට වැඩමෙව්වොත් මේ බිය සියල්ලම අලපනාදිය නොරඳ රැරුබස්නා කළක්මෙන් වහා සුවවන්නේයයි පූරණ කාශ්‍යප ආදී සවැදෑරුම් සත්ථෘන්ගේ ගුණමුව නොපොහොනා තරම්වැනි. ඉන් තවත් අයෙක් අප සම්මා සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේගේ (ඉතිපිසෝ භගවා) යනාදි කප්කෙළ දනසක් කියාත් අවසන් නොවන ගුණ ඇතිබැව් ප්‍රකාශකොට උන්වහන්සේ මෙයට වැඩමෙව්වොත්නම් නිරූ උදාකල පහවන ගනඳුරු සෙයින් මේ හැමඳුරුව පහවයන්නේයයි කියා ඒ උතුමා දැන් ලොවපහළව වැඩ වසනසේක. උන්වහන්සේ සියල් සත්නට හිතසැප පිණිස දහම් දෙසනසේක. ඔහත් ඉදුහයෙන් යුක්තසේකැයි නැවත නැවතත්

වර්ණනා කරවා කල්හි ඒ ඇසීමෙන් සතුටුවූවාහු ඒ උතුමෝ දූත් කොහි හෝ වෙසෙත්ද? අප විසින් ආරාධනා යැවූ කල්හි වඩින සේක්ද? වැලි අතිකෙත්ද? බුදුවරයෝ නම් සියලු සතුන් කෙරෙහි අනුකම්පා ඇත්තෝය. කුමකැයි නොවඩිනාහුද? ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි දැනට රජගහ නුවර සමීපයෙහි වේළුවනාරාමයෙහි වැඩවසනසේක උන්වහන්සේට බිම්සර මහරජ තෙම උපස්ථාන කෙරෙයි. කියිච්චක ඔහු උන්වහන්සේට වැඩමවන්ට ඉඩ නොදෙ යිහයි සිතූහු. එසේ වී නම් රජ හට කියා වැඩමවාගත යුතුයයි මහත්වූ බලසේනාව හා රත්රුවන් ඈ බොහෝ පඬුරුදී ලිච්ඡවි රජ වරුන් දෙදෙනෙකු බිම්සර මහරජහට මෙපුවත්කියා භාග්‍යවතුන් වහන්සේ වැඩමවාගෙන එවයි බිම්සර මහරජුනකරා පිටත්කළෝ, ඔව්හුගොස් රජහට පඬුරුදී එපුවත් සැලකොට මහරජාණනි. භාග්‍යවත් අප සම්මා සම්බුද්ධ රජාණන්වහන්සේ අපගේ නුවරට එව වමැනවයි කීහ. රජාණෝ එය පිළිනොගත්තෝ තෙපිම දනිව් යයි කීවෝ. එවිට ඔව්හු භාග්‍යවතුන් වහන්සේකරා එළඹ වැඳ එකත්පසෙක සිටියාහු මෙසේ සැලකළෝ ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස, අපගේ නුවර දැනට ත්‍රිවිධ භයකින් උපද්‍රතය. ඉදින් ස්වාමින්වහන්සේ වැඩමවනසේක් නම් අපට එයින් මහත් සැප ඇති වන්නේය. භාග්‍යවතුන් වහන්සේද සියල්ල දන්නා නුවණ මෙමහ යාබලා විශාලාමහනුවර රතන සූත්‍රය දෙසූකල්හි ඕ ආරක්ෂාතො මෝ කෙළසියදහසක් සක්වළ පැතිර පවත්තිය. සූත්‍රයාගේ කෙළවර අසූසාර දහසක් ප්‍රාණීන්ට නිවන් අවබොධය වන්නේ යයි දැනවදාරා ආරාධනාව ඉවසූසේක ඉක්බිත්තෙන් බිම්සර මහ රජාණෝ භාග්‍යවතුන් වහන්සේ විශාලාමහනුවරට වැඩම්වීම ඉවසූ සේකැයි නුවර ඝෝෂාකරවා භාග්‍යවතුන් වහන්සේකරා එළඹ කි මෙක්ද ස්වාමිනි විශාලාමහනුවර ගමන ඉවසූසේක්ද? මහරජ එසේ ය එසේවිනම් ස්වාමිනී යම්තාක් මග සරසම්ද ඒ තාක් නවතුව මැනවයි කියා බිම්සර මහරජාණෝ රජගහ නුවරටත් ගඟටත් අතර පස්යොදුන් පමණ බිම සමකරවා යොදුනක් පාසා මහවෙ හෙර කරවා භාග්‍යවතුන් වහන්සේට වැඩමවන කාලය දැන්වූහු භාග්‍යවතුන් වහන්සේද පන්සියයක් භික්ෂූන් සමග වැඩිසේක රජ තෙමේද පස්යොදුන් පමණ මග පස්වණි පුෂ්පයෙන් බෙලින් දණක් පමණ විසුරුවා දදකොඩි කෙසෙල් තොරන් ආදියෙන් මො නවට සරසා භාග්‍යවතුන් වහන්සේට සේසත් දෙකක් හා එකි එකී භික්ෂූන්වහන්සේට එකි එකී සේසත බැගින් නන්වා තමාගේ පිරි වර ජනයා හා සමග ගඳින් මලින් පුදමින් එකි විහාරයෙහි භාග්‍ය වතුන් වහන්සේ වසකරවා මහදන්දී පස්දිනකින් ගංතෙරට පැමිණවූහු. ගඟෙහි අලංකාරයෙන් නැවක් සරසා භාග්‍යවතුන්

වහන්සේ මෙහි ගංතෙරට වැඩිසේක. එසඳ සියල්ලෝම උන්ව
හන්සේට පෙර ගමන්කරවීයයි වෙසල්පුර වැසියනට හස්නක් යැවී
වෝ. ඔව්හුද දෙගුණයක් පුදකරම්හයි විසල්පුරවත් ගඟාවත් අත
රෙහිවූ තුන්යොදුන් බිම සමකරවා භාග්‍යවතුන් වහන්සේට සේ
සත් සතරක් හා එකී එකී භික්ෂූන්වහන්සේට සේසත් දෙක බැගින්
සාදා නොයෙක් පුද පෙළහරින් ගංතෙරට අවුත් සිටගත්තු. බිම්සර
මහරජාණෝද නැව්දෙකක් එක්කොට අගුලක්සාදා එහි සත්රුවන්
මුවා බුද්ධාසනයක් පණවා භාග්‍යවතුන් වහන්සේ එහි වැඩහිඳවූ
සේක. පන්සියයක් භික්ෂූන්වහන්සේලාද නැව නැගී සුදුසු පරිද්
දෙන් වැඩඋන්නෝය. මහරජාණෝද භාග්‍යවතුන් වහන්සේට පසු
ගමන්යන්නෝ කරවටක් දියට බැස ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,
නුඹවහන්සේ යම්තාක් කලකින් මොබ වඩිනසේක්ද, ඒතාක් ඇප්
මොබ ගංඉවුරෙහිම වසමුයයි කියා නැවතුනෝ. එකල්හි බඹලොව
තෙක් අහස්වැසි සියලු දෙවිබඹ ආදීහු පුදකරන්ට පටන්ගත්තු.
ගඟ දියයට වසන්නාවූ කම්බල අස්සතර ආදි දිව්‍ය නාගයෝද පුද
යට පටන්ගත්තු. මෙසේ මහත්වූ පුදපෙළහරින් යොදුනක් පමණ
තැන් ගඟින් වැඩවවා විශාලාමහනුවර ශීමාන්තරයට සුවසේ පැමි
ණිසේක. ඉක්බිත්තෙන් ලිච්ඡවි මහරජහු බිම්සර මහරජහු විසින්
කරනලද පූජාවන්ට වඩා දෙගුණයක් පූජා පවත්වමින් කරවටක්
දියෙහි භාග්‍යවතුන් වහන්සේට පෙරගමන්ගත්තු. ඒ ඇසිල්ලෙහි
(ඒ මොහොතෙහි) විදුලිය එළියෙන් නහනලද මහත් ගනඳුරු ඇති
අනෙත් සියදහස් වැසි වලාකුලින් හැවසීගත් මහත්වූ ජලධාරාවලින්
යුක්තවූ මහාමේඝයක් සිවුදිග වර්ෂාකරන්ට පටන්ගත්තේය. වැලි
භාග්‍යවතුන් වහන්සේ පළමු සිරිපා ගඟ ඉවුරෙහි තැබූකල්හිම
පොකුරුවැසිවට. යම් කෙනෙක් තෙමෙනු කැමැත්තාහුද ඔහුම
තෙමෙත්. යම්කෙනෙක් තෙමෙනු නොකැමැත්තාහුද ඔහු නො
තෙමෙත්. සියල්තැන දණ පමණද කලවා පමණද කටිය පමණද
ගල පමණදැයි මෙතෙක් තැන් දිය ගලා බසිමින් සියලු කුණපයන්
ජලයෙන් ගඟට බටහ. එහි ඉතා පිරිසිදුබැව් ඇතිවිය. ලිච්ඡවි රජ
හුද උන්වහන්සේ යොදුන් යොදුන් තැන වාසය කරවමින් මහ
දන් පිළිගන්වමින් තෙදිනකින් දෙගුණයක් අසිරිමත් මහපෙළහර
පවත්වමින් විසල් මහපුරට වැඩමවා ගත්තු. එතුමාණන් වහන්සේ
විසල්මහපුරට වැඩිකලැ සක්දෙව් මහරජාණෝද දෙව්ලොව දිව්‍ය
ගණයා විසින් පිරිවරණ ලද්දාහු පැමිණියෝ. මහෙශාක්‍ය දෙවතා
වන්ගේ සන්නිපාතයෙන් බොහෝ සෙයින් එහිවූ අමනුෂ්‍යයෝ
භයින් පලාගියෝ. එසඳ භාග්‍යවතුන් වහන්සේ නුවරදොර වැඩසිට
අනඳ මෙහි එව මේ රුවන් සූත ඉගෙණ බිලියම ඈ උපකරණ
ගෙන්වාගෙන ලිච්ඡවි රජකුමරුවන් සමග විශාලාමහනුවර ප්‍රාකාර
ත්‍රය තුළ හැසිරෙමින් පිරිත් බණවයි අනඳමහ තෙරුන් අමතා මේ
රතන සූත්‍රය දෙශනාකාර වදාළසේක.

මේ කථාව මෙහි සන්නකතීවූ ස්වාමීන් වහන්සේම
පෙළබසින් එලුවට නගාදෙනලදී.

මිට,-ආර්. ඩබ්ලිව්. ඩී. සල්මන් අප්පුහාමි.

# බුදුගුණඅලංකාරය පිළිබඳ

## වළාණේ සන්නය.

කුළුණුමෙන් සත වෙ ත
පතල නැණසව් පද රු ත
හෙළිකල ලොවට සෙ ත
නිතර නමදිම් මුනිඳු සරණ ත

2

ලංකර සසර හි ම්
දුරුකර කෙලෙස් බිය ගි ම්
සිදුකල යුතු උතු ම්
වදිම් නව ලොව්තුරා සදහ ම්

3

කිසිකෙනෙකුන් පම ණ
නොකළැකි ගුණැති අපම ණ
සතගා පිළි සර ණ
වඳිම් අදරින් අරි සඟන ණ

---

1 සතවෙත, සත්ත්වයන්කෙරෙහි; කුළුණුමෙන්, කරුණාවපරිද්දෙන්; සව්පදරුත, සකලඥෙය පදාර්ථයෙහි; පතල, ව්‍යාප්තවූ; නැණ, ඥානය ඇත්තාවූ; ලොවට, ලෝකයාහට; සෙත, ශාන්තවූ නිර්වාණ ධර්මය; හෙළිකල, ප්‍රකාශකළාවූ; මුනිඳු, මුනීන්ද්‍රයන් වහන්සේගේ; සරණත, චරණයුගමය; නිතර, අනවරතයෙන්; නමදිම්, නමස්කාර කෙරෙමි.

2 සසරහිම්, සංසාරසීමාව; ලංකර, සමීපකොට; කෙලෙස්බිය, ක්ලෙශභීතිනැමති; ගිම්, ග්‍රීෂ්මය; දුරුකර, දුරුකොට; සිදුකලයුතු, සිද්ධකටයුතුවූ; උතුම්, ප්‍රවරවූ; නවලොව්තුරා සදහම්, * නවලොකොත්තර ශ්‍රී සද්ධර්මය; වඳිම්, නමස්කාර කෙරෙමි.

3 කිසිකෙනෙකුන්, කිසිසත්ත්වයකු විසින්; පමණනොකළැකි, ප්‍රමාණකොටලිය නොහැක්කාවූ; අපමණ, ප්‍රමාණාතික්‍රාන්තවූ; ගුණැති, ගුණඇත්තාවූ; සතගා, දිව්‍යබ්‍රහ්මාදී ප්‍රජාවට; පිළිසරණ, පිහිටවූ; අරිසඟගණ, ආර්‍ය්‍යසඞ්ඝසමූහයා; අදරින්, අදරයෙන්; වඳිම්, නමස්කාර කෙරෙමි.

---

* සෝවාන් ආදි මාර්ගඵල හා නිර්වාණය යන නවය ලොකොත්තර ධර්මයෝ නම්වෙත්.

| 4 | | 6 | |
|---|---|---|---|
| භවසිඳු පසු | රුවන් | මහකිවිවරුන් පෙ | ර |
| අවබිය අඳුරු හි | රුවන් | පවසා නොපත් පරතෙ | ර |
| පිරිගුණ මහ | රුවන් | සුගතිඳු ගුණගැඹු | ර |
| මෙමෙස් නමකරපුද තෙ | රුවන් | මෙමා කියමි සිතනු වැරසැ | ර |

| 5 | | 7 | |
|---|---|---|---|
| කයනම් අසා | රය | සුවාසූ දහස | ක් |
| බවනම් බයං කා | රය | යොදුන් ගැඹුරැති මුහුද | ක් |
| කියනුව දිවා | රය | නොඩකරමැයි උද | ක් |
| කියමි බුදුගුණ අලංකා | රය | ලෙහෙනු කලතැත් වැත්තදවස | |

---

4 භවසිඳු, සංසාර නමැති සිඳුහට; පසුරුවන්, උඩුපයක් වැනිවූ මෙහවුන් නැවක් වැනිවූ; අවබිය, අපාය භීතිනමැති; අඳුරු, අන්ධකාරයට; හිරුවන්, සූර්‍ය්‍යාවැනිවූ; මහරුවන්, මාහැඟිවූ; පිරිගුණ, ගුණයෙන් සම්පූර්ණවූ; තෙරුවන්, රත්නත්‍රයට; මෙමෙස්, උක්තප්‍රකාරයෙන්; නමකොටපුද, නමස්කාරකොටපුදා.

5 කයනම්, (භූතකාය) සංඛ්‍යාත ශරීරය; අසාරය, (සාර රහිත හෙයින්) අසාරවෙයි; බවනම්, සංසාරයනම්; බයංකාරය (ජාත්‍යාදි දුක් උපදවන හෙයින්) භයඞ්කාරවෙයි; දිවාරය, රෑදවල්; කියනුව, කථනය කරනුවස්; බුදුගුණඅලංකාරය, බුදුගුණඅලංකාරය නම් ප්‍රකරණයක්; කියමි, කථනය කෙරෙමි.

6 පෙර, පූර්වයෙහි; මහකිවිවරුන්, මහාකාව්‍යශ්‍රෙෂ්ඨයන් විසින් පවසා, ප්‍රකාශකොට; පරතෙරනොපත්, පරතෙරට නොපැමිණියාවූ සුගතිඳු, සුගතෙන්ද්‍රයාගේ; ගැඹුරුගුණ, ගම්භීරවූ ගුණය; මෙමා, කාව්‍යකර්තෘවූ මම; කියමි, කථනය කරමැයි; සිතනු, සිතන්නාවූ; වැරසැර, වීර්‍යසාරය. (කෙසේදයත්?)

7 සුවාසූ දහසක් යොදුන් ගැඹුරැති, අසූහාරදහසක් යොදුන් ගැඹුරුවූ; මුහුදක්, සාගරය; උදක්, තනිව; නොඩකරමැයි, ගෙඩ කරන්නෙමියි; දළසක්, (අතීතයෙහි) එක්කලෙක; ලෙහෙනුකල තැත්වැත්ත, කලන්දකයා කළයත්නයමෙනි (කලන්දක ජාතකය බලනු.)

8

එතකුදුවත් සො   දී ත්
පුරමි පිණක් නොම   දී ත්
මුනිඳු ගුණ මුහු   දී ත්
බිඳක් දක්වම් උදක් ඔක   දී ත්

9

නුවණැතියෙනි මෙ   මා
බස දෙස ඇතත් එද   මා
දෙසවත් පුටන   මා
පමාතොව ගනුව මුනිගුණ   මා

10

සගසිරි අසා   ලා
කළයුරු සොඳුරු සා   ලා
සිරිත් සුව් සා   ලා
පවර නුවරෙක්වී විසා   ලා

11

සත්සමුදුර අග   ළ
සත්ගිරිපවුරු වටක   ළ
සක්පුර මිසඋදු   ළ
එපුර සරිකොද පුරෙක් සක්ව   ළ

---

8 එතකුදුවත්, එසේවීනමුත්; සොඳින්, සුන්දරවූ; පිණක්, පුණ්‍යයක්; පුරමි, පූරණය කරමැයි; මෙහෙදින්, බොහෝවූ; මුනිඳුගුණ මුනීන්‍ද්‍රයාණන්ගේ ගුණනමැති; * මුහුදින්, සාගරයාගේ; † ඔක දින්, ජලස්කන්ධයෙන්; උදක්, එකම; බිඳක්, බින්දුවක්; දක්වම්, දක්වාලම්.

9 නුවණැතියෙනි, ඥානවන්තයෙනි; මෙමා, මේමාගේ; බස, කීමෙහි; දෙසඇතත්, දෝෂයක් ඇතහොත්; ඒ, ඒදෝෂය; දමා, ඉවතලා; දෙසවත්පුට, කර්ණයුගවනමැති පුටවන; නමා, නිමතකොට; පමාතොව, අප්‍රමාදව; මුනිගුණමා, මුනීන්‍ද්‍රයන්වහන්සේගේ ගුණමෙ; ගනුව, ග්‍රහණය කරව්.

10 සගසිරි, ස්වර්ගෛශ්වර්යය; අසාලා, ශ්‍රවණයකොට; කළයුරු, කළාක්වැනිවූ; සොඳුරුසාලා, සුන්දරශාලාවන් ඇත්තාවූ; සුව්සාලා, ඉතාමහත්වූ; සිරිත්, ඓශ්වර්යයෙන් යුක්තවූ; විසාලා, විශාලා නම්වූ; පවර නුවරෙක්, පුරප්‍රවරයෙක්; වී, වූයේයි.

11 සත්සමුදුර, සප්තසාගර නමැති; අගල, (දිය) අගලින්ද; සත් ගිරි, (යුගන්ධරය, ඊසධරය, කරවීකය, සුදර්ශනය, නේමින්ධරය, විනතකය, අශ්වකර්ණය, යනමේ සප්තකුලපර්වතයෝයි). සප්තකුල පර්වත නමැති; පවුරු, ප්‍රාකාරයෙන්ද; වටකළ, පරික්ෂේපකරනලද්දාවූ; උදුළ, උපමලිතවූ; සක්පුරමිස, ශක්‍රනගරය මිනා; සක්වළ, සක්වළෙහි; එපුර සරි, ඒ නගරය වැනිවූ; පුරෙක්, නගරයක්; කොද, කොයින්ද.

---

* මුහුදින්, සාගරයෙන්;
† ඔකදින්, ප්‍රිතිගෙන් යුක්ද සඟරු කියත්.

12

බබලන පැහැ ගිහි ණි
වෙන වෙන දෙසින් සපැමි ණි
පබළුරන් මුතුමි ණි
නොයෙක් සල්පි*ල්සියෙන් [සුසැදි ණි

13

ගණරන් කොත් පැළ ඳි
සිතුසිතුවමින් සිත් බැ ඳි
මිණිපහ පැහැ විදි
කොණේ මාවේ සියෙන් සියසැ ඳි

14

පුරවැසියන් හි ළි
කෙළින කෙළිමෙන් නියැ ළි
දද ඉන් ඉන් වෙ ළි
කෙළි පුරඹර රැසින් බැබ ළි

15

මනහර රුසිරු ස ර
දෙවියන් ලෙසින් සුර පු ර
උරයෙන් උර පැහැ ර
නිතොර මහසෙන් සිටිති එනුව ර

---

12 වෙන වෙන දෙසින්, දේශාන්තරයෙන්; සපැමිණි, සම්ප්‍රාප්තවූ; ගිහිණි, ගැවසීගත්තාවූ; පබළුරන් මුතුමිණි, ප්‍රවාලසුවර්ණ මුක්තාමාණික්‍යයන්ගේ; පැහැ, ප්‍රභාවයන්; බබලන, බබලන්නාවූ; නොයෙක් සල්පිල් සියෙන්, අනේකාපණ ශතයෙන්; සුසැදිණි, මනාවසජ්ජිතවී.

13 පැළඳි, පිළඳිනය කරවනලද; ගණරන්කොත්, ඝනසුවර්ණ ශෘඞ්ගයන්හි; මිණි, මාණික්‍යයන්ගේ; සිතුසිතුවමින්, භිත්තීන්හි කරණලද චිත්‍රකර්මයන්; සිත්බැඳි, මනොබන්ධනයකළාවූ; *පහ, පැහැවිදි, ප්‍රභාව්‍යාප්තවූ; කොණේ, කුඩාවීථීහා; මාවේ, මහාවීථීන්; සියෙන්සිය, ශතයෙන් ශතය; සැදි, සජ්ජිතවී.

14 පුරවැසියන්, නාගරිකයන්; හිළි, තුෂ්ටව, නියැළී, තත්පරව; කෙළින, ක්‍රීඩාකරන්නාවූ; කෙළිමෙන්, ක්‍රීඩා පරිද්දෙන්; ඉන් ඉන්, අන්‍යොන්‍යයන්; වෙළි, වෙෂ්ටනය වන්නාවූ; දද රැසින්, ධ්වජසමූහයාගේ; කෙළි, ක්‍රීඩායෙන්; පුරඹර, නගරාකාශය; බැබළි, භ්‍රාජිතවී.

15 එනුවර, ඒ නගරයෙහි; මහසෙන්, මහාසේනාවෝ; සුරපුර දිව්‍යපුරයෙහි; මනහර, සිත්කළුවූ; රුසිරුසර, රූපශ්‍රීයෙන් බබළන්නාවූ; දෙවියන් ලෙසින්, දෙවතාවන් පරිද්දෙන්; උරයෙන්උර පැහැර, උරයෙන් උරය ගටා; නිතොර, නොරනොව; සිටිති, සිටිත්ය.

---

* රුවෙන් සුසැදිනි;

| 16 | | 18 | |
|---|---|---|---|
| හෙන සෙන සේ කිපෙ | න | එපුර රජ මාව | ත |
| තවසුන් ලෙසින් * නික්මෙ | න | බත් රත් දෙදෙන් පැහැප | ත |
| හැමරුපුසෙන් දින | න | සක් සත් ගත් දිග | ත |
| මගත්ගජසෙන්සිටිති තැනතැන | | නිතර රතසෙන් විතරවනුනැ | ත |

| 17 | | 19 | |
|---|---|---|---|
| හසළ පස් දහ | රේ | සුරතුරුමෙන් කැම | ති |
| කිසිදෙස් නොවැකි සිරු | රේ | දෙය යදියන්ට දෙන | ති |
| යනෙනා නිති එපු | රේ | ලොවපරසිදු පිණැ | ති |
| තුරඟ සෙන්වැනි තරඟ සයු | රේ | නොයෙක්මහසල්කුලන්ගෙන් | යු |

16 හෙන, පතිතවන්නාවූ, සෙහෙසේ අශනිපරිද්දෙන්; කිපෙන, කොපවන්නාවූ; තවසුන් ලෙසින්, තාපසයන් පරිද්දෙන්; නික්මෙන, ගමනාකරන්නාවූ; හැමරුපුසෙන්, සකල ශත්‍රුසෙනාවන්; දිනන, ජයගන්නාවූ; තැන තැන, තන්හි තන්හි; මහත්ගජසෙන්, මහත් හස්තිසෙනාවෝ; සිටිති, සිටිත්ය.

17 පස්දහරේ, † ආස්කන්දිතාදිපඤ්ච ධාරායෙහි; හසළ, පුරුදුවූ; සිරුරේ, ශරීරයෙහි; කිසිදෙස්, කිසිදෝෂයක්; නොවැකි, නොමැත්තාවූ; එපුරේ, ඒනගරයෙහි; නිති, නිරන්තරයෙන්; යනෙනා, ගමනාගමනය කරන්නාවූ; තුරඟසෙන්, අශ්වසෙනාව (කොසේද?); සයුරේ, සාගරයෙහි; තරඟවැනි, රළවැන්න.

18 එපුර, ඒනගරයෙහි; රජමාවත, රාජවීථිය; බත්, බඳනාලද; රන්දෙදෙන්, ස්වර්ණධ්වජයන්ගෙන්; පැහැපත, බබලන්නාවූ; දිගත, දිශාන්තය; සක්සත්, රථචක්‍රයන්ගේ ශබ්දයෙන්; නිතර, අනවරතයෙන්; ගත්, ග්‍රහණයකලාවූ; රතසෙන්, රථසෙනාව; විතරනුනැත, ඌනතාවක් නොමැත්තේය.

19 සුරතුරුමෙන්, දිව්‍යවෘක්ෂපරිද්දෙන්; නිති, නිරන්තරයෙන්; යදියන්ට, යාචකයන්ට; කැමතිදෙය, රුචිවූ ද්‍රව්‍යයන්; දෙන, දානය කරන්නාවූ; ලොව, ලොකයෙහි; පරසිදු, ප්‍රසිද්ධවූ; පිණැති, පුණ්‍ය වන්නාවූ; නොයෙක් මහසල්කුලන්ගෙන්, අනෙක (ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, යන මහාසාරකුල තුනෙකි) මහාසාර කුලයන්ගෙන්; යුති, යුක්තය.

* නික්මෙන; සිඳ පොත්. † ආස්කන්දිතය, ධෞරිතය, රෙචිතය, වල්ගිතය, ප්ලුතය, යන මොහු පඤ්චධාරනම්.

20

සුරගන සිරි සි ලූ
වරගන කෙළිත සඳ ලූ
ලියඟී කන් ක ලූ
ඉමෙක් නැත රගන රඟ මඬු ලූ

21

ඇමතැන ඇති සැප ත්
*එකතැන් කෙළෙව් සිරිග ත්
දක දක රිසිනුමු ත්
නැතැයියනසම්පතෙක්එහිනැ ත්

22

නන් වෙස් නන් බර ණ
සැපතින් පිරුණු අපම ණ
සිටි වයසෙහි තරු ණ
කෙසේ මෙතෙකැයි සෙද්දනරග ණ

23

සිහිල් දිය පිරු ණු
පියගැට පෙළින් දිලු ණු
බිඟු දැල් විසුරු ණු
වූය නැත තැන පියුම් පොකු ණු

---

20 සුරගන, දිව්‍යාඞ්ගනාවන්ගේ; සිරි, ශ්‍රීයාව; ඉසිලූ, ඉසුලූවාවූ; වරගන, වරාඞ්ගනාවන්; කෙළිත, ක්‍රීඩාකරන්නාවූ; සඳලූ, චන්ද්‍රකා ස්ථලයන්ගේද; කන්කලූ, කර්ණරසායනවූ; ලියඟී, ලයානුචිත ගීතිකා (කියමින්;) රගන, නටන්නාවූ; රඟමඬුලූ, නෘත්‍යමණ්ඩලයන්ගේද, ඉමෙක්නැත; සීමාවක් නොමැත්තේයි.

21 ඇමතැන, සියලු තන්හි; ඇති, විද්‍යමානවූ; සැපත්, සම්පත්තීන්; එකතැන් කෙළෙව්, එක්ස්ථානයෙක්හි කළාක්මෙන්; සිරි, ශොභාව; ගත්, ග්‍රහණය කළාවූ; දක දක, දර්ශනය කොටකොටත්; රිසි, රුචිය; නුමූත්, නොමිඳෙන්නාවූ; එහි, ඒ නගරයෙහි; නැතැයි යන, නැත්තේය යන; සම්පතෙක්, සම්පත්තියෙක්; නැත්, නැත්තේයි.

22 නන්බරණ, නානා භරණයෙන්; නන්වෙස්, නානා වෙසධාරීවූ; අපමණ, අප්‍රමාණවූ; සැපතින්, සම්පත්තීන්; පිරුණු, පරිපූර්ණවූ; තරුණවයසෙහි, තරුණ අවස්ථාවෙහි; සිටි, සිටියාවූ; නරගණ, මනුෂ්‍ය සමූහයා; කෙසේ, කවරාකාරයකින්; මෙතෙකැයි, මෙපමණ කැයි; සෙද්ද, (සංඛ්‍යායෙන් පරිමිතයට) පැමිණෙද්ද.

23 සිහිල්දිය, සිසිල ජලයෙන්; පිරුණු, පිරුණාවූ; පියගැට පෙළින්, පඞ්ක්තියෙන්; දිලුණු, දිලියෙන්නාවූ; බිඟුදැල්, භෘඞ්ගසමූහයෙන්; විසුරුණු, ව්‍යාප්තවූ; තැන තැන, තන්හි තන්හි; පියුම් පොකුණු, පද්ම පුෂ්කරණීනු; වූය, වූවෝයි.

---

* එකතැනමවූ.

24

නළඹල නත් කෙහෙ ළී
බත්මිණි කිකිණි මුතුදූ ළී
රත් පැට පහන්දි ළී
දෙරින් දෙරදන්දෙවනදන්හ ළී

25

අසුර සෙන් තර මින්
තැන තැන පැන අතර මින්
රැපුමන් උපුර මින්
සරණ මහසෙනහ අවිසර මින්

26

ගිජ්දුත් හිමදගි ළී
තුරඟුන් සමඟ නොහැකි ළී
තබ බත් රණැකි ළී
කෙළිතනැන්තැන්හි ගිලිඅලිකුළී

27

දූනගෙන විදූසිය ල්
උනුනට වෙමින් පිළිම ල්
කියන රැ දව ල්
සැදිණිවෙනවෙනනොයෙක්විදූහ

---

24 නළඹල, සුලඟින් ආවෘතවන්නාවූ; නත්කෙහෙළී, නොයෙක් පතාකයන් ඇත්තාවූ; බත්, බඳනාලද, මිණිකිකිණිමුතුදූලි, මාණික්‍ය කිඞ්කිණිකා මුක්තාජාලාවන් ඇත්තාවූ; රත්පැට පහන්, සවර්ණ පට්ට ප්‍රදීපවලින්; දිලී, බබලන්නාවූ; දෙරින් දෙර, වාරයක් පාසා; දන්දෙවන, දන්දෙවන්නාවූ; දන්හලී, දනශාලා ඇත්තේහි.

25 තරමින්, (සෞර්‍යාදි ගුණයන්ගේ) ප්‍රමාණයෙන්; අසුරසෙන් අසුරසේනාව වැනිවූ; තැනතැන, තන්හිතන්හි; පැන, පනිමින්; අතරමින්, අත්සරඹින්ද; අවිසරමින්, කඩුසරඹ සරමින්ද; රැපු, සතුරන්ගේ; මන්, මානය; උපුරමින්, උද්පාටනය කෙරෙමින්; සරන, හැසිරෙන්නාවූ; මහසෙන්, මහාසේනා ඇත්තේහි.

26 හිමදගිලි, ත්‍රිමද ගලිතවූ; ගිජ්දුත්, ගජේන්ද්‍රයන්; නොහැකිලී, අසංඛ්‍යාතව; තුරඟුන් සමඟ, අශ්වයන්හා; බත්රණැකිලී, බඳනාලද සවර්ණමයන; තබා, නික්ෂේපකොට; තැන්තැන්හි, ඒ ඒ ස්ථානයන්හි; කෙළින, ක්‍රීඩාකරන කල්හි;* අලිකුලී, භෘඞ්ග සමූහයා; ඉගිලී, ඉගිල ගියේයි.

27 සියල් විදූ, සකල විද්‍යාවන්; දූනගෙන, උද්ග්‍රහණය කොට; උනුනට, ඔවුනොවුන්හා; පිළිමල් වෙමින්, තරඟ වෙමින්; රැදවල්, දිවාරෑ දෙක්හි; කියන, කථනය කරන්නාවූ; වෙන වෙන, වෙන් වෙන්වශයෙන්; නොයෙක් විදුහල්, අනෙක විද්‍යාශාලා වන්ගෙන් සැදිණි. සජ්ජිතවී.

---

* කූවවූ භෘඞ්ග සමූහයායයි, සමහරු.

28

විහිදිමිණි කිර — ණ ය
මදුර දෙදෙරහි රත් තොර — ණ ය
නිති සතොස කර — ණ ය
සිරින් පිරිතිරි එපුර දෙර — ණ ය

30

පුර දෙරණත පි — රි
කුරරොන් සමග ඉහි — රි
දිගත ගොස් පැති — රි
පවති හයමිණි කිකිණි ගිගි — රි

29

සතුරන් කල නිහ — ඬ
එහි රිය සක්හි සක්හ — ඬ
වැජඹෙයි දසත මැ — ඬ
ලෙසින් රළ ගල සයුර ගත්හ — ඬ

31

පසඟතුරු — නා දේ
ගජසෙන් කුඤ්ච — නා දේ
සමග තුති — නා දේ
එපුර දිවරැ එකනි — නා දේ

---

28 මදුර මදුරෙහි, මාරයක්පාසා; මිණිකිරණය, මාණික්‍ය රශ්මින්; විහිදි, ව්‍යාප්තවූ; රන්තොරණය, සුවර්ණතොරණයන් ඇත්තාවූ; නිති, අනවරතයෙන්; සතොස කරණය, සතුටුඑලවන්නාවූ; එපුර, ඒ නගරයෙහි; දෙරණය, ධරණිය; සිරින්, ඓශ්වර්‍ය්‍යයෙන්; පිරිතිරි, පිරී ඉතිරියාක්වැන්න.

29 සතුරන්, ශත්‍රූන්; නිහඬකල, නිශ්ශබ්දකළාවූ; එහි, ඒ නගරයෙහි; රියසක්හි, රථචක්‍රයන්හි; සක්හඬ, චක්‍රනාදය; (කෙසේද?) සයුර, සාගරයෙහි; රළගල, තරඞ්ගපඞ්ක්තීන්; ගත්, ග්‍රහණයකළාවූ; හඬලෙසින්, ඝෝෂාව පරිද්දෙන්; දසතමැඬ, දශදිශාවමැඬ; වැජඹෙයි.

30 පුරදෙරණත, නගර පෘථුවියෙහි; පිරී, පරිපූර්ණව; හයකුර රොන්, සමග, අශ්වයන්ගේකුරයෙන් නගනාලද පාංශුවහා; ඉහිරි උතුරා දිගත, දිශාන්තායෙහි පැතිරීගොස්; ව්‍යාප්තව, ගමනාකොට; මිණිකිකිණි, මාණික්‍යමය කිඞ්කිණිකයන්ගේ; ගිගිරි, ගජිනාව; පවති, පවත්නේයි.

31 පසඟ තුරුනාදේ, (ආතතය, විතතය, ආතතවිතතය; ඝණය, සුසිරය යන මේ පඤ්චාඞ්ගික තූර්‍ය්‍යනාදයයි). පඤ්චාඞ්ගික තූර්‍ය්‍යනාද යෙන්ද, ගජසෙන්, ඇත්සමූහයාගේ, කුඤ්චනාදේ (කොස්වා ලිහිණින්ටබඳු නාදඇතිහෙයින් කුඤ්චනාදයයි නම්ලත්) රාවයෙන් ද; තුතිනාදේ සමග, ස්තුතිඝෝෂාවහා; එපුර, ඒ නගරයෙහි; දිවාරැ, රෑදවල්දෙක්හි; එකනිනාදේ, එකනින් නාද පැවැත්තේයි.

| 32 | | 34 | |
|---|---|---|---|
| එව කව බොව කිය | න | කෙළින පුර වැසි | යන් |
| තෙපුලෙන් පිරුණු ඇමතැ | න | ලොබවන තරම් දෙවි | යන් |
| උතුරු කුරු දිවයි | න | සව්සිරිනි සැදි | යන් |
| වැන්නාඉසුරෙන් එපුරහැමතැ | න | සැදිණිඑපමණපොකුණුගෙවුයන් | |

| 33 | | 35 | |
|---|---|---|---|
| සුරන් පහ සදි | සිය | නිරිඳුන් පෙම් බැ | දි |
| දිලියන් රුවන් බිතු | සිය | උනුන්වෙත සිත් පැහැ | දි |
| සත් දහස් සත් | සිය | ඉඳිනෙන් එහි සැ | දි |
| සතක් රජමහපහය ගැව | සිය | බියෙන්මෙන්කිසිදුකෙක්නොවිදි | |

32 එව, (මෙහි) ආගමණය කරව; කව, අනුභව කරව; බොව, පානය කරවයි; කියන, කථනය කරන්නාවූ; තෙපුලෙන්, වචනයෙන්; ඇමතැන, සියලු තන්හි; පිරුණු, පිරුණාවූ; එපුර, ඒ නගරය; ඇමතැන, සියලුතන්හි; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යයෙන්; උතුරු කුරු දිවයින වැන්න, උත්තරකුරු නම් ද්වීපය වැනිවී.

33 සුරන් පහසදිසිය, දිව්‍යප්‍රාසාද සමානවූ; * සත්රුවන්, සත් රුවන් මුවා; සියබිතු, ස්වකීය භිත්තීන්ගෙන්; දිලි, බබලන්නාවූ; සත්දහස් සත්සිය සතක්, හත්දස් හත්සිය හතක්වූ; රජමහ පහය, රාජමහා ප්‍රාසාදයන්ගෙන්; ගැවසිය, ගැවසි ගත්තේයි.

34 පුරවැසියන්, පුරවාසීන්; කෙළින, ක්‍රීඩාකරන්නාවූ; දෙවියන් දෙවතාවන්; ලොබවන තරම්, ආසා උපදවන පමණ; සව්සිරිනි සැදියන්, සකලශ්‍රීයෙන් සර්ජිතවූ; එපමණ, ( ඒ මාලිගාවන්ගේ ) ප්‍රමාණයට; පොකුණු ගෙවුයන්, පුෂ්කරණී හා ගෘහොද්‍යානයන්ගෙන්; සැදිණි, සර්ජිතවී.

35 එහි, ඒ නගරයෙහි; නිරිඳුන්, නරෙන්ද්‍රයන්; උනුන්වෙත, ඔවුනොවුන් කෙරෙහි; පෙම්බැදි, ප්‍රෙමයෙන් බැඳී; සිත්පැහැදි, චිත්තප්‍රසන්නව; සැදි, සර්ජිතව; ඉඳිනෙන්, ඉන්නා හෙයින්; බියෙන්මෙන්, භීතියෙන්මෙන්; කිසිදුකෙක්, දුක්අතුරෙන් කිසිවක්; නොවැදි නොවැදුනේයි.

* රන්, රිදී, මුතු, මැණික්, වෙරළුම්ණි, විදුරු, පබළු යනමේ සත්රුවන්හුයි.

| 36 | | 38 | |
|---|---|---|---|
| රැ මදනවගි නිතො | රේ | දුසිරි සිත නැව | ති |
| මිණිපහ පැහැය පැති | රේ | රජනිහිදත් ගුණැ | ති |
| දුරැවත ගතදු | රේ | මැදහත් ලෙස පැව | ති |
| ලොවැති සව්සිරි සපිරි එපු | රේ | එරජ ලිච්ඡවි නිරිඳු* නම් වෙ | ති |

| 37 | | 39 | |
|---|---|---|---|
| සත් සිය දහස් ස | ත් | කුලදෙවුවත් පැව | ති |
| සත් සරනිඳුහු සමගො | ත් | සෙබෙසි තෙදකිත් තොදිලෙ | ති |
| සත් වග කොමරනි මෙ | ත් | වෙත්වූ සඳ දිලෙ | ති |
| යුත් ව පවතිත් සිහිත් මැදහ | ත් | රසිත් මුසු හුමුසු රත්සේවෙ | ති |

---

36 මිණිපහ, මාණික්‍ය ප්‍රාසාදයන්ගේ; පැහැ, ප්‍රභාව; පැතිරේ, ව්‍යාප්තවීමෙන්; රැමදනවගි, දිවා රෑ; නිතොරේ, අනවරතයෙන්, දුරුවත, දුරුවන්නාවූ; ගතදුරේ, ඝනාන්ධකාරය ඇති; එපුරේ; ඒ නගරය; ලොවැති, ලෙව්හි විද්‍යමානවූ; සව්සිරි, සකලසම්පත්තීන් කෙත්; සපිරි, සම්පූර්ණවී.

37 සමගොත්, තුල්‍යගොත්‍ර ඇත්තාවූ; සත්දහස් සත්සිය සත් සරනිඳුහු, සත්දහස් සත්සිය සත්දෙනෙක් නරෙන්ද්‍රයෝ; සත්වග කොමරනි, සත්වැගියා කොමරෙහි; කුමාරවරුන්ද, කෙමිත්‍රියන් යුක්තව; මැදහත් සිහිත්, උපෙක්ෂා චිත්තයෙන්; පවතිත්, පවතින්නෝ වෙත්.

38 දුසිරිසිත, දුශ්චරිත චිත්තය; නැවති, වැලැක්කාවූ; රජනීති දත්, රාජනීතිය දත්තාවූ; ගුණැති, ගුණවත්තාවූ; මැදහත්ලෙස, මධ්‍යස්ථාකාරයෙන්; පැවති, පැවැත්තාවූ; එරජ, ඒ රජහු; ලිච්ඡවි නිරිඳු නම්වෙති, ලිච්ඡවි නරෙන්ද්‍රයෝ නම් වෙත්.

39 කුලදෙවුවත්, කුලජ්‍යෙෂ්ඨයන්; පැවති, පැවැත්තාවූ; සෙබෙසි, සභාවෙහි; තෙදකිත්, තේජසින් හා ආඥාවෙන්; තොදිලෙති, තොබබලත්; වෙත්වූ සඳ, (ඒකුලදෙවුවත්හෙත්) තොරවූ කල්හි; දිලෙති, බබලත්; රසිත්මුසු, පාරදයෙන් මිශ්‍රවූද; හුමුසු, අමිශ්‍රවූද; රත්සේ, සවර්ණය පරිද්දෙන්; වෙති, වෙත්.

---

* නම්ලති.

| 40 | | 42 | |
|---|---|---|---|
| නොබලා වරද | තැන් | ගතලන් | සබාමය |
| නොනැමි බසව මග | තන් | බසලන්ගේ | සබාමය |
| විලසිත් * සියසු | තන් | ඉසුරෙන් | සබාමය |
| සතන් රකිනුය බලා ඇම | තැන් | සබා නම් උන් උන් | සබාමය |

| 41 | | 43 | |
|---|---|---|---|
| නොමකා කුලසිරි | ත් | අවාබිය ඇව | රූ |
| නොනබාම දෙන දන්ව | ත් | සිත් සත් ගුණෙන්සපි | රූ |
| නොවඩා අයබදු | ත් | දිගුබිත කිවිය | රූ |
| නැගු සිත්සේම දිය දියකො | ත් | ඔවුන් ගුණසිතුයමින් තැව | රූ |

40 වරදතැන්, වරදඇතතාවුන්; නොබලා, නිරීක්ෂණයනොකොට; මගතන්, මගතුන්ගේ; බස , උවනයට; නොනැමී, නොහැරී; ඇම තැන්, සකලස්ථානයන්; බලා, නිරීක්ෂණයකොට; සිය පුතන් විලසින්, ස්වකිය පුත්‍රයන් පරිද්දෙන්; සතන්, සත්ත්වයන්; රකිනුය, රකින්නෝය.

41 කුලසිරින්, කුලචාරිත්‍රයන්; නොමකා, විනාශනොකොට; නොනබාම, අත්නොහැරම; දෙන, දෙන්නාවූ; දන්වත්, දනවසතු ඇත්තාවූ; අයබදුත්, සුංකමුත්; නොවඩා, වැඩිනොකොට; දිය, ජගත්හි; දියකොත්, ජයකෙතුන් (ජයකොඩි) සිත්සේම, සිත්වූ පරිද්දෙන්ම; නැගූ, නැගූය.

42 උන්, ඒ වැදූරජුන්ගේ; ගත, ශරීරය; සබාමය, බැබලීමෙසහිත මය; උන්ගේ, ඒ වැදූරජුන්ගේ; බස, වචනය; සබාමය, සත්‍යමය; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යයෙන්; සබාමය, භාග්‍යසම්පන්නමය; සබාතම්, සභාවනම්; උන් උන්, ඔවුන් උන්නාවූ; සබාමය, සභාවමැයි.

43 අවාබිය, අපාය භිය; ඇවරූ, ආවරණකළාවූ; සත්ගුණෙන්, සත්පුරුෂ ගුණයෙන්; සපිරූ, සම්පූර්ණවූ; සිත්, සිත්ඇත්තාවූ; ඔවුන්, ඒ උපජීන්ගේ; ගුණසිතුයමින්, ගුණනමැති චිත්‍රකර්මයෙන්; කිවියරු, කවීහු; දිගුබිත, දිශා නමැති භිත්තීන්හි; තැවරූ, සිතියම්කළෝ.

* පියසුලන්.

**44**

රත්රූ සදි සි ය ග
දූක දූක නොායන රි සි ය ග
කන්කළු සුබැ සි ය ග
ඔහුම නරදෙව් නමට නි සි ය ග

**45**

රූසිරෙන් ලොව ග රූ
අසුරූ සුරිඳුන් පිළි රූ
දස රජ දම් දූ රූ
ඔවුන් සරිවෙති මෙලොවකවු රූ

**46**

සකබිම පෙරළෙ මි ත්
ගැලබඩු නිසල කෙරෙ මි ත්
පවතිනමෙන් නො මි ත්
තුමූ දුක්වඳිනි සත රකි මි ත්

**47**

රොත් ඇරගෙණ සෙ මි ත්
යන බිගුපෙළසින් කුසු මි ත්
ලොවට දුක් නොදෙ මි ත්
ගණිති අය පඬුරූ පෙර නියැ මි ත්

---

44 දූක දූක, දශිණයකොට තොාවී; රිසිනොායනා, ආශා දුරූනොවත්තාවූ; රත්රූ සදිසියහ, සවණීප්‍රතිමාවන් සමාන රූඇත්තාවූ; කන්කළු, කණීරසායනවූ; සුබැසියහ, සුභාෂිතයන් ඇත්තාවූ; ඔහුම, ඒ වජ්ජිනුම; නරදෙව්නමට, * නරදෙවය යන නාමයට; නිසියහ, යොග්‍යයෝ වෙත්.

45 රූසිරෙන්, රූපශ්‍රීයෙන්; ලොව, ලොකයා; ගරූ, ගරූකොට සලකන්නාවූ; සුරිඳුන්, දෙවියන්ගේ; පිළිරූ අසුරූ, ප්‍රතිමාවැනිවූ; දසරජදම්, † දශරාජධම්මයෙන්; දූරූ, දූරූවාවූ; ඔවුන්, ඒ ලිච්ඡවින් හා; කවුරූ, කවර කෙනෙක්නම්; සරිවෙති, සමානවෙද්ද?

46 ගැල, ශකටය; සක, (තමන්ගේ) චක්‍රය; බිම, භූමියෙහි; පෙරළෙමින්, පරවර්තනය කෙරෙමින්; බඩු, භාණ්ඩයන්; නිසලකෙරෙමින්, නිශ්චල කෙරෙමින්; නොමින්, බෙහෙවින්; පවතිනමෙන්, පවතින්නාක් මෙන්; තුමූ, තුමූම; සතරකිමින් සත්වයන් රක්ෂා කෙරෙමින්; දුක්වඳිනි, දුක්වඳින්නෝ වෙති.

47 කුසුමින්, පුෂ්පයෙන්; සෙමින්, ලස්ව; රොත්ඇරගෙණ, රෝණු ග්‍රහණයකොට යන්නාවූ; බිගුපෙළසින්, භෘංගයන්මෙන්; ලොවට, ලොකයාහට; දුක්නොදෙමින්, දුඃඛදානය නොකෙරෙමින්; පෙරනියමින්, පූර්ව (රාජ) නියමයෙන්; අයපඬුරූගණිති, අයපඬුරූගනිත්.

---

* නරදෙවියහට.

† දශරාජ ධම්මයෝ නම්:-දානය, ශීලය, පරිත්‍යාගය, ඇදනැති බව, මෘදුබව, තපනය, නොක්‍රොධබව, හිංසානොකරණබව, ඉවසීම, අවිරොධභාවය යන මොහුයෙත්.

48

ලූවද සිඳුපෙදෙ සේ
දියනොගෙණ සිටි නැව සේ
දනනොගෙණම තො සේ
සිටිති දනවත් දනන් සිත සේ

49

පලගත් අතු න සා
පලගත්තවුන් විල සා
දනගැණුමක් නි සා
දහම් නොනසති දනන් වන සා

50

සවණින් අසන බ ස
නුවනින් අසව යනලෙ ස
යෙරෙති තමා බ ස
යමක්නොයොදති මිසක් නිසිලෙ ස

51

දෙනතුල්සේ ඉස ව
සතින් වලකන වැස්ස ව
යෙදෙන මහතුන්හ ව
දෙයක්නොයොදෙති හීනයන්හට

---

48 සිඳුපෙදෙසේ, සමුද්‍රප්‍රදෙශයෙහි; ලූවද, ප්‍රවෙශකළේවී නමුත්; දියනොගෙන සිටි, දිය නොගෙන සිටියාවූ; නැවසේ, නාවුකාවක් පරිද්දෙන්; දන නොගෙනම (රජුන් විසින්) ධනය පැහැර ගැණීම් රහිතවූම; දනවත් දනන්, ධනවත් ජනයො; සිතසේ, සිත්වූ පරිද්දෙන්; තොසේ, සතුටින්; සිටිති, සිටිත්.

49 පලගත්, ගටගත්ඵල ඇත්තාවූ; අතු, ශාඛාවන්; නසා, විනාශකොට; පලගත්තවුන් විලසා, ඵලග්‍රහණය කරන්නවුන් මෙන්; දනගැණුමක් නිසා, ධනග්‍රහනයක් හෙතුකොට ගෙණ; දනන් වනසා, ජනයන් විනාශකොට; දහම් නොනසති, (රාජ) ධර්මය විනාශ නොකෙරෙත්.

50 සවණින්, කණින්; අසන, ශ්‍රවණය කරන්නාවූ; බස, වචනය; නුවණින්, කල්පනාවෙන්; අසව යනලෙස, ශ්‍රවණය කරවයි කියන්නාක් මෙන්; තමාබස, තමාගේ වචනය; කෙරෙති, කෙරෙත්; යමක්, යම් ක්‍රියාවක්; නිසිලෙස මිසක්, යොග්‍යාකාරයෙන් විනා; නොයොදති, යොජනය නොකෙරෙති.

51 සතින් වලකන, ජන්තූයෙන් වැලකිය යුතුවූ; වැස්සව, වර්‍ෂාවට; ඉසව, ශීර්‍ෂයට; අතුල්දෙනසේ, අත්ල පාත්නාක්මෙන්; මහතුන්හට යෙදෙන, මහාශයන්හට යෙදෙන්නාවූ; දෙයක්, කාරණයක්; හීනයන්හට, ලාමකයන්හට; නොයොදති, නොයොදත්.

52

පර අඟනුන් දෙ සේ
බලනා ලෝවැඩ පිණි සේ
ගිම්හරිවිමඬ සේ
බලති ඇස අකුළුවා දුක සේ

53

පුතුවෙත සෙනෙහ සේ
*පසව දුක් ඉවසන සේ
ලෝරකු මදහ සේ
විඳිනිදුක්සරුනොකොටසැප සේ

54

බබලනා තුරුව සා
වලාලනා මරු විල සා
අනුන් ගුණ කෙලෙ සා
නුගුණ නොමපතුරුවති වෙසෙසා

55

ඇත්ගොව්වන් ම රා
තුටුවන ගජන් අයු රා
දුක්ගන්නන් ම රා
එසින් තුටු සිත් නොවෙති ඉඳු රා

---

52 ලෝවැඩ පිණිසේ, ලොකාභිවෘද්ධිය පිණිස; පරඅඟනුන්දෙසේ, පරාඞ්ගනාවන් දිශාව; බලනා අවලෝකනය කරණ කල්හි; ගිම්, ග්‍රීෂ්මකාලයෙහි; රිවිමඬලසේ, සූර්‍ය්‍යමණ්ඩලය (බලන්නාක් මෙන්) දුකසේ, කෘච්ඡ්‍රයෙන්; ඇසඅකුළුවා, අක්‍ෂිආකුංචිතකොට (ඇසඅකුළා) බලති; නිරීක්‍ෂණය කෙරෙත්.

53 පුතුවෙත, පුත්‍රයා කෙරෙහි; සෙනෙහසේ, ස්නේහාධ්‍යාසයෙන්; පසවදුක්, ප්‍රසවදුඃඛය (වැදීමෙහි දුක) ඉවසනසේ (මව්) ඉවසන්නාක් මෙන්; ලෝරකුමදහසේ, ලෝකයා රකින අදහසින්; දුක්, දුඃඛය; සරුනොකොට, නොතකා; සැපසේ, සැපයක් පරිද්දෙන්; විඳිති, විඳිත්.

54 බබලනා, බබලන්නාවූ; තුරු, තාරකාවන් වසා, ඡාදනය කොට; වලා, වලාහකයන්; ලනා, හෙලන්නාවූ; මරු, (චණ්ඩ) මාරුතය මෙන්; අනුන්ගුණ, අන්‍යයන්ගේ ගුණයන්; වෙසෙසා, වෙනස් කොට; කෙලෙසා, දූෂ්‍යකොට; නුගුණ, අගුණයන්; නොමපතුරුවති, නොපතුරුවත්.

55 ඇත්ගොව්වන්, හස්තිගොපකයන්; මරා, ඝාතනයකොට; තුටුවන, තුෂ්ටවන්නාවූ; ගජන් අයුරා, හස්තීන් මෙන්; දුක්ගන්නන්, දුඃඛිතවූ මෙහෙකරුවන්; මරා, නසා; එසින්, ඒ හේතුවෙන්; ඉඳුරා, අවශ්‍යයෙන්; තුටුසිත් නොවෙති, චිත්තප්‍රීතියට නොපැමිණෙත්.

---

* පසව ඉවසනා මවසේ.

56

සුවඳ හැල් උදු   රු
රකිනෙව් වරාඉදු   රු
අදහම් රකපු   රු
දහම් නොනසති සිතින් නිතොරු

57

පස් ඉඳුරෙන් රැග   ත්
අරමුණු පසින් සැපල   ත්
විලසින් ජවන්සි   ත්
ලෙවන්ලද සැපතින්ම තුටුවෙත්

58

වතුරු වැලි බිම්පෙ   ත
නොහැරම කරණ මෙන් නෙ   ත
දුප්පත් සතුන් වෙ   ත
කෙරෙනි නිති මහකුළුණුමෙත්සි

59

කලපිරුණු තෙල් ඇ   නි
රකිනෙව් නිසලකොට නි   නි
මහතුන් ගුණ නැනැ   නි
නිතොරරකබැති සිතින් පවිතිනි

---

56 සුවඳහැල්, සුගන්ධශාලි ධාන්‍යයන්; උදුරු, උද්පාටනයකොට ඉඳුරු, යහපත්ව; වරා රකිණෙව්, වරානම් තෘණ ධාන්‍ය රකින්න වුන්මෙන්; අදහම්, අධර්මය; පුරු, පුරණයකොට; රැක, ආරක්ෂාකොට; නිතොරු, අනවරතයෙන්; සිතින්, චිත්තයෙන්; දහම් නොනසති, (රාජ) ධර්මය විනාශ නොකරනි.

57 පස්ඉඳුරන්, * පඤ්චෙන්ද්‍රියයන් කරණකොටගෙණ; රැගත්, ගන්නාලද; † අරමුනු පසින්, ආලම්බන පඤ්චයෙන්; සැපලත්, සැප ලැබුවාවූ; ජවන්සිත්විලසින්, ජවන චිත්තයන් පරිද්දෙන්; ලෙවන්, ලොකයා විසින්; ලද, ලබනලද; සැපතින්ම, සම්පත්තියෙන්ම! තුටුවෙත්, තුෂ්ටියට පැමිණෙත්.

58 වතුරු, ජලය; වැලිබිම්පෙත, වාලුකා භූමිප්‍රදෙශය; නොහැරම, අනවශෙෂකොට; නෙත කරණමෙන්, සෙවනය කරන්නාක් මෙන්; දුප්පත් සතුන්වෙත, දුඃඛිත සත්වයන් කෙරෙහි; නිති, සතතයෙන්; මහකුළුණු මෙත්සිත, මහා කරුණා මෛත්‍රී චිත්තය; කෙරෙනි, පතුරුවත්.

59 පිරුණුතෙල් ඇති, තෛලයෙන් පරිපූර්ණවූ; කල, කුම්භයන්; නිති, අනවරතයෙන්; නිසලකොට, නිශ්චලකොට; රක්නෙව්, රක්ෂා කරන්නවුන් මෙන්; ගුණ නැණැති, ගුණයෙන් හා ඥානයෙන් යුක්තවූ; මහතුන්, මහාත්මයන්; නිතොර, නිරන්තරයෙන්; බැතිසිතින්, භක්තිචිත්තයෙන්; රැක, රක්ෂාකොට; පවතිනි, පවතිත්.

---

* චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, යන මේ පසිඳුරෝයි.

† රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, යන මේ පසරමුනයි.

60

හමින පවනක් සේ
ගවර වලපුල් සර සේ
කුල නුකුලන් දෙ සේ
සමවපවතිත් සිහින් සොඳ සේ

61

* ගිරු නැගෙන කොළෙ සේ
රකිණඳුරු ගිරිලෙන සේ
සැඩදනතැත් සෙ සේ
දුගීජන රැකසිටිති සිත සේ

62

දත්මැදලා දම න
දුහැටිදඬුමෙන් දින දි න
මෙමෙහෙණගන දනන් ගෙ න
පසුවනොදමති †නොදත්තන්මෙ

63

වෙන වෙන කරලදු වූ
වීගෙණ පුරණමෙන් අ වූ
හැමසතසිත සතු වූ
තමා ලෙසිලානුවූ අකප වූ

---

60 ගවරවල, ‡ වනදිනිකායෙහි හා; පුල්සරසේ, ප්‍රුල්ලතඩාගයෙහිද; හමින, හමන්නාවූ; පවනක්සේ, සුළඟක්මෙන්; කුලනුකුලන්දෙසේ, කුලවතුන් හා හීනකුලඇත්තවුන්කෙරෙහි; සමව, සමානව; සොඳසේ සිහින්, යහපත් චිත්තයෙන් යුක්තව; පවතිත්, පවතින්නෝ වේත්.

61 ගිරු, සූර්යයා; කොළෙසේ, කෛලාස කූටයෙහි; නැගෙන, නැගෙනකල්හි; අඳුරු, අන්ධකාරය; රකිණ, රක්ෂාකරන්නාවූ; ගිරිලෙනසේ, ගිරිගුහාවක් මෙන්; සැඩදන, චණ්ඩජනයා; ඇතත්, ඇත්තේ නමුත්; සිතසේ, සිත්වූ පරිද්දෙන්; දුගීජන, කෘපණ ජනයා; රැක, රක්ෂාකොට; සිටිති, පවත්නෝයි.

62 දින දින, දවසක් පාසා; දත්මැදලා දමන, දත්ත නිෂ්කීණය කොට බැහැරලන්නාවූ; දුහැටි දඬුමෙන්, දන්තකාෂ්ඨ පරිද්දෙන්; දනන්ගෙණ, මිනිසුන්ගෙන්; මෙමෙහෙණෙණ, වැඩහෙණ; පසුව, නැවත; නොදත්තන්මෙන්, නොදන්නන් පරිද්දෙන්; නොදමති, අත්නොහරිති.

63 කරල, ශීර්ෂය; වෙනවෙන, වෙන්වෙන් වශයෙන්; දුටු, දර්ශනය කළාවූ; වීගෙණ, ධාන්‍ය ග්‍රහණයකොට, අටුපුරණමෙන්, කුශල පූරණයකරන්නාක්මෙන්; හැමසත, සියලු සත්වයන්ගේ; සතුටුසිත, සන්තෝෂ චිත්තය; තමාලෙසිලා, තමාගේ හෘදයට පමුණුවා; අකපටුපුවූ, මදකුත් අඩුනොවූවෝයි.

---

* ගිරු නැගෙ තුදු කෙසේ. † නොදත්තන්මෙන.

‡ වනදිනිකාය නම්;-ගම්දොරපිහිටි හැලිවලත් ලෙනාදිය ආදීවූ අපවිත්‍ර ගෙනෙගොස් බහාලන්නාවූ මහාවලෙක්වෙයි.

64

කුසගිනි විතර මි ස
නොකරන ලෙසින් බත් කි ස
නොකරවති දනරැ ස
සතන් රකිනා විතරකට මි ස

65

පියුමෙහි මී විලෙ හි
තබා බොනහසමෙන් මෙ හි
දන දනවතුන්ගෙ හි
තබා වැඩ විඳගනිති නිති එ හි

66

ඇතු රකිනා පිණි ස
දලන අනුන් යස්ලෙ ස
එකෙකුට වැඩ පිණි ස
නොදෙති උදුරු එකෙකුගේ යස

67

මෙවැනි දස්කම් කො ට
ලබමි යමක් ආහ ට
නොමදී ඒ ඔහු ට
නොයාදෙහිදෙමිනසින්* සියගෙ

---

64 කුසගිනි විතරම්ස, ක්ෂුධාග්නිය පමණමුත්; බත්කිස නොකරන ලෙසින්, භක්තකෘත්‍යය නොකරන්නාක්මෙන්; සතන් රකිණ, විතරම්ස, සත්වයන් රකිණ පමණමුත්; දන, ධනය; රැස්නොකරවති, රාසිනොකරවත්.

65 විලෙහි, තඩාගයෙහි හටගත්තාවූ; පියුමෙහි, පද්මයෙහි; මී, මධුත්; තබා, හැර; මෙහිමේ, ඒතඩාගයෙහි; බොන, දියබොන්නාවූ; හසමෙන්ම, හංසයන් පරිද්දෙන්ම; දනවතුන්, ධනවන්තයන්ගේ; ගෙහි, ගෘහයන්හිවූ; දන, ධනය; තබා, ස්ථාපනයකොට; එහි, ඒනගරයෙහිවූ රජදරුවෝ; නිති, නිරතුරුව; වැඩවිඳගනිති, වෘද්ධ්‍යාභිවින්දනයකෙරෙත්.

66 ඇතුරකිනා පිණිස, හස්තීන් රක්ෂාකරණු සඳහා; අනුන්යස්, අන්‍යයන්ගේ යශස; දලනලෙස, (කපා)දමන්නාක්මෙන්; එකෙකුට, එක් අයෙකුට; වැඩ පිණිස, වෘද්ධිය පිණිස; එකෙකුගේ, අන්‍යයෙකුගේ; යස, ඓශ්වර්‍ය්‍යය; උදුරු නොදෙති, උදුරා නොදෙත්.

67 මෙවැනි, මෙයාකාරවූ; දස්කම් කොට, දක්ෂකර්මයක් කොට; යමක් ලබමි, යම්දෙයක් ලබමැයි; ආහට, පැමිණියාහට; ඒ, ඒ රුවිදය; නොමදී, දනය නොකොට; ඔහුට, ඕහට; දෙමිනසින්, දෞර්මනස්‍යයෙන්; සියගෙට, ස්වකීය ගෘහයට; යානොදෙති, යන්ට නොදෙති.

---

* ඔහුගෙට.

68

මල සිඳෙන පමණ ට
දවන රත් සේ ගිනි කො ට
කල වරද පමණ ට
දෙවති සන්තාප ඔහු දන හ ට

69

සිඳුවඩදිය නොව නා
කලපුව සිඳෙන දියමෙ න
සැපෙන් දුරුවුව ද නා
තුමූනොසිඳිති සිහින් සැපගෙ න

70

දුන් නෙහි දුඛිත මෙන්
විදිසැරය දුරයන මෙන්
තම කළ දුඛිත මෙන්
සතුන් දුරනොයැවූය නියමෙන්

71

මුලහිරව සිටි සේ
සලල වන තුරු සිර සේ
සත සුව විඳින සේ
තුමූ සලලව සිටිති සිත සේ

---

68 මලසිඳෙන පමණට, මල දුරුවන ප්‍රමාණයට; ගිනිකොට චිත්තසන්තාපයකොට; දවන, පුළුස්සන්නාවූ; රත්සේ, ස්වර්ණයක් පරිද්දෙන්; කලවරද පමණට, කළාවූ දොෂයාගේ ප්‍රමාණයට; ඔහු, ඒ රජහු; දනහට, ජනයාහට; සන්තාප, දණ්ඩනය ආදී සන්තාපය; දෙවති, දනය කරවත්.

69 සිඳු, සමුද්‍රයෙහි; වඩදිය, වැඩෙන්නාවූ ජලය; නොවනා නොවැදීමෙන්; කලපුවදිය, ලොණිකායෙහි ජලය; සිඳෙනමෙන්, සිඳෙන්නාක් මෙන්; දන, ජනයා; සැපෙන් දුරුවුව, සම්පත්තියෙන් දුරුවූවහොත්; තුමූ, (ඒරජදරුවෝ) තුමූ; සිහින්, චිත්තයෙන්; සැපගෙන, සුඛග්‍රහණය කොට; නොසිඳිති, නොසිඳිත්.

70 දුන්නෙහි, ධනුෂයෙහි; දුඛිතමෙන්, වක්‍රභාවයෙන්; විදිසැරය, විදිනලද ඊය; දුරයනමෙන්, දුරයන්නාක්මෙන්; තමකළ, තමා විසින් කළාවූ; දුඛිතමෙන්, දුශ්කර්මයෙන්; නියමෙන්, නියමයෙන්; සතුන්, සත්වයන්; දුරනොයැවූය, ඈත්හී නොකොළේයි.

71 මුල, මූලය; හිරව, සවිරව; සිටිසේ, සිටියදීම; තුරු, වෘක්ෂයාගේ; සිරසේ, මස්තකය;(හෙවත්)නසඅග; සලලවනසේ, චලාචලවන්නාක් මෙන්; තුමූ, තුමූහු; සත, සත්වයන්ගේ; සිතසේ, සිත්වූ පරිද්දෙන්; සුවවිඳිනසේ, සුවවිඳින පරිද්දෙන්; සලලව, සැලෙමින් හෙවත් නැමෙමින්; සිටිති, සිටිත්.

72

නුවර රැක බරණ ට
කරන පවුරෙව් තිරකො ට
ලොවට රැක වරණ ට
තමා කරකොට ගනිති ඇමි ට

73

බොහනමෙන් මුවෙන් ගෙ න
ඇතුසොඬිනුකා ගත් පැ න
ලෝවැස්සන් පොව න
තමාලත් සැපත මා නිතියෙ න

74

මල්නොගෙන පලදෙ න
දිඹුල් තුරුසේ ඇමතැ න
කිසිකරුණක් නොගෙ න
දනන්සුවපත් කෙරෙතිනිතියෙන

75

සගිනි! නොප පුහු දුන්
තුදුටුවෙන් සග සුරි දුන්
බලවයි තෙල ර දුන්
බුදුන් වදහල බැවින් සෙත දුන්

---

72 නුවර, නගරයාගේ; රැකබරණට, රක්ෂාවරණයපිණිස; තිර කොට, සිරව; කරනපවුරෙව්, කරන්නාවූ ප්‍රාකාරයක්මෙන්; ලොවට, ලෝකයාගේ; රැකවරණට, රක්ෂාවරණය පිණිස; තමා, තමන්; ඇමිට, නිතර; කරකොට ගනිති, සිරකොට ගනිත්.

73 ඇතු, හස්තියා; සොඬින්, සොණ්ඩයෙන්; උකාගත්, උරා ගත්තාවූ; පැන, පියයුතු ජලය; මුවෙන්, මුඛයෙන්; ගෙන, ග්‍රහණය කොට; බොහනමෙන්, පානය කරන්නාක්මෙන්; නිතියෙන, නිරන්තරයෙන්; තමාලත්, තමන් ලද්දාවූ; සැපත, සම්පත් නැමති; අමා, අමෘතය; ලෝවැස්සන්, ලෝකවාසීන්ට; පොවන, පානය කරවන්නෝයි.

74 මල්නොගෙන, පුෂ්පග්‍රහනය නොකොට; හැමතැන්, සියලු තන්හි; පල්දෙන, ඵල දෙන්නාවූ; දිඹුල් තුරුසේ, උදුම්බරවෘක්ෂයන්මෙන්; කිසිකරුණක් නොගෙන, කිසිකාරණයක් නොමැතිව; නිතියෙන, අනවරතයෙන්; දනන්, ජනයා; සුවපත් කෙරෙති, සැප ඇති කෙරෙත්.

75 සගිනි, මහණෙනි; පුහුදුන්, පෘථග්ජනවූ; නොප, යුෂ්මත්හු; සග, ස්වර්ගයෙහි; සුරිඳුන්, දෙවියන්; තුදුටුවෙන්, දර්ශනය නොකල හෙයින්; තෙලරදුන්, අරහරජුයන්; බලවයි, නිරීක්ෂණය කරවයි; සෙතදුන්, ශාන්තිදානය කළාවූ; බුදුන්, සර්වඥයන් වහන්සේ; වදහලබැවින්, වදාළ බැවින්.

76

සැබවින් තිදස පු ර
සුරසෙන් ලෙසින් මනහ ර
තුටුකල ලොව නොහැ ර
කෙසේ වණමුද ඔවුන් සිරිස ර

77

සුරසිරි මෙන් නොම ද
රජසිරි යෙහෙන් විඳ වි ද
ඔවුනොවුන් පෙම් බැ ද
මෙසේ එරජුන් රජ කරන ස ද

78

දෙවියන් ගතෙහි දි ලි
දිසිමෙන් ජරා විලි පි ලි
එනුවර පවා ක ලි
කලෙක දුබ්බික් දුකෙක් වියකලි

79

නැත නිත්ත ව න් නේ
සව් සැප ලොව සතු න් නේ
පාතෙව් මෙතැ න් නේ
රෝග බියකුත් අවුත් ව න් නේ

---

76 සැබවින්, සවභාවයෙන්; තිදසපුර, ත්‍රිදශපුරයෙහි; මනහර, මනොහරවූ; සුරසෙන් ලෙසින්, දිව්‍යසෙනාව මෙන්; ලොව, ලොකය; නොහැර, අනවශෙෂකොට; තුටුකල, තුෂ්ට කළාවූ; ඔවුන්, ඒ රජුන්ගේ; සිරිසර, ශ්‍රීසාරය; කෙසේ වණමුද, කවරාකාරයකින් වර්ණනා කරමෝද.

77 සුරසිරිමෙන්, දිව්‍ය ඓශ්වර්‍ය්‍ය වැනිවූ; නොමඳ, බොහෝවූ; රජසිරි, රාජෛශ්වර්‍ය්‍යය; යෙහෙන්, යහපත්ව; විඳ විඳ, විඳිනය කොට කොට; ඔවුනොවුන්, අන්‍යොන්‍යයන්; පෙම්බැඳ, ප්‍රෙමබන්ධන යකොට; මෙසේ, මෙයාකාරයෙන්; එරජුන්, ඒ රාජයන්; රජකරනසඳ, රාජ්‍යය කරන කල්හි.

78 දිලි, බබලන්නාවූ; දෙවියන් ගතෙහි, දෙවතාවන්ගේ ශරීරයෙහි; ජරා විලිපිලි, ජරාවලිත පලිතයන්; දිසිමෙන්, දක්නා ලබන්නාක් මෙන්; කලි, මනොඥවූ; එනුවර පවා, ඒ විශාලාමහනුවරද; කලෙක, එක්කාලයෙක්හි; කලි, රෞද්‍රවූ; දුබ්බික්දුකෙක්, දුර්භික්ෂ දුඃඛයක්; විය, වූයේයි.

79 ලොවැ, ලොකයෙහි; සව්සතුන්නේ, සකල සත්වයන්ගේ; සැප, සම්පත්; නිත්තවන්නේ නැත, නිත්‍ය නොවන්නේය යනු; මෙතැන්නේ, මේ ස්ථානයෙහි; පාතෙව්, ප්‍රකාශ කරන්නාක්මෙන්; රෝගබියකුත්, රෝගභීතියකුත්; අවුත්, පැමිණ; වන්නේ, වැදුනේයි,

80

ඉසුරෙන් තම නු වර
සරියසි සිහින් බැඳ වෙර
දූත්නෙවී කුවෙර වර
වත්නු යක්සෙන් අවුත්එනු වර

81

නුවරෙහි විසා ලා
යම් කිසිවකු තබා ලා
යමුදුසි සිතා ලා
මරුගෙ සෙන්වන් වැනි විසා ලා

82

ගජතුරග සෙන් හ ඬ
රියසක් පසගතුරු හ ඬ
මෙහැම වෙසෙසින් මැ ඬ
වැජඹි බලුකැන හිලුන්ගේ හ ඬ

83

දිය අගල ගැඹු රූ
වසා පවු රිස් අතු රූ
මළ මිනියෙන් පි රූ
වටාකළ වැනි අමුතු පවු රූ

---

80 ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යයෙන්; තමනුවර සරියසි, තමන්ගේ (ආලකමන්‍දා නම්) රාජධානිය සදෘශයයි; සිහින්, විඥානයෙන්; වෙරබැඳ, උපනාහකොට; කුවෙර, වෛශ්‍රවණයා; වරදූත්නෙවී, වරදූත් නාක් මෙන්; එනුවර, ඒ නගරයට; යක්සෙන්, යක්‍ෂසේනාවෝ අවුත්, ආගමනය කොට; වත්නු, වත්නාහු.

81 විසාලානුවරෙහි, විශාලානම් නගරයෙහි; යම්කිසිවකු, යම් කිසි සත්ත්වයකු; තබාලා, ශේෂකොට; යමුදුසි, යන්නමෝදුසි; සිතාලා, කල්පනා කොට; මරුගේ, මාරයාගේ; විසාලා, මහත්වූ; සෙන්, සේනාව; වන්වැනි, පැමිණියාක් වැන්න.

82 ගජ, හස්තිය; තුරග, තුරඞ්ගය; සෙන්, පාබල සේනාය යන මොවුන්ගේ; හඬ, ශබ්දය; රියසක්, රථචක්‍රය; පසගතුරු, පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය යන; මෙහැමහඬ, මේසියල්ලෙහි නාදය; වෙසෙසින්, විශේෂයෙන්; මැඩ, අභිභවනයකොට; බලුකැන හිලුන්ගේ හඬ, ශෝණශෘගාලයන්ගේ රාවය; වැජඹි, විජෘම්භනවී.

83 ගැඹුරු, ගම්භීරවූ; දියඅගල, ජලපරිඛාවපවත්; පවුරිස්, ප්‍රාකාරශීර්‍ෂ දක්වා; අතුරු, මේ අතර; වසා, ඡාදනයකොට; පිරූ, පිරුණාවූ; මළමිනියෙන්, මෘතකලේබරයෙන්; වටා, වටකොට; අමුතු පවුරු කළවැනි, අලුත් ප්‍රාකාරයක් කළාක් වැන්න.

84

දඹදිව් තල අව ව
උවදුරු තාක් එක් කො ව
නොහැර ගෙන එපුර ව
අවුත් මරු බව වැන්න එකම් ව

86

දොර දොර මිනී බෙ ර
ගෙයි ගෙයි හඬය බිය ක ර
පිල පිල අදින ම ර
ගිලුනුන් ගෙන් නැත අවස ර

85

ගොඩ ගොඩ ඇට හැකි ලි
තැන තැන තුබූ බලි බි ලි
මග මග රෙදි වැර ලි
එපුර හැමතැන බලත් පිළිකු ලි

87

මුනවරල ඉස ඉ ස
ගෙන කඳු ලැලිය ඇස ඇ ස
සාගිනිය කුස කු ස
කියන දුකුලාම විය බස බ ස

---

84 දඹදිව්තල, ජම්බුද්වීප තලයෙහි; අවා, හාත්පස; තාක්උවදුරු, උවදුරුමුල්ල; නොහැර, අනවශෙෂ කොට; එක්කොට, පුඹුකොට; එපුරට, ඒ නගරයට; ගෙනඅවුත්, ග්‍රහණයකොට අවුත්; මරු, මාර තෙම; එකම්ව, පෙරපසුනොව; බව වැන්න, බැස්සක් වැනිවිය.

85 ගොඩ ගොඩ, රාශි රාශිවූ; ඇට හැකිලි, අසම්කාඩකාල ඇත්තාවූ; තැන තැන, තත්හි තත්හි; තුබූ, තබනලද; බලි බිලි, බිලි පූජා ඇත්තාවූ; මග මග, මගක්පාසා; රෙදිවැරලි, ජීර්ණවස්ත්‍ර ඇත්තාවූ; එපුර, ඒ නගරය; බලත්, බලතහොත්; හැමතැන සකලස්ථානය; පිළිකුලි, ප්‍රතික්කූලයි

86 දොර දොර, වාරයක්පාසා; මිනීබෙර, මලබෙරයන්ද; ගෙයි ගෙයි, ගෙයක්පාසා, බියකරහඬය භයඞ්කාර ශබ්දයයෙන්ද; පිල පිල, ආලින්දයක් පාසා; මරඅදින, පණඅදින්නාවූ; දුගී ගිලනුන් ගෙන්, කෘපණ රෝගීන්ගෙන්; අවසරනැත, අවකාශ රහිතවී.

87 ඉස ඉස, ශීර්ෂයක්පාසා; මුන, මිදුනාවූ; වරල, කෙශකලාපයෙන්ද ඇස ඇස, අක්ෂියක්පාසා; ගෙන, වැගිරෙන්නාවූ; කඳුලැලිය, බාෂ්ප ධාරායෙන්ද; කුස කුස, කුක්ෂියක්පාසා, සාගිනිය ක්‍ෂුධාග්නියෙන් ද දැනකව; කියන කථනයකරන්නාවූ; බස බස, වචනයක් පාසා; දුකුලාමවිය, අනාලාපම වූයේයි.

88

කඩ කබල අත අ ත
ඉපිලි නඟරද ගත ග ත
බැගෑ හඬ වත ව ත
වැඩුනු දළසෝගිනිය සිත සි ත

90

උතුන්වෙත පියබ ස
යොදමින් සිතින් සගතො ස
උත් රජමැති පිරි ස
නැමද ඇතිතතු කිවුය මේ ලෙ ස

89

බිය තුනකින් රැදු රූ
බලා සපැමිණි උවදු රූ
ඇදුරන්ගෙන් ගැඹු රූ
ඇතුළු නුවරට වන්නු එනුව රූ

91

දූඩි දුබ්බික් දුහෙ කී
කිසි වෙදකමක් නොකළෑ කී
සැඩ රෝ දුක් බිය කී
යකුන්ගෙන්වන මහත් වනසෙ කී

---

88 අතඅත, හස්තයක් පාසා; කඩකබල, කපාල ඛණ්ඩයෙන්ද; ගත ගත, ගාත්‍රයක් පාසා; ඉපිලි නඟරද, ඉල්පුනාවූ නඟරුන්ගෙන්ද; වත වත, මුඛයක් පාසා; බැගෑහඬ, කෘපණ ශබ්දයෙන්ද; සිත සිත, චිත්තයක් පාසා; වැඩුනු, වර්ධිතවූ; දළසෝ ගිනිය, දෘඪ ශෝකාග්නියෙන්ද යුක්තවිය.

89 රුදුරා, රෞද්‍රවූ; බියතුනකින්, භීතිත්‍රයකින්; සපැමිණි, සම්ප්‍රාප්තවූ; උවදුරු, උපද්‍රව; බලා, නිරීක්ෂණය කොට; එනුවරු, ඒ නාගරිකයෝ; ගැඹුරු, ගම්භීරවූ; ඇදුරන්ගෙන්, ( වෛද්‍යාදි ) ආචාර්යයන්ගෙන් යුක්තවූ; ඇතුළු නුවරට, අභ්‍යන්තර නගරයට; වන්නු ප්‍රවිෂ්ටවූවෝයි.

90 උතුන්වෙත, ඔවුනොවුන් කෙරෙහි; පියබස, ප්‍රියවචනයන්; යොදමින්, ප්‍රයෝජන කරමින්; සග තොස සිතින්, සන්තෝෂ චිත්තයෙන් යුක්තව; උත්, හුන්නාවූ; රජමැති පිරිස, රාජාමාත්‍ය පිරිස; නැමද, නමස්කාර කොට; මේ ලෙස, මෙයාකාරයෙන්; ඇතිතතු, විද්‍යමාන තත්වය; කිවුය, කථනය කළෝයි.

91 දූඩි, දැඩිවූ; දුබ්බික්, දුර්භික්ෂයෙන් හටගත්තාවූ; දුහෙකී දුඃඛයෙක්ද; කිසිවෙදකමක්, කිසි වෛද්‍යකර්මයක්; නොකළෑකී, කරණු නොහැක්කාවූ; සැඩ, චණ්ඩවූ; රෝදුක් බියෙකී, රෝගදුඃඛ භීතියෙක්ද; යකුන්ගෙන්, යක්ෂයන්ගෙන්; වන, වන්නාවූ; මහත් වනසෙකී, මහත් විනාශයෙක්ද වී.

92

කෙත් වත් විපත වී
ගංඟෝදිය ගිය තැ වී
වැසි නැති විගත වී
නොයෙක් තුරුලියද පතිත වී

93

තොලුගානා තණ ක්
දියතලු තෙමෙන පමණ ක්
නැතිව තුරු සෙවන ක්
දුකෙක් සිවුපාවුන්ට දියුණ ක්

94

පෙරසුරඟනන් වැ නී
අඟනෝ සොඳුරු රුසිරෙ නි
මස් ලේ නැති බැවි නි
උදක් ගෙයි ගෙයි යකින්නන්වැ

95

*නොයෙක් උක් මි ර ස
ගියවැනි බියෙන් පරදෙ ස
සුලබ පස්ගෝර ස
දුලබවිය මෙහි ඇතැයි යන බ ස

---

92 කෙත්වත්, ක්ෂෙත්‍රවස්තු; විපතවී, විනාශවිය; ගංඟෝ, නදී ප්‍රවාහයෝ; දිය, ජලය; තැවීගිය, හුණුව ගියේය; වැසිනැති, වර්ෂාරහිතවූ; විගත, අහස; වී, වූයේයි; නොයෙක් තුරුලිය, අනේක වෘක්ෂලතා තොමෝ; ද, දණ්ඩව හෙවත් වියලී; පතිතවී, වැටුනීය.

93 තොලුගානා, තොල උලාකන්නාවූ; තණක්, තෘණයක්ද; තලු තෙමෙන පමණක්, තලුතෙමීම් විතරවූ; දිය, ජලයක්ද; තුරු වෘක්ෂයන්ගේ; සෙවනක්, ඡායාවක්ද; නැතිව, නොමැතිව; සිවුපාවුන්ට, චතුෂ්පදිකයන්ට; දියුණක්, විගුණවූ; දුකෙකි, දුඃඛයෙකි.

94 පෙර, පූර්වයෙහි; රුසිරෙනි, රූපශ්‍රීයාව කරණකොටගෙන; සුරඟනන් වැනි, දිව්‍යාඞ්ගනාවන් වැනිවූ; සොඳුරු, සුන්දරවූ; අඟනෝ, අඞ්ගනාවෝ; මස් ලේ නැති බැවිනි, මස්ලේ නොමැත් තෙන්; උදක්, ඒකාන්තයෙන්; ගෙයි ගෙයි, ගෘහස්ථානයෙහි; යකින්නන් වැනි, යකින්නන් වැන්නාහ.

95 නොයෙක්, අනේකප්‍රකාරවූ; උක්මිරස, ඉක්ෂු රස හා මධුරසය; බියෙන් මෙන්, භීතියෙන්මෙන්; පරදෙස ගියවැනි, තොරව ගියාක් වැනිවිය; මෙහි, මේ නගරයෙහි; සුලබ, (පෙර) සුලභවූ; පස්ගෝරස, * පඤ්චගෝරසය; ඇතැයි යන බස, (දුන්) ඇතැයි යන වදනකුදු; දුලබවිය, දුර්ලභවීය.

---

* ඛීරං දධි ඝතං තක්කං–නොනීතං පඤ්චගෝරසා,
කිරි, මිදුනුකිරි, ගිතෙල්, මෝරු, වෙඬරු. (අභිධානප්පදීපිකා)

96

පෙර සත සිත ලෙසි නි
සෙවුනා මනා සුවඳි නි
කපුරු කස්තුරි දූ නි
මෙපුර නපුරැයි දමා ගියවැ නි

97

නැතුවත් සිල් අට ග
සුවඳ ගැමෙක් නැත ඇ ග
දුර ලියලිය සස ග
පිහිටි අයමෙස්ම බඹසරම ග

98

දුසිරි මග නැව නි
සිල්වත් දනන්සේ නි නි
කිවිනළු රස නැව නි
නටන නටවන අයෙක්නම් නැ නි

99

දැනෙන් එකඟ සි ත
වුමෙන් කෙළි සිනා නැ ත
නොසිඟන කෙනෙක් නැ ත
පිහිටි අයමෙන් දුහඟ පිළිවෙ ත

---

96 පෙර, පූර්වයෙහි; සත, සත්ත්වයන්; සිතලෙසිනි, සිත්වූ පරිද්දෙන්; සෙවුනා, සේවනයකළාවූ; මනා, යහපත්වූ; සුවඳිනි, සුගන්ධයෙන් යුක්තවූ; කපුරු කස්තුරි, කර්පූර හා කස්තූරි; දූනි, මේ කාලයෙහි; මෙපුර, මේ නගරය; නපුරැයි, අනිෂ්ටයයි; දමාගියවැනි, අත්හැර ගියාක් වැන්න.

97 අටහසිල්, අෂ්ටාඞ්ගශීලයාගේ (සමාදානයක්;) නැතුවත්, නැත්තේවි නමුත්; ඇඟ, ශරීරයෙහි; සුවඳගැමෙක්, සුගන්ධලේපනයෙක්; නැත, නැත්තේය; බඹසරමග, බ්‍රහ්මචාර්‍ය්‍යා මාර්ගයෙහි; පිහිටිඅයමෙස්ම; පිහිටියවුන්මෙන්; ලිය සසඟ, ස්ත්‍රී සංසර්ගය; දුරලිය, දුරුකළෝයි,

98 නිති, නිරන්තරයෙන්; දුසිරිමග, දුශ්චරිත මාර්ගයන්; නැවිනි, නිවෘත්තනයකළාවූ; සිල්වත් දනන්සේ, සීලවන්ත ජනයාමෙන්; කිවිනළුරස, කාව්‍ය නාටක රසය; නැවනි, නිවෘත්තනයකළෝ; නටන, නටන්නාවූද; නටවන, නටවන්නාවූද; අයෙක්නම්, කිසිවෙක්නම්; නැති, නැත්තේයි.

99 දැනෙන්,* ධ්‍යානයෙන්; සිත, චිත්තය; එකඟවූමෙන්, ඒකාග්‍රතායෙහි පිහිටියාක්මෙන්; කෙළිසිනා, ක්‍රීඩාහාස්‍යයෙක්; නැත, නැත්තේය; දුහඟපිළිවෙත, † ධූතාඞ්ගප්‍රතිපත්තියෙහි; පිහිටි අයමෙන්, පිහිටියවුන්මෙන්; නොසිඟන කෙනෙක්, භික්ෂාචාරය නොකරන කෙනෙක්; නැත, නැත්තාහුයි.

---

* සිතඑකඟ කරණ ප්‍රථමධ්‍යානාදි ධ්‍යානයන්ගෙන්

† පංසුකූලික, තෙචීවරික, පිණ්ඩපාතික, සපදානචාරික, එකාසනික, පත්තපිණ්ඩික, ඛලුපච්ඡාභත්තික, ආරඤ්ඤක, රුක්ඛමූලික, අබ්භෝකාසික, සෝසානික, යථාසන්ථතික, නේසජ්ජික යන මේ ධූතාඞ්ගයෝවෙති.

100

අගෙයක් රට වැ    ස් සෝ
වැලූන දූසි දූ    ස් සෝ
ලෑස පෙර නි    ස් සෝ
දුනුත් වටලා දුවති මැ    ස් සෝ

101

දියසෙ සිව් සයු    රේ
මහසෙනග ඇති නිතො    රේ
සපැමිණි උවදු    රේ
ඔවුන් ගැණ ගතහැකිය මෙපු    රේ

102

වැඩකෙරෙමි ලොව    ට
සපැමිණ මෙරජ සැපත    ට
* කිසියම් නැති ලොව    ට
කිමෙකපිහිටක් නොවනුමෙදුක    ට

103

දුක් බික් දුක් මු    සු
තම සිත දුකට සුදු    සු
නුවරුන් බස් ඇ    සු
නිරිඳු මෙමලසින් තෙපුල් පැ    සු

---

100 රටවැස්සෝ, රටවාසිවූ; අගෙයක්, යම්කිසිකෙනෙක්; දූසිදූස්සෝ, දූෂ්‍යදූෂකයන් විසින්; වැලූන, පිරිවරණලද්දෝද; පෙර, පූර්වයෙහි; නිස්සෝ, (පිරිවැරීමට) යොග්‍යවූවෝ; ලෑස, ඔහුමයයි; මැස්සෝ, මක්ෂිකාවෝ; දුනුත්, මේ උවදුරු කාලයෙහිත්; වටලා, වටකොට; දුවති, ධාවනය කෙරෙත්.

101 සිවුසයුරේ,† චතුස්සාගරයෙහි; දියසෙ, ජලයමෙන්; නිතො; රේ, අතර රහිතවූ; මහසෙනගඇති, මහාසේනා ඇත්තාවූ; මෙපුරේ, මේ නගරයට; සපැමිණි, සම්ප්‍රාප්තවූ; උවදුරේ, උපද්‍රවඇති කල්හි, ඔවුන්, ඒ සේනාවන්; ගැණගතහැකිය, ගණියහැක්කේසි.

102 ලොවට, ලෝවැස්සාට; වැඩකෙරෙමි, හිතවැඩකරමැයි; මෙරජසැපතට, මේ රාජසම්පත්තියට; සපැමිණ, සම්ප්‍රාප්තව; කිසිකම් නැති, කිසික්‍රියාවක් නොමැත්තාවූ; ලොවට, ලෝකයාගේ; මෙදුකට, මේ දුඃඛයට; පිහිටක් නොවනු, ප්‍රතිෂ්ඨාවක් නොවීම; කිමෙක, කිමෙක්දෝ.

103 දුක්බික්දුක්, දුර්භික්ෂදුඃඛයෙන්; මුසු, මිශ්‍රවූ; තමසිත, තමන්ගේ චිත්තයෙහි; දුකට, දුඃඛයට; සුදුසු, යොග්‍යවූ; නුවරුන්, නාගරිකයන්ගේ; බස්, වචනයන්; ඇසු, ශ්‍රවණයකලාවූ; නිරිඳු, නරේන්ද්‍රයෝතුමූ; මෙමලසින්, මෙආකාරයෙන්; තෙපුල්, වචනයන්; පැවසු, ප්‍රකාශකළේය.

---

* කිසිකම් නැති ලෙසට

† ක්ෂීර සාගර, ලවණ සාගර, ප්‍රවාල සාගර, නීල සාගර යන මොහු සිව් සයුරුවෙත්.

104

රජුන් අද මිටුව ත්
මෙපති මැතිදෝද එපව ත්
දුකාතුන්ගේ * පව ත්
බමුණු ගහපතියෝද එගති ත්

106

එදුන තුරු දෙ වි යෝ
† මෙපති අදහමව සෙ වි යෝ
එයින'ඝන දෙ වි යෝ
‡ කොරතිනිති ඒඅදම් නොවි යෝ

105

උන්දුක දනව් වැ සි
දනවෙහි අදහමට රි සි
රැකළුන්වෙත පැහැ සි
සුරන් සිතටත් එදම් අදහ සි

107

මෙලෙසින් අදහම ට
නිරිඳුන් ලොව පැමිණි වි ට
එරදුන් නතුරට ට
හමයි විසමව පවන් දැඩිකො ට

104 රජුන්, රාජයන්; අදමිටුවන්, අධර්මිෂ්ඨවූකල්හි; මැතිදෝද, මන්ත්‍රීහුද; එපවත්වෙති, එහිපැවැත්තෝවෙත්; උන්ගේ, ඒමන්ත්‍රීන්ගේ; පවත්, පැවැත්ම; දුක, දශිණයකොට; බමුණු ගහපතියෝද, බ්‍රාහමණ ගෘහපතියෝද; එගතින්, ඒ අධම්ග්‍රහණය කෙරෙත්.

105 උන්, ඒ අධර්මිෂ්ට බමුණු ගැහැවියන්; දුක, දශිණයකොට; දනව්වැසිදන, ජනපදවාසි ජනයෝද; අදහමට, අධම්යටම; රිසි වෙත්, රුචිවෙති; උන්වෙත, ඔවුන්කෙරෙහි; පැහැසී, ප්‍රසන්නව හෝ එක්ව; රැක, රක්ෂාකොට නැවැත්තාවූ; සුරන් සිතටත්, දෙවියන්ගේ චිත්තයටත්; ඒ දම් අදහසී, එඅධම්ධ්‍යශයම වෙයි.

106 එ දුක, ඒඅධම්වාශ්‍රීාව දශිනයකොට; තුරුදෙවියෝ, වෘක්ෂ දේවතාවෝ; අදහමම, අධම්යම; සෙවියෝවෙති, සෙවනය කරන්නෝවෙත්; එයින්, ඒවෘක්ෂදෙවතාවන්ගේ අධම්සේවනයෙන්; අඝය දෙවියෝ, ආකාශසථදෙවතාවෝ; නිති, නිරන්තරයෙන්; ඒ අදම් නොවියෝ, ඒ අධම්යෙන් නොරක්ෂාවූවෝ; කොරති, ඒ අධම්සේවනය කෙරෙත්.

107 මෙලෙසින්, මෙයාකාරයෙන්; ලොව, ලෝකයෙහි; නිරිඳුන්, නරෙන්ද්‍රයන්; අදහමට, අධම්මයට; පැමිණිවිට, ප්‍රාප්තකල්හි; එරදුන් නතුරවට, ඒරාජයන් යටත්වූ රාෂ්ට්‍රයන්ට; පවන්, සුලඟ; විසමව විෂමවී; දැඩිකොට හමයි, චණ්ඩව වහනයකෙරේ

* පුවත්. † වෙත එදහමට සෙවියෝ.
‡ කෙරෙයිසිතඑදහම්න් නොවියෝ.

108

එ පවත් වැදැසැළෙන
*නුඹෙදෙව් විමන් ගම්නොන
කිපුනෙත් සුරන් සින
නොවස්වනිවැසි ලොවට කරමෙන

109

රිවිසඳහුදු තොසේ
ගනම්ග නොයති පෙරසේ
එසුරන් වන එසේ
නැතිව වැසිසස් කලටනොපැසේ

110

එක ගමකද වැසී
වසිතත් සමව නොවසී
ඉන් විසමව පැසී
තිබුසස්වග ඉතා නොරිසී

111

ඒ අහර කන බොන
දනහට එයින් වෙන වෙන
රෝදුක් වන බැවින
ලොවට වැඩඅවැඩ නිරිඳුන්ගෙන

---

108 එපවත්, ඒ සුළඟ; වැද, වැදී; නුඹ, ආකාශයෙහි; දෙව් විමන්, දිව්‍යවිමානයන්; සැලෙන, කම්පාවන කල්හි; ගම්නොන, ගමන්වැළැක්නුමන්; සුරන්, දෙවියන්ගේ; සින, චිත්තය; කිපුනෙන්, කොපවූයෙන්; ලොවට, ලොකයට; සෙතකර, ශාන්තිකරවූ; වැසි, වර්‍ෂාව; නොවස්වති, වර්‍ෂානොකරවත්.

109 රිවිසඳහුද, සූර්‍ය්‍යචන්ද්‍රයෝද; තොසේ, තුඹටම; පෙරසේ, පෙර මෙන්; ගනම්ග, ගන්නාවූ මාර්ගයෙහි; නොයති, ගමන්නොකරති, එසුරන්, මෙසඳහිරු; එසේවන, එසේ නොමගයන කල්හි; කලට; සුදුසුකාලයෙහි; වැසිනැතිව, වර්‍ෂානැතිවීමෙන්; සස්, සශ්‍ය; නො, පැසේ, නොපැසෙන්නේයි.

110 එකගමද, ඉදින් එක් ග්‍රාමයෙක්හි; වැසි, වර්‍ෂාව; වසිතත්, වර්‍ෂාකරතත්; සමව, සමානව; නොවසී, වර්‍ෂානොකෙරෙයි; ඉන් ඒ හේතුවෙන්; විසමව, සමනොව; පැසිතිබූ, පරිණතව තිබුනාවූ; සස්වග, සශ්‍යවර්ගය; ඉතා නොරිසි, අතිශයින් අමනොඥවෙති.

111 ඒ අහර, ඒ ධාන්‍යයෙන් උපන් ආහාර; කනබොන, කෑම් බීම් කරන්නාවූ; දනහට, ජනයාහට; වෙනවෙනරෝදුක්, නානා රෝග දුඃඛයන්; වනබැවින, උපදනා බැවින්; ලොවට, ලෝකයාගේ; වැඩඅවැඩ, හිතාහිතය; නිරිඳුන්ගෙන, නරෙන්ද්‍රයන්ගෙන්ම වන්නේයි.

---

* නුඹෙදෙව්.

**112**

එබැවින් අප ලොව් ට
පෙරරජ සිරිත් වෙත්කො ට
කළ කී දෙය තොප ට
*දූනෙයි කීවයි කිවුග සිහිකො ට

**113**

නුවරෙරෝ එබස සා
නිරිඳුන් නුගුණ් විම සා
නැතිගෙන් කිසිදෙ සා
මෙමෙස් පවසති ඔවුන් යස සා

**114**

සව් සතරෙහි පුරු දූ
මහසත් ගුණෙන් පරසි දූ
මහපින් ඇති මෙබ දූ
උපන් නිසිකැත් කුලෙන් පිරිසි දූ

**115**

දූනාකල ගුණ් වෙසෙ ස
නුවනැති දනන් කිලෙ ස
පවසින ඇමදව ස
දුරින්දුරුකොට වසන බොරුබ ස

---

112 එබැවින්, එහෙයින්; අප, අසමත්හු විසින්; ලොව්ට, ලොකයාහට; පෙර, පූර්වයෙහිවූ; රජසිරිත්, රාජ චාරිත්‍රයන්; වෙත්කොට, ඉවත්කොට; කළකීදෙය, කළකී දෙයක්; තොපට, තුෂ්මතූන්ට; දූනෙයි, වැටහෙයි; (එබැවින්) සිහිකොට, සමරණය කොට; කීයවයි, කථනය කරවයි; කිවුය, කීවෝයි.

113 නුවරෙරෝ, නාගරිකයෝ; එබස්, ඒවචනයන්; අසා, ශ්‍රවණය කොට; නිරිඳුන්, නරෙන්ද්‍රයන්ගේ; නුගුණ, අගුණ; විමසා, විමංසනය කොට; කිසිදෙසා, කිසිදෙසක්; නැතිගෙයන්, නැතිගෙයින්; ඔවුන්, හෝරජුන්ගේ; යසසා, යශස්; මෙමෙස්, මෙයාකාරයෙන්; පව සති, ප්‍රකාශකෙරති.

114 සව්සතරෙහි, සකල ශාස්ත්‍රයෙහි; පුරුදූ, පරිචිතවූ; මහසත් ගුණෙන්, මහාසත්වගුණයෙන්; පරසිදූ, ප්‍රසිද්ධවූ; මහපින්ඇති, මහා පුණ්‍යවන්තවූ; මෙබදූ, මෙයාකාරවූ; පිරිසිදූ, පරිශුද්ධවූ; නිසි, යොග්‍යවූ; කැත්කුලෙන්, ක්‍ෂත්‍රිය වංශයෙන්; උපන්, ජාතවූ.

115 වෙසෙසින්, විශෙෂයෙන්; කළගුණදූන, කෘතඥව; නුව නැති දනන්, ඥානවන්තජනයන් විසින්; කිලෙස, කීආකාරයෙන්; ඇමදවස, සැමකල්හි; පවසින, පවත්නාවූ; බොරුබස, මිථ්‍යාවච නය; දුරින්දුරුකොටවසන, දුරිම්ම දූරීභූතකොට වසන්නාවූ.

---

* දූනෙනා.

116

මෙරමා වැඩ කැම ති
කීකරු අමැත්තන් ඇ ති
නොහැරම රද නි ති
කැමතිදෙය සිදුකරන දනුමැ ති

117

නැගෙණ රිවි විල සි න්
දින දිනා උදය සිර සි න්
පෙර නිරිඳුන් වි සි න්
පැවතිලෙසටම පැවති වෙසෙසි න්

118

විකුමට නිබොරු ව ට
දෙනාමහ දනට දනග ට
දිවිසතරවනු කො ට
රකින සිහිපත් ඇතිව හැමවි ට

119

පිරි සුසිරි ම ගේ
සිටි මැතිවරුන් සම ගේ
රකින නිති සම ගේ
කවර වරදෙක්ද ඔබ හැම ගේ

---

116 මෙරමා වැඩකැමති, පරවැඩ කැමතිවූ; රදනිති, රාජනීතිය; නොහැරම, දුරුනොකොටම; කැමතිදෙය සිදුකරන, අභිමතාර්ථ සිද්ධිකරණයෙහි; දනුමැති, දනුමිඇත්තාවූ; කීකරුඇමැත්තන් ඇති විනීතාමාත්‍යයන් ඇත්තාවූ.

117 දින දින, දවසක්පාසා; උදය සිරසින්; උදයපර්වත මස්තක යෙන්; නැගෙණ, උදාවන්නාවූ; රිවිවිලසින්, සූර්‍ය්‍යයාමෙන්; පෙර' පූර්වයෙහි; නිරිඳුන් විසින්, නරෙන්ද්‍රයන් විසින්; පැවති ලෙසටම පැවති ආකාරයටම; වෙසෙසින්, විශෙෂයෙන්; පැවති, පැවැත්තාවූ.

118 විකුමට, වික්‍රමයටද; නිබොරුවට, සත්‍යයටද; දනගට, ජනයාහට; දෙන, දෙන්නාවූ; මහදනට, මහාදානයටද යන (මේගුණ ත්‍රයට) දිවිසතරවනුකොට, ජීවිතය සිව්වැනිකොට; හැමවිට, නිර න්තරයෙන්; සිහිපත් ඇතිව, එලඹසිටි සිහියෙන් යුක්තව; රකිණ, රක්ෂාකරන්නාවූ.

119 පිරි, පරිපූර්ණවූ; සුසිරිමග, සුචරිත මාර්ගයෙහි; සිටි, පිහිටි යාවූ; මැතිවරුන් සමගේ, මන්ත්‍රීවරයන්හා; සමගේ, සාමග්‍රිය; නිති, නිරන්තරයෙන්; රකින, රක්ෂාකරන්නාවූ; ඔබහැමගේ, ඔබවහන්සේලා සියලුදෙනාගේ; කවරවරදෙක්ද, කිනම් දොෂයෙක්ද?

120

නිරිඳෝ එබස සා
මැනින් වෙත නෙත් සල සා
කියව කිව් නොල සා
එදුක් පහවනා කරුණු විම සා

121

නිවටුන් බස් නිව ට
දුවරී පිවිටු සසර ට
නාට ගුණ ගත් ගුණ ට
එවිටමැනිදෙක්සෙබෙන්නැගිසිට

122

නිරිඳුපද නඹර ට
නමකර සෙමින් නැගිසි ට
දිළිබඳැ දිළිව සි ට
මෙසේ දක්වයි තෙපුල් සබය ට

123

සිත කෙලෙසුන් පසි ඳ
සැනහුණු නිවන් පුරවැ ද
බුදුසමණෙනැත මෙස ද
පවර පූරණ කසුබු නමිල ද

---

120 නිරිඳු, නරේන්ද්‍රයෝ; එබස්, මේවචනයත්; අසා, ශ්‍රවණය කොට; මැනින් වෙත, මන්ත්‍රීන් දෙසට; නෙත්සලසා, නෙත්‍රයන් සලස්සා; මෙහෙවත් බලා; එදුක්; ඒ ත්‍රිදුර්භික්ෂාදි දුඃඛයන්; පහවනා, දුරුවීමට; කරුණු, හේතූන්; විමසා, විමංසනය කොට; නොලසා, වහා; කියව, කථනය කරවයි; කිව්, කීමෙව්යි;

121 නිවටුන්, නිගණ්ඨයන්ගේ; නිවටබස්, නිගණ්ඨධර්මයෙහි; දුවරී, බද්ධව; සසරට, සංසාරයට; පිවිටු, ප්‍රවිෂ්ටවූ; නාටගුණ, නෂ්ටවූ ගුණඇති නිවටුන්; ගුණට, ගුණවන්තයන් කොට; ගත්, ග්‍රහණය කළාවූ; මැනිදෙක්, මන්ත්‍රීන්දෙයෙක්; එවිට, එකල්හි; සෙබෙන්, සභායෙන්; නැගිට, නැගීසිට;

122 නිරිඳු, නරේන්ද්‍රයන්ගේ; පදනඹර, පාද පද්මයට; නමකර, නමස්කාරකොට; සෙමින්, ලැසිව; නැගිසිට, නැගී; දිළි, බබලන්නාවූ; බඳැදිළිව, බද්ධාඤ්ජලීව; සිට, සිටනව; මෙසේ, මෙයාකාරයෙන්; තෙපුල්, වචන; දක්වයි, ප්‍රකාශකෙරේ.

123 සිත, චිත්තයෙන්; කෙලෙසුන්, කෙලශයන්; පසිඳ, ප්‍රච්ඡින්න කොට; නිවන්පුර, නිර්වාණ පුරයට; වැද, ප්‍රවිෂ්ටව; සැනහුණු, සංසිඳුනාවූ; පවර, උතුම්වූ; පූරණ කසුබු නමිලද, පූරණ කාශ්‍යප යයි නම් ලද්දාවූ; බුදුසමණෙනක්, බුදුවරයෙක්; මෙසද, මෙකල්හි; ඇත, ඇත්තේයි;

124

කළසතන් පිරිසි දු
තපෝ ගුණයෙන් පිරිසි දු
ඇත බුදු කෙනෙක් සි දු
කකුද කසසින් නමින් පරසි දු

125

දුසිරිසිත නැව ති
තපෝ ගුණයෙන් ලද තු ති
බුදු කෙනෙකැත තෙදු ති
අජිත කෙස්කම් බිලි නම් ඇ ති

126

තුවුකල සත් සත න
දිලිතව තෙදින් ඇම තැ න
බුදු කෙනෙ කැත සොබ න
නිගට නාතපුත් නමින් බබල න

127

සඳසෙ තරු වැල මැ ද
බබලන තවුස් ගණ මැ ද
බුදුකෙනෙ කැත මෙස ද
සජය බෙල්ලට්ටිපුත් නම් ල ද

---

124 පිරිසිදු, පරිශුද්ධවූ; තපෝගුණයෙන්; තපස් ගුණය කාරණ කොටගෙණ; සතන්, චිත්තසන්තානය; පිරිසුදු කළ, පරිශුද්ධකළාවූ; සිදු, පරිනිෂ්පන්නවූ; පරසිදු ප්‍රසිද්ධවූ; කකුද කසසින් නමින්, කකුධ කච්චායන යන නාමයෙන් යුක්තවූ; බුදුකෙනෙක්, සර්වඥවරයෙක්; ඇත, ඇත්තේයි.

125 තපෝගුණයෙන්, තපස්ගුණය කරණකොටගෙණ; සිත, චිත්තයයි; දුසිරි, දුශ්චරිතය; නැවති, වැළැක්වීමෙන්; තුතිලද, සතුතිලද්දාවූ තෙදුති, තේජස් ඇත්තාවූ; අජිතකෙස් කම්බිලී, අජිතකෙශ කම්බලයන; නම් ඇති, නාමාත්ථතවූ; බුදුකෙනෙක්, සර්වඥවරයෙක්; ඇති, ඇත්තේයි.

126 සත, සත්වයන්ගේ; සතන, චිත්තසන්තානයන්; තුවුකල, සන්තොෂකළාවූ; ඇමතැන, සියලුතන්හි; තවතෙදින්, තපො තෙජසින්; දිලි, බබලන්නාවූ; සොබන, ශොභමානවූ; නිගටනාතපුත් නමින්, නිගණ්ඨනාථ පුත්‍ර යන නාමයෙන්; බබලන, භ්‍රාජමානවන්නාවූ; බුදුකෙනෙක්, සර්වඥකෙනෙක්; ඇත, ඇත්තේය.

127 තරුවැල ! මැද, තාරකාවලී මධ්‍යයෙහි; සඳසෙ, චන්ද්‍රයා මෙන්; තවුස් ගණමැද, සෘෂි සමූහයා මධ්‍යයෙහි; බබලන, බබලන්නාවූ; සජයබෙල්ලට්ටි පුත් නම් ලද, සඤ්ජය බෙල්ලට්ඨි පුත්‍ර යන නාමය ලද්දාවූ; බුදුකෙනෙක්, සර්වඥකෙනෙක්; මෙසඳ, මේකාලයෙහි; ඇත, ඇත්තේය.

128 ලොව නරයින් කර - තා
මහපුද ලබන නිතිනය - තා
බුදුකෙනෙකැත නම් - තා
පසිදු මක්කලිගෝසාල ය - තා

129
මෙහිසිටන බුදුන් වැ - ද
කලහොත් මහත් නිසිපු - ද
තිමසඳ මෙපුර බ - ද
කීය උවදුරු දුරුවෙති මස - ද

130
ජඩ නිවටුන් නි - සා
බුදුනැයි නමක් සල - සා
මුහු සි එබස - සා
කියයි මැතිඳෙක් සෙබෙහිමමලෙ - සා

131
පව් පින් නැතැයි ය - න
නිවටෝය මූ හැමදෙ - න
ලොවට මුන්ගෙන් ව - න
සෙතැතසිගිලැසලැබෙයිගින්නෙ - න

132
පව් පින් දෙකම නැ - ත
රක්නා තපස් නම් නැ - ත
ඔවුන් බුදුනැයි කෙ - ත
මෙසේ අනුවනකාමෙක් නම් නැ - ත

---

128 ලොව, ලෝකයෙහි; නරයින්, මනුෂ්‍යයන් විසින්; කරන, කරනුලබන්නාවූ; මහපුද, උදාර පූජාවන්; නිතියෙන, නිරන්තර යෙන්; ලබන, ලබන්නාවූ; මක්කලිගෝසාල යන, මක්ඛලිගෝසාල යයි; නමින, නාමයෙන්; පසිදු, ප්‍රසිද්ධවූ; බුදුකෙනෙක්; සර්වඥයෙක්; ඇත, ඇත්තේයි.

129 තිමිසඳ, ස්වාමීන්ද්‍රයාණනි; මෙහිසිටන, මේප්‍රකාශකලාවූ; බුදුන්, සර්වඥයන්; වැඳ, නමස්කාරකොට; නිසි, යෝග්‍යවූ; මහත්පුද; උදාර පූජාවන්; කලහොත්, කෙළේනම්; මෙපුරබඳ, මේ නගරය සම්බන්ධවූ; උවදුරු, උපද්‍රවයෝ; මසඳ, වහා; දුරුවෙති, දුරීභූත වෙත් යයි; කීය, කථනය කෙළේය.

130 ජඩ, මූඪවූ; නිවටුන් නිසා; නිගණ්ඨයන් සඳහා; බුදුනැයි, බුද්ධයයි; නමක්, නාමයක්; සලසා, ආරූඪකොට; මුහු, ඒ ඇමතියා; එබස්, කීවදත්; අසා, ශ්‍රවණයකොට; මැතිඳෙක්, මන්ත්‍රීන්ද්‍රයෙක්; මමලෙසා, මෙවැනාකාරයෙන්; සෙබෙහි, සභාවෙහි; කියයි, කථනය කෙරෙයි.

131 මූ හැමදෙන, මෙකී සියල්ලෝම; පව්පින් නැතැයි යන, පව් පින් නැතැයි ප්‍රකාශ කරන්නාවූ; නිවටෝය, නිගණ්ඨයෝය; මුන් ගෙන්, මොවුන්ගෙන්; ලොවට, ලෝකයාට; වන, වන්නාවූ; සෙත ඇත, ශාන්තියක් ඇත්තේනම්; ගින්නෙන, අග්නියෙන්; සිගිලැය, සිගිල් ගුණය; ලැබෙයි, ලැබිය හැක්කේයි.

132 පව්පින් දෙකම නැත, පව්පින් නැතැයි (කියමින්); රකිනා, රක්ෂා කරන්නාවූ; තපස්නම්, තපෝගුණයක්නම්; නැත, නැත්තේය; ඔවුන්, එසේවූවන්; බුදුනැයිකෙත, බුදුනැයි කියා උඩා; මෙසේ, මෙවැනාකාරවූ; අනුවන කාමෙක්නම්, අඥාන කාමක්නම්; නැත, නැත්තේය.

133 මුත්ගෙන් වෙත් සෙ ත
කරත පුදදීමේ ලෙව්ස ත
වැලිමලු ලා සත ත
මඩිනවැනි තෙල්පතා තෙලීය ත

134

තොරුවෙන් වඩන බ ඩ
එබැවින් දුරුරමුන් ජ ඩ
දත් සිව්වේ නොක ඩ
ගෙණැරබමුණන් කරව ලෝවැඩ

135

ගහකැත් වළ ද වා
ගිනිදෙව්යාව පු ද වා
යාග කල සො ද වා
*යේයසෙදදුක් මුලින් මු ද වා

136

එමැනිද කී බස ට
මැතිදෙක් කියනී මෙමලෙස ට
ලෙඩ දුප්පත් අය ට
තවත් උවදුරුදෙසිද පිටපි ට

137

බොරුවේව තුරු බැ ද
වලහන ලෙවන් හැමස ද
බමුණන්ගෙන් දුල ද
වැඩක්වූයේ ලොවට කිකල ද

---

133 මුත්ගෙන්, මේ නිවටුන්ගෙන්; සෙතවෙතී, ශාන්තිවෙත්යයි; මේලෙව්සත, මේලෝකවාසී සත්ව්‍යයන්; සතත, සතතයෙන්; කරතපුද, කරනලද පූජා; තෙලියත, තෙලයනත්‍රයෙහි; වැලිමලුලා, වාලුකාපසිබඹ බහා; තෙල්පතා, තෙල්කැමතිව; මඩිනවැනි, පෙළිමක් වැන්න.

134 එබැවින්, එහෙයින්; බොරුවෙන්, මිථ්‍යායෙන්; බඩ වඩන, උදරපොෂණයකරන්නාවූ; ජඩ, මුඪවූ; මුන්, මේ නිගණ්ඨයන්; දුරුර, දුරුකොට; නොකඩ, අඛණ්ඩව; සිව්වේදත්, † චාතුර්වේදය දත්තාවූ; බමුණන්, බ්‍රාහ්මණයන්; ගෙණැර, ගෙන්වා; ලෝවැඩ කරව, ලෝකාභිවෘද්ධි කරණු මැනවි.

135 ගහකැත්, ග්‍රහසමූහයා; වළදවා, අනුභවකරවා; ගිනිදෙව්යාව, අග්නිදේවයාවාව; සොදවා, මනාකොට; පුදවා, පූජා පවත්වා; යාගකල, යාගකලහොත්; දුක්, දුඃඛය; සෙද, වහා; මුලින් මුදවා, මූලොත්පාටනය කොට; යේය, යන්නේය.

136 එමැනිඳු, එම්නත්‍රීන්ද්‍රයා; කීබසට, කීවචනයට; මැතිදෙක්, අනික් මැතියෙක්; මෙමලෙසට, මෙමයාකාරයට; කියයි, කථනය කෙරෙයි; ලෙඩ දුප්පත් අයට, ලෙඩින් දුකට පැමිණියවුන්ට; පිට පිට, නැවත නැවතත්; තවත් උවදුරු දෙසිද, වැඩියක් උපද්‍රව දිනාය නොකෙරෙනිද?

137 බොරුවේව තුරු, මිථ්‍යාවේද මන්ත්‍ර; බැද, බන්ධනයකොට; ලෙවන්, ලොකවාසීන්; හැමසද, සදකාල්හි; වලහන, වඤ්චාකරන්නාවූ; දුලද, දුලිබිඩීවූ; බමුණන්ගෙන්, බ්‍රාහ්මණයන්ගෙන්; ලොවට, ලෝකයාට; වැඩක් වූයේ, අභිවෘද්ධියක් වූයේ; කිකලද, කවර කාලෙක්හිද.

---

* එය සෙතද්ක්.

† ඉර්ජුර, යජුර්, සාම, අථර්වන් යන මේ චතුර්වේදයයි.

138 ගහයෝතම් අඹ ර
දෙවියෝය උඹ සුර පු ර
නොගනිති අත් අහ ර
උදක් අමරස මිසක් මනහ ර

139
එසිත් උත් පෙර ක ළ
කුසලින් උපත් නිකස ළ
අතික් කෙනෙකුත් ක ළ
දෙයක් උදෙසා නොවෙයි එපහළ

140
සිඳුදිය ලෙස නිස ග
පමණ නොකළැකි සැප ස ග
නරලොව සැපත ර ග
රුදුනු පිණිබිඳු වැන්න තණ අ ග

141
සිව් සිය ගව් අස ල
වූනම් නරෝ යම්ක ල
දෙවියෝ තමන් ගෙ ල
දුටි කුණුසේ කෙරෙති පිළිකු ල

142
එබඳු සුරලොව සි ට
දෙවියෝ අවුත් මෙලොව ට
තමන් දුන් අහර ට
තුටුව සෙතකර නොයති රැකසිට

---

138 අඹර, ආකාශයෙහි; ගහයෝනම්, ග්‍රහයෝනම්; සුරපුර, ස්වර්ගයෙහි; දෙවියෝය, දෙවතාවෝය; උඹ, ඔව්හු; උදක්, එකම; මනහර, මනොහරවූ; අමරස මිසක්, අමෘත රසය මුත්; අත් අහර, අනික් ආහාරයක්; නොගනිති, ග්‍රහණයනොකරෙත්ය.

139 එසිත්, ඒ අමෘත රසයද; උන්, ඔවුන් විසින්; පෙර, පූර්වයෙහි; කළ, කළාවූ; නිකසළ, පිරිසිදුවූ; කුසලින්, කුසල් හේතුකොටගෙන; උපත්, උපන්නේවෙයි; ඒ, ඒ අමෘත රසයද; අතික් කෙනෙකුත් කල දෙයක් උදෙසා, අනික්කෙනෙකුන් කළාවූ දෙයක් සඳහා; පහළ නොවෙයි, ප්‍රාදුර්භූත නොවෙයි.

140 නිසග, නිසර්ගයෙන්; සිඳුදියලෙස, සමුද්‍රජලයමෙන්; පමණ නොකළැකි, ප්‍රමාණකොට නොහැක්කාවූ; සගසැප, ස්වර්ගසම්පත්තිය සඳහා; නරලොව, මනුෂ්‍යලොකයෙහි; සැපත, සම්පත්තියගේ; රග, ආකෘතිය; තණඅග, තෘණාග්‍රයෙහි; රුදුණු, රඤ්ජිතවූ; පිණිබිඳු වැන්න, තුෂාර බින්දුමෙනි.

141 යම්කල, යම්කාලයෙක්හි; නරෝ, මනුෂ්‍යයෝ; සිව්සියගව්, ගව් හාරසියයකින්; අසලවූනම්, සමීපගතවූවාහුනම්; දෙවියෝ, දේවතාවෝ; තමන්ගෙල, තමන්ගේ ග්‍රීවයෙහි; දුටි, දුටුවාවූ; කුණුසේ; කුණපයක්මෙන්; පිළිකුල් කෙරෙති, ප්‍රතිකූල කෙරෙත්.

142 දෙවියෝ, දෙවතාවෝ; එබඳු, එයාකාරවූ; සුරලොව, දිව්‍ය ලොකයෙහි; සිට, සිටලා; මෙලොවට, මේ ලොකයට; අවුත්, ආගමනයකොට; තමන් දුන්, තමන් විසින් දෙනලද්දවූ; අහරට, ආහාරයට; තුටුව, තුෂ්ටව; රැකසිට, රැකබල්ලකොටසිට; සෙතකර නොයති, ශාන්තිකොට නොයති.

143 නරලොවැ දෙන පුද ව
රිසිවන දෙරින් දෙරසි ට
සුරනැයි යනු කුම ට
දුගී යාචකයන්ට එනිව ට

144

ගැනුමට අත් ඉසු රු
උපමා යොද විසිතු රු
කොමරත් යාග බො රු
කෙසේ දුරුවේද ලොව උවදු රු

145

නොයෙක් දෙය රැස්කො ට
කලපුදගිනි දෙවිය හ ට
සෙතවෙසි යනු ලොව ට
පැවති බොරුමායමකි පෙරසි ට

146

බරණැස පෙර කාලෙ ක
බමුණු මහසල් කුලයෙ ක
ගුණ නැණයුත් නිසැ ක
උපන් පින්සරු බමුණු උතුමෙක

147

සවිසතර සමුදු ර
දක නැණ නැවින් පරතෙ ර
පසිඳුව ලොව පතා ර
තමා බිහිවන දිනෙහි ගුරුව ර

---

143 නරලොවැ, මනුෂ්‍යලොකයෙහි; දෙන, දානය කරන්නාවූ; පුදට, පූජාවට; දෙරින්දෙරසිට, වාරයක් පාසා සිටගෙන; රිසිවන, කැමැත්තවන්නාවූ; නිවට, නිඳිතවූ; එදුගීයාචකයන්ට; ඒ දුප්පත් හිඟන්නන්ට; කුමට, කුමක්පිණිස; සුරනැයිනු, දෙවියන්යයි ප්‍රකාශ කෙරෙද්ද.

144 අත්ඉසුරු, අනුන්ගේ සම්පත්; ගැනුමට, ගන්නා පිණිස; විසිතුරු, විචිත්‍රවූ; උපමා, උපායමාර්ග; යොද, යොජනාකොට; බොරු යාග, අසත්‍ය යාගයන්; කොමරත්, කෙරෙත්ද; (ඒ හේතුකොට) ලොව, ලොකයාගේ; උවදුරු, උපද්‍රව; කෙසේ දුරුවේද? කෙසේනම් දුරුවන්නේද (නොවේමැයි.)

145 නොයෙක්දෙය, අනෙක ද්‍රව්‍යයන්; රැස්කොට, රාශිකොට; ගිනිදෙවියහට, අග්නිදේවතාවාහට; පුදකල, පූජාපැවැත්තුයේනම්; ලොවට, ලෝකයාහට; සෙතවෙසි යනු, ශාන්තියවේයයි කීම; පෙරසිට, පූර්වයෙහි පටන්; පැවති, පැවැත්තාවූ; බොරු මායමකි, අසත්‍ය මායාවකි.

146 පෙරකාලෙක, පූර්වකාලයෙක්හි; බරණැස, බාරාණසී නගරයෙහි; බමුණුමහසල් කුලයක, බ්‍රාහ්මණ මහාසාර කුලයෙක්හි; උපන්, උපන්නාවූ; නිසැක, ශංකාරහිතවූ; ගුණනැණයුත්, ගුණයෙන් හා ඥානයෙන් යුක්තවූ; පින්සරු, පුණ්‍යසාරවූ; බමුණුඋතුමෙක, බ්‍රාහ්මණ උත්තමයෙක්;

147 සවිසතර, සකල ශාස්ත්‍ර නැමැති; සමුදුර, සමුද්‍රයාගේ; පරතෙර, පරතීරය; නැණනැවින්, ඥානනැමැති නෞකාවෙන්; දක, දර්ශනයකොට; පතාර, විශාලවූ; ලොව, ලෝකයෙහි; පසිඳුව, ප්‍රසිද්ධව; තමා, තමන්; බිහිවනදින, බිහිවන්නාවූ දිනයෙහි; ගුරුවර, මව්පියන් විසින්;

---

148 නොනිවා තබා රැ ක
දුත්ගිනි රැගෙණ එනයෙ ක
වැස අවුරුදු නොයෙ ක
* පුදන ගිනිදෙවියාට දවසෙ ක

| 149 | 151 |
|---|---|
| සිහාගිය තැන ල ද | එගොණා මරු ම ස් |
| ගොණෙකු ගෙනවුත් ගසබැ ද | පලගා කමින් නොසර ස් |
| කෙරෙමි ‡මයින් පු ද | උන් ගිය සඳ එගො ස් |
| සිතා ගිනිදෙවියාට මහපු ද | බලා ගොන් නගුට කුර †ඇටම ස් |

| 150 | 152 |
|---|---|
| ලුණු නැති මස් පුද ට | අප රකිනා ත බා |
| නපුරැසිතා ගමක ට | තොප සතු ගොණා නොත බා |
| යාදී ඔහු ලුණ ට | කනතෙක් මෙත න බා |
| අවුත් වලවැදි දනෝ එතන ට | බලා උත්කෙනෙකි තෙපි අසුබා |

148 නොනිවා, නිර්වාපණය නොකොට; රැකතබා, රක්ෂාකොට තබා; දුත්, දුන්නාවූ; ගිනි, වහ්නිය; රැගෙණ, ගෙන; එනයෙක, එනයක්හි; නොයෙක අවුරුදු, අනේක වර්ෂයක්; වැස, වාසය කොට; ගිනිදෙවියාට, අග්නිදේවතාවා; පුදන දවසෙක, පූජාකරන දිනයෙක්හි;

149 සිහාගියතැන, සිඟීමෙන් ගිය තැනෙක්හි; ලද, ලද්දාවූ; ගොණකු, ගවයෙකු; ගෙනවුත්, ගෙනැවිත්; මහපුද, මහාපූජ්‍යවූ; ගිනිදෙවියාට, අග්නිදේවතාවා හට; මයින්, මාංශයෙන්; පුදකෙරෙමි, පූජාකරන්නෙමි; සිතා, චින්තනයකොට; ගසබැඳ, ගසක බැඳලා;

150 ලුණුනැති, ලවණයෙන් තොරවූ; මස්, මාංශය; පුදට, පූජාවට; නපුරැසිතා, අයෝග්‍යයයි කල්පනාකොට; ඔහු, ඒ තවුසා; ගමකට, ග්‍රාමයකට; ලුණට, ලුණු පිණිස; යාදී, ගියකල්හි; එතනට, ඒ ස්ථානයට; වල, වනයෙහි; වැදිදනෝ, වනසාදජනයෝ; අවුත්, ආගමනයකොට;

151 නොසරස්, වහා; එගොණා, ඒගවයා; මරු, ඝාතනය කොට; මස්, මාංශය; පලගා, පුලුස්සා; කමින්, අනුභවකොට; උන්, ඒ ව්‍යාධයන්; ගියසඳ, ගියකල්හි; එ, ඒ ස්ථානයට; ගොස්, ගමනයකොට; ගොන්, ගවයාගේ; නගුටකුරඇටමස්, වාලධිඛුරාස්ථිමාංශයන්; බලා, නිරීක්ෂණයකොට;

152 අපරකිනාතබා, අපරැකීම හැර; තොපසතුගොනා, යුෂ්මත්නු සන්තක ගවයා; නොතබා, ඉතිරිනොකොට; මෙතනතබා, සමීපයෙහි තබාගෙන; කනතෙක්, කනතුරු; බලාඋත්, උපෙක්ෂිතවූ; තෙපි, යුෂ්මත්හු; අසුබා කෙනෙක්, අයහපත් කෙනෙක;

* පුදන ‡ මසින්අද. † ඇටරැස.

153 එයින් ගිනිදෙවි තෑ ඝ
පින් නැතා පුදෙන් පල නැ ත
බොරු බස් ලොවැ පැව ත
කරනපුදයෙක නුවණනැතිය ත

154

ගොත් මස් තොලදි නී
මෙපමණ කවයි ඉති නී
කියමින් වල ගි නී
ගඟා දිය ගෙව නිවිය ඒ ගි නි

155

උපන් බමුණන් කු ල
නුවණැතිය වුත් පෙර ක ල
නිසරු කොට හැරි ක ල
එවැනි ගිනිපුද කළැයි කිම ප ල

156

ගිනි දෙවියා කැම ති
ගෙයි ගෙයි තබා කර රු ති
නොනිවා රකින නි ති
මෙලොව ගැණුද්දූනුදුලෙඩවෙති

157

කලකින් බමුණු ද නා
උඳෙසා තම ලබන ද නා
ගිනි දෙවියා පුද නා
පුදෙන් පලකිමලොවට සිදුවෙනා

153 එයින්, එසේ හෙයින්; ගිනිදෙවි, අග්නිදෙවතාවෙක්; නැතා, නැත්තේය; පුදෙන්, පූජාවෙන්; පින්, පුණ්‍යයෙක්; නැත, නැත්තේය; පල, විපාකයෙක්; නැත, නැත්තේය; ලොවැ, ලොකයෙහි; පැවත, පැවැත්තාවූ; බොරු බස්, මිථ්‍යාවචනයෙන්; නුවණැතියන; අඥාන ජනයා; කරන, කරන්නාවූ; පුදයක, පූජාවක;

154 ගොත්මස්, ගවමාංශය; තොලදිනී, තොලත්හෙයින්; ඉතිනී, දුන්; මෙපමණ, මෙපමණක්ම; කවයි, අනුභවකරවයි; කියමින්, කර්ගය කෙරෙමින්; ගිනිවල, අග්නි ආවාටයෙහිවූ; ගිනි, වහ්නිය; දියනෙවගසා, දියවත්කොට; නිවිය, නිවූයේය;

155 බමුණන්කුල, බ්‍රාහමණ වංශයෙහි; පෙරකල, පූර්වකාලයෙහි; උපන්, උපන්නාවූ; නුවණැතියවුන්, ඥනවන්තයන්; නිසරුකොට, නිශ්ඵලකොට; හැරිකල, හැරියකල්හි; එවැනි, එයාකාරවූ; ගිනිපුද. කළැයි, ගිනිපූජා කෙළේයයි; කීමපල, කවර ඵලයෙක්ද?

156 ගිනිදෙවියා, (අග්නි) දෙවතාවා; කැමැති, රුචිවූ;ගිනි, වහ්නිය;ගෙයි ගෙයි, ගෙයක්පාසා; තබා,ස්ථාපනයකොට, රුතිකර; ආශාකොට; නිති, නිරන්තරයෙන්; නොනිවා, නිර්වාපණය නොකොට; රකින, රක්ෂාකරන්නාවූ; මෙලොව,මේලොකයෙහි; ගැණුද, ස්ත්‍රීහු පවා; දුනුදු, මේ කාලයෙහිද; ලෙඩවෙති, ගිලන්වෙත්.

157 කලකින් බමුණුදනා, කාලකණ්ණි බ්‍රාහමණ ජනයා විසින්; තම, තමන්; දනාලබනා උදෙසා, එසතුලබන පිණිස; ගිනිදෙවියා පුදනා, අග්නිදෙවතාවා පුදන්නාවූ; පුදෙන්, පූජාවෙන්; ලොවට සිදුවනා, ලොකයාට සිඩවන්නාවූ; පලකිම්, කිනම් ඵලයෙක්ද?

158 මෙසෙ බමුණන් ක තා
කරවන යාගමෙස තා
සුවදැල් වි ප තා
අකුරු වපුරණ වැන්න තිය තා

159
තිසුලවිගත් ක රින්
කළුපැහැ රැගත් උගු රින්
සම්සලු ගනැඹ රින්
අඩක උමංගණ ගත් සිරු රින්

160
දළ අඩසඳ බඳි න
ගොරසප් ඝරක් පළඳි න
රහකරණ දින දි න
මහලු ගොන්වාහනෙන් ඇවිදින

161
ලත් මහ පද වියා
සිර සුරගගින් දෙ වියා
අනඟ රූ දිවියා
යෙහෙක පුදකරන මහ දෙවියා

162
එම මහ දෙවිඳු හෝ
නොහොත් සිවලිංගය හෝ
වැඳ පිදුමොත් බො හෝ
එත් කි ලොවට සෙත අම හෝ

---

158 මෙසනා, මේ සත්වයා විසින්; බමුණන්, බ්‍රාහමණයන්ගේ, කතාගෙන, වචනගුහණයකොට; කරවනයාග, කරවන්නාවූ පූජ වන්; සුවදැල්විපතා, සුගන්ධශාලිධාන්‍ය කැමතිව; (ප්‍රාර්ථනාකොට;) තිය තා, එකාන්තයෙන්; අකුරු වපුරණ වැන්න, ගල්කැට වපුරන් නාක් වැනිවෙයි;

159 කරින්, හස්තයෙන්; තිසුලවිගත්, ත්‍රිසුලායුධ ග්‍රහණයකළ වූ උගුරෙන්; කණ්ඨයෙන්, කළුපැහැ රැගත්, කාළවර්ණය ග්‍රහණයකළාවූ; අඹරින්, වස්ත්‍රයෙන්; සම්සළුගත්, චර්මශාටක ග්‍රහණය කළාවූ; අඩක් සිරුරින්, අර්ධශරීරයෙන්; උමයගණගත්, උමයංගනා ගෘහිතවූ-

160 දළ, ජටාව; අඩසඳබඳින, අර්ධචන්ද්‍රාකාරයෙන් බඳින්නාවූ; ගොර, ඝොරවූ; සප්ඝරක්, සර්පහාරයක්; පළඳින, පළඳින්නාවූ; දින දින, දවසක් පාසා; රහකරන, නෘත්‍යකරන්නාවූ; මහලු ගොන් වාහනෙන්, ජරාවෘෂභ වාහනයකින්; ඇවිදින, ඇවිදින්නාවූ;

161 මහපදවියා, මහා(දේව)පදවිය; ලත්, ලද්දාවූ; සිර, මස්තකය; සුරගඟින්, මන්දාකිනියෙන්; දෙවියා, ධාවනයකළාවූ; අනඟරුව, අනඞ්ගයාගේ රූපය; දවියා, භස්මකළාවූ; මහදෙවියා, මහාදේව නම්වූ ඊශ්වරයා; පුදකරන, පූජාකෙළේනම්; යෙහෙක, යහපත් වෙයි.

162 එම මහදෙවිඳුහෝ, ඒ මහාදේවේන්ද්‍රයා හෝ; නොහොත්, නැතහොත්; සිවලිංගය හෝ, ඊශ්වරලිඞ්ගය හෝ; බොහෝ, බොහෝ කොට; වැඳපිදුමොත්, නමස්කාර පූජා පැවැත්වූයේනම්: ලොවට, ලෝකයාහට; සෙත, ශාන්තිනාමති; අමහෝ, අමෘතප්‍රවාහය; එති, එන්නේයයි; කී, කථනය කෙළේ;

163 එමැ හිඳු බස් අ සා
මැතිඳෙක් කියයි මෙලෙ සා
ඇසි දුක් මද නි සා
තවත් දුක්ගෙන* දෙසිද එවු සා

164
දෙවියෝ නම් ස ගය
පැලඹෙන අයෙකි සස ගය
උන් රූ මන ර ගය
විසුලුවෙස් ඇතිනොවෙති මෙරගය

165
උතුමෝ ලියන් වෙ න
නොසිඳිනි වලින් දුක ස න
මෙමහසුරු උමා න
තබා †රකිතියි කියයි සිය ග න

166
පවතින මෙලොව රැ කා
නැතිකල සිරි ඔතප් දෙ කා
ඔහු වැඳ පුද නොමෙ කා
කලයි වැඩ සිදුවේද කිකල කා

167
අවි අත් වැනසුම ට
නැකවෙයි තමා රැකුම ට
එසින් තිසුලවිය ට
ඇතැසිරුදෙස්දනෙයි මෙමලොවට

163 එමැ හිඳු, ඒ මන්ත්‍රීන්ද්‍රයාගේ; බස්, වචනයන්; අසා, ශ්‍රවණය කොට; මැතිඳෙක්, මන්ත්‍රීන්ද්‍රයෙක්; ඇසිදුක්, පීඩාවන්න දුඃඛය; මඳ නිසා, මන්දබැවින්; එවසා, ඊවතු; තවත්, වැඩියක්; දුක්ගෙනදෙසිද, දුක්ගෙන දෙන්නේදයි; මෙලෙසා, මෙසේ ආකාරයෙන්; කියයි, කථනය කෙරෙයි;

164 සගය, කොල; දෙවියෝ නම්, දෙවතාවෝ නම්; සසගය, සදිව්‍ය ලෝකයෙහි; පැලඹෙන අයෙකි, පුලොභවනාගෙනාවෙති; උන්, ඕවුන් ගේ; රූ, රූපයෝ; මනරගය, මනොඥයහ; මෙරග, මෙයාකාර යෙන්; විසුලුවෙස් ඇතිනොවෙති, විකාරවේස ඇත්තෝ නොවෙති.

165 උතුමෝ, උත්තමයෝ; සන, සත්වයන්; දුන, දශීණයකොට; වලින්, ලජ්ජාවෙන්; ලියන්වෙන, සත්‍රීන් කෙරෙති; නොසිඳිනි, නොසිඳින්; මෙමහසුරු, මහෙශ්වරතෙම; උමාන, ශ්‍රෙෂ්ඨ කානතාව; සියගන, සවකීය ගාත්‍රයෙහි; තබා, ස්ථාපනයකොට; රකිතියි, රක්‍ෂා කෙරේයයි; කියයි, කථනය කෙරෙයි.

166 මෙලොව, මේ ලොකවාසී සත්වයා; රැකා, රක්‍ෂාකොට; පවතින, පවතියයි කියන්නාව; සිරිඔතප්දෙකා, ලජ්ජාභයදෙක; නැතිකල, දුරුකලාවූ; ඔහු, ඊශ්වරයා; නොමෙකා, අනෙකප්‍රකාරයෙන්; වැඳපුදකලයි, වැඳුම්පිදුම් කෙලේයයි; කිකලෙකා, කවරකලෙක්හි; වැඩසිදුවේද, වැඩක් සිද්ධවන්නේද (නොවේමැයි.) ‡

167 අවි, ආයුධය; අත්වැනසුමට, අතනයන් විනාශයපිණිසවෙයි; නැකා, නැකගෙන; තමාරැකුමට, තමාගේ ආරක්‍ෂාව පිණිස වෙයි; එසින්, එසේනෙයි; තිසුලවිහට, ත්‍රිසූලධාරී ඊශ්වරයාහට; රුදෙස් ඇතැයි, ලොභවෙස ඇත්තේයයි; මෙමලොවට, මේ ලොකවාසීන්ට; දනෙයි, අවබෝධවෙයි.

* දුක්ගෙන ලෙසිද. † රකිති. ‡ සිරි, ඔතප් දෙක ලොකපාලක්නා පිරිසිදු ධර්මයන් බැව් තථාගත දෙශනායි. එබව අඞ්ගුත්තර නිකායෙහි—"ද්වෙ මෙ භික්ඛවෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති, කතමෙ ද්වෙ හිරි ච ඔත්තප්පං ච

168 රාගදොස් පව් මි       දී
දිසි උතුමන් තිබෑ       දී
සිටි කෙලෙසුන් බෑ       දී
ඕහුට පුදකොට කිම්ද පැහැ       දී

169

සසරෙහි සබව ද       ත්
සිල්වත් දනෝ නැණව       ත්
තුමූරඟ නොකෙරෙ       ත්
අනුන්කළ නැටුමකුත් නොබලත්

170

නළුවෙස් ගෙණ එ       සේ
නටන කල හැම දව       සේ
උන් පිදුවයි කෙ       සේ
වැඩෙක්සිදුවෙද ලොවට සිත සේ

171

දද දන බස් අ       සා
කරන පුද ඔහු උදෙ       සා
දිඹුලෙහි මල්න       සා
දියැද දුක්විඳින වැනි* නොලසා

172

අයක් පිළිකුල් ව       නා
අයක් සිතරු වඩ ව       නා
ලිඟුසටහන් රැගෙ       නා
කළැයි පුදපල කිම්ද ඉන්ව       නා

---

168 රාගදොස්පව්, ලෝභද්වේෂ පාපයන් කෙරෙන්; මිදී, මුක්තවූ; උතුමන්, උත්තමයන්; දිසී, දෘශ්‍යමානව; තිබෑදී, විද්‍යමානකල්හි; කෙලෙසුන්, ක්ලේශයන්ගෙන්; බැඳීසිටි, බද්ධව සිටිනාවූ ඒ ඊශ්වර යාහට; පැහැදී, ප්‍රසන්නවැ; පුදකොට, පූජාකොට; කිම්ද, කිනම් ඵලයක් ලබාද;

169 සසරෙහි, සංසාරයෙහි; සබවදත්, ස්වභාවය දත්තාවූ; නැණවත්, ඥානවන්තවූ; සිල්වත් දනෝ, ශීලවන්ත ජනයෝ; තුමූ, තුමූත්; රඟනොකෙරෙත්, නොනටත්; අනුන්කළ, අන්‍යයන් විසින් කරන ලද; නැටුමකුත්, නෘත්‍යයකුත්; නොබලත්, නිරීක්ෂණය නොකෙරෙත්.

170 එසේ, එයාකාරයෙන්; නළුවෙස්ගෙණ, නාට්‍යවේශධාරීව; හැමදවසේ, සියලු දවස්හි; නටනකල, නෘත්‍යකරන කල්හි; උන්, ඒ (ඊශ්වර) යන්; පිදුවයි, පූජාකෙළේයයි; කෙසේ, කවරආකාරයකින් ලොවට, ලෝකයාට; සිතසේ, සිත්වූපරිද්දෙන්; වැඩෙක්, අභිවෘද්ධියෙක්; සිදුවෙද, සිද්ධවේද.?

171 දදදන, අඥානජනයාගේ; බස්, වචනයන්; අසා, ශ්‍රවණයකොට; ඔහු උදෙසා, ඒ(ඊශ්වරයා) උදෙසා; කරනපුද, පූජාකිරීම; දිඹුලෙහි, උදුම්බරවෘක්ෂයෙහි; මල් නිසා, මල් සඳහා; නොලසා, අනලස්ව; දියැද, වතුර ඇද; දුක්විඳිනවැනි, දුක්විඳින්නාක් වැන්න.

172 අයක්, *සමහරක්හට; පිළිකුල්වන, ප්‍රතිකූල වන්නාවූ; අයක්, (තවත්) සමහරුන්ගේ; සිත, චිත්තයෙහි; රු, රාගය; වඩවන, වර්ධනය කරන්නාවූ; ලිඟුසටහන් රැගෙණ, ලිඞ්ගසංස්ථාන ග්‍රහණයකොට; පුදකළැයි, පූජාකෙළේයයි; ඉන්වනා, ඒ හේතුවෙන් වන්නාවූ; පල, ඵලය; කිම්ද, කවරේද.

---

* වෙමයකා.

173 සිතදුසිරි කිළු ට
පින්කෙත් නොවන මෙලොව ට
කරනපුද ඉසුරු ව
ගලක වපුරණ වැන්න බිජුව ට

174
හත්යගද අත ට
පත්දිව ගුරුළුයාන ට
වැදසමුදුර දිය ට
හැතපී නනනා දරණ වැලපි ට

175
තෙදියත උපිඳු මය
නැතවෙන තෙනෙක් එස මය
පුදයට තිසි එ මය
කීය පුදකරන ලෙස මහි මය

176
උපිඳුන් ගුණ වෙසෙ ස
පළකර කියන මේ බ ස
සිට නිරිඳු අබිය ස
කියයි නිරිඳෙක් සෙබෙහිමේබ ස

177
ඇතිහට පැන් පව ස
ලුණුදිය ගෙණ පොවන ලෙ ස
විදිනා මේ වෙහෙ ස
මදව තව සලසිද දුක්රු ස

---

173 සිත, චිත්තයෙහි; දුසිරි, දුශ්චරිතයෙන්; කිළුට, කිලිටුවූ; මෙලොවට, මේ ලෝකයට; පින්කෙත් නොවන, පුණ්‍යක්ෂෙත්‍රනොවන්නාවූ; ඉසුරුව, ඓශ්චර්‍ය්‍යයාගෙව; කරනපුද, පූජාකිරීම; බිජුවා, බීජයන්; ගලක, පාෂාණයක්හි; වපුරණ වැන්න, වපුරන්නාක් මෙන්.

174 අතට, හස්තයට; යගද, ගදායුධය; හත්, ග්‍රහණය කළාවූ; දිව ගුරුළුයානට, දිව්‍ය ගරුඩ වාහනයට; පත්, ප්‍රාප්තව; සමුදුර දියට, සමුද්‍ර ජලයට; වැද, ප්‍රවිෂ්ටව; නනනා, අනන්තනම් නාගරාජයාගේ; දරණවැලපිට, භොගාවලිය මතුයෙහි; හැතපී, ශයනය කරන්නාවූ;

175 තෙදියත, ජගත්‍රයෙහි; උපිඳුමය, උපෙන්ද්‍රයාමය; එසමය, ඒසමානවූ; වෙනතෙනෙක්, අන්කිසිවෙක්; නැත, නොමැත්තේය; (එහෙයින්) පුදයට, පූජාවට; තිසි, යොග්‍යවූයේ; එමය, උත්වහන්සේමැයි; පුදකරනලෙස, පූජාකරන පරිද්දෙන්; මහිමය, මහත් බැව්; කීය, කථනය කෙළේයි.

176 උපිඳුන්, උපෙන්ද්‍රයාගේ; ගුණවෙසෙස, ගුණවිශේෂය; පළකර, ප්‍රකාශකොට; මේබස, මේවචනය; කියන, කියනකල්හි; මැතිදෙක්, අමාත්‍යයෙක්; නිරිඳු අබියස, නරෙන්ද්‍රයන් අභිමුඛයෙහි; සෙබෙහි, සභායෙහි; මේ බස, මෙවක්ෂ්‍යමාන වචනය; කියයි, කථනය කෙරෙයි.

177 පැන්පවස, දියපිපාසය; ඇතිහට, ඇත්තාහට; ලුණුදිය, ලවණ ජලය; ගෙණ, ග්‍රහණයකොට; පොවනලෙස, පොවන්නාක් මෙන්; විදිනා, (මේ) විඳින්නාවූ; වෙහෙස, විනාශය; මඳව, මඳව; තවදුක්රුස, අප දුඃඛරාශියක්; සලසිද, සලස්වන්නේද?

178 නොබාලොව නී ත් ද
තක්වත් අන් ද ම ත් ද
පුදකර උව් ත් ද
ඇද්ද ඇසුවා වැඩක් වි ත් ද

| 179 | | 181 | |
|---|---|---|---|
| හැමතැන උවිඳු ඇ | ත | අස මබස ස | ත් තේ |
| සිතාව වෙත්වනු නෑ | ත | නොදනී* මෙතෝ ත | ත් තේ |
| එනිසා සුදත් ඇ | ත | ඔහුව බිය ඇ | ත් තේ |
| කුමට පැවසිද මේ බොරු මැ | ත | එසිත යගද සුදය ග | ත් තේ |

| 180 | | 182 | |
|---|---|---|---|
| වඳුරෙකු පිනු මුහු | ද | සක්බෙල්ලෙකු පි | බි ය |
| එතරව යා නොහී කි | ද | රාදෙස් සිතින් නොති | බි ය |
| ගියෙල රම්පෙත් බැ | ද | ඔහුට ඇතිකල | බි ය |
| මෙසේවේද මෙලොව දෙවියන් තෙ | ද | කෙසේ දුරලූද තරයන් | බි ය |

178 ලොව, ලෝවැස්සාගේ; නිඳු, අවමානයට; නොබා, භය නැතිව; අඳුම්කු, අඳුනබාලවූ; තක්වත්, තා එසේකි නමුත්; උවන්ද, උපෙක්ෂායාගව; (විෂ්ණුට) පුදකර, පූජාකොට; වැඩක්විත්ද, අභිවෘද්ධියක්; ඇසුවා ඇද්ද, ශ්‍රවනය කෙළේ ඇද්ද.?

179 උවිඳු, වාසුදේවතෙම; හැමතැන, සියලුතන්හි; ඇත, ඇත්තේය; සිතාව, සීතාප්‍රමේශ්වරී නම් අඟනාවගෙන්; වෙත්වනු, වෙන්වීමක්; නැත, නැත්තේය; එනිසා, ඒ(සීතාව) නිසාම; සුදත්, සංග්‍රාමත්; ඇත, ඇත්තේය; යනමේ බොරු මැත, මේ මිථ්‍යාමතය; කුමට පැවසිද, කුමක් නිසා ප්‍රකාශකෙළේද?

180 වඳුරෙකු, වානරයෙකු; පිනු, පැන එතරව ගියාවූ; මුහුද, සමුද්‍රයෙන; එතරව යානොහී, එතරව යා නොහැකිව; රම්, රාමතෙම; පෙත් සෙතුවක්, (පාලමක්;) බැද, බන්ධනයකොට; ගියෙල, ගමනය කෙළේලු; මෙලොව, මේ ලෝකයෙහි; දෙවියන්, දේවතාවන්ගේ; තෙද, තේජස, මෙසේවේද, මෙයාකාරම නොවේද.?

181 සත්තේ, සත්‍යවූ; මබස, මාගේ වචනය; අස, ශ්‍රවනයකර; මෙතෝ, සුෂ්මත්තෙම; තත්තේ, ඇතිස්වභාවය; නොදනී, නොදන්නේය; ඔහුට, ඒ විෂ්ණුහට; බිය, භීතිය; ඇත්තේ, විද්‍යමානවේ; එසිත්, එභයකරණකොටගෙන; යගදසුදය, අයමුවා එනම්ආයුධය; ගත්තේ, ග්‍රහණය කෙළේය.

182 සක්බෙල්ලෙකු, සංඛයක්; පිබිය, පිඹින්නාවූ; රාදෙස්, රාජවේෂයත්; සිතින්, චිත්තයෙන්; නොතිබිය, දුරු නොකළවූ; ඔහුට, ඒ වාසුදේවයාගට; බිය ඇතිකල, භයඇතිකල්හි; තරයන්, මනුෂ්‍යයන්ගේ; බිය, භීන්ය; කෙසේදුරලසිද, කවර ආකාරයකින් දුරු කෙරේද.

* මේ නැතැයි ටෝ.

183 ලබමි සෙත ඉදි — රි
ඔහුව කරනා පුද සි — රි
ලබනුව තෙල් මිහි — රි
තබා අලලන වැන්න ඔටුකි — රි

184

පෙර බුදුබණ අ — සා
බුදුගුණ උගත් සක — සා
මැතිඳෙක් එවිග — සා
එරද සබමැද මෙමෙස් පව — සා

185

අපමුනි තිලෝ — නා
හැරකියන බස් මෙද — නා
ඇරකිරි පිරි ත — නා
වැන්න අග රුගෙණ කිරිදේ — නා

186

ලැබදිවැස නිකස — ළු
බැලුවත් සියළු සක්ව — ළ
මුනිඳුන් මිස උදු — ළු
කෙනෙක් නැත සත්ලොවටසෙත් (කළ

187

මෙර ගිරි සරි ගිරෙ — ක්
රිවිසඳ සදිසි පහනෙ — ක්
නැත සිඳු සරිසරෙ — ක්
එමෙන් නැත* මුනිඳු සරි උතුමෙ — ක්

---

183 ඉදිරි, මතුකාලයෙහි; සෙතලබමි, ශාන්තිය ලබමැනි; ඔහුව, ඕහට; කරන, කරන්නාවූ; පුදසිරි, පූජාවන්; මිහිරිතෙල්, මධුරවූ තෙලය; ලබනුව, ලබනුවස්; ඔටුකිර, කරහස්තිය; තබා, ස්ථාපනයකොට; අලලනවැන්න, මර්දනය කරන්නාක්මෙනි.

184 පෙර, පූර්වයෙහි; බුදුබණ, බුඩධර්මය; අසා, ශ්‍රවණයකොට; සකසා, යහපත්ව; බුදුගුණ, සර්වඥයන් වහන්සේගේ ගුණයන්; උගත්, උද්ග්‍රහණය කළාවූ; මැතිඳෙක්, මන්ත්‍රීන්ද්‍රයෙක්; එවගසා, එඇසිල්ලෙහි; එරදසබමැද, ඒ රාජසභා මධ්‍යයෙහි; මෙමෙසේ, මෙයාකාරයෙන්; පවසා, ප්‍රකාශ කෙරෙයි.

185 තිලෝනා, තුන්ලොවට නායකවූ; අපමුනි, අපගේ මුනීන්ද්‍රයන් වහන්සේ; හැර, දුරුකොට; මෙදනා, මේජනයාවිසින්; කියන, කථනයකරන්නාවූ; බස්, වචනයන්; කිරිපිරි, ක්ෂීරයෙන් පරිපූර්ණවූ; තනා, තනය; ඇර, දුරුකොට; අගරුගෙණ, ශෘඞ්ගග්‍රහණයකොට; කිරිදේනාවැන්න, කිරිදෙවින්නාක්වැනිය.

186 නිකසළ, පිරිසිදුවූ; දිවැසලැබ, දිවැස්ලැබ; සියලුසක්වළ සකලචක්‍රවාලයෙහි; බැලුවත්, නිරීක්ෂණය කළත්; උදුළු, බබලන්නාවූ; මුනිඳුන්මිස, සර්වඥයන් වහන්සේ විනා; සත්ලොවට, සත්ත්වලෝකයාට; සෙත්කළ, ශාන්තිකළාවූ; කෙනෙක්, අන්කෙනෙක්; නැත, නැත්තාහ.

187 මෙරගිරිසරි, මෙර පර්වතය සමානවූ; ගිරෙක්, පර්වතයෙක්ද; රිවිසඳසදිසි, සූර්‍ය්‍යචන්ද්‍රයන්වැනිවූ; පහනෙක්, ප්‍රදීපයෙක්ද; සිඳුසරි, සින්ධුවැනිවූ; සරෙක්, තඩාගයෙක්ද; නැත, (යම්සේ) නැත්තේද; එමෙන්, එසේ; මුනිඳුසරි, සර්වඥයන් වහන්සේ වැනිවූ; උතුමෙක්, උත්තමයෙක්; නැත, නැත්තේය.

---

* මුනිඳුට උවමෙක්.

188 ඔහු නොවැඩී — දෙස් දෙ ස්
ඔහු දෙය නොනැමී — ඉස් ඉ ස්
ඔහු හුදවූ — ඇස් ඇ ස්
නොවෙයි ඔහුගුණ නොවැසී — බස් බ ස්

189
සිහි නොකළ — සි ත සි ත
ඔහුගුණ* නොකී — ව ත ව ත
ඔහු නොවැඳි — ඇ ත ඇ ත
නොවෙයිඑසරණ නොගත්සතස

190
සිහිනොකළ — දි න දි න
ඔහුබස් නොවිත් — ක ණ ක ණ
නොදත් ගුණ — දැ ණ දැ ණ
නොවෙයිඔහුමුල්නොකළ පිණපි

191
මුනිඳුන් හුද — ටු වෝ
වෙති බවදුකට බ — ටු වෝ
එමුනිසඳ දු — ටු වෝ
ඔහුමවෙද මොක් සැපතදු — ටු වෝ

192
†මුනිදම් නොඇ — සූ වෝ
වෙති සසර බැස වි — සූ වෝ
ඔහුගෙබස් ඇ — සූ වෝ
ඔහුමවෙද සසර දුක් නැ — සූ වෝ

---

188 ඔහු, (ඒ සම්බුද්ධ භගවතාණෝ) නොවැඩී, වැඩීම නොකළාවූ; දෙස්, දෙසය; දෙස්නොවෙයි, දෙශයක් නොවෙයි; ඔහු දෙසය, උන්වහන්සේ දිසාවට; නොනැමී, නොනැමුවාවූ; ඉස්, හිස්ය; ඉස් (නොවේද) හිසක් නොවෙයි; ඔහු, උන්වහන්සේ; හුදවූ, අභියස නොකළාවූ; ඇස්, ඇසය; ඇස් (නොවෙයි,) ඇසක් නොවෙයි; ඔහු ගුණ, උන්වහන්සේගේ ගුණයන්ගෙන්; නොවැසී, වැසීම නොවූ; බස්, වචනය; බස්නොවෙයි, වචනයක් නොවෙයි.

189 සිහිනොකළ, උන්වහන්සේ අනුස්මරණය නොකළාවූ; සිත, සිත්තය; සිත (නොවෙයි,) සිත්තයක්නොවේය; ඔහුගුණ, උන්වහන්සේගේගුණයන්; නොකී, නොකීවාවූ; වත, වක්ත්‍රය; වත (නොවෙයි) වක්ත්‍රයක් නොවේය; ඔහු, උන්වහන්සේ; නොවැඳි, නොවැන්දාවූ; අත, හස්තය; අත (නොවෙයි,) හස්තය නොවේය; එසරණ, උන්වහන්සේගේ සරණ; නොගත්, ග්‍රහණය නොකළාවූ; සත, සත්වයා; සත නොවෙයි, සත්වයෙක් නොවෙයි.

190 සිහිනොකල (උන්වහන්සේ) සිහිනොකළාවූ; දින, දවස; දින (නොවෙයි,) දවස නොවෙයි; ඔහු, උන්වහන්සේගේ; බස්, වචනය; නොවිත්, [illegible]; නොවෙත්, [illegible]; කණ, [illegible]; කණ (නොවෙයි,) කණක් නොවෙයි; නොදත්ගුණ, (උන්වහන්සේගේ) ගුණයන් නොදත්තාවූ; දැණ, ප්‍රඥාව; දැණ (නොවෙයි,) [illegible] නොවෙයි; ඔහු මුල්නොකළ, උන්වහන්සේ මුලිකව [illegible] නොකළාවූ; පිණ, පුණ්‍යය; පිණ නොවෙයි, පුණ්‍යයක් නොවෙයි.

191 මුනිඳුන, මුනීන්ද්‍රයන් වහන්සේ; හුදටුවෝ, [illegible] වෙති; බවදුකට, භවදුඃඛයට; බටුවෝ වෙති, [illegible]; එ මුනිසඳ, ඒ මුනීන්ද්‍රයාණෝ; දුටුවෝ, (දකිනාහු) [illegible]; ඔහුම, ඒ සම්බුද්ධයෝම; මොක්සැපත, [illegible]; දුටුවෝ වෙද, දුටුවෝනම් වෙත්

192 මුනිදම්, මුනීන්ද්‍රයන් ධර්මය; නොඇසුවෝ, [illegible]; සසර බැස, සංසාරයට බැස; විසූවෝ වෙති, [illegible]; ඔහු

---

* නොවැසී; † මුනි බණ.

193 ඔහු මය නො දත් තෝ
මුනිදම් රස නො දත් තෝ
ඔවුන් ගුණ දත් තෝ
උමයසග පවග සැප දත් තෝ

194
සුළකින් කුම න් දේ
නොදනීති අන්ද ම න් දේ
මුනිසරණ වැ න් දේ
උමයසැප සිඳුමැද කිමි න් දේ

195
දිටු කිලුටු ව ත් තෝ
පෙවහිපසු තැවිලි ව ත් තෝ
ඔහු සරණ ව ත් තෝ
උමයබවපරතෙරට ව ත් තෝ

196
බඹසුර නිරි න් දේ
මුනිපද තඹර වැ න් දේ
මුදුනැඳිලි බැ න් දේ
උමය අත්බැවෙහි පලවි න් දේ

197
තම බස වත් ස වත්
සතා රූවත් දෙනු වත්
සැදැහෙත් වත් ලෙ වත්
බහයි මහසැපත වත් එති වත්

ඔහුගෙ, උන්වහන්සේගේ; බණ් අසුනෝ, (යම්කෙනෙක්) ධර්මශ්‍රවණය කළෝද; ඔහුම, ඒ සත්වයෝම; සසරදුක් නැසුවෝවෙද, සංසාරදුඃඛය නැසුවාහු වෙත්.

193 මුනිදම්, සර්වඥයන් වහන්සේගේ ධර්මයෙහි; රස, රසය; නො දත් තෝ, (යම්කෙනෙක්) නොදත්තෝද; නොදත්තෝ, (කිසිවෙක්) නොදත්තෝනම්; ඔහුමය, ඔව්හුමය; ඔවුන්ගුණ, උන්වහන්සේගේ ගුණය ; දත්තෝ, යම්කෙනෙක් දත්තෝද; සගපවගසැපදත් තෝ, ස්වර්ගාපවර්ග සැපදත්තෝනම්; උමය, ඔහුමය.

194 අන්දමන්දේ, අඥානබාලයෝ; මුනිසරණ, සර්වඥ චරණය; වැන්දේ, වැන්දවුන්ට; කුමකින් කුමන්දේ, කුමනකාරණාවක්වත් නාහුද්ද; නොදනිති, නොදනිත්; සැපසිඳුමැද, සුඛසාගර මධ්‍යයෙහි; කිමිනාදේ, කිමින්දේනම්; උමය, ඔහුමය.

195 දිටුකිලුටුවත්තෝ, දෘෂ්ටියෙන් දූෂ්‍යවත්තෝ; සෙවත් මිථ්‍යා දෘෂ්ටිවත්තෝ; පසුතැවිලි වත්තෝවෙති, පශ්චාත්තාප වත්තෝ වෙත්; ඔහුසරණවත්තෝ, යම්කෙනෙක් උන්වහන්සේගේ සරණ ගියාහුද; බවපරතෙරට වත්තෝ, භවයාගේ පාරතීරයට ගියාහු; උමය, ඔහුමවෙත්.

196 මුනිපද තඹර, සර්වඥපාදනාම රසය; වැන්දේ, යම්කෙනෙක් නමස්කාර කළාහුද; මුදුන, මස්තකයෙහි; ඇඳිලිබැන්දේ, අඤ්ජලි බඳකළාහුද; (ඔහුකුමු) බඹසුරනිරියන්දේ, බ්‍රහ්මදිව්‍ය නරෙන්ද්‍රවූහ; අත් බැවෙහි, ආත්මභාවයෙහි; පලවින්දේ, ඵලවින්දේද; උමය, ඔව්හුමය.

197 සැදැහෙයන්, ශ්‍රද්ධායෙන්; වත්, තමන්වහන්සේ වසනා තැනට පිවිසියාවූ; ලෙවත, ලෝවැස්සන්; තමබස, තමන්වහන්සේගේ කරුණාද ගුණෝපලක්ෂිතවූ ධර්මය; වත්, පිවිසියාවූ; සවන්, ශ්‍රවණයන්ද; රූවත්, මහාපුරුෂ ලක්ෂණෝප ශෝභිත රූපශ්‍රීය; වත, ‡ආලම්බන වශයෙන් පිවිසියාවූ; දෙනුවත්, නෙත්‍රයුග්මයද; සතපා, සන්තර්පණය කොට; ඒ, එසර්වඥයන්; වත්, පිවිසියාවූ; මහසැපත, මහාසම්පත්තියවූ; නිවත්, නිර්වාණධර්මයට; බහයි, ප්‍රවේශකරයි.

* මුනිබස; † උමයමොක් සිඳුවැද.

198 බව්දුක් ගිනි නි වන
සතමග පෙළෙන් පින වන
නැත සරිවන දෙ වන
කෙනෙක් මුනිඳුට තිලෝගුරු වන

199

සගමොක් සැප දෙව ති
අපාබිය දුක් නවත ති
පිරිමෙත් කුළුණු ඇ ති
ලොවට උතුමෝ ඔවුන්මුන් නැ ති

200

උන් උන් තැන් පු ද
උන් වත් දෙසට නැම ද
ලැහිබව දුක් මු ද
කියනු කිම උන් මහිමපහ ද

201

උන්වැලඳූ පය ද
උන්පදල සැති පහණ ද
උන්පිවදුන් රුක ද
පුදමොක්සැප ලබතිදුක්සි ද

202

ඒමොක් පුරවත් දූසි
සෙතදෙන්ට පුළුවන් දූසි
නොකියව කුමන් දූසි
*තමාපදගිරිතුරුදවත් දූසි

---

198 බව්දුක්, සංසාර දුඃඛනැමති; ගිනි, අග්නිය; නිවන, නිර්වාපණය කරන්නාවූ; සත, සත්වයන්; මගපෙළෙන්, †සතරමග සතරඵලයෙන්; පිණවන, පිනය කරවන්නාවූ; තිලෝගුරුවන, ත්‍රෛලෝකාචාර්යවූ; මුනිඳුට සරි, සර්වඥයන් සදෘශවූ; දෙවනකෙනෙක්, ද්විතීය පුද්ගලයෙක්; නැත, නොමැත්තේය.

199 සගමොක්සැප, ස්වර්ගමෝක්ෂසම්පත්තිය; දෙවති, උපදෙශ දානයෙන් ලොකයාලවා ග්‍රහණය කරවන්නාවූ; අපාබියදුක්, අපාය භීතිදුඃඛයන්; නවතති, වලක්වන්නාවූ; පිරි, පූර්ණවූ; මෙත්කුළුණු ඇති, මෛත්‍රීකරුණාවෙන් යුක්තාවූ; ලොවට, ලොකයාහට; උතුමෝ උත්තමයෝනම්; ඔවුන්මුන්, උන්වහන්සේහැර; නැති, නැත්තේය.

200 උන්, උන්වහන්සේ; උන්තැන්, වැඩඋන්ස්ථාන; පුද, පූජාකොට; උන්, උන්වහන්සේ; වත්දෙසට, පිවිසිදිශාවට; නැමද, නමස්කාරකොට; බව්දුක්, සංසාරදුඃඛය; මුද, මිදීමකොට; ලැහි, මොක්ෂයටයෙත්; උන්මහිම, උන්වහන්සේගේ මහිමය; පහද, ප්‍රකාශකොට; කියනුකිම, කියනුමකාවරේද ?

201 උන්, උන්වහන්සේ; වැලඳූපයද, වැළඳූවාවූ පාත්‍රාධාතුන් වහන්සේද; උන්, උන්වහන්සේගේ; පදලසැති, පාදලාඤ්ඡනය ඇත්තාවූ; පහණද, පාෂාණයද; (ගලද) උන්, උන්වහන්සේ; පිවදුන්, පිවදුන්නාවූ; රුකද, අශ්වත්ථබෝධිවෘක්ෂයද; පුද, පූජාකොට; දුක්සිඳ, දුක්නසා; මොක්සැප, මොක්ෂසම්පත්තිය; ලබති, ලබත්.

202 ඒ, [illegible]; මොක්පුර, මොක්ෂපුරයට; වත්දූසි, පිවිසිසේක්වේද්දූසි; තමාපද, තමන්වහන්සේගේ පාදලාඤ්ඡනය; ගිරි, පර්වතයක් මෙවන් පාෂාණයක්වේද; තුරු, වන්දූසි, බෝධිවෘක්ෂයක්වේද; (එමෙහසින්) කුමන්දූසි, කිමෙක්ද; සෙතදෙන්ට පුළුවන් දූසි, ශාන්ති දානය කරනු හැක්කේද්දූසි; නොකියව, කථනය නොකරව.

---

* අනන්ත ශාස්තෘක බුද්ධශාසනය උණිතාක්‍රීඩ ප්‍රකරණයෙකි ම අතීත ශාස්තෘක ශාසනයද උණීණනාකරනු කැමැත්තෝ මෙකව කීසූ. †සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත්,යන මොහු සතරමග සතරඵලයෝයි.

203 තමරුව දුටු නෙත ට
තම්ගුණ සිතූ සතහ ට
දුක්* නොවිඳින ලෙස ට
†දෙසි නිසිමග දහම් මෙලොව ට

204
මිසදිටු මුලු පු ලේ
ඇටගම්ග බිජු වපු ලේ
දහම් ගඟ දිය ලේ
ඔවුන්ගෙන සෙත දියත පත ලේ

205
දියසෙස් බිමගිලෙ ත
කිමෙස් දියෙහි ඇවිදි ත
අහසත් එම කර ත
සමත ඒමුනි මිසක් වෙන නැ ත

206
දින දින දිනිඳු මෙන්
කර රස නොවන සිඳු මෙන්
නොනැසි විඳු කිඳු මෙන්
වැජඹිඅඩුනොවනපුන්සඳ මෙන්

207
ලෙඩාට දිව ඔසු සේ
මරු කතර පුල් විල සේ
‡දුකෙහි පිහිටක් සේ
පිහිටි දෙර දෙරෙහි කප්තුරු සේ

---

203 තමරුව, තමන්වහන්සේගේ රූපය; නෙතට, නෙත්‍රයෙන්; දුටු, දර්ශනය කළාවූ; තම්ගුණ, තමන්වහන්සේගේ ගුණයන්; සිතූ, සිතුවාවූ; සතහට, සත්ත්වයාට; දුක්නොවිඳින ලෙසට. අපායාදි දුක් නොවිඳින පරිද්දෙන්; නිසි, යොග්‍යවූ; දහම්මග, ධර්මමාර්ගය; දෙසී, දෙසනසේක.

204 මිසදිටු, මිථ්‍යාදෘෂ්ටි නැමැති; මුල්, මූලයන්; උපුලේ, උත්පාටනය කළසේක; අටගම්ගබිජු, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග නැමැති බීජයන්; වපුලේ, වැපුරූසේක; දහම්ගඟ, ධර්මනැමැති ගංගාවෙහි; දිය, ජලය; ඇලේ, හෙළූසේක; දියත, ලෝකයෙහි; සෙත, ශාන්තිය; පතලේ, ව්‍යාප්තවූයේ; ඔවුන්ගෙන, උන්වහන්සේකෙරෙන්. වෙති.

205 දියසෙස්, ජලයෙහිමෙන්; බිම, භූමියෙහි; ගිලෙත, ගැලීමෙහිද; කිමෙස්, භූමියෙහිමෙන්; දියෙහි, ජලයෙහි; ඇවිදිත, සඤ්චාරණයෙහිද; අහසත්, ආකාශයෙත්; එමකරත, එසේ සංචාරණය කිරීමෙහිද; සමත, සමර්ථවූයේ; එමුනි මිසක්, ඒ සර්වඥයන් වහන්සේ විනා; වෙන, අනිකෙක්; නැත, නොවැත්තේයි.

206 දින දින; මධ්‍යාහ්නයෙහි; දිනිඳුමෙන්, දිනනායකයා මෙන්ද; කරරස, ලවණ ජලය; නොවන, විනාශනොවන්නාවූ; ගෙවන් අඩු නොවන්නාවූ; සිඳුමෙන්, සාගරයමෙන්ද; නොනැසි, අවිනාශිව පවත්නා; විඳුකිඳුමෙන්, විද්‍යුත්කදම්බයක් මෙන්ද; අඩුනොවනා, හානිනොවන්නාවූ; (පුරපක්ෂයෙහිවූ) පුන්සඳමෙන්, පූර්ණචන්ද්‍රයා මෙන්ද; වැජඹි, විජෘම්භමානවී.

207 ලෙඩාට, ව්‍යාධියාට; දිවඔසුසේ, දිව්‍යඖෂධයක් වැනිසේක; මරුකතර, වාලුකාකාන්තාරයෙහි; පුල්විලසේ, ප්‍රඵුල්ලතඩාගයක් වැනිසේක; දෙරදෙරෙහි, ද්වාරයක් පාසා; පිහිටි, පිහිටියාවූ; කප්තුරුසේ, කල්පවෘක්ෂයක්, වැනිසේක.

---

* නොවඳින; † දෙසිය. ‡ දුකෙහි, (කායිකචෛතසික) දුඃඛයෙහි; පිහිටක්සේ, ප්‍රතිෂ්ඨාවක් වැනිසේක.

208 ලංවු සිරි මරණ ට
වැඳහොත් එසක් දෙව්ඳු ට
තෙකෙළ* සැට් ලස්සෙ ට
ආයු දුනි එක බසින් එම්බි ට

209
නබා තුන් පිය ව ර
වැඩිකල තිදස පුරව ර
මුනිඳුගේ පව ර
කෙසේ පැවසිය හැකිද සිරි ස ර

210
දසව රියනක් ග ත
රැගෙණ අබළුව ඇතුල ත
යත හැතපෙත ඉඳි ත
සමත ඒ මුනි මිසක් වෙන නැ ත

211
සවනක් රැසින් දු ළු
තිල බිජු පමණ ගතින ළු
හැමතැන එකෙළි ක ළ
අනත පිරියත සියලු සක්ව ළ

212
දෙසත බණ එකවි ට
එකමගද බසිනෙළි කො ට
සියබස ලෙස කණ ට
ඇසෙයි මුළුලොව සියලු සතහ ට

---

208 මරණට, මරණයට; ලංවසිරි, සම්පව සිටියාවූ; වැඳහොත්, නමස්කාරකොට හොත්තාවූ; එසක්දෙව්ඳු, ඒ ශක්‍රදේවේන්ද්‍රයාහට; තෙකෙළ සැට්ලසෙක්ව, තුන්කෝටිහැටලක්‍ෂයකට; එම්බිට, එඈ සිල් ලෙහිම; එකබසින්, එකවචනයෙන්; ආයුදුනි, ආයුෂදී වදළසේක.

209 තුන්පියවර, පියරත්‍රයක්; නබා, ස්ථාපනයකොට; තිදසපුර වර, උත්තමවූ ත්‍රිදශනගරයට; වැඩිකල, වැඩමවූ කාලයෙහි; පවර, උතුම්වූ; මුනිසඳුගේ, මුනිඋතුමාණන්ගේ; සිරිසර, ශ්‍රීසාරය; කෙසේ පැවසිය හැකිද, කොයිආකාරයකින් ප්‍රකාශකොට හැක්කේද.?

210 දසව රියනක්, අෂ්ටාදශරතනප්‍රමාණවූ; ගත, ශරීරය; රැගෙණ, ග්‍රහණයකොට; අබළුව ඇතුලත, සාසපාභ්‍යන්තරයෙහි; යත, චංක්‍රමණයද; සැතපෙත, සයනයකිරීමද; ඉඳිත; නිසීදනයද; සමත, සමර්ථවූයේ; එමුනි මිස, ඒ මුනීන්ද්‍රයාවනා; වෙන, අන්‍ය යෙක්; නැත, නොමැත්තේය.

211 තිලබීජු පමණ, තිලබීජ ප්‍රමාණව; (තලඇටයක් පමණව;) ගතින්, ගාත්‍රප්‍රදේශයෙන්; අළු, හරණලද; දුළු, බබලන්නාවූ; සව ණක් රැසින්, ෂඩ්වර්ණරශ්මියෙන්; සියලු අනත පිරියත සක්වළ, සකල අනන්තාපර්යන්ත චක්‍රවාලයෙහි; හැමතැන, සියලු තන්හි; එකෙළිකළ, එකාලෝක කළසේක.

212 එක මගදබසින්, එකම මාගධ භාෂාවෙන්; එළිකොට, ප්‍රකා ශකොට; බණදෙසත, ධර්මදේශනාකරන කල්හි; එකවිට, එකැසිල් ලෙහි; මුළුලොව, සකලලෝකයෙහි; සියලුසතහට, සකල සත්‍ව යන්ට; සියබසලෙසට; සවකීය භාෂාවෙන්මෙන්; කණට, කර්ණයට; ඇසෙයි, ශ්‍රවණයවෙයි.

---

* සුප්ගසකට.

213 ඔහු බණ දෙසන වි ට
වත් නද දහම් මඬල ට
හිස පිරිස වීතර ට
නොයේ එක අඟුලකුත් බැහැර ට

214
වඩිම්පි සිතුවි ට
දෙරඟුලු ඇරෙති එකවි ට
දිගු දිගු කළ පය ට
පිපෙයි සත් බුමු පියුම් මුනිඳු ට

215
වල තොඩ එවිග සේ
සමවෙය බෙර ඇස සේ
දිව මල් වැසි වැ සේ
සැදෙයි මුනි වඩිනා මඟ දෙප සේ

216
මුනිසඳ යන උ සේ
උවත් මෙරගිරි සිර සේ
හිවු වේ බඩය සේ
නැමී පිළිගනිය පද* එක සේ

217
බඹලොව ගොස් ඉඳි ති
කප්සියදහස් නරඹ ති
රිවිසඳ පිරිමදි ති
මෙසේ ඔහු සඟගණද වැජඹෙ ති

---

213 ඔහු, උන්වහන්සේ; බණදෙසනවිට, ධර්මදෙශනා කරනකල්හි; දහම්මඬලට, ධර්මසභාමණ්ඩලයට; වත්, පූර්වෂ්ටවූ; නද, නාදය; පිරිස විතරටහිස, පර්ෂත්හුගේ ප්‍රමාණයට හිසක්; එක අඟුලකුත්, ඒකාඞ්ගුල මාත්‍රයකුත්; බැහැරට නොයේ, පිටතට නොයත්තේය.

214 වඩිම්පි, වැඩමකරමැයි; සිතුවිට, සිතූකල්හි; දෙරඟුළු, දෙර අගුල්; එකවිට, එකක්ෂණයෙහි; ඇරෙයි, විවෘතවෙයි; දිගුදිගුකළපයට, ප්‍රසාරණය කළ කලාවූ පාදයට; මුනිඳුට, මුනීන්ද්‍රයන් වහන්සේට; සත්බුමු පියුම්, සප්තභූමක පද්ම; පිපෙයි, පුෂ්පිතවෙයි.

215 එවිගසේ, එඇසිල්ලෙහි; වලතොඩ, නිම්නස්ථාන හා ස්ථලස්ථානයන්; බෙරඇසසේ, භෙරි අක්ෂියක්මෙන්; සමවෙය, සමතලාවෙයි; දිවමල්වැසි, දිව්‍යමාලා වර්ෂාවන්; වැසේ, වර්ෂණයවෙයි; මුනිවඩිනමඟ, මුනීන්ද්‍රයන් වඩින මාර්ගය; දෙපසේ, උභයපාර්ශ්වය; සැදෙයි, සර්ජිතවෙයි.

216 මුනිසඳ, මුනිඳුතුමා; උසේයන, උස්තැනකට ගමනයකරන කල්හි; මෙරගිරි සිරසේ උවත්, මේරුපර්වත මස්තකය උසයේනමුත්; හිවු, තාපනය කරණලද; වේබඩයසේ, වෙත්‍රනගීයක්මෙන්; එකසේ, එකසෙණි; නැමී, නීම්නව; පද, පාදයුග්මය; පිළිගනිය, ප්‍රතිග්‍රහණය කෙරේය.

217 බඹලොව, බ්‍රහ්මලොකයට; ගොස්, ගමනයකොට; ඉඳිති, නිසිදනයට පොහොසත්වූද; කප් සියදහස්, ලක්ෂගණන් කල්ප; නරඹති, අවලොකනයට පොහොසත්වූද; රිවි සඳ, සූර්‍ය්‍යචන්ද්‍රයන්; පිරිමදිති, පරාමර්ශණයට පොහොසත්වූද; ඔහු, උන්වහන්සේ ග්; මෙසේ, මෙආකාරගුණඇති; සඟගණද, (සාරිපුත්‍රාදී) සඞ්ඝසමූහයාද; වැජඹෙති, විජෘම්භමානවෙති.

218 සක්වළ ගිරි සුනෙ ර
දෙරණ සොල්වා එකව ර
කරනා මහ පෙළ හ ර
පවර සඟගණය* ඔහු පිරිව ර

219
මෙසසර පෙර දව ස
නොයෙක් කප්කෙළ සුවහ ස
කද පිළිවෙළ වෙසෙ ස
දකිනා සඟපිරිවරය නිසි ලෙ ස

220
ලක් තිබතත් දෙර ණ
පස් මදනා යනා අපම ණ
ලැබගණ මහනුව ණ
†මුනිඳු වෙත සිටිති මහසඟග ණ

221
මුළුලොව හැම දෙ සේ
දක්නා සත සිත එක සේ
ලැබගණ දිව ඇ සේ
සිටිති මහසඟහු ඔහු දෙප සේ

222
සුර බඹ ලොව සත න
කියනා බස් හැම තැන තැ න
දිවකන් ලැබ අස න
එමුනි වෙත සඟගණයවැජඹෙ න

---

218 සක්වළ, චක්‍රවාටයද; සුනෙරගිරි, මෙරුපර්වතයද; දෙරණ ධරණියද; (පොළොවද) එකවර, එකඇසිල්ලෙහි; සොල්වා, කම්පා කරවා; මහපෙළහරකරනා, මහා ප්‍රතිහාර්‍ය්‍ය කරන්නාවූ; පවර, ප්‍රවරවූ; සඟගණය, සංඝසමූහයා; ඔහු පිරිවර, උන්වහන්සේගේ පිරිවාරවූසේක.

219 මෙසසර, මේසංසාරයෙහි; පෙරදවස, අතීතකාලයෙහි; නොයෙක් කප්කෙළ සුවහස, අනේක කල්පකොටි ශතසහස්‍රයෙහි; කද පිළිවෙල, ස්කන්ධපරිපාටියෙහි; වෙසෙස, විශේෂයෙන්; නිසිලෙස, යොග්‍යාකාරයෙන්; දකින, දකින්නාවූ; සඟ, මහා) සංඝයා; පිරිවරය, (උන්වහන්සේගේ) පරිවාරවූසේක.

220 දෙරණ, ධරණියෙහි; පස්, පාංශු (රාශිය) ලක්තිබතත්, ලක්‍ෂාස්ථාපනය කරතත්; මදයයන, මන්‍දයකියන්නාවූ; අපමණ, අප්‍රමාණවූ; මහනුවණ, මහත්වූඥානයන්; ලැබගණ, ලාභිව; මහසඟගණ, මහාසංඝසමූහයෝ; මුනිඳුවෙත, මුනීන්‍ද්‍රයන්සමීපයෙහි; සිටිති, සිටිත්ය

221 මුළුලොව, සකල ලෝකයෙහි; හැම්දෙසේ, සියලු දිශාවන්හි; සත, සත්වයන්ගේ; සිත, චිත්තයන්; සිතසේ, සිත්වූපරිද්දෙන්; දක්නා, දක්නා; දිවඇසේ, දිව්‍යඅක්ෂින්; ලැබගණ, ලාභිව; මහසඟහු, මහාසංඝසමූහයෝ; ඔහුදෙපසේ, උන්වහන්සේගේ උභය පාර්ශ්වයෙහි; සිටිති, සිටිත්ය.

222 සුර බඹලොව, දිව්‍යබ්‍රහ්මලෝකයෙහි; සතන, සත්වයන්විසින්; හැනතැන, තන්හි තන්හි; කියන, කථනය කරනු ලබන්නාවූ; හැමබස්, සියලු වචන; දිවකන්ලැබ, දිව්‍යකර්ණලාභිව; අසන, ශ්‍රවණය කරන්නාවූ; සඟගණ, සංඝසමූහයා; එමුනිවෙත, ඒ මුනීන්‍ද්‍රයන් සමීපයෙහි; වැජඹෙන, විජෘම්භමානවෙත්ය.

---

* මුනි පිරිවර; † එමුනි වෙත.

223 කෙලෙසුත් දුරැර සි ත
විදසුත් මඟින් ලැබූ සෙ ත
පිත්කෙත් වන දිය ත
පසිදු* සඟගණ එමුනි සඳු වෙ ත

| 224 | | 227 | |
|---|---|---|---|
| පහද තමත් සි | ත | ගමනොත මුනිඳු | තා |
| මුදුනැඳිළි බැඳ වැඳි ස | ත | සුරිඳු† රජ සිරිඳු | තා |
| ලත සගමොක් සැප | ත | සිබිල් තල සිද | තා |
| එමුනිවෙත මෙවැනිසඟගණඇ ත | | සලති සුදුසිනිඳු වල් විදූ | තා |
| 226 | | 228 | |
| මහබඹු මුනිඳු | ට | මුනිසඳු වඩින තැ | න |
| සේසත් නගති මුදුන | ට | දිව මල් දිව පහන් ගඟ | න |
| එමුනිසඳු පුදය | ට | පුදකරති වෙන වෙ | න |
| පිඹිති සක් සක් දෙවින්දෙ සි | ට | දහස් සුවහස් පමණ සුරග | න |

223 සිත, චිත්තයෙහි; කෙලෙසුන්, කෙලශයන්; විදසුන් මගින්, විදශීනාමාගීයෙන්; දුරැර, දුරුකොට; සෙතලැබූ, ශාන්තිලැබූවාවූ; දියත, ලොකයාගට; පිත්කෙත්වන, පුණ්‍යක්ෂෙත්‍රවූ; පසිදු, ප්‍රසිඬවූ; සඟගන, සඞ්ඝසමූහයා; එමුනිසඳුවෙත, ඒ මුනිඳුහුමා සමීපයෙහි ඇත්තේය.

224 එමුනිවෙත, ඒ මුනිඳුහුමා සමීපයෙහි; තමත්සිත, තමන්ගේ චිත්තය; පහද, ප්‍රසන්නකොට; මුදුනැඳිළිබැඳ, මස්තකාඤ්ජලිබඬක ලකොට; වැඳිස, වැන්දවූසත්ත්වයන්;සගමොක්සැපත, ස්වර්ගමොක්ෂ සම්පත්තියට; ලත, පමුණුවන්නාවූ; මෙවැනි, මෙයාකාරවූ; සඟ ගණ, සඞ්ඝසමූහයා; ඇත, ඇත්තේය.

225 මහබඹු, මහාබ්‍රහ්මයෝතුමූ; මුනිඳුට, මුනීන්ද්‍රයන් වහන්සේ ගේ; මුදුනට, මස්තකයට; සේසත්, සෙතච්ඡත්‍ර; (සුදුකුඩ) නගති, නගත්ය; එමුනිසඳු, ඒ මුනීන්ද්‍ර උත්තමයාගට; පුදයට, පූජාපිණිස; සක්දෙවින්දෙ, ශක්‍රදෙවේන්ද්‍රයෝතුමූ; සිට, සිටියව; සක්පිඹිති, ශඞ්ඛධ්වනය කෙරෙත්.

226 තා, (ජිනෙන්ද්‍රනයන් නික්මවන හෙයින්) නායකවූ; මුනිඳු, මුනීන්ද්‍රයන් වහන්සේ; ගමනොත, (මාගීයෙහි වැඩමවීමට අවයිමණ කල්හි; රජසිරිඳුනා, (දිව්‍ය) රාජශ්‍රීය විඳිනය කරන්නාවූ; සුරිඳු, සුරෙන්ද්‍රයෝතුමූ; සබිල්තල, සිවිලුවූ සුලග; සිදුතා, විහිදුවන්නාවූ; සුදු, ශුභ්‍රවූ; සිනඳු, ස්නිග්ධවූ; වල්වදුනා, වාලව්ජනින්; සලති, වලන ය කෙරෙත්.

227 මුනිසඳු, මුනිඳුහුමා; වඩිනතැන, වැඩමවන්නාවූස්ථානයෙහි; දිවමල් දිවපහන්ගෙන, දිව්‍යපුෂ්ප දිව්‍යප්‍රදීපයන් ග්‍රහණයකොට; වෙන වෙන, වෙන් වෙන් වශයෙන්; දහස්සුවහස්පමණ සුරගන, සහශ්‍ර ලක්ෂසඞ්ඛ්‍යාත දිව්‍යසමූහයෝ; පුදකෙරෙති, පූජාකෙරෙත්ය.

* සඟගණය මුනිසඳු වෙත; † සදුසිර.

228 සිතුමිණ මෙන් ලොව ට
සපැමිණි මෙඅප මුනිඳු ට
සුරසෙන් සිට දෙපි ට
සලති පැහැ විහිදි මිණි තල්වැ ට

229
දෙව්සියෝ දිව ම ලින්
අසුරසෙන් සිත් පලො ලින්
දිව නාගී කඹු පු ලින්
*පිදූ නරවර උපුල් කම ලින්

230
සවණක් රැස් දිග ත
පැතිරෙයි බුදුන්ගේ ග ත
බඹලොව සිට බල ත
අවලෝකිතය උන් මුදුන ත

231
සැදි මුළු තුන් දිය ත
†විසිතුරු පෙනෙයි සරණ ත
රූසිරු සර සුග ත
බලත අමරස වැන්න නෙත නෙ

232
එළිපත මිටිව යෙයි
උඩළිපත හෝ උඩ යෙයි
සත සිත තුටුව යෙයි
මුනිඳු නොනැමිම ගෙට වැදයෙ යි

---

228 ලොවට, ලෝකයාහට; සිතුමිණමෙන්, චින්තාමාණික්‍ය මෙන්, සපැමිණි, සම්ප්‍රාප්තවූ; මෙඅප මුනිඳුට, මේ අපගේ මුනින්ද්‍රයාහට; සුරසෙන්, දිව්‍යසේනාවෝ; දෙපිටසිට, උභයපාර්ශ්වයෙහි සිටගෙන; පැහැවිහිදි, ප්‍රභාවිසර්ජිණිවන්නාවූ; මිණිතල්වැට, මිණිතාල වෘන්තයෙන්; (මිණිමුවා තල්පතින්) සලති, (පවන්) සලත්.

229 දෙව්සියෝ, දේවතාවෝ; දිවමලින්, දිව්‍යකුසුමයන්ගෙන්ද; අසුරසෙන්, අසුරසේනාව; සිත්පලොලින්, චිත්‍රපල්ලිපුෂ්පයන්ගෙන්ද; දිවනාගී, දිව්‍යනාගයෝ; කඹුපුලින්, කණේඩොත්පලයලින්ද; නරවර, මනුෂ්‍යරජහු; උපුල්කමලින්, කමලොත්පල වලින්ද; පිදූ, පූජාකළෝය

230 බුදුන්ගේ, සර්වඥයන් වහන්සේගේ; ගත, ශරීරයෙන්; සවණක්රැස්, ෂඩ්වර්ණරශ්මිය; දිගත, දිශාන්තයෙහි; පැතිරෙයි, ප්‍රසාරිතවේයි; බඹලොවසිට, බ්‍රහ්මලොකයෙහි සිටගෙන; බලත, අවලොකනය කලත්; උන්මුදුනත, උන්වහන්සේගේ මස්තකය; අවලෝකිතය, අවලොකනයකොට නොහැක්කේය.

231 සරණත, චරණ (යුග්ම) යෙහි; මුළු තුන්දියත, සියලු තුන් ලෝකයෙහි; සැදි, සර්ජිතවූ; විසිතුරු, විචිත්‍රයන්; පෙනෙයි, දෘශ්‍යමාන වේයි; සුගත, සුගතයන් වහන්සේගේ; රූසිරුසර, රූපශ්‍රීසාරය; බලත, අවලෝකනය කරන කල්හි; නෙත නෙත, නෙත්‍රයක්පාසා; අමරසවැන්නා, අමෘත රසමෙනි.

232 එළිපත, දෙහලිය; මිටිවයෙයි, මිටිවන්නීය; හෝ, නැත හොත්; උඩළිපත, නාසාදාරුව; උඩයෙයි, උස්වන්නේය; සත, සත්වයන්ගේ; සිත, චිත්තය; තුටුවයෙයි, තුටුවන්නේය; මුනිඳු, මුනීන්ද්‍රයන් වහන්සේ; නොනැමිම, ඍජුවම; ගෙවැදයෙයි, ගෘහයට ප්‍රවිෂ්ට වනසේක.

---

* "පිදූගිරිතුරු උපුල්කමලින" යයි බොහෝ පොත්වල- දක්නා ලැබේ.

† පිළිරූ

233 නාරඹා එක් දිග  ත
මුනිඳුන් දහම් පවස  ත
සිටි අය දස දි ග  ත
දකින් අප මුනිසඳුන් උවන  ත

23
සදහම් දෙසන ස  ඳ
නිකුත් කටහඬ මන න  ඳ
කුරවි නදට න  ඳ
වඩා දහසක් ගුණෙනත් වෙයි න  ඳ

235
සක්වළ නුබ දෙර  ණ
පිරුණු දියකඳ සහර  ණ
කියහැකි දුන පම  ණ
*පමණ නැත අප බුදුන්ගේ ගු  ණ

236
මෙතනට මේ ව  ටී
කියන උතුරක් නුදු  ටී
එගනිති වැද වැ  ටී
එමුනිඳෙ† තුන්ලොවට බුහු  ටී

237
සේ පොහොසේ කම්ප  ල
ඇ ඇවිතැත්හි හැමක  ල
පවත් නුවන බ  ල
එමුනි දසබලය ඉන් එම්බ  ල

---

233 මුනිඳුන්, මුනීන්ද්‍රයන් වහන්සේ; එක් දිගත, එක් දිශාවක්; නරඹා, බලා; දහම්, ධර්මය; පවසත, ප්‍රකාශකරනකල්හි; දසදිගත, දශදිශාවෙහි; සිටිඅය, සිටියාහු; අපමුනිසඳුන්, අප මුනිඋතුමාණන්, ගේ; උවනත, වක්ත්‍රය; (මුහුන) දකිත්, දක්නෝමය.

234 සදහම්, සද්ධර්මය; දෙසනසඳ, දෙශනාකරන කල්හි; නිකුත්, නිෂ්ක්‍රාන්තවූ; මනනඳ, මනානන්දනීයවූ; කටහඬ, මුඛශබ්දය; නඳ, නන්දනීයවූ; කුරවීනදට, පරපුටු නාදයටත්; වඩා, අධිකවූ; දහසක් ගුණෙන්, සහශ්‍රගුණයෙන්; නැඳෙවෙයි, සතුටු එලවන්නේවෙයි.

235 සක්වළ, චක්‍රවාටයෙහිද; නුබ, ආකාශයෙහිද; දෙරණ, ධරණියෙහිද; සහරණ, සතරමහා සාගරයෙහිද; පිරුණු, පිරුණාවූ; දියකඳ, ජලස්කන්ධය; පමණදුන, ප්‍රමාණ ජානනයකොට; කියහැක්, කථනයකොට හැක්කේය; (එසේද නමුත්) අපබුදුන්ගේ, අපසර්වඥයන් වහන්සේගේ; ගුණ, ගුණය; පමණනැත, ප්‍රමාණයක් නොමැත්තේය.

236 මෙතනට, මේ ස්ථානයට; මේවටී, මෙය වටනේයයි; කියන, කියන්නාවූ; උතුරක්, (විරුඩව) උත්තරයක්; නුදුටී, නොදුටු; ඒ, ඒ උදුල පවනයම්; වැදවැටී, නමස්කාරකොට පතිතව; ගනිති, ගුණය කෙරෙහි; (එසේ හෙයින්) තුන්ලොවට, ‡ ත්‍රිවිධලෝකයෙහි; බුහුටී, දක්කාවූයේ (ඒම්) එමුනිමය, ඒ මුනිඋතුමාමැයි,

237 සේ පොහොසේ කම්පලඇ, ස්ථාන අස්ථාන කර්මඵලාදිවූ; හැමතන්හි, සකලස්ථානයෙහි; හැමකල, සියලුය කාලයෙහි; නුවනබල, ඥානබලය; පවත්, පවත්නේය; එම්බල, පින්වත්නි; ඉන්, එසේ හෙයින්; එ මුනි, ඒ මුනිඳු; දසබලය,× දසබලධාරනම් වහන්සේක.

---

* පමණ නොකැළැක් එමුනිසඳ ගුණ;  † මුළුලොවට.
‡ කාම, රූප, අරූප යන ත්‍රිවිධලෝකයයි;  × කාලාවක ආදි දස ඇත්කුලයන්ගේ ශක්තියෙන් කායබල දසයක් හා ඨානා ඨාන ඥානය ආදී ඥානබල දසයක්දවේ.

238 කිසිවෙකුට ලොව ඇති
දුකක් නොකරණු මිසනිති
එමුනිසඳ රුව ඇති
*ඇතුන් කෙළසුවගසක බල ඇති

239
දිව්කුරු බුදුන් කල
පටන් විනෑතක් දසබල
මෙසතර අසෙකි කල
නොකෙළෙ එකලපතකුත් නිස්පල

240
දිසි ඇමතැන අහස
පමණකළහැකි තුරුරැස
මුනිසඳු පෙර දවස
පමණනැත යදියන්ට දුන් ඇස

241
පරයා පොළොව පස්
දුන් යදියන්ට ඇඟ මස්
ඔහු දනට දුන් ඉස්
විය මහමෙර ගිරිසිරට උස්

242
දිව්කුරු බුදුකෙරේ
පටන් බුදුවනා අතරේ
දුන් ලෙයට සිරුරේ
මදය දියකඳය සිවුසයුරේ

---

238 ලොව, ලෝකයෙහි; ඇති, ඇත්තාවූ; කිසිවෙකුට, කිසිම සත්ත්වයෙකුට; නිති, නිත්‍යයෙන්; දුකක් නොකරණු මිස, දුකක් නොකරන්නේවීනමුත්; රුවඇති, රූපවත්තාවූ; එමුනිසඳ, ඒ මුනීන්ද්‍රයන් වහන්සේ; ඇතුන් කෙළසුවගසක, හස්තීන් සම්බන්ධවූ කොටිලක්ෂයක් හුගේ; බලඇති, ශක්තිය ඇතිසේක.

239 දිව්කුරු බුදුන් කල පටන්, දීපඞ්කර සර්වඥයන් වහන්සේගේ කාලයෙහි පටන්; දසබල වනතෙක්, බුදුවීමදක්වා; මෙසතර අසෙකි කල, මේ සාරාසංඛ්‍යලක්ෂකාලය මුළුල්ලෙහි; එකලපතකුත්, එකම උත්පාතියක්වුත්; නිස්පල නොකෙළෙ, නිෂ්ප්‍රයෝජන නොකළසේක.

240 අහස, අවකාශයෙහි; ඇමතැන, සකලස්ථානයන්හි; දිසි, දෘශ්‍යමානවූ; තුරුරැස, තාරකාරාශිය; පමණකළහැක, ප්‍රමාණකොට සැයහැක්කේය; (එසේද නමුත්) මුනිසඳු, මුනිඳුතුමා; පෙරදවස, අතීතකාලයෙහි; යදියන්ට, යාචකයන්ට; දුන්ඇස, දානයකළාවූ අක්ෂීන්ගේ; පමණනැත, ප්‍රමාණයක් නොමැත්තේය.

241 පොළොව, මෙදිනියගේ; පස්, පාංශුරාශිය; පරයා, පරදවා; යදියන්ට, යාචකයන්ට; ඇඟමස්, ශරීරමාංස; දුන්, දානයකළසේක; ඔහු, උන්වහන්සේ; දනට, දානය පිණිස; දුන්ඉස්, දානයකළාවූ හිස්; මහමෙරගිරිසිරට, මහාමේරුපර්වත ශිඛරයටත්වඩා; උස්විය, උස්වූයේය.

242 දිව්කුරුබුදුකෙරේපටන්, දීපඞ්කරසර්වඥයන්වහන්සේගේ කාලයෙහි පටන්; බුදුවනාඅතරේ, බුදුවීමදක්වා; සිරුරේ, ශරීරයෙන්; දුන්ලෙයට, දානයකළාවූ රුධිරයට; (උපමාකරතහොත්) සිවුසයුරේ, සතර (මහා) සාගරයෙහි; දියකඳය, ජලස්කන්ධය; මදය, මඳවැයි.

---

* "ඇතුන් කෙළදහසකට බල ඇති" මෙසේ උවහොත් කාව්‍ය හැලපේ, අදහසටද විරුඬ නොවේ. ඇතුන්, හස්තීන්; කෙළදහසකට, කොටි සහශ්‍රයක්හුගේ; බලඇති, ශක්ති ඇතිසේක. පැරණිපොත්වල මෙසේ තිබුණ බැවින් අපිදු එසේම යෙදීමු. නමුත් "ඇතුන්කෙළදහසකට බලඇති" යන අපේ කියමන ධර්මප්‍රදීපිකාවේද එකඟවේ. ඇත්ගණනින් පිළිවෙළින් ගුණකර බැලියයුතු.

243 අපමුනි සස ක ලේ
දුන් දනට නොව සස ලේ
දෙව්දු ඇඳි සස ලේ
දනුත් පවතීය සිසි මඬ ලේ

244
බුදුබල මින් දු තේ
නොකිවත් බොහෝ මෙතැ තේ
වටුවද උත්තැ තේ
මෙකප ගිනිනොනැගනීය එව තේ

245
වඳුරැව උපන්ක ල
කළ අදිටනින් දසබ ල
පුරැක්බව දඹුව ල
දනුත් තැත්තේය උත් උත් ව ල

246
වඳුරැව මහ වන ත
මිනිසෙකු වලින් ගොඩල ත
එමෙකා තම මර ත
ඔහුට මගැ කෙළේ මහමෙ ත

247
පියරද යෙදූ ව ද
කම්කරු කරන ඉස්සි ද
මවවලපිත වැළ ද
කෙළේ සමමෙතම සත්මැසිව ද

---

243 අපමුනි, අපසර්‍වඥයන් වහන්සේ; සසකලේ, සාවඋපන්කල්හි; සසලේනොව, වඤ්චල නොවී; දුන්දනට, දුන්නාවූ දානයට, (සතුටුව) දෙව්දු, (ශක්‍ර) දේවෙන්‍ද්‍රයා; ඇඳී, ආලේඛ්‍යකළ වූ; සසලේ, සසලාඤ්ඡනය; (සාවාගේ රුව) දනුත්, මේ වර්‍තමාන කාලයෙහිත්, සිසිමඬලේ, චන්‍ද්‍රමණ්ඩලයෙහි; පවති, පවත්නේය.
(සසජාතකය බලනු)

244 මෙතැනේ, මේ ස්ථානයෙහි; බොහෝ, බහුලව; නොකිවත්, නොකීයේ නමුත්; මින්, මෙපමණකින්ම; බුදුබල, සර්‍වඥයන් වහන්සේගේ ශක්තිය; දුනේ, අවබොධවන්නේය; වටුවද, වර්‍තකයෝනි යෙහි උත්පාදිතව; එවතේ, එවතයෙහි; උත්තැනේ, උත්තාවූස්ථානය; මෙකප, මේ කල්පය මුළුල්ලෙහි; ගිනිනොනගනීය, ගින්නක් හටනොගන්නේමය;-(වට්ටකජාතකය බලනු)

245 දසබල, දසබලධාරීන් වහන්සේ; වඳුරැව, වානරයෝනි යෙහි; උපන්කල, උපන්කල්හි; කළඅදිටනින්, කළාවූ අධිෂ්ඨාන යෙන්; බවදඹුවල, බට්ලීවල; උත්, උන්වහන්සේ; උත්වල, විස්ත්‍ර්‍රිත යෙහි; දනුත, මේ කාලයෙහිත්; පුරුක්නැත්තේය, පර්‍වනොමැත් තේය;-(නලපාන ජාතකය බලනු.)

246 මහවනත, මහාවනයෙක්හි; වඳුරැව, වානරව; මිනිසෙකු; මනුෂ්‍යයෙකු; වලින්, අවාටයෙන්; ගොඩලත, ගොඩගත්කල්හි; එමෙකා, ඒමනුෂ්‍යයා; තමමරත, තමන්ට වධකරනකල්හිත්: ඔහුට, ඔහට;මගපෑ, මාර්‍ගය පෙන්නා; මහමෙතකෙළේ, මහා මෛත්‍රිය ම කළසේක;-(මහාකපි ජාතකය බලනු.)

247 පියරද, පීතෘරාජයා විසින්; යෙදූ, යොදනලද්දාවූ; කම්කරු, කර්‍මකාරතෙම; (වදකයා) ඉසසිඳ, ශිරශ්ඡේදනයකොට; වදකරත, වධකරණ කල්හි; මව, මාතෘව; වැළද, ආලිඞ්ගනයකොට; වලපිත, වලප්නා කල්හි; සත්මැසිවද, (උපපත්තියෙන්) සත්‍මාසිකාවද; සමමෙතකෙළේ, සමමෛත්‍රිය කළසේක; (ධම්පාලජාතකය බලනු)

248 ගුණයක බුදු ත් තේ
සිව්නිරිඳුව උප ත් තේ
ඇස් උපුට දු ත් තේ
සිතනි පිරි සන්තොසම් දු ත් තේ

249
පුණ්ණයක ගෙණ දම ත
විදුරුපඬි කල එසුග ත
ගලසැට යොදුනු සැ ත
වැටෙන අතුරෙහිගණත් දූතගත

250
ගිජ්ඳුව මුනිසෙත ළ
විදිවැද්දවුව සිවච ළ
සියතිත් කපා ද ළ
දුත්තෙසතොසිත් සවන් පැහැද

251
දිවනයිවද තොම ද
වදකර රූගත ගතවි ද
ඇතද දිව විස තෙ ද
රූගැණිතොව සිල්ම රැක්කේවද

252
මහජනකව පව ර
නැසුනු තුරු දූක පල බ ර
සපිරි රජ සිරි හැ ර
ගොසිත් වනවැද කෙළේ තවසර

---

248 බුදුත්තේ, සර්වඥයන් වහන්සේගේ; ගුණයක, ගුණයක් නම්; සිව්නිරිඳුව, සිවි නම් නරෙන්ද්‍රව; උපන්තේ, උත්පාදවූ (බෝසත්තෙම;) ඇස්උපුට දුන්තේ, නෙත්‍රොත්පාටනයකොට දුන්තේ; සිතනි, චිත්තයෙහි; පිරිසන්තොසම; පිරුණාවූ සන්තොෂයම; දුන්නේ, දානයකෙළේය;-(සිවිජාතකය බලනු)

249 එසුගත, ඒසුගතයන් වහන්සේ; විදුරුපඬිකල, විදුරනම් පණ්ඩිතව උපන් කල්හි; පුණ්ණයකු, පූර්ණකනම් යක්ෂයා; ගෙණ, ග්‍රහණයකොට; දමත, දැමූකල්හි; සැටයොදුන් උසැත, සටඨියෝජනු බෙබඩවූ; ගල, ශෛලයාගේ; ගණත්, (යොදුන්) ගණන; වැටෙන අතුරෙහි, පතිතවන්නාවූ අන්තරයෙහි; දූතගත, දූතවදළසේක;-
(විදුරජාතකය බලනු)

250 දිවනයිවද, දිව්‍යනාගව උපන් වාරයෙක්හිද; (භූරිදත්තව උපන්කල්හි;) තොමද, බොහෝවූ; වදකර, වධකොට; ගත, ශරීරය; විද, ව්‍යාධනයකොට; රූගත, ග්‍රහනයකළ කල්හි, දිවවිසතෙද, දිව්‍යවිෂතෙජස්; ඇතද, විද්‍යමාන වුවත්; රූගැණිතොව, (ඕනුකෙරෙහි) අකොපිව; සිල්ම, ශීලයම; රැක්කේවද, (නොබිද) ආරක්ෂා කළේමය;-(භූරිදත්ත ජාතකය බලනු.)

251 සෙතල, නිර්වාණය ප්‍රකාශකොට වදාළාවූ; මුනි, සර්වඥයන් වහන්සේ; ගිජ්ඳුව, (ඡද්දන්ත නම්) ගජෙන්ද්‍රව (උපන්කල්හි;) වල, ආවාටයෙහි (සැඟවී) සිට, සවිතව; විදිවැද්දවුව, විදිනාලද වැද්දා හට; සවන්පැහැ, ෂඩ්වර්ණ ප්‍රභාවෙන්; දුළ, බබලන්නාවූ; දළ, දන්තයන්; සියතින්, ස්වහස්තයෙන්; (තන්නාලද සියතින්) කපා, ඡේදනයකොට; සතොසින්, සන්තොෂයෙන්; දුන්තේ, දානයකළේ;-
(ඡද්දන්ත ජාතකය බලනු)

252 පවර, උත්තමවූ; මහජනකව, මහා ජනකනම්; (රජව) උපන් කල්හි; පලබර, ඵලභරිතවූ; නැසුණු නැසුණාවූ; තුරු, වෘක්ෂය; දූක, දර්ශනය කොට; සපිරි, සම්පූර්ණවූ; රජසිරි, රාජශ්‍රීය; හැර, දුරුකොට; ගොසින්, ගමනයකොට; වනවැද, වනයට ප්‍රවිෂ්ටව; තව්සරකෙළේ, තපශ්චර්යා කළසේක;-(මහාජනකරාජ ජාතකය බලනු.)

253 මුවරදඹ මුනිවි රැ
විද විද දුවනා නරවි රැ
වැටුණ වල ගැඹු රැ
බලා ගොඩලා කෙළේ බඹ දූ රැ

254
වඳුරැව එතර ග ග
පැන වේවැලක් බැඳ ඉ ග
වානර සෙන් සම ග
ගඟින් එතරව යත්ට කෙළෙම ග

255
මැස්සෙකු බොනා විත ර
*ලෙහෙයෙන් නොසොල්වාවෙ ර
මහඔසු පඬිව පෙ ර
දිනී දඹදිව රජුන් එකව ර

256
සීලව රදව ර දූ
නුවර ගෙනෑ රුපු නරනි දූ
මහවද කරන රැ දූ
කෙළේ තම සිත සිල්ම පිරිසි දූ

257
බලව සත සිත ර ග
පැවසූ දහම් මනර ග
සිදුකර සැප සස ග
සිටිය පස්වාදහස් එකර ග

---

253 මුනිවිරු, සර්වඥවීරයා; මුවරදව, මෘගරාජත්ව; (උපන් ව රෙක්හි) විද විද, විදිමින්; දුවනා, ධාවනයකරන්නාවූ; නරවිරැ, නරවීරයා; වැටුණ, පතිතවූ; ගැඹුරැ, ගම්භීරවූ; වල, ආවාටය; බලා, නිරීක්ෂණයකොට; ගොඩලා, ඵලසථානයෙහිකෝට; බඹදුරැ කෙළේ, බිඝ පහකෙළේය;-(මිගරාජ ජාතකය බලනු)

254 වඳුරැව, වානරව; (උපන්කලෙක්හි) ගඟඑතර, ගඟින් එගොඩව; පැන, පක්ඛන්දනයකොට; ඉග, කටියෙහි; වේවැලක්, වෙත්‍රලතාවක්; බැඳ, බන්ධනයකොට; වානර සෙන් සමග, වඳුරැ සේනාව හා; ගඟින්, ගංගාවෙන්; එතරව යත්ට, එගොඩවී යනුපිණිස; මග කෙළේ, මාර්ගයක් කළසේක;-(මහාකපි ජාතකය බලනු)

255 පෙර, පූර්වයෙහි; මහඔසුපඬිව, මහෞෂධ පණ්ඩිතව; (උපන් කල්හි) වෙර, ශරීරයෙහි; මැස්සෙකු බොනාවිතර, මක්ෂිකාවක් පානය කරන පමණවත්; ලෙහෙයෙන්, රුධිරයෙන්; නොසොල්වා, වෙන නස නොකොට; එකවර, එකැසිල්ලෙහි; දඹදිවරජුන්, ජම්බුද්වීපයෙහි රාජයන්; දිනී, ජයගත්සේක.-(උම්මග්ග බලනු)

256 සීලව රදවරදූ, සීලවනම් රජව උපන්කල්හිද; රුපුනරනිඳු, සතුරැ රාජයා; නුවරගෙන, නගරය ග්‍රහණයකොට; රුදු, රෞද්‍රවූ; මහවද, (පොළොවෙහි වැලලීම් ආදිවූ) මහාවධයන්; කරන, කරන කල්හිද; තමසිත, තමන්ගේ චිත්තයෙහි; සිල්ම, ශීලයම; පිරිසිදූ කෙළේ, පරිසුඬ කළසේක; (මහාසීලව ජාතකය බලනු.)

257 සත, සත්වයන්ගේ; සිතරහ, චිත්තානුකූලව; පැවසූ, ප්‍රකාශ කළාවූ; මනරග, මනොහරවූ; දහම, ධර්මය; සස, සවර්ගිකැපය සහිතවූ; සැප, සුඛසංඛ්‍යාත (නිර්වාණය) සිදුකර, සිඬකොට; පස්වාදහස්, වර්ෂ පන්දහසක්; එකරග, ඒකාකාරයෙන්; සිටිය, පවත්නේය; බලව, (මෙහිවශෙෂය) අවලොකණය කළ මැනව.

---

* ලෙහෙයක්.

258 බවදුක් විඳ තදි ති
සිටින සත දුක නොම දි ති
නොඩලම් යත සඳි ති
දනට අඹුදරුවන්ද බැඳ දු ති

| 259 | | 261 | |
|---|---|---|---|
| මගපල නියම කො | ට | ගණනක්ද අත | කින් |
| පැහැද ඔහු කී දහම | ට | නොගුණෙණ දෙයක් පොත | කින් |
| වන්සත මොක්පුර | ට | නොඇසා ඉවත | කින් |
| කියති සුවිසි අසංඛෙය ක | ට | මෙලොවද දුන නිවීය නිසැ | කින් |

| 260 | | 262 | |
|---|---|---|---|
| දූඩිබැල්මක් නෙ | තින් | රහසත් පවි නොකො | ට |
| මඳ දෙම්නසක් සිත | තින් | කෙලෙ සරයනුත් දුරුකො | ට |
| කිසි අවියක් අ | තින් | නිසිවුයෙන් පුද | ට |
| නොමගනමරසෙන්දිනියළුමෙ | ති | අරහ යෑ නම කියති මුනිඳු | ට |

---

258 තදිති, තදින්; බවදුක්, සංසාරදුක්ඛය; විඳ, විඳිනානොව; නොමදිති, බොහෝසෙසින්; සිටින, වාසයකරන්නාවූ; සත, සත්වයන්; දුක, දුශීණයකොට; නොඩලම් යත සඳිති, නොඩකරමැසි යත විතානයෙන්; දනට, දනය පිණිස; අඹුදරුවන්ද, පුත්‍රදාරුවන්ද; බැඳ දුති, බැඳදුන්සේක;-(වෙස්සන්තර ජාතකය බලනු.)

259 මගපල, මාර්ගඵලයන්; නියමකොට, නිශ්චයකොට; ඔහු, උන්වහන්සේ විසින්; කී, දෙශනා කරනලද; දහමට, ධර්මයට; පැහැද, ප්‍රසන්නව; මොක්පුරට, නිර්වාණපුරයට; වන්සත, පැමිණිසත්වයන්ගේ; (සඞ්ඛ්‍යාව) සුවිසිඅසංඛ්‍යකට, අසඞ්ඛ්‍යය විසිහතරකැයි; කියති, කථනයකෙරෙති

260 එ, ඒ මහාසත්වයන් වහන්සේ; නෙතින්, නෙත්‍රයෙන්; දූඩිබැල්මක්, නපුරුකොට බැලීමක් හෝ; සිතින්, චිත්තයෙන්; මඳ දෙම්නසක්, මඳවූදෞර්මනස්‍යයක් හෝ; අතින්, හස්තයෙන්; කිසි අවියක්, කිසිම ආයුධයක් හෝ; නොමගත, ග්‍රහණයනොකොට; මෙතින්, මෛත්‍රියෙන්; මරසෙන්, පාපීසේනාව; දිනිය, ජයග්‍රහණය කළසේක.

261 අතකින්, හස්තයකින්; ගණනක්ද, සඞ්ඛ්‍යාවක්ද; පොතකින්, පුස්තකයකින්; දෙයක්, (යම්කිසි ශාස්ත්‍ර) යක්ද; නොගුණෙණ, උද්ග්‍රහණය නොකොට; ඉවතකින්, බැහැරගිවුවෙකුගෙන්; නොඇසා, ශ්‍රවණයක් නොකොට; මෙලොව, මේලෝකය; නිසැකින්, ශඞ්කාරහිතව; දුන, අවබෝධකොට; නිවීය, නිවොකළසේක.

262 රහසත්, රහසින්වත්; පවිනොකොට, පාපයක්නොකොට; කෙලෙසරයනුත්, (සංසාර චක්‍රයාගේ) කෙලෙස් නැමැති අරයන්; දුරුකොට, දුරලා; පුදට, පූජාවට; නිසිවුයෙන්, සුදුසුවූහෙයින්; මුනිඳුට, මුනීන්ද්‍රයන් වහන්සේට; අරහයෑ, අරහං යන නාමය; කියති, කියත්.

263 තුන්කල්හිම පැව ති
පදරුත් සියල් ලොව ඇ ති
අතඹුලසෙ දැනග ති
එගින සම්මා සම්බුදුන යෙ ති

264
විද්දු නැණ අට ද
පසලොස් සරණ ගුණය ද
ඇතියෙන් එමුනි ස ද
පිරුණු විජ්ජා *සරණ නම්ල ද

265
යහපත්කොට යෙ තැ යි
සුන්දර තැනට සැප තැ යි
සොඳුරු බස් කිය තැ යි
කියති ඒ මුනි †සඳුට සුග තැ යි

266
තුන්ලොව තතු ලෙස ට
දැනගෙන නොදත් මෙලොව ට
දෙසුයෙන් නියම කො ට
ලෝකවිදූ යයි කියති මුනිඳු ට

267
හැම්ගුණයෙන් න ඳු
සම්පැඩිසතකු හැම ඳු
දියතෙහි නැති ස ඳු
අනුත්තරයයි කියති මුනි ඳු

---

263 තුන්කල්හිම, (භූත භවිෂ්‍යත් වර්තමාන යන) කාලත්‍රයෙහි; පැවති, පැවැත්තාවූ; ලොවඇති, ලෝකයෙහි ඇත්තාවූ; සියල් පද රුත්, සකල පදාර්ථයන්; අතඹුලසෙ, හස්තාමලකනියායෙන්; (අල්ලෙහි තිබූ නෙල්ලිගෙඩියක් සෙයින්;) දැනගති, අවබෝධකළසේක; එගින, එහෙයින; සම්මාසම්බුදුන, සම්මා සම්බුද්ධයයි; යෙති, කියත්.

264 විද්දු නැණ අටද, (විදර්ශනාඥානාදි) අෂ්ටවිද්‍යාඥානයන්ද; පසලොස් සරණගුණයද, (ප්‍රාතිමෝක්ෂසංවරශීලාදී) චරණගුණ පසළොසද; ඇතියෙන්, ඇතිබැවින්; එමුනිසඳ, එමුනි උතුමා; පිරුණු, පූර්ණවූ; විජ්ජාසරණ නම්ලද, විජ්ජාචරණ යන නාමය ලත්සේක.

265 යහපත්කොට, සොභනව; යෙතැයි, වැඩමවන හෙයින්ද; සුන්දර තැනට, සුන්දරවූ ස්ථානයට; (නිර්වාණට) සපතැයි, සම්ප්‍රාප්ත හෙයින්ද; සොඳුරුබස්, යහපත් වචන; කියතැයි, කියන හෙයින්ද; ඒ මුනිසඳුට, ඒසර්වඥයන්වහන්සේට; සුගතැයි, සුගතයයි; කියති, කථනයකෙරෙති.

266 × තුන්ලොව, ලෝකත්‍රය; තතුලෙසට, තත්වූ පරිද්දෙන්; දැනගෙන, පරිඥානයකොට; නොදත්, නොදත්තාවූ; මෙලොවට, මේ ලෝකයාහට; නියම්කොට, නිශ්චයකොට; දෙසුයෙන්, දෙශනා කළ හෙයින්; මුනිඳුට, මුනීන්ද්‍රයාහට; ලෝකවිදූයයි, ලෝකවිදූ කියා; කියති, කියත්.

267 නඳු, යහපත්වූ; හැමගුණයෙන්, සියලුගුණ හෙතුකොට ගෙන; සම, සමානවූද; වැඩි, අධිකවූද; සතකු, සත්වයෙකු; හැමසඳ, සියලු කාලයෙහිම; දියතෙහි, ලෝකයෙහි; නැතිසඳ, නැති බැවින්; මුනිඳු, මුනීන්ද්‍රයාට; අනුත්තරයයි, අනුත්තර කියා; කියති, කථනය කෙරෙති.

---

* චරණ, † ගජ්ජ, ‡ මාත්‍රාක්‍ෂයක් ඇතැම්

× මෙහි සංස්කාර අවකාශ යන ලෝකත්‍රය ප්‍රධානව.

268 බඹසුර යකුන් තා ද
දමනයකර තමන් ල ද
සෙත්දී මුනිඳුන ද
පුරිසදම්සාරති නම් ල ද

269
බවකතරින් එත ර
ලනුයෙන් සතන් හැමව ර
තිලෝගුරු මුනිව ර
විය සත්ථා නමින් පුවත ර

270
සිවුසස් සිය නැ ණින්
දූතදූත්විය කුළු ණින්
දුරලයි අනුව ණින්
එ බුදු නම් විය ගුණපම ණින්

271
*බෙදුවෙන් දහම් ක ද
බජනය කෙළෙන් ගුණක ද
බගදහමින් සස ද
බැවින් බගවත් විය මුනිය ද

272
රත්මිරිවැඩි ලෙස ට
වළංගොඩ නොවී එකවි ට
වැදනැගෙන මිහිපි ට
මෙවැනි දෙපතුල්ය අපමුනිඳු ට

---

268 තද, දැඩිවූ; බඹ, බ්‍රහ්මයා; සුර, දෙවිය; යකුන්, යක්‍ෂය යන මොවුන්; දමනයකර, දමනයකොට; (හික්මවා) තමන්ලද, තමන් වහන්සේ විසින් ලද්දවූ; සෙත්, ශාන්තවූ නිර්වාණය; දී, දනයකළ හෙයින්ම හෝ; මුනිඳුසඳ, මුනිඳුතුමා; පුරිසදම් සාරති, පුරිසදම්ම සාරථි යන; නම්ලද, නාමයලත්සේක.

269 සතන්, සත්වයන්; හැමවර, සියලුකාලයෙහි; බවකතරින්, සංසාර නැමති කාන්තාරයෙන්; එතරලනුයෙන්, එතරට පමුණුවන හෙයින්; තිලෝගුරු, තුන්ලෝ වැස්සාට ආචාර්‍ය්‍යවූ; මුනිවර, මුනි උතුමා; සත්ථා නමින්, සත්ථා යන නාමයෙන්; පුවතරවිය, ප්‍රසිද්ධ වූසේක.

270 සියනැණින්, සවකීය ඥානයෙන්; සිවුසස්, †චතුරාර්‍ය්‍යසත්‍යධර්ම සත්; දූත, අවබෝධකොට; කුළුණින්, කරුණාවෙන්; දූත්විය, ප්‍රකාශකළසේක; අනුවණින්, අනූනතාවයෙන්; දුරලයි, (සත්වයන්) දුරුකළසේක; එගුණපමණින්, ඒ ගුණයාගේ ප්‍රමාණයෙන්; බුදුනම විය, බුධ නම්වූසේක.

271 දහම්කඳ, ධර්මස්කන්ධය; බෙදුවෙන්, විභාගකළ බැවින්ද; ගුණකඳ, ගුණස්කන්ධය; බජනයකෙළෙන්, සේවනය කළහෙයින්ද; බග දහමින්, (ඓශ්වර්‍ය්‍යාදී) ෂට්භාග්‍යධර්මයෙන්; සසඳබැවින, සංසන්දන වූ බැවින්ද; මුනිසඳ, මුනිඋතුමා; බගවත්නම්විය, භගවා නම් වූසේක.

272 රත්මිරිවැඩිලෙසට, සවර්ණපාදුකාසෙයින්; වළංගොඩිනොවී (සුප්‍රතිෂ්ඨිතපාද ඇතිහෙයින්) වළංගොඩලිරනිනම්; එකාවට, එක්සමාණ යෙහි; මිහිපිට, පොළොව මතුයෙහි; වැදනැගෙන, ස්පර්ශවනැගෙන් නාවූ; මෙවැනි, මෙයාකාරවූ; දෙපතුල්, පාදයුග්මයක්; අපමුනිඳුට, අපසර්වඥයන් වහන්සේට ඇතිසේක.

---

* බෙදුයෙන්; † දුඃඛසත්‍යය, සමුදයසත්‍යය, නිරොධසත්‍යය, මාර්ගසත්‍යය, යන මේ චතුරාර්‍ය්‍ය සත්‍යයයි.

273 නැබ නිම් දිසි නිම ල
අරදහසකින් මනක ල
සියටක් රුවින් උදු ල
මෙවැනි රියසක් දෙසහා දෙපතු ල

274
පතුල සතරක් කො ව
බෙදුනෙන් එසක් විලුඹ ව
දිලි රත්පලස් ව ව
මලසිත් දිගු විලුඹ අපමුනිඳු ව

275
අඩුවැඩි නුවූ විත ර
ඉඟුල් පළසේ පැහැස ර
රතැඟිලිය මුනිව ර
මොළොක් දික්අක් සිහින් මනහර

276
පොළොමින් සියක් ව ව
පහන් ගිංතෙලෙහි ලූය ව
කපුපුළුනක් මෙලස ව
මොළොක් අත්පාය අපමුනිඳු ව

277
ඇදුරෙකු විසින් ක ළ
දුලකාවුළුසේ නිකස ළ
අතපය මුනි ළක ළ
ඇඟිලි සම අතුරු වෙයි පැහැදු ළ

---

273 නිමල, නිම්ලවූ; සැටක් රුවින්, එකසිය අටක් (මඞ්ගල) රූපයෙන්; උදුල, දෙපතුල බබලන්නාවූ (ශ්‍රී) පාදයුගලයෙහි; නැබ, නාභිචක්‍රයන්ද; නිම්, නෙමියන්ද; දිසි, දෘශ්‍යමානවූ; අරදහසකින්, අරසහස්‍රයකින්; මනකල, මනෝකල්‍යවූ; මෙවැනි, මෙවැනි ආකාරවූ; (චක්‍රලක්ෂණයෙන් යුක්තහෙයින්) රියසක් දෙකකි, රථචක්‍රයුගලයක සැටහන් ඇතිසේක.

274 පතුල, පාදතලය; සතරක්කොට, සතර කොටසක්කොට; එකක්, එක් කොටසක්; විලුඹව, පාෂ්ණිය ව; බෙදුනෙන්, බෙදූ තැනෙන්; අපමුනිඳුව, අප මුනීන්ද්‍රයාගේ; (ආයත පාෂ්ණිලක්ෂණයෙන් යුක්තහෙයින්;) දිගු, දික්වූ; විලුඹ, පාෂ්ණිය; රත්පලස්වැ, රත්කම්බිලිහුයෙන් කරණලද පසුම්බක්මෙන්; දිලි, බබලනසේක.

275 විතර, ප්‍රමාණයෙන්; අඩුවැඩිනුවූ, ඌනාධිකනොවූ; ඉඟුල් පළසේ, හිංගුලපලලවයක්මෙන්; (සාදිලිංගංපලුමෙන්) පැහැසර, ප්‍රභාසාරවූ; මුනිවර, මුනිඳුහුගේ; මොළොක්, මෘදුවූ; දික්, දීර්ඝාංගුලිතාලක්ෂණයෙන් යුක්තහෙයින්) දීඝවූ; අක්සිහින්, අසිත්කෘශවූ; මනහර, මනොහරවූ; රතැඟිලිය, රක්තාඞ්ගුලි ඇතිසේක.

276 සියක්වට; ශතවාරයක්; පොලමින්, පොළඹනයකොට; පහන්ගිංතෙලෙහි, ප්‍රසන්නවූ ගිංතෙලෙහි; ලූ, බහාලූවාලු; කපුපුළු නක්මෙලසට, කපුපුළුනක්මෙන්; අපමුනිඳුව, අපසර්වඥයන් වහන්සේගේ මොළොක් (මෘදුතලුනහස්තපාදලක්ෂණයෙන් යුක්තහෙයින්) මෘදුවූ; අත්පාය, හස්තපාද ඇතිසේක.

277 ඇදුරෙකු විසින්, වඩුආචාර්යයකු විසින්; කළ, කරනලද්දවූ; දුලකාවුළුසේ, ජාලකවාටයක් සෙයින්; මුනි, සර්වඥයන් වහන්සේගේ; නිකසළ, පවිත්‍රවූ; ළකළ, අලංකාරවූ; අතපය, හස්තපාදයන්ගේ; ඇඟිලි, අඞ්ගුලි; සමඅතුරුවෙයි, සමාන්තර වන්නේය. (ජාලහස්තපාද ලක්ෂණයෙන් යුක්තහෙයිනි.)

278 පිටිපස ඉදිරිපි ට
බැලුවත් දෙඅත් පරසි ට
සවිපුලු නෙපෙනෙනු නො ට
උස්වසිටි බොලවයද මුනිඳු ට

| 279 | | 281 | |
|---|---|---|---|
| මුලින් දල සිහින | ග | පියුම්පෙයි ඇතුල | ට |
| පටවෑටි මස් එකර | ග | වැද සිටින කෙම් විලස | ට |
| සොඳුරු ඇල් හැඹිර | ග | වැදසිටි කෑතුල | ට |
| කෙරෙසි මනදහ මුනිඳුයුගද | ග | පුරිස්ලකුණැත්තේය මුනිඳු | ට |

| 280 | | 282 | |
|---|---|---|---|
| දිලිමුනි දිවනෙ | තිත් | දුහිගුවලත් මැද | ළ |
| කුදුම්වි නොවී නිය | තිත් | ඔප්ලාබහා දිවද | ළ |
| නොනැම් සිට ග | තිත් | ගුරුපිරියම් ලක | ළ |
| දෙදන පිරිමදිනේය දූ | හිත් | මුනිඳුරුව රත්රුවෙව් නිකස | ළ |

278 පිටිපස, පිටිපස්සෙහිද; ඉදිරිපිට, ඉදිරියෙහිද; දෙඅත්පර, දෙපැත්තෙහිද; සිට, සිටගෙන; බලුවත්, අවලොකනයකළත්; සවිපලුනෙපෙනෙනුකොට, සවිපුලුදක්නා ස්කොට; මුනිඳුට, මුනිඳුන් වහන්සේගේ; උස්වසිටි, (උස්සඞ්ඛපාදලක්ෂණයෙන් යුක්තවූහෙයින්) උන්නතව සිටියාවූ; බොලවයද, ගුල්ඵයද ඇතිසේක.

279 මුල, මුලයෙන්; දල, මහත්ව; අග, අග්‍රය; සිහින්, සිහින්ව; එකරග, එකාකාරයෙන්; සොඳුරු, සුන්දරවූ; ඇල්හැඹිරග ගෙලීහි ... සෙයින්; මස්, මාංශ; පටවසිටි, (එනිජඞ්ඝලක්ෂණයෙන් යුක්තහෙයින්) පෘතපසිටියාවූ; මුනිඳු, මුනීන්ද්‍රයාගේ; දහයුග, ජඞ්ඝාද්වය; මනදහකෙරෙසි, මනොබන්ධනය කරනසේක.

280 දිවනෙතින්, දිව්‍යනෙත්‍රයෙන්; දිලි, බබලන්නාවූ; මුනි, සර්වඥයන් වහන්සේ; නියතින්, එකාන්තයෙන්; කුදුම්වීනොවී, කුබ්ජපාමනනොවී; ගතින්, ගාත්‍රයෙන්; නොනැමී, අවනතනොවී; සෘජුව; දූහින්, (ඨිතකො අනොනමන්ත ලක්ෂණයෙන් යුක්තහෙයින්) උභය හස්තයෙන්; දෙදනපිරිමදිනේය, ජානුයුග්මය පරිමර්දනය කරනසේක.

281 පියුම්පෙති ඇතුලට, පද්මපත්‍ර අභ්‍යන්තරයට; වැදසිටිනා ඇතුල්වන්නාවූ; කෙම්විලසට, කර්ණිකාවක් සෙයින්; කෑතුලට, සිරුර ඇතුලට; වැදසිටි, (කොෂොහිතවත්ථගුය්හ ලක්ෂණයෙන් යුක්තහෙයින්) ප්‍රවෙශවසිටියාවූ; පුරිස්ලකුණු, පුරුෂලක්ෂණය; මුනිඳුට, සර්වඥයන් වහන්සේට ඇත්තේය, ඇතිසේක.

282 මුනිඳුරුව, මුනීන්ද්‍රයන්ගේ රූපය; දුහිගුවලත්, ජාතිහිංගුල වැනිවූ; (සෑදිලිංගම්වූ) මැදල, මදිනයකොට හැරියාවූ; දිවදල, දිව දලයෙන්; බහා, සම්මර්ණයකොට; ඔප්ලා, ඔපදමා; ගුරුපිරියම්, ගුරුපරිකර්මයෙන්; ලකල, අලඞ්කාරකරනලද්දාවූ; රත්රුවෙව්, (සුවණ්ණවණ්ණ ලක්ෂණයෙන් යුක්ත හෙයින්) සුවණ්ණප්‍රතිමාවක් සේ; නිකසල, පදිප්‍රසේක.

283 අලපත දියමලස ව
දූලිතෙල් රජස් හැමවී ව
ගතනොරදන ලෙස ව
සියුම් සිවි ඇත්තේය මුනිඳු ව

284
දුටුවෙයි පෙමෙර් ම ය
දුක දුක රිසිනොයේ ම ය
මුනිඳු ඇඟ මරෝ ම ය
දෙකක් එකතැන නොසිටිමෙන් ම

285
නිල්මිණි රැස් තර ග
විහිදුවාසිටි මතර ග
හැමලොම් මුනිඳු ඇ ග
වලලු හීරාඩ බලාසිටි අ ග

286
නෙත නෙත පියකා රැ ම
තිරසර ගුණෙන්* විදු රැ ව
ලෙසින් මහබඹු රැ ව
මුදුව ඉරුදුව සිටි මුනි රැ ව

287
දෙඅත් පට පාපි ව
දෙවුරෙහි කඳෙහි තහරැ ව
නොපෙනෙන ලෙස උස ව
පිරුණු මස් ඇත්තේය මුනිඳු ව

---

283 අලපත, නෙලුම්කොළයෙහි; දියමලසව, ජලය (නොරඳනා) මෙන්; හැමවීව, සියලුමවිමලහි; දූලිතෙල්රජස්, මසිමෙතලධූලීන්; මුනිඳුව, සර්වඥයන් වහන්සේගේ; ගත, ශරීරයෙහි; නොරඳන ලෙසව, රඤ්ජනය නොවන පරිද්දෙන්; සියුම්සිවි, (සුවුමවණ්ණලක්ෂණ යෙන් යුක්තහෙයින්) සියුම්වූ ඡවිය; ඇත්තේය, ඇතිසේක.

284 දුව, දශීනයකලේනම්; පෙරේමයමවයි, ප්‍රෙමඋපදනේමය; දුක, දුක, දශීනයකොට කොටන්; රිසිනොයේමය, රුචියනොයන්නේමය; (එයාකාරවූ) මුනිඳුඇඟ, මුනිඥයාණන්ගේ ශ්‍රී ශරීරයෙහි; මරෝමය, රෝමයෝ; දෙකක් එකතැන නොසිටිනේමය, (එකෙක ලොමතාම ලක්ෂණයෙන් යුක්තහෙයින්) දෙකක් එකතැන හටනොගන්නේමය.

285 නිල්මිණිරැස් තරඟ, නීලමාණික්‍ය රශ්මි තරඞ්ගය; විහිදුවා සිටි, විසිනිකොට සිටියාවූ; මනරඟ, මනොඥවූ; මුනිඳුඇඟ, සර්වඥයන්වහන්සේගේ ශරීරයෙහි; හැමලොම්, සකලලොමයෝම; අග, අග්‍රය; (උද්ධගග ලොමලක්ෂණයෙන්යුක්තහෙයින්) උඩබලා ලොක නය කොට; වලලුනි, (දක්ෂිණා) වෘතවලයාකාරවී; සිටි, පවත්නේමය.

286 නෙත නෙත, නෙත්‍රයක්පාසා; පියකරුව, ප්‍රියඞ්කරව;තිරසර ගුණෙන්, සර්වසාරගුණයෙන්; විදුරුව, වජ්‍රජීවයමෙන්ව; මුනි රුව, මුනීන්ද්‍රරූපය; මහබඹුරුව ලෙසින්, (බ්‍රහ්මුජ්ජුගත්ත ලක්ෂණ යෙන් යුක්තහෙයින්) මහාබ්‍රහ්මයාගේ රූපයමෙන්; මුදුව, මෘදුවද; ඉරුදුව, සෘජුවද; සිටි, සිටිනාසේක.

287 මුනිඳුව, මුනීන්ද්‍රයන්වහන්සේගේ; දෙඅත්පිට, හස්තවයමතු යෙහිද; දෙපාපිට, පාදවයමතුයෙහිද; දෙවුරෙහි, උභයඅංශකූටයෙ හිද; කඳෙහි, ශරීරයෙහිද; තහරඇව, තහරුඇටයින්; නොපෙනෙන ලෙසව, නොපෙනෙන පරිද්දෙන්; උසව, උසවීව; පිරුණුමස්ඇත් තේය, මාංසයෙන් පූර්ණවූසේවෙයි; (සත්තුස්සදනම් ලක්ෂණයෙන් යුක්තහෙයිනි.)

---

* ඇදුරුව.

288 සිරදුගෙ හිමද ඬ
පිරුණුවන්වෙයි පෙරක ඬ
පෙරකඬද පසුක ඬ
පිරුණුවත මුනිඳුගේ* ලෝවැ ඬ

289

කවියෙහි පටන් කො ට
කඳට දක්වා සමකො ට
රත්පලසක් ලෙස ට
පිහිටි මස් ඇත්තේය මුනිඳු ට

290

මුලුතුන් ලෝ වි යත්
දනයන් කරන නොවි යත්
මුනිඳුන්ගේ ක යත්
දිගින් එකපමණවෙයි බඹ යත්

291

සදහම් දෙසන ව ර
නොසිපිලි නහර පැහැස ර
මෙන්රණ මිහිඟු බෙ ර
වටව මොනවට සිටි මුනික ර

292

මුනිසඳුගෙ උගු රා
සද්දහස් රසනහ රා
සිටියෙන් තුඩුපු රා
යැපෙයි මඳඅහරකින් සිරු රා

288 හිමදඬ, හිමාලය වනයෙහිදඬය විකරන්නාවූ; සිරදුගෙ, සිංහරාජයාගේ; පෙරකඬ, පූර්වඛණ්ඩය; (ඉදිරිපස), පිරුණුවන් වෙයි, පූර්ණවූයේවෙයි; ලෝවැඬ, ජගද්‍හිවෘඬිදායකවූ; මුනිඳුගේ, මුනීන්‍ද්‍රයාණන්ගේ; පෙරකඬද, පූර්වඛණ්ඩයද (ඉදිරිකොටසද); පසුකඬ, පසුභාගයද; පිරුණුවත, (සිංහපූර්වාර්ධකාය ලක්ෂණයෙන් යුක්තහෙයින්) සම්පූර්ණවූයේවෙයි.

289 කවියෙහිපටන්කොට, තුනවියෙහිසිට; කඳටදක්වා, ග්‍රීවාසම්යදක්වා, (බෙල්ලපිටිපස පිහිටි මුදුන්ඇටයෙහිමුලඇටය ලඟටවනතුරු) සමකොට, සමානකොට; රත්පලසක්ලෙසට, රක්තකම්බිලියක්මෙන්; මුනිඳුට, මුනීන්‍ද්‍රයන්වහන්සේට; පිහිටි, (මනාකොට) පිහිටියාවූ; මස්ඇත්තේය, (චිතන්තරංසලක්ෂණ යෙන් යුක්තහෙයින්;) මාංසඇත්තේය.

290 මුලුතුන්ලෝ, ලෝකත්‍රයමුලුල්ලෙහිවූ; වියත්දනයන්, ව්‍යක්තජනයන්; නොවියත්කරන, අව්‍යක්තකරන්නාවූ; මුනි ඳුන්ගේ, මුනීන්‍ද්‍රයන්වහන්සේගේ; කයත්, ශරීරයත්; දිගින්, දීර්ඝ ප්‍රමාණයෙන්; බඹයත්, ව්‍යාමයත්; එකපමණවෙයි, (න්‍යග්‍රොධපරි මණ්ඩල ලක්ෂණයෙන් යුක්තහෙයින්) එකපමණවන්නේය.

291 සදහම්දෙසනවර, සද්ධර්මදෙශනාකරනකල්හි; නහර නොසිපිලි, නහරඉල්පීමක්නොමැතිව; පැහැසර, ප්‍රභාස්වරවූ; රන්මිහිඟුබෙරමෙන, ස්වර්ණමෘදඞ්ගභෙරියක්මෙන්; මුනිකර, සර්වඥග්‍රීවය; වටව, වෘතව; මොනවට, මනාව; සිටී, (සමවත්තක්ඛන්ධලක්ෂණයෙන් යුක්තහෙයින්) පිහිටියේක.

292 මුනිසඳුගෙ, මුනිඋතුමාගේ; උගුරා, උගුරෙහි; සද්දහස් රසනහරා, හත්දහක්රසනහර; තුඩුපුරාසිටියෙන්, තුඩුපුරාසිටි හෙයින් (උගුරටතුඩුදීසිටිහෙයින්); සිරුරා, ශරීරය; මඳඅහර කින්, මන්දාහාරයකින්; යැපෙයි, (රසග්ගසග්ගිලක්ෂණයෙන් යුක්ත හෙයින්) යාපනයවෙයි (පොෂණයවෙයි.)

× සත්සියක්. *දියමැඬ.

293 දෙලොස්වක සඳු ගේ
මඬල හනු සිරදු ගේ
පරයා එකර ගේ
පිරුණුහනුදෙකය * මුනිරජු ගේ

294
පිහිටිදත් දෙතිස ට
දෙතිසක්වේය දනහ ට
උස්මිටිනොව රුව ට
පිහිටි දත්සතළිසෙක මුනිඳු ට

295
ගාඇතුලත් පිට ත්
සමකොට තුබූසක්ප ත්
විලසින් මුනිඳු ද ත්
සිටිය උස්මිටිනොවී මඳකු ත්

296
තෙලිතුඬකින් සොඳු රු
ඇඳි † සිරියලින් පිවිතු රු
මඳකුත් නොව සිදු රු
විදුරුසේ සිටිය දත් මුනිවි රු

297
සුදුරුස් මතර ගේ
ලෙසින් සුරගඟ තර ගේ
විහිදෙනදසදි ගේ
සතර දළදය මුනිසඳු ගේ

---

293 දෙලොස්වක, (පුරපස) දෙලොස්වක්හිවූ; සඳුගේමඬල, චන්ද්‍රමණ්ඩලයද; සිරදුගේ, මෘගරාජයාගේ; හනු, හනුවද; එක රගේ, එකාකාරයෙන්; පරයා, පරදවා; මුනිරජුගේ, මුනීන්ද්‍රයාගේ; පිරුණුහනුදෙකය, (සිංහහනුලක්ෂණයෙන්යුක්තහෙයින්) පූර්ණවූ දෙකපොලය ඇතිසේක.

294 දනහට, (අවශෙෂ) මනුෂ්‍යයන්ගේ; දෙතිසට, දෙහනු වෙහි; පිහිටිදත්, ප්‍රතිෂ්ඨිතදන්තයෝ; දෙතිසක්වේය, තිස්දෙ කක්වෙත්මය; මුනිඳුට, සර්වඥයන්වහන්සේගේ; උස්මිටිනොව, උස්මිටිනොවී (සමව); රුවට, යථාපත්ව; පිහිටිදත්, සුප්‍රතිෂ්ඨිත දන්තයෝ; සතළිසෙක, (චත්වාළිසදන්තලක්ෂණයෙන් යුක්ත හෙයින්) චත්වාළිසයක්වෙති.

295 ඇතුලත්පිටත්ගා, බාහිරාභ්‍යන්තරයසුඬකොට; සමකො ටතුබූ, සමකොටහබනලද; සක්පත්විලසින්, සඞ්ඛපත්‍රමෙන්; මුනි ඳුදත, මුනීන්ද්‍රයන්වහන්සේගේදන්තයෝ; මඳකුත්, ස්වල්පයකුත්; උස්මිටිනොවීසිටිය, (සමදන්තලක්ෂණයෙන් යුක්තහෙයින්) උස් මිටිනොවීසිටිත්ය; (සමවපවතිත්.)

296 සොඳුරු, සුන්දරවූ; තෙලිතුඬකින්, තෙලිකූරකින්; පිවි තුරු, පවිත්‍රවූ; සිරියලින්, සිරියල්සායමෙන්; ඇඳි, අඳිනලදඉරි සේ; මඳකුත, ස්වල්පයකුත; සිදුරුනොව, ඡිද්‍රානොව; මුනිවිරු, සර්වඥවිරයාගේ; දත්, දන්තපඞ්ක්තිය; විදුරුසේ, වජ්‍රමෙන්; සිටිය, (අවිවර දන්තලක්ෂණයෙන් යුක්තහෙයින්;) සිටිතවේ.

297 සුරගඟ, මන්දාකිනීයගේ; (අගස්ගඟේ); තරගේලෙසින්, රළමෙන්; මතරගේ, මනොගරවූ; සුදුරුස්, සෙවතරශ්මිය; දස දිගේ, දසදිශායෙහි; විහිදෙන, විහිදෙන්නාවූ; මුනිසඳුගේ, මුනි උතුමාගේ; සතරදළදය, (සුක්ලදාඪාලක්ෂණයෙන් යුක්තහෙ සින්;) දාඪාධාතු සතරනමක්වෙති.

---

* මුනිසඳුගේ. † හිරිලෙසින් පැහැතුරු.

298 දිගපා දෙකන් සි ළු
මොලකදක්වා තැහැතු ළු
පලලින්* මූවමඩ ළු
වසන දිවමුනිසඳුගෙ පැහැදු ළු

299
පුරවීකෙවිලිහ ඬ
මියුරුසි කියන බසමැ ඬ
දෙවාතුති තුඩ තු ඬ
පවතිනෙය මුනිසඳුගෙ කටහ ඬ

300
ඉඳුනිල්මැණිකර ස
සරිකොට නොකිය හැකිලෙ ස
වඩවන සත සතො ස
පහන් නිල්පැහැය මුනියුවලැ ස

301
එකෙණෙහි මනර ගේ
උපන් රතුවස්සෙකු ගේ
ඇසිපිය ගුලිර ගේ
පහන් ඇස්ගුලිය මුනිසඳුගේ

302
ඇද රියනක් දිග ට
හළ සඳමඩලසේව ට
බැමමැද නලල් පි ට
දිලෙන උණ්ණලොමිය අපමුනිඳු

---

298 දිගපා, දීර්ඝවූප්‍රකාශකොට; දෙකන්සිළු, කන්සිදුරුදෙකද; මොලකදක්වා, මෘදුබවප්‍රකාශකොට; තැහැතුළු, නාසිකාභ්‍යන්තරයද; පලලින්, පෘථුලබවප්‍රකාශකොට; මුවමඩළු, මුඛමණ්ඩලයද; වසන, ඡාදනයකරන්නාවූ; මුනිසඳුගේ; මුනිඋතුමාගේ; පැහැදුළු, ප්‍රභායෙන්බබලන්නාවූ; දිව, (පහූතජිව්හාලක්ෂණයෙන් යුක්තහෙයින්) ජිව්හාධාතුඇතිසේක.

299 පුරවීකෙවිලිහඬ, පරපුටු (කොවුල්) නාදය; මියුරුසි; කියන, මධුරයකියන්නාවූ; බස, වචනය; මැඩ, මැඩපවත්වා; තුඩතුඩ, මුඛයක්පාසා; දෙවාතුති, සතුටිදෙවමින්; මුනිසඳුගේ; ඍෂීන්ද්‍රෝත්තමයාගේ; කටහඬ, මුඛශබ්දය; පවතිනෙය, (බ්‍රහ්මස්සර ලක්ෂණයෙන් යුක්තහෙයින්) පවත්නේමය.

300 ඉඳුනිල්මැණික, ඉන්ද්‍රනීලමාණික්‍යයකගේ; රස, රශ්මිය සරිකොට, සමානව; නොකියහැකිලෙස, කියනොහැකිපරිද්දෙන්; සත, සත්වයන්ගේ; සතොසවඩවන, සන්තෝෂය වර්ධනය කරවන්නාවූ; මුනි, මුනීන්ද්‍රයාණන්ගේ; යුවලැස, අක්ෂියුගමය; පහන්, ප්‍රසන්නවූ; නිල්පැහැස, (අභිනීලනෙත්තලක්ෂණයෙන් යුක්තහෙයින්) නීල ප්‍රභාවඇතිසේක.

301 එකෙණෙහි; එඇසිල්ලෙහි; උපන්, උපන්නාවූ; මනරගේ, මනොඥවූ; රතුවස්සෙකුගේ, රක්තවර්ණ ගවපොතකයකුගේ; ඇසිපියගුලිරගේ, අක්ෂිගුලයුගමයක් බඳුවූ; මුනිසඳුගේ; මුනිඋතුමාගේ; පහන්, ප්‍රසන්නවූ; ඇස්ගුලිය, (ගොපඛුමලක්ෂණයෙන් යුක්තහෙයින්) අක්ෂිගොලයුවලයක් ඇතිසේක.

302 රියනක්දිගට, රතනප්‍රමාණව; ඇද; ආකර්ෂණයකොට; හළ, හැරියකල්හි; වට, වෘතවූ; සඳමඩලසේ, චන්ද්‍රමණ්ඩලයමෙන්; බැමමැද, භ්‍රෑමධ්‍යයෙහි; නලල්පිට, ලලාටයමතුයෙහි; අපමුනිඳුට, අස්මත්මුනීන්ද්‍රයාගේ; දිලෙන, බබලන්නාවූ; උණ්ණලොමිය (උණ්ණාලොමලක්ෂණයෙන්; යුක්තහෙයින්) ඌර්ණරෝමධාතුව; පිහිටිසේක.

---

*. ඹුළුතලල †. කුරව

303 දියබුබුලක් ලෙ          සේ
වටවගෙණ සිට සොඳ          සේ
නිල්මිනිරුස් ලෙ          සේ
බැබලි අප මුනිසඳුගෙ සිර සේ

304
මෙලෙසින් බුදුන් බ          ද
දෙතිසෙක ලකුණු මතන          ද
එබැවින් මුනිඳු ස          ද
පහන්තුරසේ දිලෙයි හැමස ද

305
නෙතැතිව උපන්          ජන
කරවන මනෝරං          ජන
මුනිඳුගෙ නිරං          ජන
අසුවෙක ඇඟෙහි අනුවැං ජන

306 තම වනදෙස නැමීඉස කෙනෙකු          න් නේ
දෙසවඳිනාලෙස නොනැමිය දෙ          න් නේ
තමයස තුතිකළ වනට දන          න් නේ
කලකත් පිරිදෙව් වැද්ද නොදෙ          න් නේ

---

303 අපමුනිසඳුගෙ, අප සර්‍වඥයන්වහන්සේගේ; සිරසේ, ශිර්‍ෂය; (හිස;) දියබුබුලක්ලෙසේ, ජලබුබ්බුලයක්මෙන්; සොඳසේ, යහපත්ව; වටවගෙණසිට, වෘතාකාරයෙන් සුප්‍රතිෂ්ඨිතව; නිල්මිනිරුස්ලෙසේ, නීලමාණික්‍යරශ්මියක්මෙන්; බැබලි, භ්‍රාජිතවී; (උණ්හීෂලක්‍ෂණයෙන් යුක්තහෙයිනි.)

304 මෙලෙසින්, මෙයාකාරයෙන්; බුදුන්බඳ, සර්‍වඥයන්වහන්සේගේශරීරය; දෙතිසෙකලකුණු,ඞාත්‍රිංසත්වරමහා පුරුෂලක්‍ෂණයෙන්; මතනද, මනොනන්‍දනයකරනසේක; එබැවින්, එසේ හෙයින්; මුනිසඳ, මුනිඋතුමා; හැමසඳ, සියලු වේලෙහි; පහන්තුරසේ, ප්‍රදීපවෘක්‍ෂයක්මෙන්; දිලෙයි; බබලනසේක.

305 නෙතැතිව, ඇස්ඇතිව; උපන්ජන, උපන්මනුෂ්‍යයන්ගේ; මනෝරංජනකරවන, සිත්අාලයකරවන්නාවූ; නිරංජන, නිෂ්කලංකවූ; මුනිඳුගෙ, මුනීන්‍ද්‍රයාගේ; ඇඟෙහි, ශරීරයෙහි; අනුවැංජන, අනුබ්‍යඤ්ජනලක්‍ෂණ; අසුවෙක, අශීතියෙක.

306 තම, තමන්වහන්සේ; වනදෙස,වැඩියාවූදිශාවට; නැමි, නමස්කාරකළාවූ; නොහොත් අවනතකළාවූ; ඉස,ශිර්‍ෂය; කෙනෙකුන්නේ, අන්කිසිවෙක්හුගේ;දෙස, දිසාව;වඳිනාලෙස ,නමස්කාරකිරීමට; නොනැමියදෙන්නේ, නැමීමටඉඩනොදෙනසේක; තමයස, තමන් වහන්සේගේ යසස්; තුතිකළ, ස්තුතිකළාවූ; දනන්නේ, ජනයන්ගේ; වනට,මුඛයට; කලෙකත්,කිසිකලෙකත්; පිරිදෙව්,පරිදෙව(දුඃඛ)යෙක්; වැද්දනොදෙන්නේ, නොවදනේමය.

307 තම තම සිහිකළ සිතට සතු න් නේ
හැම දෙම්නස් දුක් වැද්ද නොදෙ න් නේ
හැම ලෙඩ සුවවනලෙසට දන න් නේ
තම උපතම බෙහෙදක්කොට දු න් නේ

308 තමවෙත දික්කළ අත පෑ දේ යා
සිගමනකට දික්කරනු නො දේ යා
තමවෙත යෙම් එස වූපා දේ යා
නිරයට වැද දුක් විඳිනු නො දේ යා

309 සි හි ලැල් පවනින් ගිම් මඩ වා ලි ය
මෙසි ය ල් ලොවපිය බස් දෙඩ වා ලි ය
වි ය වු ල් සත සිත තොස්වඩ වා ලි ය
ගනබොල් බිමමගඬිත් හඩ වා ලි ය

---

307 තමතම, තමන්වහන්සේගේ නාමය; සිහිකළ, සමරණ යකළාවූ; සතුන්නේ, සත්‍වයන්ගේ; සිතට, චිත්තයට; හැමදෙම්නස් දුක්, සකලදෞම්නස්‍යදුඃඛයන්; වැද්දනොදෙන්නේ, ප්‍රවිෂ්ට විය නොදෙනසේක; දනන්නේ, ජනයන්ගේ; හැමලෙඩ සුව වනලෙසට, සකලරෝගයන්ගේ සුවවීමට; තමඋපතම, තමන් වහන්සේගේ උත්පත්තියම; බෙහෙදක්කොට; ඖෂධයක් කොට; දුන්නේ, දානයකළසේක.

308 පෑදේයා, ප්‍රසාරිතව; තමවෙතදික්කල, තමන්වහන් සේට (දන්දෙනුපිණිස) ප්‍රසාරණයකළාවූ; අත, හස්තය; සිග මනකට, සිඟිමකට; දික්කරනුනොදේයා, ප්‍රසාරණයකිරීමට නොදෙනසේක; තමවෙතයෙම්, තමන්වහන්සේ කරායන්තෙම් එසවූ, නගනලද; පාදේයා, පාදය; නිරයටවැද, දුර්ගතිගාමීව දුක්විඳිනුනොදේයා; දුක්විඳීමට ඉඩනොදෙනසේක.

309 සිහිලැල්පවනින්, සිසිලවූමන්දමාරුතයෙන්; ගිම්, සම්මය මඩවාලිය, මර්දනයකළසේක; මෙසියල්ලොව, මේසකලලෝක යෙහි; නොහොත් සකලලෝකයාලවා; පියබස්, ප්‍රියභණිතයන්; දෙඩවාලිය, කථාකරවූසේක; සත, සත්‍වයන්ගේ; වියවුල්, විශෙෂයෙන් ආකුලවූ; සිත, චිත්තය; තොස්වඩවාලිය, තුෂ්ටි වර්ධනයකරවාලූසේක; ගනබොල්බිම, ඝනබහලවූ පෘථුවිය; මහ ඬින්, මහත්වූ ගර්ජනාවෙන්; හඩවාලිය, ගුගුරවාලූසේක; (කම්පා කළසේක.)

310 මුහුදද පිපිරුස් පබෙරින් වැ ස් වි ය
නුබතල පිපිමල් වියතින් වැ ස් වි ය
මුලුලොව සුවඳැති මල්වැසි වැ ස් වි ය
සතර*අපාදෙර සුවසේ වැ ස් වි ය

311 අ ට තුරු සිය සුබ ලකුණෙන් සිරිම ත්
ය ට කර බවදුක් එබුදුන් බුදුවෙ ත්
ව ට සිය යොජනෙක ගන ගිනිදූල්ග ත්
අ ට මහනරකය වියවුල් සියප ත්

312 ගෞත මනම් එබුදුන් බුදුවෙනස ද
පේ ත ලොවේ සාගිනිදුක් මුල්සි ද
බී ත කරන් ලෝදිය උන්මුවවැ ද
සී ත අමාමියුරසවිය එමස ද

---

210 මුහුදද, සමුද්‍රයද; පිපි, විකසිතවූ; රුස්පබෙරින්, හෙල පියුම්රාශියෙන්; වැස්විය, ඡාදිතකරවූසේක; නුබතල, ආකාශතලයද; පිපි, පුෂ්පිතවූ; මල්වියතින්, පුෂ්පවිතානයෙන්; වැස්විය, ඡාදිතකරවූසේක; මුලුලොව, සකලලෝකයෙහි; සුවඳැති, සුගන්ධවත්වූ; මල්වැසි, පුෂ්පවර්ෂාවන්; වැස්විය, වර්ෂාකරවූසේක; සතරඅපාදෙර, නරක, තිරිසන්; ප්‍රෙත, අසුර යන මොහු සතරඅපායෝයි; සතරඅපායෙහි වාරයන්; සුවසේ, නිරායාසයෙන්; වැස්විය, ඡාදනයකරවූසේක;

311 සිරිමත්, ශ්‍රීමත්වූ; අටතුරු සියසුබලකුණෙන්, අෂ්ටොත්තරශතප්‍රමාණවූ මඞ්ගල ලක්ෂණයෙන් (එකසියඅටක් මගුල් ලකුණින්) යුක්තවූ; එබුදුන්, ඒ සර්වඥයන්වහන්සේ; බවදුක්, සංසාරදුඃඛය; යටකර, අධොගතකොට; බුදුවෙත්, බුද්ධත්වයට පැමිණෙනකල්හි; වට, හාත්පස; සියයොජනෙක, යොජනශතප්‍රමාණහැන; ගන, ඝනව; ගිනිදූල්ගත්, වහ්නිජ්වාලාවලින් ගැවසිගත්තාවූ; අටමහනරකය, අටමහනරක, සඤ්ජීවය, කාලසූත්‍රය, සඞ්ඝාතය, රෞරවය, මහාරෞරවය, තාපය, ප්‍රතාපය, අවීචිය (යනමොහුවෙත්) (සංජීවාදී) මහානරකඅට; සියපත්, ශතපත්‍රයන්ගෙන් (නෙළුම්වලින්); අවුල්විය, ආකූලවූයේය.

312 ගෞතමනම්, ගෞතමනම්වූ; එබුදුන්, ඒ සර්වඥයන්වහන්සේ; බුදුවෙනසඳ, බුද්ධරාජ්‍යයට පැමිණෙනකල්හි; පේත ලොවේ, ප්‍රෙතලොකයෙහි; උන්මුව, (ඒ) ප්‍රෙතයන්ගේ මුඛයට; වැද, ප්‍රවෙශව; භීතකරන, භයකරවන්නාවූ; ලෝදිය, (කකාරනලද) ලොහජලය; එමසඳ, එකල්හි; සීත, සිසිල්වූ; අමාමියුරසවිය, මධුරවූ අමෘත රසයක්මෙන්වී; සාගිනිදුක්, ක්ෂුධාග්නිදුඃඛයද; මුල්සිඳ, මුලොච්ඡින්නවිය.

---

* අපාසතා.

313 අ වි ග ත් යමපල්දුද ත න් ද න ව න
බ ල ව ත් කම්කටුලෙන් ත න් ද න ව න
අ සි ප ත් වන බියපත් ත න් ද න ව න
සි රි ග ත් සුරසෙන්කෙළි ත න් ද න ව න

314 ස ත් වගවෙන මහමෙතටස මා ව ට
ප ත් වන උන් බුදුබවට අ මා ව ට
ප ත් වන තිරිසත් මූවටද මා ව ට
ප ත් විය දිලි රත්යවට අ මා ව ට

315 බි ය ක රු ගිනිදූල් විසුරු තුමු ල් ව න
තී ර තු රු කටුසොළ සඟුලින් තු ල් ව න
තී ර තු රු ඔසුපත් පිහිටි ඉඹු ල් ව න
සු ර තු රු විය සත සතොස උපු ල් ව න

---

313 අවිගත්, ආවුධග්‍රහණයකළාවූ; යමපල්දුදනන්, යමපාල දුර්ජනයන්විසින්; දනවන, කරනුලබන්නාවූ; බලවත්, මහත් වූ; කම්කටුලෙන්, කම්කටුල්වලින්; නන්, අනෙකවිධ දුඃඛයන්, දනවන, උපදවන්නාවූ; නන්දන, නොයෙක්ජනයන්; බියපත් වන, භයප්‍රාප්තවන්නාවූ; අසිපත්වන, අසිපත්‍රවනය; (එනම්නරකය)සුරසෙන්, දිව්‍යසේනාව විසින්; කෙළි, ක්‍රීඩාකරනලද; නන් දනවන, නන්දනෝද්‍යානයාගේ; සිරිගත්,ශොභාග්‍රහණයකෙළේය;

314 සත්වගවෙන, සත්ව වර්ගයාකෙරෙහි; මහමෛතටසමා වට, ක්ෂාන්තිමෛත්‍රිදෙකින් යුක්තවූ; උන්, උන්වහන්සේ; අමා වට, නිර්වාණාවබොධය කරවනු පිණිස; බුදුබවට, බුද්ධත්වයට; පත් වන, පැමිණවදාළකල්හි; තිරිසත්, තෙරසිකයන්ගේ; මූවට, මූඛයට;දමාවට,අකුසලධර්මතාවයෙන්;පත්වන,පැමිණෙන්නාවූ; දිලි, දීප්තිමත්වූ; රත්යවට, ගිනියම්කරනලද ලෝගුලි; අමාවට, අමෘතාකාර බවට; පත්විය, ප්‍රාප්තවූයේය.

315 බියකරු, භයඞ්කාරවූ; තුමූල්වන, මහත්වූ; ගිනිදූල් වහ්නිජාලාවන්; විසුරු විසුරුණාවූ; නිරතුරු, අතරංහිතව; සොළසඟුලින් ෂොඩසාඞ්ගුලප්‍රමාණවූ; තුල්වන, මහත්වූ; කටු, කටු ඇති; (අඟල්දහසයක් දිගකටුවලින්යුක්තවූ;) නිරතුරු, නිරන්තර යෙන්; ඔසුපත්, උත්සදනරකයෙහි; පිහිටි, පිහිටියාවූ; ඉඹුල්වන සිම්බලීවනය; (එනම්අපාය,සත, සත්වයන්ගේ; සතොස, සන්තොෂය; උපුල්වන, උද්ගතකරන්නාවූ; සුරතුරුවිය; දිව්‍යවෘක්ෂයන් මෙන් වූයේය.

316 ක ර වැ ල් අවුලෙන් තිරිසත් වත ද ඟ
ය ම ප ල් බිලියෙන් අදනා ලඟ ල ඟ
ඇ ම ක ල් දලවුල් වේතරණී ග ඟ
සි හි ලැ ල් දියවිය විලසින් සුරග ඟ

317 ග න බො ල් යකබල්තිති ගිනිගෙණ ර ත්
ඇ ම ක ල් සිහිලැල්මෙන් සිහිලැල් ව ත්
ගි නි දූ ල් ලෝදිය ලෝකුඹු නිරය ත්
ම න ක ල් මලවුල් පිරිකුඹු සිරි ග ත්

318 ද රු ණුව දසදහසක් සක්වළ තු ර
දු රු නොව සිටි එකරහටම ඇමව ර
දු රු විය ලොවැදිරි නිරයේ ගනඳු ර
ඉ රු සඳු සුවහස් පැවුමෙන් එකව ර

---

316 කරවැල්අවුලෙන්,ක්ෂුරලතාජටාවෙන්නොහොත්වේත්‍ර ලතාජටාවෙන්; තිරිසත්, නෙරයිකයන්; දහවන, බඩවන්නාවූ; යමපල්, යමපාලයන්විසින්;ලඟලඟ, සමීපකොට; බිලියෙන්;බලි සයෙන්;අදනා,(වෙතට)ආකර්ෂණයකරන්නාවූ; ඇමකල්, සියලු වේලෙහි; දලවුල්, ගිනිජාලාවලින්ආකුලවූ;වේතරණීගඟ,වේතර ණීගංගාව; (එනම්අපාය) සුරගඟ, ආකාශගංගාවෙහි; දියවිල සින්, ජලයමෙන්, සිහිලැල්විය; සිහිල්වූයේය;

317 ගනබොල්, ඝනබහලවූ; තිති, නිතරම; ගිනිගෙණ, වහ් නිග්‍රහණයව; රත්,රත්වූ;යකබල්, අයෝමයකපාලයන්;ඇමකල්, සියලුකාලයෙහි; සිහිලැල්මෙන්,සීතලඇත්තවුන්මෙන්;සිහිලැල් වත්, සීතලවනකල්හි; ගිනිදූල්, ගිනිජාලාවෙන් ගැවසීගත්තාවූ; ලෝදිය, ලෝහජලයඇති; ලෝකුඹුනිරයත්, ලෝහකුම්භීනරක යත්; මනකල්, මනොහරවූ; මලවුල්, පුෂ්පාකුලවූ; පිරිකුඹු, පූර්ණ ඝටයක්හුගේ; සිරිගත්, ශොභාග්‍රහණයකෙළේය.

318 දරුණුම, රෞද්‍රව; දසදහසක්සක්වළතුර; දසසහශ්‍ර ප්‍රමාණචක්‍රවාළාන්තරයෙහි; එකරහටම, එකාකාරයෙන්ම; ඇම වර;; සියලුකාලයෙහි, දුරුනොවසිටි, පහනොව පැවතුනාවූ; ලොවැදිරිනිරයේ, ලොකාන්තරිකනරකයෙහි; ගනඳුර, ඝනාන්ධ කාරය; ඉරසඳසුවහස්, සූර්‍ය්‍යචන්ද්‍රයන්ශතසහශ්‍රයක්; එකවර, එක විට; පැවුමෙන්; පහළවූවාක්මෙන්; දුරුවිය, පහවූයේය.

319 හි ම වන මෙරගිරි කුල ගිරි සිර සේ
හැ ම දිවයින සක්වල දස දහ සේ
බි ම සිට තුරු සිරටම* එක දව සේ
හැ ම තැන හැමමල් පිපුනෙය එව සේ

320 උ ර ගු න් ගේ ගත දුහුලින් රැ ස් වූ
මො න රු න් ගේ පිල් කලඹින් පි ස් වූ
දි වි ය න් ගේ කෙළිමඬලට රැ ස් වූ
මෙව් ගෙ ලු න් අංදළු වෙන්කර කැ ස් වූ

321 උ ර ගු න් සැහපූ මුගටින් අර ණේ
මැ ඩි ය න්† නිදිගත උරගුන් දර ණේ
සි ව ලු න් කෙළිමින් සිටි ‡රුක් සෙව ණේ
සා වු න් පෙම්කෙළි කෙළවූ එකෙ ණේ

---

319 හිමවත, හිමාලයවත ප්‍රදෙශයෙහිද; මෙරගිරි, මෙරුපර්වතයෙහිද; කුලගිරිසිරසේ,× (සප්ත) කුලපර්වත ශිඛරයෙහිද; හැමදිවයින, සියලුදිවයින්වලද; දසදහසේසක්වල, දශසහස්‍ර චක්‍රවාලයෙහිද; බිමසිට, භූමියෙහි පටන්; තුරුසිරටම, වෘක්ෂශිඛී අවසන් කොටම; එකදවසේ, (ඒ) එකදිනයෙහි; එමසේ, එසාකාරයෙන්; හැමතැන, සියලු තන්හි; හැමමල්, සියලු පුෂ්පයන්; පිපුනෙය, පුෂ්පිතවූයේය.

320 දුහුලින්, මලිනයෙන්; රැස්වූ, රාශිභූතවූ; උරගුන්ගේ, සර්පයන්ගේ; (නාගයන්ගේ) ගත, ශරීරය; මොණරුන්ගේ, මයූරයන්ගේ; පිල්කලඹින්, පිඤ්ඡකලම්බයෙන්; පිස්වූ, පුඤ්ඡනයකරවූසේක; දිවියන්ගේ, දීපීන්ගේ; කෙළිමඬලට, ක්‍රීඩාමණ්ඩලයට; රැස්වූ, රාශිභූතවූ; මෙවෙහෙලුන්, මුවන්ගේ; අංදළුවෙන්, ශෘංගඅංකුරයෙන්; කර, (එදිවියන්ගේ) ග්‍රීවය; කැස්වූ, කණ්ඩූවනය කරවූසේක

321 මුගටින්අරණේ, නකුලන් වසන්නාවූ ආරණ්‍යයෙහි; උරගුන්, සර්පයන්; සැහපූ, සයනාශ්‍රකරවූසේක; උරගුන්දරණේ, නාගයන්ගේ දරණයෙහි; මැඩියන්, මණ්ඩුකයන්; නිදිගත, නිදිගැන්වූසේක; සිවලුන්, ශෘගාලයන්; කෙළිමින්සිටි, ක්‍රීඩාකරමින් සිටියාවූ; රුක්සෙවණේ, වෘක්ෂච්ඡායාවෙහි; එකෙණේ, එක්ෂණයෙහි; සාවුන්, ශශකයන් ලවා; පෙම්කෙළිකෙළවූ, ප්‍රේමයෙන් ක්‍රීඩාකරවූසේක.

---

* එක බඳයේ, † නිදිගැන්වූ උන දරණේ; ‡ තුරු.
× සත්කුළුපව් බලනු

322 උ ර ගු න් ගේ පෙණ මඬලට ව ණ වූ
ගු රු ළු න් පිය තෙපුලෙන් ඔහු ඇ ණ වූ
නා ර ය න් මෙන් සෙනෙහස එකප ණ වූ
තු ර ගු න් මිහිවුන් පියබස් බැ ණ වූ

323 බ ළ ලු න් ගේ වෙත නිති අරත ර වූ
මී ය න් ගේ සිත ඇති බිය ඇ ර වූ
දි ව ඳු න් ගේ වෙත පෙර තර වෙ ර වූ
ක පු ටු න් ගේ සිත සෙනෙහස ක ර වූ

324 කෙසරු න් තෙණ හැර දුන් නිය පඳු රෙ න්
ගි ජි ඳු න් සනහා ලූ රස ගොදු රෙ න්
ගි ජි ඳු න් ගෙනවත්කල කර පොකු රෙ න්
කෙසරු න් ගිම්දුරලූ දිය දහ රෙ න්

---

322 ඔහු, ඒ සර්වඥයන් වහන්සේ; උරගුන්ගේ, සර්පයන්ගේ; පෙණමඬලට, ඵණමණ්ඩලයකරු; වණවූ, ප්‍රණාමවූ; ගුරුළුන්, ගරුඩයන් ලවා; ඇණවූ, ආඥාකරවූසේක; සෙනෙහස, ස්නෙහාධ්‍යාශයෙන්; එකපණවූ, එකාවාසිකවූ; නරයන්මෙන්, මනුෂ්‍යයන්මෙන්; තුරගුන් මිහිවුන්, තුරඟමහිෂයන්ලවා; පියබස්, අන්‍යොන්‍ය ප්‍රිය වචනයන්; බැණවූ, කථාකරවූසේක.

323 බළලුන්වෙත, බිළාරයන් වෙතින්; නිති, නිත්‍යයෙන්; අරතරවූ, අභිනයින් දුරුවූවසත්තාවූ; මීයන්ගේ, මූසිකයන්ගේ; සිත, චිත්තයෙහි; ඇති, ඇත්තාවූ; බිය, භීතිය; ඇරවූ, පහකරවූසේක; පෙර, ප්‍රථමකාලයෙහිසිට; දිවඳුන්ගේවෙත, මහමුහුනන්කෙරෙහි; තරවෙරවූ, අතිශයින්වෛරීවූ; කපුටන්ගේ, වායස පක්ෂීන්ගේ; සිත, චිත්තය; සෙනෙහසකරවූ; ස්නෙහාධ්‍යාශය ඇතිකරවූසේක.
(කාකොලූකජාතකය බලනු)

324 කෙසරුන්, කෙශරසිංහයන් විසින්; නියපඳුරෙන්, නඛපඤ්ජරයෙන්; තෙණහැරදුන්, ග්‍රහණයකොට දානයකලාවූ; රසගොදුරෙන්, රසගොචරයෙන්; ගිජිඳුන්, ගජෙන්ද්‍රයන්; සනහාලූ, සන්තර්පණය කරවූසේක; ගිජිඳුන්, ගජෙන්ද්‍රයන් විසින්; කරපොකුරෙන්, සොඬ අගින්; ගෙන, ග්‍රහණයකොට; වත්කල, සෙවනයකරනලද දිය හරින්, ජලධාරාවෙන්; කෙසරුන්, කෙශරසිංහයන්ගේ; ගිම්, ග්‍රීෂ්මය; දුරලූ, බැහැරකරවූසේක.

325 ගොළුව ත් කී මියුරස ගී ලස වා
බිහි ර න් දෙන අත්තල තාලම වා
දූ ස දු ත් ඇසදුන් රසඳුන් ලෙස වා
පිළි නා ත් දුන රඟ කැරවූ රුව වා

326 මි නි ස ත් බව තිරිසන් අත්බව ල ද
හැ ම ස ත් වග එදිනා හැමදුක් න ද
බැ ලූ ව ත් දසදහසක් සක්වළ වැ ද
ම ද කු ත් නැත එබුදුන් බුදුවන ස ද

327 ද ස දෙස මැද හළමෙන් නිකස ළි වී
නි ස ලව සිව්සයුරම රස නි ළි වී
තො ස කර මුළුලොව ගත් පුදකෙ ළි වී
ද ස දහසක් සක්වළ එක ගෙ ළි වී

---

325 ගොළුවන්, මූගයන් විසින්; කී, කියනලද; මියුරස, මධුර රසවූ; ගීලසවා, ගීතිකාවන්ට අනුකූලවද; බිහිරන්, බධිරයන් විසින්; දෙන, දූනයකරනලද; අත්තලතාලමවා, හස්තතලතාලමට අනුකූලවද; දූසඳුන්, ජාත්‍යන්ධයන්ගේ; ඇස, අක්ෂියට; දුන්, දුනාය කරගලද; රසඳුන්ලෙසවා, රසාඤ්ජනපරිද්දෙන්; නන්, අනන්‍යාංගු; පිළිදන, පීඨසර්පින්ලවා; (කොරුන්ලවා) රුවටා, යහපත්ව; රඟ කැරවූ, නෘත්‍යකරවූසේක.

326 එබුදුන්, සර්වඥයන් වහන්සේ; බුදුවනසඳ, බුද්ධරාජ්‍යයට පැමිණ වදළ කල්හි; මිණිසත් බව, මනුෂ්‍යාත්මභාවයද; තිරිසන් අත්බව, තිරශ්චීන ආත්මභාවයද; ලද, ලද්දාවූ; හැමසත්වග, සියලු සත්ත්වගීයා; එදිනා, අනුභව කරන්නාවූ; නද, දැඩිවූ; හැමදුක් සියලු දුඃඛයන්; දසදහසක් සක්වළවැද, දශසහස්‍ර චක්‍රවාළයට ප්‍රවිෂ්ටව; බැලූවත්, අවලෝකනය කළත්; මදකුත්, ස්වල්පයකුත්; නැත, අවිද්‍යමානවී.

327 දසදෙස, දසදිගුන්; මැදහළමෙන්, මැදහැරියාමෙන් නිකසළිවී, පිරිසිදුවූයේය; සිව්සයුරම, චතුස්සාගරයම; නිසල, නිශ්චලව; රසනිළිවී, දියබිඳුනක්මෙන්වූයේය; මුළුලොව, සකල ලෝකය; තොසකර, තුෂ්ටකොට; ගත්, ගත්තාලද; පුදකෙළින්, පූජාක්‍රීඩාවලින්; දසදහසක් සක්වළ, දශසහස්‍රප්‍රමාණ චක්‍රවාළයන්; එකගෙළිවී, ඒකාලෝකවූයේය.

328 මු ළු තු න්  ලොව ගෙය මෙගය හළදෙ  ර වී
දු න කැ න්  වදබන්දන සෙන් තො  ර වී
හැ ම තැ න්  දිවසුවඳින් මනහ  ර වී
මෙමලෙ සි න්  මුළුලොව මහ පෙළහ  ර වී

329 එ බ සි න්  එබසට කරවා තුති න  ද
වෙසෙසසින්  තම නැණ පමණින් පිරිසි  ද
අ හ සි න්  පානාමෙන් සුරගඟ මෙස  ද
මෙමලෙසින්  එමැහිඳු බුදුගුණ කී ස  ද

330
ඔහු තෙපුලෙන් සුබැ  සි
අසා මුනිඳුන් ගුණ නි  සි
නැවතත් අසන රි  සි
නිරිඳුගණමේ ලෙසින් පිළිවි  සි

331
උතුමැයි යන ලොව  ව
බඹසුර නරන් පසුකො  ව
පැවසූ නියම කො  ව
මෙමතක් ගුණ ඇද්ද ඒ මුනිඳු  ව

---

328 මුළුතුන්ලොව* සියලු තුන්ලොකයෙහි; ගෙයමෙගය, ගෙයක් පාසා; හළදෙරවී, විවෘතවූමාර ඇතිවිය; දනකැන්, ජනසමූහයා; වදබන්දනයෙන්, වධයෙන් හා බන්ධනයෙන්; තොරවී, මුක්තවිය; හැමතැන්, සකලස්ථානය; දිවසුවඳින්, දිව්‍යසුගන්ධයෙන්; මනහරවී, මනොහරවිය; මෙමලෙසින්, මෙයාකාරයෙන්; මුළුලොව, සකලලොකයෙහි; මහපෙළහරවී, මහාප්‍රාතිහාර්‍ය්‍යයෙක්වූයේය.

329 එබසින් එබසට, එවචනයෙන් වචනයට; තුතිනද කරවා, සතුතිඝොෂාපවත්වා; වෙසෙසසින්, විශෙෂයෙන්; තමනැණපමණින්, තමන්ගේ ඤාණප්‍රමාණයෙන්; පිරිසිඳ, පරිච්ඡින්නකොට; සුරගඟ, ආකාශගංගාව; මෙසද, මෙන්; අහසින්, ආකාශයෙන්; ගෙන, ග්‍රහණයකොට; පානාමෙන්, ප්‍රකාශකරන්නාක්මෙන්; මෙමලෙසින්, මෙයාකාරයෙන්; එමැහිඳු, එමැති උතුමා; බුදුගුණ, බුද්ධගුණය; කීසද, කථනයකළකල්හි;

330 සුබැසි, සුභාෂිතවූ; ඔහුතෙපුලෙන්, ඔහුගේ වචනයෙන්; මුනිඳුන්, මුනීන්ද්‍රයන්වහන්සේගේ; නිසිගුණ, යොග්‍යවූගුණයන්; අසා, ශ්‍රවණයකොට; නැවතත්, යලිත්; අසනරිසි, ඇසීමෙහි ආශාවෙන්; නිරිඳුගණ, නරෙන්ද්‍ර සමූහයාතෙම; මෙමලෙසින්, මෙයාකාරයෙන්; පිළිවිසි, විචාළේය.

331 ලොවට, ලොකයෙහි; උතුමැයි, උත්තමයයි; යන, කියන්නාවූ; බඹසුරනරන්, බ්‍රහ්මදිව්‍යමනුෂ්‍යයන්; පසුකොට, පශ්චාත්කොට; නියමකොට, නිශ්චයකොට; පැවසූ, ප්‍රකාශකළාවූ; ඒ මුනිඳුට, එසර්වඥයන්වහන්සේට; මෙමතක්ගුණ ඇද්ද, මෙපමණ ගුණ විද්‍යමානමද.

---

* කාමලොක, රූපලොක, අරූපලොක යන මොහුයි.

332

මුනිඳුන් ගුණ වෙසෙස ස
දුනගතනොහී තතු ලෙ ස
නිරිඳුන් කී එබ ස
අසා එමැනිඳු කියසි *මේලෙ ස

333

බඹ සුරලොව දෙර ණ
හැමතැන දනන් අපම ණ
කියතත් ලැබ නුව ණ
පමණ නැත අප බුදුන්ගේ ගුණ

334

නිතොර පෙරුමන් ද ස
සාරහැකි කප් සුවහ ස
නුපුරා ඔවුන් ලෙ ස
කෙසේ පවසම්ද උන් ගුණ රැ ස

335

උන් †සිරුර දුක්නෙ ත
ඔවුන් සදහම් වැද සි ත
නොපහන් කෙනෙක් නැ ත
එසින් උන්ගුණ කියත් හිම්නැත

---

332 මුනිඳුන්, මුනීන්ද්‍රයන්වහන්සේගේ; ගුණවෙසෙස, ගුණවිශෙෂය; තතුලෙස, තත්වූපරිද්දෙන්; දුනගතනොහී, ජනනයට අපොහොසත්ව; නිරිඳුන්, නරේන්ද්‍රයන්විසින්; කී, කියනලද; එබස, ඒ වචනය; අසා, ශ්‍රවණයකොට; එමැනිඳු, ඒ මන්ත්‍රීන්ද්‍රයා; මේලෙස, මෙයාකාරයෙන්; කියසි, කථනය කෙරෙයි.

333 බඹ, බ්‍රහ්මලොකයෙහිද; සුරලොව, දිව්‍යලොකයෙහිද; දෙරණ, ධරණියෙහිද යන; හැමතැන, සියලු තන්හි; අපමණ, අප්‍රමාණවූ; දනන්, ජනයන්; නුවණලැබ, ඥානලාභිව; කියතත්, කියන්නේවීනමුත්; අප බුදුන්ගෙ, අප සර්වඥයන් වහන්සේගේ; ගුණ, ගුණය; පමණනැත, ප්‍රමාණයක් නොමැත්තේය.

334 ඔවුන්ලෙස, උන්වහන්සේමෙන්; සාරහැකිකප්සුවහස, සාරාසංඛ්‍යකල්පලක්ෂයක්; නිතොර, නිරන්තරයෙන්; දසපෙරුමන්, දසපාරමී ධර්මයන්; නුපුරා, පූරණයකොට; උන්, උන්වහන්සේගේ; ගුණරැස, ගුණසමූහය; කෙසේපවසම්ද, කොයිආකාරයකින් ප්‍රකාශකරම්ද.?

335 නෙත, නෙත්‍රයෙන්; උන්සිරුර, උන්වහන්සේගේ ශරීරය; දුක, දර්ශනයකොටද; ඔවුන්, උන්වහන්සේගේ; සදහම්, සද්ධර්මය; සිත, චිත්තයට; වැද, ප්‍රවේශවද; නොපහන්, නොපැහැදුනාවූ; කෙනෙක්, යම්කිසිවෙක්; නැත, නැත්තේය; එසින්, එහෙයින්; උන්, උන්වහන්සේගේ; ගුණ, ගුණය; කියන්, කථනයකරන්නහොත්; හිම්නැත, සීමාවක් නොමැත්තේය.

---

* මෙබස; † රුසිරු.

336 බුදුගුණ මහ මුහු ද
නුදුටු පරතෙර හැමස ද
මා කී ගුණ මෙස ද
එයින් ගත්වැත්හ එක දිය බි ද

337

පොළොවෙහි පස් ර ගිත්
දිසි බුදුගුණය සම ගිත්
මකී ගුණ මෙර ගිත්
එයින් ගත් පස්වැත්හ නියගි ත්

338

බුදුගුණ මහ අහ ස
නුදුටු නිම්මක් දසදෙ ස
මකී බුදුගුණ ලෙ ස
වැත්තමැසිපියෙනිසෙව්නුබකු ස

339

මුනිඳුන් ගුණ මහ ත්
අසා නිරිඳෙ තුටු සි ත්
ඔහු පුර කුල පුව ත්
කෙබඳුදැයි ඔහු අතින් පිළිවි ත්

340

එසඳ කුල පර පු ර
පුර ඉසුරු පිරි පිරිව ර
වරගත රුසිරු ස ර
සරා මෙලෙසින් කියයි මැතිව ර

---

336 බුදුගුණ, සර්වඥයන්වහන්සේගේ ගුණනැමති; මහමුහුද, මහාසාගරයාගේ; පරතෙර, පරතීරය; හැමසඳ, සියලුකාලයෙහි; නුදුටු, (කිසිවෙකු විසින්) නොදක්නා ලද්දේය; මෙසඳ, මේකාලයෙහි; මාකී, මවිසින් කියනලද; ගුණ, ගුණය; එයින්, ඒසාගරයෙන්; එකදියබිඳ, එකම දියබින්දුවක්; ගත්වැත්හ, ග්‍රහණය කළාක් වැත්හ.

337 බුදුගුණ, බුඩගුණය; පොළොවෙහි, පෘථුවියෙහි; පස්රගින්, පාංශුවමෙන්; සමගින්, සමගිතාවයෙන්; දිසි, දෘශ්‍යමාණය; මෙරගින්, මේරුාකාරයෙන්; මාකී, මවිසින් කියනලද; ගුණ, ගුණය; එයින්, ඒ ගුණනැමති පෘථුවියෙන්; නියගින්, නඛාග්‍රයෙන්; ගත්, ගන්නාලද; පස්වැත්හ, පාංශුවවැනිවෙයි.

338 බුදුගුණ, බුඩගුණ නැමති; මහ අහස, මහා ආකාශයෙහි; දසදෙස, දශදිශාවෙහි; නිම්මක්, නිම්මාවක්; නුදුටු, නොදක්නා ලද්දේය: මකී, මවිසින් කියනලද; බුදුගුණලෙස, සර්වඥගුණලේශය; මැසිපියෙනි, මැස්සෙකුගේ පියාපතින්; සෙව්, ඡාදනයකරනලද; නුබකුසවැත්හ, නභොකුක්ෂියමෙනි

339 මුනිඳුන්, මුනීන්ද්‍රයන්වහන්සේගේ; ගුණමහත්, මහත්වූගුණය; අසා, ශ්‍රවණයකොට; තුටුසිත්, තුෂ්ටවූසිත්ඇති; නිරිඳේ, නරේන්ද්‍රයෝ; ඔහු, උන්වහන්සේගේ; පුර, නගරයෙහි හා; කුලපුවත්, කුලයාගේ පුවෘත්තිය; කෙබඳුදැයි, කෙසේදැයි; ඔහුඅතින්, ඒ ඇමතියාගෙන්; පිළිවිත්, ප්‍රතිපෘච්ඡාකළෝ.

340 එසඳ, එකල්හි; කුලපරපුර, කුලපරම්පරාවද; ඉසුරු, සම්පත්තියෙන්; පිරි, පූර්ණවූ; පුර, නගරයද; පිරිවර, පරිවාරසම්පත්තියද; රුසිරුසර, රූපශ්‍රීන් සාරවූ; වරගත, උත්තමස්ත්‍රීන්ද; මැතිවර, මැතිඋතුමා; මෙලෙසින්, මේආකාරයෙන්; සරා, (වර්ණනාමුඛයෙන්) සර්ජනකොට; කියයි, කථනයකෙරෙයි.

341 බඹ උපතින් *පැව  ත
පෙර නරලොවට කර සෙ  ත
නරන් කළ සම්ම  ත
වීය නිරිඳෙක් මහා සම්ම  ත

342
රිවි කුලෙහි මන න  ඳ
ඔහු දරු මුණුබුරුව සො  ඳ
සක්විති ඉසුරු ල  ද
උතුම් නිරිඳුන්ගෙන් සැදුම් ල  ද

343
ලත් සක්දෙව් ප  දෙ වි
දෙවියන්ටවූ කුල  දෙ වී
මන්දතු නර  දෙ වී
පසන් සිත්දිය කඳින් කළ  දෙ වි

344
මුළු සක්වළ වැජ  ඹි
සිත අවගුණෙන් නොකැල  ඹි
බෝසත් ගුණෙන් දු  ඹි
මහා සුදසුන් රජුන්ගෙන් ගෙ  ඹි

345
පදනිය කිරණ ම  ලී
කළ නිරිඳුන් මුදුන් ම  ලී
බඳලොව ජයකෙහෙ  ළි
පසිඳු මූවදෙව් රජුන්ගෙන් දි  ලී

---

341 පෙර, පූර්වකාලයෙහි; නරලොවට, මනුෂ්‍යලොකයට; සෙත කර, ශාන්තිකරවූ; බඹඋපතින්, බ්‍රහ්මයාගේ උත්පත්තියෙන්; පැවත, පැවැත්තාවූ; නරන්, මනුෂ්‍යයන් විසින්; සම්මතකළ, (නරදෙවභාව යෙන්) සම්මතකරන ලද්දවූ; මහාසම්මත, මහාසම්මත නම්වූ; නිරිඳෙක්, නරෙන්ද්‍රයෙක්; වීය, වූයේය.

342 මනනඳ, මනොනන්දනීයවූ; රිවිකුල, දිවාකරවංශයෙහිවූ; ඔහු, ඒ (මහාසම්මත රජුගේ;) දරුමුණුබුරුව, දරුමුණුපුරු පරම්පරාවෙහිවූ; සොඳ, සුන්දරවූ; සක්විති ඉසුරු, චක්‍රවර්ත්තිසම්පත්; ලද, ලද්දවූ; උතුම්නිරිඳුන්ගෙන්; උත්තම නරෙන්ද්‍රයන්ගෙන්; සැදුම්ලද, සැදුම් ලද්දවූ.

343 සක්දෙව්පදෙවි, ශක්‍රදෙවෙන්ද්‍ර පදවිය; ලත්, ලද්දවූ; දෙවියන්ට, (උත්පත්ති) දෙවතාවන්ට; කුලදෙව්, කුලදෙවතාවූ; මන්දතු නරදෙවි, මන්ධාතු නම් නරදෙවයාගේ; පසන්, ප්‍රසන්නවූ; සිත් දිය කඳින්, කීර්ත්තිනැමති ජලස්කන්ධයෙන්; කළදෙවි, ධාවනයකළාවූ.

344 මුළුසක්වළ, සකලචක්‍රවාටයෙහි; වැජඹි, විජෘම්භමානවූ; සිත, චිත්තය; අවගුණෙන්, නපුරුගුණයෙන්; නොකැලඹි, නොකැලඹුනාවූ; බෝසත්ගුණෙන්, බොධිසත්වගුණයෙන්; දුඹි, දෘජනාවූ; මහා සුදසුන් රජුන්ගෙන්, මහාසුදර්ශනරාජයන්ගෙන්; ගෙඹි, ගෙඹියාවූ.

345 පද, පාදයෙහි; නියකිරණමලී, නඛරශ්මි පුෂ්පයෙන්; නිරිඳුන්, (අන්) නරෙන්ද්‍රයන්ගේ; මුදුන්මලිකළ, මස්තකමාලාකෘතවූ; ලොව, ලොකයෙහි; බඳ, බඳනාලද්දවූ; ජයකෙහෙළි, ජයකොඩි ඇත්තාවූ; පසිදු, ප්‍රසිද්ධවූ; මූවදෙව්රජුන්ගෙන්, මඛාදෙව රාජයන් ගෙන්; දිලි, දීප්තිමත්වූ.

---

* සැපත.

346 ගොස් *බඹලොව දූව ටී
යසලිය රදනා දිගු ය ටි
ලොව නුගු ණ කල පැ ටී
පවර නිම් නිරිඳුගෙන් සුපිහි ටි

347
රුපුසෙන් බිඳ ගිහි ණී
ලත් දෙව්ඳුගෙන් අග මි ණී
සව්සිප් කෙළ පැමි ණී
කුසාරජ පරපුරෙන් සපැමි ණී

348
අවබිය නැවැත් වූ
දසරජදම් පැවැත් වූ
විකුමෙන් මහත් වූ
එරම් රජුගෙන් සසිරි මත් වූ

349
පුන්සඳ කිරණ බ ඳු
යසසින් දියත කළ සු ඳු
සිවුසඟරු පුරු ඳු
ඔක්කාවස් පරපුරෙන් †පිරිසු ඳු

350
මෙලෙසින් ලොව පැව ත
ආරජ පරපුරෙන් ප ත
ජයසේන නම් යු ත
පවර නිරිඳෙක් වී කිඹුල්ව ත

346 බඹලොව, බ්‍රහ්මලෝකයෙහි; ගොස්, ගමනයකොට; දූවටී, දූවටුනාවූ; යසලිය, කීර්තිනැමති ලතාවන්; දිගුටි, දිශානැමැති සළුපිලිති; රදනා, රඤ්ජමානවූ; ලොව, ලෝකයාගේ; නුගුණ, අව ගුණයන්; (පාපයන්) පැරීකල, පහකළාවූ, පවර, උතුම්වූ; නිම්නිරිඳුගෙන්, නිම්නරේන්ද්‍රයාගෙන්; සුපිහිටි, මනාව පිහිටියාවූ.

347 ගිහිණී, ගතාණවූ; රුපුසෙන්, සතුරුසෙනාවන්; බිඳ, භින්නකොට; දෙව්ඳුගෙන්, (ශක්‍ර දෙවේන්ද්‍රයාගෙන්; අගමිණී, අග්‍රමාණික්‍යය; (අෂ්ටවංකමාණික්‍යය ලත්, ලද්දවූ; සව්සිප්, සකලශාස්ත්‍රයාගේ; කෙළපැමිණී, කොටිප්‍රාප්තවූ; කුසාරජ පරපුරෙන්, කුසරාජ පරම්පරාවෙන්; සැපැමිණී, සම්ප්‍රාප්තවූ.

348 අවබිය, අපායභීතිය; නැවැත්වූ, ආවරණය කළාවූ; දසරජදම්, ‡දශවිධරාජ ධර්මය; පැවැත්වූ, ප්‍රවර්තනයකළාවූ; විකුමෙන්, වික්‍රමයෙන්; මහත්වූ, උසස්බවට පැමිණියාවූ; එරම්රජුගෙන්, ඒ රාම රජයාගෙන්; සසිරිමත්වූ, සශ්‍රිකබවට පැමිණියාවූ.

349 පුන්සඳකිරණබඳු, පූර්ණචන්ද්‍රකාන්තිය සමානවූ; යසසින්, කීර්තියෙන්; දියත, ලෝකය; සුදුකළ, ශුභ්‍රවර්ණකළාවූ; සිවුසඟරු, ×චතුස්සංග්‍රහ (වස්තූන්) පුරුද, පරිචිතවූ; ඔක්කාවස්පරපුරෙන්, ඔක්කාකවංශ පරම්පරාවෙන්; පිරිසිඳු, පරිශුද්ධවූ.

350 මෙලෙසින්, මෙයාකාරයෙන්; ලොවැ, ලෝකයෙහි; පැවත, පැවත, ප්‍රවෘත්තිනම් පැමිණියාවූ; රජපරපුරෙන්, රාජපරම්පරාවෙන්; පත, පැමිණියාවූ; ජයසේන නම්යුත, ජයසේන යන නාමයෙන් යුක්තවූ; පවර, උතුම්වූ; නිරිඳෙක්, රජෙක්; කිඹුල්වත, කපිලවස්තු නගරයෙහි; වී, වූයේය

* බඹතල; † පරසිදු
‡ "දානං ශීලං පරිච්චාගං-අජ්ජවං මද්දවංතපං
අක්කොධො අවිහිංසා ච-ඛන්ති ච අවිරොධිතා."
× දීම, ප්‍රියවචනකීම, අර්ථචර්‍ය්‍යාව, සමානාත්මතා යන මේ සතර සංග්‍රහවස්තූහුයි.

351 ඔහු පුත්වූ නොම ඳ
විකුමෙන් රජුන් මත් බි ඳ
සිහහනු නම් ල ද
රජෙක් එපුරෙහිම රජසිරි ල ද

352
රිවිකුල සුරතු රේ
ගත් අඹ පලක අයු රේ
සිටිපිය තනතු රේ
වීය ඔහු පිත්‍රජෙක් එපු රේ

353
ලෙස සරද ඳේ නා
යස සිත් ලොව සු ඳේ නා
සිත කිලිටු ඳේ නා
නමින් ඒ රජ වී සු ඳේ නා

354
මුනිඳුව තිලෝ ගු රු
ලබත ලෙස පිය තනතු රු
දසපෙරුමත් සොඳු රු
පුරා කප්සුවහසක් තිරතු රු

355
සුර බඹ සතුටු කො ට
හැම නරනිඳුන් පසු කො ට
එපින් පල දෙනු කො ට
පැමිණි මහරජ තුමෙක් එපුර ට

---

351 ඔහු, ඒ (ජයසේන නම්) රජහුගේ; පුත්වූ, පුත්‍රවූ; නොමිඳ, අබිඳුවූ; විකුමෙන්, වික්‍රමයෙන්; රජුන්, (ශත්‍රු) රාජයන්ගේ; මත් බිඳ, මාන භග්න කළාවූ; සිහහනුනම්ලද, සිංහහනු යන නාමය ලද්දාවූ; රජෙක්, නරේන්ද්‍රයෙක්; එපුරෙහිම, එ (කපිලවස්තු) නගරයෙහිම; රජසිරිලද, රාජ්‍යශ්‍රී ලද්දේය.

352 රිවිකුල, සූර්‍ය්‍යවංශ නැමති; සුරතුරේ, දිව්‍යවෘක්ෂයෙහි; ගත්, හටගත්තාවූ; අමපලෙක අයුරේ, අමෘතඵලාකාරවූ; පිය තනතුරේ, (බුද්ධ) පිතෘස්ථානාන්තරයෙහි; සිටි, පිහිටියාවූ; ඔහුපිත්, ඒ (සිංහහනුනම්) රජහුගේ පුත්‍රවූ; රජෙක්, නිරිඳෙක්; එපුරේ, ඒ (කිඹුල්වත්) පුරයෙහි; වීය, වූයේය.

353 සරදඳේනාලෙස, ශරච්චන්ද්‍රයාමෙන්; යසසිත්, කීර්ත්තියෙන්; ලොව, ලොකය; සුඳේනා, මනාව ධවනය කළාවූ; සිත, චිත්තයෙහි; කිලිටු, මලිනය; ඳේනා, ධවනය කළාවූ; ඒ රජ, ඒ රාජයා; නමින්, නාමයෙන්; සුඳේනාවී, සුඬොදන නම්වීය.

354 තිලෝගුරු, ත්‍රෛලොකාචාර්‍ය්‍යවූ; මුනිඳුව, මුනීන්ද්‍රයන් ම හන්සේට; පියතනතුරු, පිතෘස්ථානාන්තරය; ලබනලෙස, ලබන මෙන්; සොඳුරු, සුන්දරවූ; දසපෙරුමන්, (දානාදි) දශපාරමි ධර්ම්යන්; කප්සුවහසක්, කල්පශතසහශ්‍රයක්; තිරතුරු, නිරන්තරයෙන්; පුරා, පූරණයකොට.

355 සුරබඹ, දිව්‍යබ්‍රහ්මයන්; සතුටුකොට, සන්තුෂ්ටකොට; හැමනරනිඳුන්, සියලු නරේන්ද්‍රයන්; පසුකොට, පශ්චාත්භූතකොට; එපින්, ඒ පුණ්‍යයෙන්; පලදෙනුකොට, විපාක දානය කරන්නාවූත් කොට; මහරජතුමෙක්, මහාරාජෝත්තමයෙක්; එපුරට, ඒනගරයට; පැමිණි, ප්‍රාප්තවූයේය.

356 මුවු ගනතුරු ප — තා
බුදුකෙනෙහතුන්ට තීය — තා
දත්සිල් ගුණ ඉ — තා
පුරා කප්සුවහසක් සත — තා

| 357 | | 359 | |
|---|---|---|---|
| සිරින් සුරි | ඳු වූ | සුදොවුන් රජු පිණි | ස |
| යසසින් පුන් ස | ඳු වූ | එමායා බිසවුන් කු | ස |
| තෙදින් දිනි | ඳු වූ | පිළිසිඳගෙන තක | ස |
| අඳුන් සක් නරනිඳුව | ඳු වූ | බිහිව මැදිපෝද වෙසක් ම | ස |
| **358** | | **360** | |
| රුසිරෙන් න | මා යා | දුටු දුටුවන් සිත | ව |
| සරිකළ ලෝ අ | මා යා | සක්විති සැපත් පසුකො | ව |
| වින් නෙතව | මා යා | සපැමිණ ඉඳුලෙස | ව |
| රදූ යුත්වූ නමින් | මා යා | කිඹුල්වත් පුරෙහි රජ සැපත | ව |

356 බුදුකෙනෙහතුන්ට, සබ්‍ඥයන්වහන්සේනමකට; නියතා, ඒකාන්තයෙන්; මුවුතනතුරුපතා, මාතෘස්ථානනතරයප්‍රාර්ථනාකො...ඉතා, බොහෝවූ; දත්සිල්ගුණ, දානශිලගුණයන්; සතතා, නිරන්තරයෙන්; කප්සුවහසක්, කල්පසියදහසක්; පුරා, පූරණයකොට

357 සිරින්, ඓශ්වර්‍ය්‍යයෙන්; සුරිඳුවූ, සුරේන්ද්‍රයාවැනිවූ; යසසින්, කීර්තියෙන්; පුන්සඳවූ, පූර්ණචන්ද්‍රයා වැනිවූ; තෙදින්, තෙජස කරණකොටගෙන; දිනිඳුවූ, දිනෙන්ද්‍රයාවැනිවූ; අඳුන්සක් නරනිඳුව, අඤ්ජනශාක්‍ය නරේන්ද්‍රයාගේ; දූවූ, ජනවූ.

358 රුසිරෙන්, රූපශ්‍රියාවකරණකොටගෙන; ලෝ, ලොකයාහට; නමායා, නමාව; අමායාසරිකළ, අමෘතයක් සමානකළාවූ; නෙතව, නෙත්‍රායව; මායාවන්, මායාවක්මෙන් කළාවූ; මායානමින්යුත්, (මහා) මායා යන නාමයෙන් යුක්තවූ; රදූ, රාජදූවක්; වූ, වූවාය.

359 සුදොවුන් රජුපිණිස, සුද්ධොදන මහා රජාණන් නිසා; එමායා බිසවුන්කුස, ඒ මායාබිසවුන්වහන්සේගේ කුක්ෂියෙහි; සතය, සහපත්ව; පිළිසිඳගෙන, ප්‍රතිසන්ධිග්‍රහණයකොට; වෙසක්මස, වෛශාඛමාසයෙහි; මැදිපෝද, පුරපසළොස්වක්දිනයෙහි; බිහිව, ප්‍රසූතව.

360 දුටුදුටුවන්, දර්ශනයකළකළවුන්ගේ; සිතව, චිත්තයව; සක්විතිසැපත්, චක්‍රවර්ත්තිසම්පත්තිය; පසුකොට, පරදවා; ඉඳුලෙසව, ශක්‍රයාමෙන්; කිඹුල්වත්පුරෙහි, කපිලවස්තුනගරයෙහි; රජසැපතව, රාජසම්පත්තියට; සපැමිණ, සම්ප්‍රාප්තව.

361 යසසින් සුපිරි සි ඳු
සල තුන්ලොවම සව්සු ඳු
රජ උතුමෙක් මෙබ ඳු
වීය සිදුහත් නමින් පරසි ඳු

362
අසුර සුර බඹ හැ ම
තුටුකර නරන් නොහැර ම
දක්වා ලොව මහි ම
එහිමිසඳ තම උපන් දිනෙහි ම

363
මිහිපිට සිට තො සි න්
දිගත නරඹා* සියැ සි න්
සක්විති රජවෙ සි න්
ගොසින් සත්පියවරක් වෙසෙසින්

364
සුරබඹ මහ සැ බ ව
පුදන දූන බුදුවන බ ව
තෙපුලෙන් ගෙන ස බ ව
කීය තම මුළුලොවට අග බ ව

365
සිටැසත්මැසි වය ස
පලක් බැඳ හිඳ නුබකු ස
නාමිමා පිතු සිර ස
දිගත කියවිය තමා යසර ස

---

361 යසසින්, කීර්තියෙන්; සුපිරිසිඳු, අතිපරිශුද්ධවූ; තුන්ලොවම, ලෝකත්‍රයම; සව්සුදුකළ, සර්වශුභ්‍රකළාවූ; මෙබඳු, මෙනාකාරවූ; රජඋතුමෙක්, රාජෝත්තමයෙක්; සිදුහත් නමින්, සිද්ධාර්ථනාමයෙන්; පරසිදුවීය, ප්‍රසිද්ධවූයේය.

362 හැම, සියල්ලම; අසුර, දානවය; සුර, දෙවිය; බඹ, බ්‍රහ්මය යන මොවුන්ද; නරන්, මිනිසුන්ද; නොහැරම, අත්නොහැරම; තුටුකර, තුෂ්ටකොට; ලොව, ලෝකයෙහි; මහිම, මහත්බව; දක්වා, ප්‍රකාශකොට; එහිමිසඳ, ඒ ස්වාමීන්ද්‍රයා; තම, තමන්වහන්සේ; උපන් දිනෙහිම, ප්‍රසූතවූ දිනයෙහිම.

363 තොසින්, තුෂ්ටියෙන්; මිහිපිට, පොළොවමතුයෙහි; සිට, සිටිනව; සියැසින්, ස්වකීය අක්ෂියෙන්; දිගත, දිගාන්තයන්; නරඹා, බලා; සක්විති රජවෙසින්, චක්‍රවර්තිරාජවේශයෙන්; වෙසෙසින්, විශේෂයෙන්; සත්පියවරක්, සප්තපදව්‍යතිහාරයක්; ගොසින්, (ඉදිරියට) ගමන්කොට;

364 මහසුරබඹ, මහත්වූ දිව්‍යබ්‍රහ්මයන්; සැබව, සැබවින්; බුදුවනබව, බුද්ධත්වයට පැමිණෙනබව; දූන, ජානනයකොට; පුදන, පූජාකරනකල්හි; සබව, (ඒ) ස්වභාවය; තෙපුලෙන්, වචනයෙන්; ගෙන, ග්‍රහණයකොට; තම, තමන්වහන්සේ; මුළුලොවට, සියලුලෝකයාහට; අගබව, අග්‍රභාවය; කීය, කීයේක.

365 සත්මැසිවයස, සප්තමාසික අවස්ථාවෙහි; සිට, ස්ථිතව; නුබකුස, අහස්කුසෙහි; පලක්බැඳ, පර්‍ය්‍යංකබන්ධනයකොට; හිඳ, නිෂීදනයකොට; පිතු, පියාගේ; සිරස, මස්තකය; නාමිමා, නැමීමවා; (නමස්කාරකරවා) තමාගේ යසරස, තමන්වහන්සේගේ කීර්තිරාශිය; දිගත, දිගන්තයෙහි; කියවිය, කථනයකරවූයේක.

---

* දියැසියා.

366 ලොව හැම්සතන් නි ති
ඇරමෙන යතන් අඹුනෑ ති
තිදන් සතරෙක් ඇ ති
ගව් දෙතුන්ගව් යොදුන් ගැඹුර ති

| 367 | | 369 | |
| --- | --- | --- | --- |
| ගිම් ගිම් වසන් කා | ල් | දිලිරුවමෙන් කා | සු ත් |
| විසුමට සුදුසු සුවිසා | ල් | ගෙනිත් හසුන් මන් | සු ත් |
| තුන් පස් සත් මහ | ල් | විශයවිගට යුද | යු ත් |
| එතුන්පහකුළෙහි* වැසමනකා | ල් | යසෝදරනම් කතක් මෙමහසු | ත් |

| 368 | | 370 | |
| --- | --- | --- | --- |
| †සෙසුකුලහනන් හැ | ර | මුත් වරලස කළු | ඹ |
| රජකුල උපන් මනහ | ර | සරිවන එතක් නොමලැ | ඹ |
| සුරහන පුරු පව | ර | තුදුටු නො ඇසු සු | ඹ |
| ‡ලියෝ සතළිස් දහස් පිරිව | ර | මුහුල කොලසින මැවේඇ | ඹ |

366 ලොව, ලොකයෙහි; හැම්සතන්, සියලු සත්ත්වයන්; නිති නිරන්තරයෙන්; ඇරමෙනයතන්, ආශ්‍රහනය කොට යත්නෙන් නමුත්; අඹුනැති, උපනයක් නොවන්නාවූ; ගව්, ගව්වුතප්‍රමාණවූද; දෙගව්, දිගාවුතප්‍රමාණවූද; තුන්ගවු, තිගාවුතප්‍රමාණවූ; යොදුන්, යොජනප්‍රමාණවූ; ගැඹුරති, ගැඹුරින්යුක්තවූ; තිදන් සතරෙක්, නිධිකුම්භි චතුෂ්කයෙක්; ඇති, ඇත්තේය.

367 ගිම්ගිම්වසන්කල්, හෙමන්ත ගිම්හාන වසන්ත යන කාලත්‍රයෙහි; විසුම්ට, වාසයකිරීමට; සුදුසු, යොග්‍යවූ; සුවිසල්, අතිවිශාලවූ; ×තුන්පස්සත්මහල්, ත්‍රිභූමක පඤ්චභූමක සප්තභූමිකවූ; මන කල්, මනොකාන්තවූ; එතුන්පහකුළෙහි, ඒ ත්‍රිවිධප්‍රාසාද කූටයෙහි; වැස, වාසයකොට;

368 සෙසුකුලහනන්, අවශෙෂ කුලාඞ්ගනාවන්; හැර, වර්ජිත කොට; රජකුල, රාජවංශයෙහිම්; උපන්, උත්පන්නවූ; මනහර, මනොහරවූ; සුරහනපුරු, දිව්‍යාඞ්ගනාවන් වැනිවූ; පවර, උතුම්වූ; ලියෝ සතළිස්දහස්, සත්‍රිනු සතළිස්දහසක් පමණ; පිරිවර, පරිවාරවූහ.

369 කාසුන්රුවමෙන්, කාඤ්චනරූපයක්මෙන්; දිලි, බබලන්නාවූ; ගෙනිත්, ගෙන කාරණකොටගෙන; හසුන්, හංසයන්ගේ; මන්සුත්, මානයෙහිගනකාලාව; සුදුසුත්, සුදුසිනියවූ; විගට, ඒ සිඩාරිකුමාරයාහට; යසෝදරනම් කතක්, යශොධරානම් කාන්තාවක්; මෙමහසුත්වය, (අග්‍ර) මෙහෙසිකාවූහ.

370 මුත්, මේ යශොධරාකාන්තාවගේ; වරලසකළුඹ, කෙසකලාපයට; සරිවනඑතක්, සමානවන්නාවූ වස්තුවක්; නොම්ලැඹ, අලබ්ධව; තුදුටු, (පෙර) නුදුටුවාවූ; නොඇසු, (පෙර) නොඇසුවාවූ; සුඹ, යහපත්වූ; මුහුල, ධම්මිල්ලය; ඇඹ, ලබන්නෙමේ; කොලෙසින් මැව්දෙ, කොහිඅකාරයකින් මාපනය කෙළේදො.

* විසි, † තෙලු, ‡ ලියන්, × පශ්‍යන්තවමහල් යනු සිංහල ඛණ්ඩපාඨවලපෙණි,

371 ඉඳුනිල් ඉඳුවර ට
නැත මෙවැනි පැහැපුර ට
මොවුන් ඇස් මැවුම ට
කුමන පැහැයක් ගනිද එන්කො ට

372
දුටු දුටුවන් ඔක ද
එතමුන් උවන් පුන් ස ද
මවනකල නුඹමැ ද
අනේ කුම්කාට මැවීලෙදු ස ද

373
වට මට සිලුටු නො ට
ගත හැකි ලිමකින් ව ට
උන් කර ගිරි තුන ට
කුමන උපදෙස් ලදිද ඇඳුම ට

374
ඝන රන් කුඹු අයු රු
දුටු දුටුවනට පියක රු
කළෙලාත් උන් පියවු රු
බඹා බඹසර වේද තහවු රු

375
මොලොක් සිහිලැල් ව ත
එක්කොට අඹා පැහැප ත
අයුරු මුන් කොමල ත
බලව් උවමක් සොයත අන් නැත

---

371 ඉඳුරට, රත්නපුල්ලෙහි; (සෙවවත්) ඉඳුනිල්, ඉන්ද්‍රනීලමාණික්‍යයට හා; ඉඳුවරට, ඉන්දීවරයන්ට; (නිල්මානිල්පලට) මෙවැනි, මෙබඳු ආකාරවූ; පැහැ, ප්‍රභාවක්; නැත, නැත්තේය; (එසේහෙයින්) මොවුන්, මේ කාන්තාවගේ; ඇස්මැවුමට, අක්ෂිමාපනයට; කුමන පැහැයක්, කිනම් ප්‍රභාවක්; එක්කොටගතිද, පිඬුකොට ගත්තේද.?

372 දුටුදුටුවන්, දක්නාවූ සකලකලවුන්; ඔකදවන, සතුටු උපදවන්නාවූ; මුන්, මේ යශෝදරාදේවියගේ; උවන්, මුහුණනැමැති; පුන්සඳ, පූර්ණචන්ද්‍රයා; මවනකල, නිර්මාණය කරනකල්හි; නුඹමැද, නභෝමධ්‍යයෙහි; සඳ, චන්ද්‍රයා; කුම්කාට මැවීලෙදු, කුමක්සඳහා නිර්මිත කෙළෙදු; අනේ, විස්මයෙකි.

373 වට, වෘත්තවූ; මට, මට්ටම්වූ; සිලුටු, ශ්ලිෂ්ටවූ; නොට, දික් නොවූ; වට ලිමකින්, කවාකාරරේඛාකරණයකින්; ගතහැකි, ගැනීමට පුළුවන්වූ; උන්, ඒ යශෝදරාවන්ගේ; කර, ග්‍රීවයෙහිවූ; ගිරිතුනට, රේඛාත්‍රයට; ඇඳුමට, ඇඳීම පිණිස; කුමන උපදෙස්, කිනම් උපදේශයක්; ලදිද, ලද්දේද.?

374 ඝන, ඝනවූ; රන්කුඹු අයුරු, රන්කලවැනිවූ; දුටුදුටුවන්ට, දක්නාසකලකලවුන්ට; පියකරු, ප්‍රියංකරවූ; උන්, ඒ මෙහෙසියගේ; පියවුරු, පයෝධරයන් කෙරෙහි; කළෙලාත්, ආශාකළාහුනම්; බඹා, බ්‍රහ්මයාගේ; බඹසර, බ්‍රහ්මචරියාව; තහවුරුවේද, ස්ථාවර වන්නේද; (නොවේමැයි)

375 මොලොක්, මෘදුවූ; සිහිලැල්වත, සිසිලවසතුන්; එක්කොට, රැසිකොට; අඹා, සාදනලද; පැහැපත, ප්‍රභාප්‍රාප්තවූ; මුන්, මේ මෙහෙසිකාවන්ගේ; කොමලත අයුරු, මොලොක්දෙඅත්හි ආකාරයක්; බලව, අවලෝකනයකරව; අන් උවමක්, අන්‍යඋපමාකට සුදුසු දෙයක්; සොයත, පරීක්ෂාකාරත්ගොත්; නැත, නැත්තේය,

376 සඳැත් කුඹු අසු රු
උසුලන පුන් පියවු රු
ඉඟ සිහින තිඹො රු
කිවසි අඳහා ගනිති කවු රු

| 377 | | 379 | |
|---|---|---|---|
| කරතුනු තුනු රුව | ට | දනත් කල උම්ම | තු |
| කලුකම් නවසෙස පැම | ට | දනළුතු* දෙකට රන්ළු | තු |
| දුන් කලුහුය ලෙස | ට | සරිනොපෙන දූත්යු | තු |
| එසාමර දළින් වැජඹි මොනව | ට | උපම් නැත දුට ස්යම් මින් ව | තු |

| 378 | | 380 | |
|---|---|---|---|
| රඹකද ගදැත්ක | ර | තුඹ මැද පත පත | ග |
| පෙරකල බඹනු මෙමෙහෙව | ර | නොදිලෙන පහන් සිළු ර | ග |
| නපුරැසි හැම දුරැ | ර | උපම් නොකැළැකි ල | ග |
| මැවුවැති ඇය වෙවාර මනහ | ර | කෙසේ වනමුද ඔවුන් යුගද | ග |

376 සඳැත්කුඹුඅසුරු, ශිලදනන (හස්ති) කුම්භාකාරවූ; පුන්පියවුරු, පීනපයොධර යුග්මය; උසුලන, උසුලන්නාවූ; සිහින, සාගවූ; ඉඟ, කටිප්‍රදෙශයමෙම්යයි;(කිකලැ) තිඹොරු, සැබවක්; කිවසි, කිමයෙයි; කවුරු, කවරනම් කෙනෙක්; අඳහාගනිති, අඳහාගනිද්ද.

377 තුනු ශරීරය; තුනුකර, කෘශකොට; රුවට, යහපත්ගේ; කල, කරනලද; කම්නවංසස; කම්එශෂය; පැමට, ප්‍රකාශකිරීමට; දුන්, දනයකලාවූ; කලුහුයලෙසට, කෘෂ්ණසූත්‍රයක් මෙන්; ( කලුනුලක් ඉන්, ඔවුන්ගේ; එසාමරාද, එසාරජිකාද; මොනවට, යහපතට; වැජඹි, විජෘම්භිතා වී

378 පෙරකල, පූර්වකාලයෙහි; බඹනු, බ්‍රහමයා; මෙමෙහෙවර, සාදාලද්දවූ; රඹකදගදැත්කර, රම්භාස්කන්ධය හා ගජහස්තියොන්ධය ගත; හැම, සියල්ල; නපුරැසි, අංගහනායසි; දුරැර, දූරුකොට; මනහර, මනොහරවූ; ඇය වෙවාර, ඇගේ කලවා යුග්මය, මැවුවැති, මැව්වාක්වැන්න.

379 දනත්, ජනයත්; උම්වතුකල, උම්මත්තකභාවයට පැමිණෙව්වාවූ; දනළුතුදෙකට, දනළුතුයුග්මයට; රන්ළුතු, සවණකුතුත්; සරිනොපත, සමානනොවනකල්හි; දූත්, එම්කාලයෙහි; යුතු, යොග්‍යවූ; උපම්නැත, උපමා නැතිබැවින්; දුට, දශිනයකොළේනම්; මින්වතු, අනාගතයෙහිවත්; ස්යම්, සාර්ථකරම්.

380 පතග, සූය්‍යියා; තුඹමැද, නභොමධ්‍යයට; පත, පැමිණිකල; පහන්සිළු, ප්‍රදීපසිඛාවත්; නොදිලෙනරග, නොබබලත් නාක්මෙන්; ලගනොකැළැකි, සම්පකොට නොහැකිවූ; උපම්, උපමාඇති, ඔවුන්දගයුග, ඔවුන්ගේ ස්තනයුග්මය; කෙසේවනමුද, කොසිආකාරයක්හට උපමාකරමුද?

---

* යුගව.

381 රූ සයුරේ ප තුල්
නොපෑ උන්ගේ දෙප තුල්
කෙරෙයි සත ලොබ තුල්
කුමක් කියමුද මෙලොව කර තුල්

382
නොවිසා යුවලැ සේ
දුක දුක රිසිනොයන සේ
රුවඇති කල මෙ සේ
කිම්ද නරසුර*ලොවෙහිවෙනසේ

383
නම ඇසූ පමණ ට
ලොබවන මතුරැ විලස ට
මුන් රුව වින්නෙත ට
ලබන සගමොක් සැපයි උගග ට

384
සුරගන සරි සි රින්
බබළන මෙම් වුන් රුසි රින්
බැඳුනහු පෙම් බ රින්
කෙසේ ගැලවී යෙද්ද සස රින්

385
මෙලෙසින් ලොව මහ ත්
වියතුන් බසින් තුතිල ත්
පවර රිවිකුල කො ත්
රුවින් මුළුදඹදිවට අගප ත්

381 රූසයුරේ, රූපශාගරයාගේ; පතුල්නොපෑ, පතුල් නොදුටුවූ; උන්ගේ, ඒ මහේශිකාවුන්ගේ; දෙපතුල්, පතුල්සඟළ; සත, සත්වයන්ගේ; තුල්, මහත්වූ; ලොබ, ලොභය; කෙරෙයි, උපදවයි; එහෙයින්) මෙලොව, මේ ලෝකයෙහි; කුමක්, කිනම් වස්තුවක්; තුල් කර, සමානකොට; කියමුද, කථාකෙරෙම්ද.?

382 යුවලැසේ, අක්ෂියුග්මය; නොවිසා, නොපියා; දුකදුක, දශිනය කොටකොටත්; රිසිනොයනසේ, රුචිනොවනමෙන්; මෙසේ, මෙයාකාරවූ; රුවඇතිකල, රූපයවිද්‍යමානකල්හි; නරසුරලොවෙහි, මනුෂ්‍යදිව්‍යයනලොකවලයෙහි; වෙනසේ, වෙනස්බවක් නම්; කිම්ද, කුමෙක්ද.?

383 නමඇසූපමණට, නාමයඇසූපමණකින්ම; ලොබවන, ලොභ උපදවන්නාවූ; මතුරැවිලසට, මන්ත්‍රයක්මෙන්; මුන්රුව, මොවුන්ගේ රූපය; වින්, ප්‍රත්‍යක්ෂවූ; නෙතට, නෙත්‍රයට; (ඇස්ඇත්තවුන්ට) ලැබෙන, ලැබෙන්නාවූ; සගමොක්සැප, ස්වර්ගමොක්ෂසම්පත්තිය; උගගටයි, දුෂ්කරවෙයි.

384 සුරගනසරි, දෙවඟනක්මෙන්; සිරින්බබළන, ශ්‍රීයෙන්බබලන්නාවූ; මොවුන්රුසිරෙන්, මැගේ රූපශ්‍රීයාවෙහි; පෙම්බරින්, ප්‍රෙම්භාරයෙන්; බැඳුනහු, බඳිවූවාහු; කෙසේ, කවරාකාරයකින්; සසරින්, සංසාරයෙන්; ගැලවීයෙද්ද, මිදෙද්ද.?

385 මෙලෙසින්, මෙයාකාරයෙන්; ලොව, ලෝකයෙහි; මහත්, බොහෝවූ; වියතුන්බසින්, විද්වාංසයන්ගේ වචනයෙන්; තුතිලත්, ස්තුතිලද්දාවූ; පවර, උතුම්වූ; රිවිකුල, සූර්යවංශයට; කොත්, කෙතුවක්වැනිවූ; රුවින්, රූපසෞන්දර්යයෙන්; මුළුදඹදිවට, සම්ස්ත ජම්බුද්වීපයට; අගපත්, අග්‍රප්‍රාප්තවූ.

* ලොවැසි.

386 දූකරුව මෙ ර ගින්
තෝරාගෙනව් සස ගින්
ඛබිලන තුනු ව ගින්
පවර එබිසෝ*සඳුන් සම ගින්

387
නොහැරම දසදි ගෙහි
පෙන්වා යසස බව ගෙහි
අඩුකල සිරි ස ගෙහි
විසි විසිතව වසක් ගිහි ගෙහි

388
සකකුලඹර ලස ද
එයසෝදරු නම් ල ද
පින්සිරිපිරි නොම ද
පවර රාහුල කුමරු ලත් ස ද

389
දූක සිව්පෙර නිමි ති
ඈරරජ සැපත සිත රු ති
ලබින මතු සක් වි ති
සැපත්නොතකාසිතින්නොනැව ති

390
ඉසෝරා මැඳුරත ට
දිගුකළ පයැද එම ට
සත්මැතිඳු පසුකො ට
නැගීකන්තක මගුල් අසුපි ට

---

386 මෙරගින්, මේරුපර්වතයෙන්; රුව, රූපය; දූක, දර්ශනය කොට; සසගින්, ෂට්විධකාමස්වර්ගයෙන්; තෝරාගෙනව්, තෝරාගත් තාක්මෙන්; ඛබලන, ඛබලන්නාවූ; තුනුවගින්, ශරීරයකින් යුක්තනාවූ; පවර, ප්‍රවරවූ; එබිසෝසඳුන්සමගින්, ඒ මෙහෙසිකාඋත්තමි යශා.

387 දසදිගෙහි, දශදිශාවෙහි; නොහැරම, අත්නොහැරම; යසස, කීර්තිය; බවගෙහි, භවාග්‍රයෙහි; පෙන්වා, දක්වා; සගෙහි, ස්වර්ගයෙහි; සිරි, ශ්‍රියාව; අඩුකල, අඩුකලාවූ; ගිහිගෙහි, ගෘහවාසයෙහි; විසිතෑවසක්, විසිනවවර්ෂයක්; වසී, වාසයකළසේක.

388 සකකුලඹර, ශාක්‍යවංශනැමති ආකාශයෙහි; ලසඳ, අභින ව චන්ද්‍රයාවැනිවූ; එ යසෝදරුනම්ලද, ඒ යසෝදරානම් කාන්තාව; නොමඳ, බොහෝවූ; පින්සිරි, පුණ්‍යශ්‍රියාවෙන්; පිරි, පූර්ණවූ; පවර, උතුම්වූ; රුහුලකුමරු, රාහුල්කුමාරයා; ලත්සඳ, ලැබූකල්හි.

389 සිව්පෙර නිමිති, පූර්වනිමිති සතර; දූක, දර්ශනයකොට; සිතරුති, සිතමිරුචිවූ; රජසැපත, රාජසම්පත්තිය; ඈර, දුරුකොට; මතු, අනාගතයෙහි; ලබින, ලබන්නාවූ; සක්විතිසැපත්, චක්‍රවර්ති සම්පත්තියත්; සිතින්, චිත්තයෙන්; නොතකා, නොසලකා; නොනැවති, නොනැවත.

390 ඉසෝරා, යශෝධරාදේවීය; (සයනයකළාවූ) මැඳුරතට, මන්දිරය ඇතුළට; එවිට, ඒක්ෂණයෙහි; දිගුකල, ප්‍රසාරණයකරනලද; පයැද, පාදයම්හැත්තොට; සත්මැතිඳු, ඡන්නනම් අමාත්‍යයා; පසුකොට, පස්සෙහිකොට; කන්තක මගුල්අසුපිට, කන්ථකනම් මඞ්ගලඅශ්වරාජයා පිටට; නැගී, ආරූඪව.

---

* ලඳුන්.

391 නික්මෙනු දුක එව රී
ගලසඳ සුරන් පුරඳෙ ර
පසු පෙරදෙ අත්ව ර
සුරන් සැට සැට දහස් පිරිව ර

392
දිගුබිත කර ප හ න්
ගත් මිණි වැට දඹු ප හ න්
හිමි සිත තුටු ප හ න්
ගෙවා නිස්යොදුන ගොස් නොපහ

393
අරුණු රැස් ප ත ර ව
සහ නඹසිළුන් ම ත ර ව
රිවි එන රත ත ර ව
අනෝමා නම් ගඟින් එ ත ර ව

394
දස පෙරුමන් බුහු රී
පිරුණෙන් සිතෙහි නොකිලි ටි
කෙලෙසුන් සහ දිගු ටි
මිඟුල් කඩුවෙන් කපා කෙස්වැ ටි

395
ලොවට පියකර ණ ව
මහ බඹහු දුන් පම ණ වූ
සිවුරු ගෙණ මහ ණ ව
එතර වන ලෙස සසර මහ ණ ව

---

391 එවර, ඒකාලයෙහි; නික්මෙනුදුක, නිෂ්ක්‍රමණදර්ශනය කොට; සුරන්, දෙවතාවන්; පුරඳෙර, නගරවාරය; ගලසඳ, හැරියකල්හි; පසු, පශ්චාත්භාගයෙහිද; පෙර, පූර්වභාගයෙහිද; දෙඅත්වර, උභය පාර්ශ්වයෙහිද; සැටසැටදහස් සුරන්, ෂෂ්ටිසහශ්‍රසඞ්ඛ්‍යාතදෙවතාවන්; පිරිවර, පරිවාරවූහ.

392 දිගුබිත, දිශානමැතිභිත්තීන්; පහන්කර, ආලෝකකොට; මිණිවැටදඹුපහන්, මාණික්‍යමයදණ්ඩප්‍රදීපයන්; ගත්, ග්‍රහණයකළ කල්හි; හිමි, ස්වාමිතෙම; සිත, චිත්තය; තුටුපහන්, තුෂ්ටප්‍රසන්නව; නිස්යොදුන, තිංශයොජනප්‍රමාණ (මග) ගෙවා, ඉක්මවා; ගොස්, ගමනයකොටත්; නොපහන්, පහන්නොවූයේය.

393 අරුණුරැස්, අරුණාලොකය; පතරව, විස්තීර්ණවනකල්හි; නඹසිළුන්, සැවුලන්ගේ; (කුකුළන්ගේ) මනාරවසහ, මනාරාවය හා සමග; රිවි, සූර්‍ය්‍යයා; රතතරව, රක්තවර්ණව; එන, උදවනකල්හි; අනෝමානම්ගඟින්, එනම් ගංගාවෙන්; එතරව, පරතෙරට පැමිණ.

394 බුහුරි, ප්‍රහල්භව; දසපෙරුමන්, දශපාරමිධර්මයන්; නොකිලිටි, කිලිටිනොවූ; සිතෙහි, චිත්තයෙහි; පිරුණෙන්, පූර්ණවූයෙන්; කෙලෙසුන් සහ, ක්ලේශයන් හා සමග; දිගු, දීර්ඝවූ; අටි, අංසා කට සුතුවූ; කෙස්වැටි, කෙශකලාපය; මිඟුල්කඩුවෙන්, මඞ්ගල ඛඩ්ගයෙන්; කපා, ඡේදනයකොට;

395 ලොවට, ලොකයාහට; පියකරණව, ප්‍රීතිකරව; මහබඹහු, මහා බ්‍රහ්මයා විසින්; දුන්, දානයකරනලද; පමණව, ප්‍රමාණවත්වූ; සිවුරුගෙන, චීවරග්‍රහණයකොට; සසර මහණව, සංසාරමහාර්ණවයෙන්; එතරවනලෙස, එතරවනුසඳහා; මහණව, ප්‍රව්‍රජ්‍යාවට පැමිණ.

396 පිළිවෙත් කර න දි ත්
අවුරුදු සයක් පබ දි ත්
ගත් වෙන වෙන ල දි ත්
නිවත් මගවත සොයා නොල දි ත්

397
මැදුම් පිළි පවත සි ට
සැපදී මඳක් සිරුර ට
සේනානි ගම ට
ගොසින් අජපාල නුග සෙවන ට

398
සුජාතා නම් ල ද
ගණරන් තලියකින් සො ද
දිව ඔදලු නොම ද
මියුරු කිරිපිඩු ගෙනත් දුන් ස ද

399
කිරිපිඩු නොඇඩු කො ට
එකුන්පනසක් පිඩු කො ට
වළඳ උඩුගඟ ට
තලිය හැර සුබනිමිති දැක සි ට

400
බමුණකු දුන් අත ට
ගෙනැර කුසතණ අටමි ට
ගොස් බෝතුර මුල ට
සළාපැළදිග බලා වැඩ සි - ට

---

396 අවුරුදු සයක්, සාවුරුද්දක් මුලුල්ලෙහි; පබඳින්, ප්‍රබන්ධයෙන්; තදින්, දැඩිව; පිළිවෙත්කර, ප්‍රතිපත්තිකොට; ගත්, ගත්තාලද; වෙන වෙනලදින්, අන්‍යාන්‍යලබ්ධිවලින්; නිවත්මගවත, නිර්වාණ මාර්ගය; සොයා, පරීක්ෂාකොට; නොලදින් නොලත්හෙයින්.

397 මැදුම් පිළිවෙත, මධ්‍යම ප්‍රතිපත්තියෙහි; සිට, පිහිටා; මඳක්, ස්වල්පයක්; සිරුරට, ශරීරයට; සැපදී, සුඛදානයකොට; සේනානි ගමට, සේනානිනම් නිගමග්‍රාමයකිවූ; අජපාල නුගසෙවනට, අජපාලන්‍යග්‍රොධ ඡායාවට; (මුලට) ගොසින්, ගමනයකොට.

398 සුජාතානම් ලඳ, සුජාතානම් කාන්තාව විසින්; සොඳ, සුන්දරවූ; ගණරන්තලියකින්, ස්වර්ණමය ස්ථාලයකින්; නොමඳ, බොහෝකොට; දිවඔදලූ, දිව්‍යඕජස් බහාලනලද; මියුරු, මධුරවූ; කිරිපිඩු, ක්ෂීරපායාස පිණ්ඩය; ගෙනත්, ග්‍රහණයකොට; දුන්සඳ, පිළිගැන්වූ කල්හි.

399 කිරිපිඩු, ක්ෂීරපායාසය; නොඇඩුකොට, ඌනනොකොට; එකුන්පනසක්, එකුනපඤ්ඤාසයක්; (ගතලිස් නවයක්) පිඩුකොට, ගුළිකොට; වළඳ, අනුභවකොට; උඩුගඟට, ඌර්ධ්වස්‍රොතයට; තලිය, භාජනය; හැර, විහිදුවා; සුබනිමිති, සුභනිමිත්තයන්; දැකසිට, දර්ශනයකොට සිටලා.

400 බමුණකු, *බ්‍රාහ්මණයෙකු විසින්; අතට, හස්තයට; දුන්, දානයකරනලද; කුසතණඅටමිට, එනම් තෘණඅෂ්ටමුෂ්ටිය; ගෙන ඇර, ග්‍රහණයකොට; බෝතුරමුලට, බොධිවෘක්ෂමූලයට; ගොස්, ගමනයකොට; සළා, සිසුරුවා; පැළදිගබලා, ප්‍රතිදිශාව අවලොකනය කොට; වැඩසිට, වැඩහිඳ.

---

* සොත්ථිය නම් බමුණා විසිනි.

401 මිහිරා නැගී රුව ට
තුදුසත් විදුරසුන් පි ට
පිටලා බෝතුර ට
යෙහෙන් ඉඳසිවු ඉවත් දුකිකො ට

| 402 | | 404 | |
|---|---|---|---|
| ආ මරසෙන් රො | සේ | මැදයම ලැබ දිවැ | ස් |
| දසබිම්බරක් එම | සේ | සැවපිළි සඳෙහි දන රැ | ස් |
| බිඳහැර දස ද | සේ | දුක මතු වන දව | ස් |
| තුමුල් තලපත් පුලුන් රළ | සේ | පැවති මොහඳුරු දමා නොවල | ස් |
| **403** | | **405** | |
| පෙරයම පෙර දව | ස | සුවිසිපසාක | ර |
| නොයෙක් කප්කෙළ සුවහ | ස | විමසා නැණින් සැකහැ | ර |
| කඳපිළිවෙළ වෙසෙ | ස | වත්මන්කල් අත | ර |
| පැවති මොහඳුරු දමා මුල් පි | ස | වැසු මොහඳුරු පටල දුරු ක | ර |

---

401 මිහිරා, පෘථිවිරාවය කොටගෙණ; රුවට, මතුව; නැගී නැංගාවූ; තුදුසත්, තුදුස්රියන් ප්‍රමාණවූ; *විදුරසුන්පිට, වජ්‍රාසනය මතුයෙහි; බෝතුරට, බෝධිවෘක්ෂයට; පිටලා, පෘෂ්ඨයකොට; සිවු ඉවත්, චතුරාධිෂ්ඨානයන්; දුකිකොට, දෘඪවූගෙණ; යෙහෙන්, සැප සේ; ඉඳ, නිසීදනයකොට.

402 රොසේ, කෝපයෙන්; ආ, පැමිණියාවූ; දසබිම්බරක් මර සෙන්, බිම්බර දශයක් ප්‍රමාණවූ මාරසේනාවන්; එමසේ, ඒ ඇසිල් ලෙහි; තුමුල්තලපත්, මහත්වූ සුලඟට පැමිණියාවූ; පුලුන්රළසේ, පුලුන්රොදක්මෙන්; දසදෙස්, දශදිශාවන්හි; බිඳහැර, බිඳවායවා.

403 පෙරයම, ප්‍රථම යාමයෙහි; පෙරකල, පූර්වකාලයෙහි; නො යෙක් කප්කෙළසුවහස, අනෙකකල්පකොටි ශතසහශ්‍රයන්හි; කඳ පිළිවෙළ වෙසෙස, ස්කන්ධපටිපාටිවිශෙෂයෙහි; පැවති, පැවැත්තාවූ; මොහඳුරු, මොහාන්ධකාරය; මුල්පිස, මූලොත්පාටනයකොට; දමා, දුරුකොට.

404 මැදයම, මධ්‍යමයාමයෙහි; දිවැස්ලැබ, දිව්‍යචක්ෂුර්ඥානලා භිව; මතුවන දවස්, අනාගතකාලය; දක, දර්ශනයකොට; දනරැස්, ජනසමූහයාගේ; සැවපිළිසඳෙහි, ච්‍යුතිප්‍රතිසන්ධියෙක්හි; පැවති, පැවැත් තාවූ; මොහඳුරු, මොහාන්ධකාරය; නොවලස්, අප්‍රමාදව; දමා, දුරුකොට.

405 සුවිසිපසාකර, චතුර්විංශත්ප්‍රත්‍යයාකාර ධර්මයන්; නැණින්, ඥානයෙන්; විමසා, විමංසනයකොට; සැකහැර, සැකදුරුකොට; වත්මන්කල්අතර, වර්තමානකාලාන්තරයෙහි; වැසු, ඡාදිතවූ; මොහඳුරු පටල, මොහාන්ධකාර පටලය; දුරුකර, දුරිභූතකොට.

---

* විදුරු එවී, විදුරු, විදුරු අස්න, විදුරස්න වජ්‍රය කිසිවෙකු විසින් නොබිඳිය හැක්කාසේ මෙම ආසනයද කිසිවෙකු විසින් නොබිඳිය හැකි බැවින් මීටද විදුරස්නයයි කියත්.

406 පෙර බුදුවරුන් හැ ම
දුටුලෙස දකින නොහැර ම
නුවණින් අසම ස ම
බුදුව සව්නේ ගෙවා අළුය ම.

407
වැලඳ අම ර සි න්
කිරිපිඩු එකුන් පන සි න්
වෙන අහර දන සි න්
නොගොස් සත්සතියක්මවෙසෙසි

408
දෙසු මේ ස ද මි න්
මුදමියි සතන් අ ද මි න්
සවන් රැස් වි ද මි න්
ගොසින් බරණැසට බඹසද මි න්

409
විහිදු බඹ ගො සා
සිවුසස් දෙසා සත සා
නිවන්පුර සල සා
බඹුන් අටළොස් කෙලක් නොල

410
තුටුකර සත ස ත න්
දෙසවයි දහම් ඇම ත න්
සිත කෙලෙසුන් මු ත න්
යවා මුළුලොව සැටක් රහ ත න්

---

406 පෙර, පූර්වකාලයෙහි; හැමබුදුවරුන්, සියලු බුදුවරයන් වහන්සේලා; නොහැරම, අත්නොහැරම; දුටලෙස, දශීනයකළ පරිද්දෙන්; දකින, දශීනය කරන්නාවූ; නුවණින්, ඥාණයෙන්; සව්නන්, සියලු දතයුතු ධම්මයන්; ගෙවා, ක්ෂපකොට; අලුයම, උදෑසන කාලයෙහි; අසමසම, (පෙර බුදුවරයනට සමහෙයින්) අසමසම නම්වූ; බුදුව, බුඩත්වයට පැමිණ.

407 අමරසින්, අමෘතරසයෙන්; වැළඳ, වළඳනලද; කිරිපිඩු එකුන්පනසින්, එකුනපඤ්ඤාස ක්ෂීරපායාස පිණ්ඩයෙන් (සතුටල පැමණ) සත්සතියක්ම, සප්තසප්තාහයක්ම; වෙන අහර අදහසින්, අනික් අහරක් ලබන කල්පනාවෙන්; නොගොස් (අන්තෑතෙක්හි) නොවැඩම්වා.

408 දෙසූ, දෙශනාකරණලද; මේ සදමින්, මේ සධර්මයෙන්; සතන්, සත්වයන්; අදමින්, අධර්මයෙන්; මුදමියි, මුක්තකරමැයි; සවන්රැස් විදමින්, සවනක්ෂණ (බුඩ) රශ්මිය විසිරීණිය කරමින්; බඹයදමින්, (මහා) බ්‍රහ්මරාජයාගේ ආයාචනාවෙන්; බරණැසට, බරණැසි නගරයට; ගොසින්, වැඩමවා.

409 බඹගොසා, බ්‍රහ්මඝොෂාව; විහිද, විහිදුවා; සකසා, යහපත්කොට; සිවුසස්, චතුස්සත්‍යධර්මයන්; දෙසා, දෙශනාකොට; නොලසා, වහා; බඹුන් අටළොස් කෙලක්, බ්‍රහ්මයන් අෂ්ටාදශකොටියකට; නිවන්පුර, නිර්වාණනගරය; සලසා, සිඬකොට.

410 සත, සත්වයන්ගේ; සතන්, සන්තානයන්, (චිත්තයන්) තුටුකර, තුෂ්ටකොට; ඇමතැන්, සියලුතන්හි; දහම්දෙසවයි, ධර්මදෙශනා කරවයි; (සියා සිත, චිත්තය; කෙලෙසුන්, කෙලශයන්ගෙන්; මුතන්, මිදුනාවූ; සැටක්රහතන්; හැටනමක් පමණ රහතන්වහන්සේලා; මුළුලොව, සමස්තලෝකයෙහි; යවා, පිටත්කරහැර.

411 නොදන්නා බුදුබල පෙ ර
තවුසන් කරන අනද ර
දක්වා වරින් ව ර
දහස් තුන්පන්සියක් පෙළහ ර

412
තුන් තවුසන් එ දා
පිරිවර සමග සමු දා
බව බැඳුමෙන් මු දා
යොදා මගපලරසෙහි නොම දා

413
එසහ පිරිවරකො ට
බඹසුර නරන් තුටුකො ට
සක්රුවනසේ බ ට
එසින්වැඩ රජගහ නුවර ට

414
මුනිසඳ සඳ මෙ නේ
දහසක් සගුන් රැගෙ නේ
*එසල් සල් උය නේ
වැඩසිඳින් යනු අසා එදි නේ

415
මහසෙන් පිරිව රා
පිරි ඇතුළුපිටි නුව රා
බිම්සර නරව රා
අවුත් වැඳ මුනීසරණ තඹ රා

---

411 පෙර, පූර්වයෙහි; බුදුබල, බුද්ධබලය; නොදන්නා, අජානනය කොට; තවුසන්, තාපසයන්; අනදරකරන, අනාදරයකරණකල්හි; වරින්වර, වාරයෙන්වාරයෙහි; තුන්දහස්පන්සියක් පෙළහර, පඤ්චසතාධික ත්‍රිසහශ්‍ර ප්‍රමාණ ප්‍රාතිහාර්‍ය්‍යයන්; දක්වා, පෙන්වා.

412 එදා, එදිනයෙහි; තුන්තවුසන්, (උරුවෙල් කසුප් ආදිවූ) තාපසයන් තුන්දෙන; සපිරිවරසමුදාසමග, පරිවාරසමූහයාසමග; බව බැඳුමෙන්, භවබන්ධනයෙන්; මුදා, මුක්තකොට; නොමදා, අමන්දව; මගපලරසෙහි, මාර්ගඵල රසයෙහි; යොදා, යුක්තකොට.

413 එසහ, එසඞ්ඝසමූහයා; පිරිවරකොට, පරිවාරකොට; (ගෙණ) බඹසුරනරන්, බ්‍රහ්මදිව්‍ය මනුෂ්‍යයන්; තුටුකොට, තුෂ්ටකොට; බට, (භූමියට) අවතීර්ණවූ; සක්රුවනසේ, චක්‍රරත්නයමෙන්; එසින්, ඒ ශීඝ්‍රයෙන්; රජගහනුවරට, රාජගෘහනගරයට; වැඩ, වැඩමවා.

414 මුනිසඳ, මුනිඳුතුමා; සඳමෙන්, (තරුපිරිවරණලද) චන්ද්‍රයාමෙන්; දහසක් සගුන්, සහශ්‍රසඞ්ඛ්‍යාත සඞ්ඝයා; රැගෙනේ, ග්‍රහණයකොට; එසල්, එශාලවූ; සල්උයනේ, සාලඋද්‍යානයෙහි; වැඩසිඳිනියනු, වැඩසිඳින්නේයයි; එදිනේ, එදිනයෙහි; අසා, ශ්‍රවණයකොට.

415 බිම්සරනරවරා, බිම්බිසාරනම්රජයා; ඇතුළුපිටිනුවරා, නුවරතුළ හා නුවරින්පිට; පිරි, පූර්ණවූ; මහසෙන්, මහාසේනාව; පිරිවරා, පිරිවරාගෙන; අවුත්, ආගමනයකොට; මුනී, මුනීන්ද්‍රයන්ගේ; සරණතඹරා, චරණනැමති තාමරසය; (නෙලුම්මල) වැඳ, නමස්කාරකොට.

---

* ධම්මපදකථාවෙහි ලට්ඨිවනුය්‍යානෙන කියාතිබෙයි, එහිපුරාණ සැටපදයෙහි ඒ පසන්වැල්මිවන කියා තේරුම්දී තිබේ, සමන්තපාසාදිකා විනය අටුවාවෙහි ලඞ්ඝිවනෙහි, තාලුය්‍යානෙ; කියා තේරු තිබේ එනම් තල්වනයයි, මෙහි සල්වනයයි කියාතිබේ, මෙය පිරික්සියයුතු නමුත් පොත්කිහිපයකම මෙසේම තිබුනනිසා වෙනස් නොකළෙමි.

416 උන්සඳ තමන් වෙ ත
සඳහම් දෙසා උන් සි ත
කෙලෙසුන් හැර ඉවු ත
ලොවට දක්වා නිවන් මගව ත

417
නරනිඳු සිත තො සේ
මහසෙංග ගෙන එම සේ
එනුවර අබි ය සේ
නිවන්පුරනම් මෙයසි යනු සේ

418
මල්වතු පලෙලාල් ස ල්
පුල්වල් පොකුණු සිහිලැ ල්
*ඇත්හල්ද දත්හ ල්
පවුරුපල ගෙලවිසල් වාස ල්

419
බඹවිමනෙව් ඉහි ල්
ලඹ කිකිණිදූල් මුතුලැ ල්
සුවිසල් මතු මහ ල්
තුමුල් පැහැපහපෙළින් මතකල්

420
නුබමෙන් සතා ර ය
දිලිහෙන නිති දිවා රැ ය
අයුරු අමතා ර ය
වෙළවන නම් කරවිහා ර ය

---

416 තමන්වෙත, තමාවෙහන්සේගේසමීපයෙහි, උන්සඳ, තිසි දනය කළකල්හි; සඳහම්දෙසා, සද්ධර්මය දෙශනාකොට; උන්සිත, ඔවුන්ගේ චිත්තයෙහි; කෙලෙසුන්, ක්ලෙශයන්; ඉවතහැර, දුරු කොට; ලොවට, ලොකයාහට; නිවන්මගවත, නිර්වාණමාර්ග මාර්ගය; දක්වා, පෙන්වා.

417 නරනිඳු, නරෙන්ද්‍රතෙම; සිතතොසේ, චිත්තසන්තොෂයෙන්; එම්සේ, එයාකාරයෙන්ම; මහසෙංගගෙන, මහාසෙනාව ග්‍රහණය කොට; එනුවර අබියසේ, ඒනගරය සමීපයෙහි; නිවන්පුරනම්, නිර්වාණපුරයනම්; මෙයසි, මේනගරයවැයි; යනුසේ, කියාවන්නාක්මෙන්.

418 පලෙලාල්, පාවලීය; සල්, ශාලයයනවෘක්ෂයන්ගෙන්යුක්තවූ; මල්වතු, පුෂ්පඋද්‍යානයන්ගෙන්ද; පුල්, පුල්ලවූ; සිහිලැල්, සිහිලජලය ඇති; විල්පොකුණු, තඩාග පුෂ්කරණීන්ගෙන්හා; පැත්හල්ද, පානීය ශාලාවන්ද; දත්හල්, දානශාලාවන්ගෙන්ද යුක්තවූ; පල, පතලාවූ; ගෙල, (සුණුයෙන්) ධවලවූ; පවුරු, ප්‍රාකාරයන්ගෙන්හා; විසල්, විශාලවූ; වාසල්, ගොපුර මාරයන්ද ඇත්තාවූ.

419 බඹවිමනෙව්, බ්‍රහ්මවිමානයක්මෙන්; ඉහිල්, සිපිලවූ; ලඹා එල්බෙන්නාවූ; කිකිණිදූල්, කිංකිණිකජාලාවන්හා; මුතුලැල්, මුක්තා ලතිකාවන් ඇත්තාවූ; සුවිසල්, අතිවිශාලවූ; මතුමහල්, මතුමහල් තල ඇත්තාවූ; තුමුල, මහත්වූ; පැහැ, ප්‍රභාමත්වූ; පහපෙළින්, ප්‍රා සාද පඞ්ක්තියෙන්; මනකල්, මනොකාලවූ.

420 සතාරය, තාරකාවන් සහිතවූ; නුබමෙන්, ආකාශයමෙන්; නිති, නිරන්තරයෙන්; දිවාරැය, රැදවල්; දිලිහෙන, බබලන්නාවූ; අම්බතාරය අයුරු, අම්බතාකාරයක්වැනිවූ; වෙළුවනනම්, වෙළුවන නම්වූ; විහාරය, විහාරයක්; කර, කරවා.

---

* පත්හල්ද

421 දුන්සඳ නිරිඳු ස ඳ
පිළිගෙන මුනිඳු මනන ඳ
දියපොළොව පිරිසි ඳ
ගුගුරුවා මුළුපොළොව එකබ ඳ

| 339 | | 338 | |
|---|---|---|---|
| දහම් වැසි ව | ස් වා | අවාබිය අවර | ණ |
| තුන්දෙස් ගිම්හන් න | ස් වා | දක්වා ලොවට තිසර | ණ |
| සත සිත සතො | ස් වා | පහළකර අපම | ණ |
| කුසල් බිජු පින්කෙතෙහිඉ | ස් වා | තමාතම අරහාදි බුදුගු | ණ |

| 337 | | 340 | |
|---|---|---|---|
| දහම් සක් පු | ම් බා | පන්වා දුසිරි සි | ත |
| පදසුර බඹුන් සි | ම් බා | නංවා දහම් ජයකො | ත |
| රූපාගුණ බි | ම් බා | පෙන්වා ගුණ මහ | ත |
| *දෙසැටමිස දිටුසිඳු කල | ම් බා | ලොවට †දන්වා තමන් දළමෙව | ත |

421 නිරිඳුසඳ, නරේන්ද්‍රචන්ද්‍රයා; දුන්සඳ, පිදූකල්හි; මනනඳ, මනොනන්දනවූ; මුනිඳු, මුනීන්ද්‍රයන් වහන්සේ; පිළිගෙණ, ප්‍රතිග්‍රහණයකොට; දියපොළොව පිරිසිඳ, ජලපොළොව අවසන්කොට; මුළුපොළොව, සියලුපෘථිවිය; එකබඳ, එකසේ; ගුගුරුවා, ගර්ජනාකරවා.

422 දහම්වැසි, ධර්මනැමති වර්ෂාව; වස්වා, වර්ෂාකරවා; තුන්දෙස්, (රාගාදි) ත්‍රිවිධදොෂනැමැති; ගිම්හන්, ග්‍රීෂ්මය; නස්වා, විනාශකොට; සත, සත්ත්වයන්ගේ; සිත, චිත්තය; සතොස්වා, සන්තොෂකරවා; කුසල්බිජු, කුසල්නැමති බීජයන්; පින්කෙතෙහි, පුණ්‍යක්ෂෙත්‍රයෙහි; ඉසවා, ඉස්සවා.

423 දහම්සක්, ධර්මනැමති ශඞ්ඛය; පුම්බා, ධමනයකරවා; පද, පාදයන්; සුරබඹුන්, දිව්‍යබ්‍රහ්මයන් ලවා; සිම්බා, චුම්බනයකරවා; ගුණබිම්බා, ගුණනැමති ප්‍රතිබිම්බය; රූපා, ගෙනහැරදක්වා; දෙසැට මිසදිටු, ද්වාෂෂ්ටිදෘෂ්ටිනැමති; සිඳු, සිඳුව; (මූද) කලම්බා, කලඹවා.

424 අවාබිය, අපායභීතිය; අවරණ, ආවරණයකොට; ලොවට, ලොකයාහට; තිසරණ, සරණත්‍රය; දක්වා, ප්‍රකාශකොට; තමා, තමන්වහන්සේගේ; අපමණ, අප්‍රමාණවූ; නවඅරහාදි බුදුගුණ, අර්හත්වය ආදිකොටඇති නවවිධ බුද්ධගුණය; පහළකර, ප්‍රකටකොට.

425 දුසිරිසිත, දුශ්චරිතචිත්තය; පන්වා, දුරුකරවා; දහම්, ධර්මනැමති; ජයකොත, ජයකෙතුව; නංවා, ආරොපණය කරවා; මහතගුණ, ගුණමහාත්මයය; පෙන්වා, දක්වා; තමන්, තමන්වහන්සේගේ; දළමෙත, දෘඪමෛත්‍රිය; ලොවට, ලොකයාහට; දන්වා, අවබොධකරවා.

* එශකාඩ උයනේ ධම්මබන්ධු මහතාගේ ලෝවැඩසඟරා විස්තරාර්ථ සන්නයබලා දතයුතු. † දක්වා.

| | |
|---|---|
| 426 ලෙසින් සිගිල | ඹි යා |
| තෙපුලෙන් යතන් පො | බ යා |
| පරවැඩ අර | බ යා |
| දියත සිටුවා දහම් වැ | ඹ යා |

| 427 | | 429 | |
|---|---|---|---|
| සසරට ස | තු රු වා | දහම් සිත පු | ර වා |
| කෙලෙසඳ රට මි | තු රු වා | නිවන්පුර මදුර හ | ර වා |
| සමමෙත් ප | තු රු වා | මරුමන් දෙද | ර වා |
| දහම් මහ ගඟ ලොව උ | තු රු වා | තමා නම නිතර සිහි ක | ර වා |

| 428 | | 430 | |
|---|---|---|---|
| තමන් නම අ | ස් වා | සමවත් සැප යෙ | දී |
| දහම් ජයබෙර ග | ස් වා | එසැප සගටත් ගෙණ | දී |
| පිරිසිදු පසැ | ස් වා | මහකුළුනෙන් බැ | දී |
| සොඳුරු සගපවග මග ස | ස් වා | ලෙවන් කළ'මිස පුදෙහි නොබැ | දී |

---

426 සිගිලඹියා ලෙසින්, සිගිල්දියෙන් මෙන්; තෙපුලෙන්, වචනයෙන්; යතන්, සත්වයන්; පොබයා, ප්‍රබෝධකරවා; පරවැඹ අරබයා, පරහිතවෘද්ධියපිණිස; දියත, ලොකයෙහි; දහම්වැඹයා, ධර්මනැමිති ස්තම්භය; (කණුව) සිටුවා, ස්ථාපිතකරවා.

427 සසරට, සංසාරයට; සතුරුවා, සතුරුව; කෙලෙස් අඳරට, කෙලශඅන්ධකාරයට; මිතුරුවා, සුහෘත්වැනිව; සමමෙත්, සමමෛත්‍රිය; පතුරුවා, ව්‍යාප්තකරවා; දහම්, ධර්මනැති; මහගඟ, මහාගංගාව; ලොව, ලොකයෙහි; උතුරුවා, උත්තරිතකරවා.

428 තමන්නම, තමන්වහන්සේගේ නාමය; අස්වා, අස්සවා; දහම්, ධර්මනැමති; ජයබෙර, විජයභෙරීන්; ගස්වා, ශබ්දකරවා; පිරිසිදු, පරිශුද්ධවූ; පසැස්වා, *පචවිධචක්‍ෂුන්ඇතිව; සොඳුරු, සුන්දරවූ; සගපවගමග, ස්වර්ගාපවර්ගමාර්ගය; සස්වා, ශුද්ධකරවා.

429 දහම්, ධර්මය; සිත චිත්තයට; පුරවා, පූරණයකරවා; නිවන් පුර, නිර්වාණපුරයාගේ; මදුර, මාරය; හරවා, විවෘතකරවා; මරුමන්, වසවර්තිමාරයාගේමානය; දෙදරවා, කම්පාකරවා; තමානම, තමන්වහන්සේගේ නාමය; නිතර, නිරන්තරයෙන්; සිහිකරවා, සමරණයකරවා.

430 සමවත්සැප, සමාපත්තිසුඛයෙහි; යෙදී, යොජිතව; එසැප, ඒ සමපත්තිසැපය; සගටත්, සත්ත්වයන්ටත්; ගෙණදී, ග්‍රහණයකොටදී; මහකුළුණෙන්, මහාකරුණාවෙන්; බැදී, බඩව; ලෙවන්, ලොකවාසීන් විසින්; කළ, කරණලද; අමිසපුදෙහි, ආමිසපූජායෙහි; නොබැදී, අබඩව.

---

* මසැස, දිවැස, පැණැස, බුදුඇස, සමතැස යනමොහුපසැව චක්‍ෂුහු වෙත්.

431 උස්කර සිල් පවු ර
තරකර දහම් කඳවු ර
සඟනව් මැති පව ර
වෙසෙස් දම්රජව මුනි එ වෙහෙ ර

432
ගොතිපත් ගෝතම න ම්
ගුණෙන් සැදි සම්බුදු න ම්
මුළුලොව තමා න ම්
මතුරුකල එබුදු වැඩියෙය් න ම්

433
අපගේ රට මෙබ දු
ඇති උවදුරෙන් මඳ කු දු
අලපතෙහි දිය බි දු
ලෙසින් නොතිබෙයි කීයමැතිසඳු

434
එමැතිඳු බස් අ සා
නිරිඳෙ වෙමින් සතො සා
යනලෙස නොවල සා
තමන් අතුරෙන් රජෙකු විම සා

435
තිලෝගුරු මුනිඳු ට
වඩනාලෙසට මෙපුර ට
අයදින ලෙස එවි ට
යවයි බිම්සර *නිරිඳුගේ ර ට

---

431 සිල්පවුර, ශීලනැමැති ප්‍රාකාරය; (තාප්පය) උස්කර, උස් කොට; දහම්, ධර්මනැමැති; කඳවුර, ස්කන්ධාවාරය; තරකර, ස්ථිර කොට; සව්සඟ, ශ්‍රාවක සංඝයානැමැති; පවර, උතුම්වූ; මැති, මන්ත්‍රීන්හා; දම්රජව, ධර්මරාජත්ව; මුනි, සර්වඥතෙම; එවෙහෙර, ඒ (වේළුවන) විහාරයෙහි; වෙසේ, වාසයකරනසේක.

432 ගොතින්, ගොත්‍රයෙන්; ගොතමනම්, ගෝතම නම් වන සේක; ගුණෙන්, (අවබොධකරනලද) විශෙෂගුණයන්කරන කොට; සම්බුදුනම්, සම්බුද්ධයන නාමය; සැදි, සැදුනසේක; මුලුලොව, සමස්තලොකයාහට; තමා නම්, තමන්වහන්සේගේ නාමය; මතුරුකල, මන්ත්‍රයක්මෙන් කලාවූ; එබුදු, ඒසම්බුද්ධයෝ තුමූ; වැඩියෙය්නම්, වැඩියාහුනම්.

433 අපගේරට, අපගේ රාජ්‍යයෙහි; මෙබඳු, මෙයාකාරව; ඇති උවදුරෙන්, ඇතතාවූ උපද්‍රවයෙන්; මඳකුදු, ස්වල්පයකුත්; අලපතෙහි, අලකොලයෙහි; දියබිඳුලෙසින්, (නොඇලි රූරාබස්නා) දියබින්දු මෙන්; නොතිබෙයි, නොතිබේයයි; මැතිසඳු, මැතිඋතුමා; කීය, කථනය කෙළේය.

434 එමැතිඳු, ඒ මන්ත්‍රීන්ද්‍රයාගේ; බස්අසා, වචනශ්‍රවණයකොට; නිරිඳෙ, නරෙන්ද්‍රයෝ; සතොසාවෙමින්, සන්තුෂ්ටවෙමින්; නොලසා, අනලස්ව; (වහා) යනලෙස, යනපරිද්දෙන්; තමන්අතුරෙන්, තමන් ගෙන්; රජෙකු, රාජයෙකු; විමසා, පරීක්ෂාකොට.

435 තිලෝගුරු, ත්‍රෛලොකාචාර්‍ය්‍යවූ; මුනිඳුට, මුනීන්ද්‍රයන් වහන්සේට; මෙපුරට, මේ නගරයට; වඩනාලෙසට, වැඩමවන පරිද්දෙන්; එවිට, එකල්හි; අයදිනලෙස, ආරාධනා කරන පිණිස; බිම්සරනිරිඳුගේරට, බිම්බිසාර රජහුගේ රාජ්‍යයට; යවයි, ගමනය කරවයි; (කියා.)

---

* නිරිඳු නුවරට.

436 බිම්සර රජුට සො ද
මාහැගිවත් පඬුරු බැ ද
මහාලී නම් ල ද
නිරිඳු නිරිඳුණු යැවූ එමස ද

437
එනිරිඳු සඳ එවි ට
මහසෙනග පිරිවර කො ට
පරසිඳු මගද ර ට
නොසිත් වැද රජගහා නුවර ට

438
බිම්සර නර ඉසු රු
දුක රුගෙනගිය විසිතු රු
දක්වා දී පඬු රු
කියා පිළිසඳර බස් පියක රු

439
තම නුවරෙහි පැව ති
ලෙඩදුක් කියා ඉක්බි ති
මුනි වඩනා කැම ති
අසුන් දක්වා රුගෙණ අනුමැ ති

440
දියගිම් මුනි වෙත ට
ගොස් වේළුවන වෙහෙර ට
වඩිනුව තම පුර ට
කෙළේ ආරාධනා මුනිඳු ට

---

336 බිම්සර රජුට, බිම්බිසාර රාජයාහට; සොද, සුන්දරවූ; මාහැගිවත්, මහාර්ඝවස්තූන්; පඬුරු, ප්‍රාභෘතවශයෙන්; බැද, බන්ධනය කොට; මහාලිනම්ලද, මහාලියන්නාමය ලද්දාවූ; නිරිඳු, නරේන්ද්‍රයා; එමසද, ඒකාලයෙහි; නිරිඳුණු, නරේන්ද්‍රයෝතුමූ; යැවූ, පිටත්කර හැරියෝය.

437 එවිට, එකල්හි; එනිරිඳුසඳ, ඒ නරේන්ද්‍රචන්ද්‍රයා; මහසෙනග, මහාසේනාව; පිරිවරකොට, පරිවාරකොටගෙන; පරසිඳු, ප්‍රසිද්ධවූ; මගදරට, මගධරටෙහිවූ; රජගහා නුවරට, රාජගෘහනම් නගරයට; නොසිත්; ගමනයකොට; වැද, ප්‍රවිෂ්ටව.

38 බිම්සරනර ඉසුරු, බිම්බිසාර නරේශ්වරයා; දුක, දර්ශනය කොට; රුගෙනගිය, ග්‍රහණයකොටගියාවූ; විසිතුරු, විචිත්‍රවූ; පඬුරු, ප්‍රාභෘතයන්; දක්වා, පෙන්වා; දී, දානයකොට; පියකරු, ප්‍රියඞ්කරවූ; පිළිසඳරබස්, පටිසන්ථාරවචනයන්; කියා, කථනයකොට.

439 තමනුවරෙහි; තමන්ගේනගරයෙහි; පැවති, පැවැත්තාවූ; ලෙඩදුක්, රොගදුඃඛයන්; කියා, කථනයකොට; ඉක්බිති, අනතුරුව; මුනිවඩනාකැමති, සර්වඥයන් වහන්සේ වැඩමවීමෙහි අභිමතවූ; අසුන්, ලෙඛනය; දක්වා,පෙන්වා; අනුමැතිරුගෙණ,අනුමැතිය ග්‍රහණයකොට.

440 වේළුවන වෙහෙරට, වෙළුවන විහාරයෙහි (වැඩවසන්නාවූ) දියගිම්, ජගත්ස්වාමිවූ; මුනිවෙතට, සර්වඥයන් වහන්සේකරා; ගොස්, ගමනයකොට; තම්පුරට, තමන්ගේ නගරයට; වඩිනුව, වැඩමවීම පිණිස; මුනිඳුට, මුනීන්ද්‍රයන් වහන්සේට; ආරාධනාකෙළේ, ආරාධනයකෙළේය.

441 අසා එනිරිඳු බ ස
විමසා නැණින් තතුලෙ ස
වන ලෝ වැඩ පිණි ස
මුනිඳු දුක්වී වඩන අදහ ස

442
සමගින් මුනි පව ර
පන්සිය රහත් පිරිව ර
වඩිති විසල් පු ර
අසා බිම්සර නිරිඳු පින්ස ර

443
වඩන සුගතිඳු හ ට
මගසරහමැයි නිසිකො ට
සිතා වැද වෙහෙ ර ට
මෙසේ දූත්වී එමුනිසඳු හ ට

444
හිමිසඳ! මෙපුර සි ට
පස්යොදුන ගංඅතර ට
එමග *සරහනු හ ට
මඳක් බලවයි කියා මුනිඳු ට

415
යොදුනු යොදුන ත රා
කරවමිනි මහ වෙහෙ රා
බඹවිමනෙව් ස රා
නොයෙක් පුද පෙරහරින් සපු රා

441 එනිරිඳුබස, ඒනරේන්ද්‍රයාගේවචනය; අසා, ශ්‍රවණයකොට; තතුලස, තත්වූපරිද්දෙන්; නැණින්, සර්වඥතාඥානයෙන්; විමසා, විමංශනයකොට; වන, සිඩවත්නාවූ; ලෝවැඩ පිණිස, ලෝකාභිවෘද්ධිය සඳහා; මුනිඳු, මුනීන්ද්‍රයන් වහන්සේ; වඩන අදහස, වැඩමවීමෙහි අධ්‍යාසය; දුක්වී, දුක්වූසේක.

442 පවර, උතුම්වූ; මුනි, මුනීන්ද්‍රයන් වහන්සේ; පිරිවර, පරිවාරවූ; පන්සියරහත් සමගින්, පන්සියයක් රහතන් වහන්සේලා හා; විසල්පුර, විශාලා මහානගරයට; වඩති, වැඩමවන්නයයි; පින්සර, පුණ්‍යසාරවූ; බිම්සරනිරිඳු, බිම්බිසාර නරේන්ද්‍රතෙම; අසා, ශ්‍රවණය කොට.

443 වඩන, (විසල්පුර) වැඩමවන්නාවූ; සුගතිඳුහට, සුගතේන්ද්‍රයාහට; නිසිකොට, යොග්‍යපරිද්දෙන්; මග, මාර්ගය; සරහමැයි, සර්ජිත කරමැයි; සිතා, කල්පනාකොට; වෙහෙරට, විහාරයට; වැද, ප්‍රවේශව; එමුනිසඳුහට, ඒ මුනීන්ද්‍රයාහට; මෙසේ, මේ ආකාරයෙන්; දූන්වී, දූත්වූයේය.

444 හිමිසඳ, ස්වාමීන්ද්‍රයාණෙනි; මෙපුරසිට, මේ නගරයෙහි පටන්; ගංඅතරට, ගඞ්ගාව අතරට; පස්යොදුන, පඤ්චයොජනයක් වෙයි; එමග, ඒ මාර්ගය; සරහනුහට, සරසන්නාවූ (මා) හට; මඳක්, ස්වල්පයක්; බලවයි, නිරීක්ෂණය කරවයි; කියා, කථනයකොට; මුනිඳුට, මුනීන්ද්‍රයාහට.

445 යොදුනයොදුනතරා, යොජනයොජනාන්තරයෙහි; මහවෙහෙර, මහාවිහාරයන්; කරවමිනි, සාදවමින්; බඹවිමනෙව්, බ්‍රහ්මවිමානයමෙන්; සරා, සරසවා; නොයෙක්පුදපෙරහරින්, අනේකපූජාප්‍රාතිහාර්යයන්; සපුරා, සම්පූර්ණකොට.

* සරහනුවට.

446 අට ඉස්බක් දෙප ස
මග කණු කාටුද සෑස පි ස
තනා බෙර ඇසලෙ ස
වනා සුදුවැලි අයුරු සඳරැ ස

| 447 | | 449 | |
|---|---|---|---|
| පිරිකුඹු සුවහ | සේ | පුදපෙරහර මහ | ත |
| රඹතුරු සඳ දෙප | සේ | සිටුවා දෙපස මහව | ත |
| දණපමණක් උ | සේ | බැඳ මුදුනත දෙගො | ත |
| පුරා මහවත මලින් සක | සේ | මුනිඳු වඩනට කලැයි දන්ව | ත |

| 448 | | 450 | |
|---|---|---|---|
| බඳපට වැරැ | ල් ලෙ ත් | සිත බිය නොව නො | සි ත් |
| යනලෙසට සෙවණැ | ල් ලෙ ත් | දක්වන විකුම් වෙසෙ | සි ත් |
| *දිලිනත් කෙහෙ | ල් ලෙ ත් | රත්ගිරි ලෙන කු | සි ත් |
| සඳ මගදිගට මෙසිය | ල් ලෙ ත් | නිකුත්වන සීරජකු විල | සි ත් |

446 දෙපස, උභයපාර්ශ්වයෙහි; අට ඉස්බක්†, අෂ්ටලසහප්‍රමාණවූ; මග, මාර්ගයෙහි; කණුකටුද, ස්ථාණුකණ්ටද; සෑස, සස්වා; පිස, හැමදවා; බෙරඇසලෙස, භේරීස්කන්ධයන්; තනා, සාදවා; සඳරැස අයුරු, චන්ද්‍රරශ්මි ආකාරවූ; සුදුවැලි, ශ්වේතවාලුකාවන්; වනා, ඉසසවා.

447 සුවහසේ, සහශ්‍රසඛ්‍යාතවූ; පිරිකුඹු, පූර්ණකුම්භයන් හා; දෙපසෙස්, දෙපාර්ශ්වයෙහි; රඹතුරු, රම්භාවෘක්ෂයන්; (කෙසෙල් ගස්) සඳ, සර්ජිතකර; දණපමණක්, ජානුප්‍රමාණව; උසේ, උස්කොට; මහවත, මහාමාර්ගය; මලින්, පුෂ්පයෙන්; සකසේ, සකස්ව; පුරා, පූරණයකොට.

448 සෙවණැල්ලෙන්, ඡායාවෙන්යුත් (මාර්ගයෙන්) යනලෙසට, වැඩමවනමෙන්; බඳ, බඳනාලද; පටවැරැල්ලෙන්, පට්ටවස්ත්‍රයෙන්ද; දිලි, ජ්වලිතවූ; නත්කෙහෙල්ලෙන්, අනේකකේතූන්ගෙන්ද යන; මෙසියල්ලෙන්, මේ සකල උපකරණයන්ගෙන්; මගදිගට, මාර්ගය දික්වූතාක් (තැන්) සඳ, සර්ජිතකොට.

449 මහත, මහත්වූ; පුදපෙරහර, පූජාපරිහාරයන්; මහාවත, මහාමාර්ගයාගේ; දෙපස, උභයපාර්ශ්වයෙහි; සිටුවා, ස්ථාපිතකරවා; දෙගොත, හස්තයුගලය; මුදුනත, ලලාටයෙහි පිහිටුවා; බැඳ, බන්ධනයකොට; මුනිඳු, මුනීන්ද්‍රයන්වහන්සේ; වඩනට, වැඩමවීමට; කලැයි, සුදුසු කාලයයි; දන්වත, දැන්වූකල්හි.

450 සිත බිය නොව, චිත්තභීතියට නොපැමිණ; සතොසින්, සන්තෝෂයෙන්; වෙසෙසින්, විශේෂයෙන්; විකුම්දක්වන, වික්‍රම දක්වන්නාවූ; රත්ගිරිලෙන්කුසින්, ස්වර්ණගිරිගුහාකුක්ෂියකෙරෙන්; නිකුත්වන, නික්මෙන්නාවූ; සීරජකුවිලසින්, සිංහරාජයකුමෙන්.

* දිලිරත්. † ඉස්බකට රියන් 140 කි.

451 එමුනි සඳ ගමන ට
දික්කරත පද දෙරණ ට
මිහිරා නැගි රුව ට
සුපිපි සත්මුඹු පියුම්පිට සි ට

452
*ලාරස රැඳුව උ ඳු
බඳුවද කුසුම්පට බ ඳු
දෙපට අඳනය මු ඳු
වඩාතෙම්බුලු වසා මුනි ස ඳු

453
බඳින රත්දම් තේ
පබලු කලඹක් ලෙසි තේ
බබලන හැම දි නේ
පටිදතුවෙනි බැඳ අඳ තේ

454
සක්වළ ගිරි අව ට
සිටිසග සුනෙරගිරි පි ට
දියපොළොව ගිම් කො ට
රැගත් මිහිමඩල කම්පාකො ට

455
නුගපලසේ සුර ත්
පැහැයෙන් කරන දිගු බි ත්
කිසිකිලුටක් නොග ත්
සුගත් මහසිවුර ගෙණ එසුග ත්

---

451 එමුනිසඳ, ඒ මුනිඳුතුමා; ගමනට, වැඩමවීම පිණිස; පද, පාදයන්; දෙරණට, ධරණියට; (පොළොවට) දික්කරත, ප්‍රසාරණය කර වදාළ කල්හි; මිහිරා, පොළොවවිවරකොට; රුවට, යහපත්සේ; නැගි, නැංග වූ; සුපිපි, සුපුෂ්පිතවූ; සත්මුඹු, සප්තභූමයාවූ; පියුම්පිට, පද්මමස්තකයෙහි; සිට, සිටනව.

452 උඳු, හුදවූ; ලාරස, ලාක්‍ෂාරසයෙන්; රැඳු, පොවනලද; බඳුවද කුසුම් පට බඳු, බන්ධුජීවකපුෂ්ප පටයක් වැනිවූ; මුඳු, මෘදුවූ; දෙපට අඳනය, දුපට්ටඅන්තරවාසකය; මුනිසඳු, මුනිඳුතුමා; තෙම්බුලුවසා, †නාභිය ආදි මණ්ඩලත්‍රය ඡාදනයකොට; උඩා, හැඳ.

453 රත්දම්තේ, සුවර්ණදාමයකින්; බඳින, බඳින්නාවූ; පබලු කලඹක් ලෙසින්, ප්‍රවාලකදම්බයක්මෙන්; හැමදිනේ, සියලු දින යන්හිම; බබලන, බබලන්නාවූ; පටිදතුවෙනි, පටිධාතුවෙන්; අඳතේ, අන්තරවාසකය; බැඳ, බන්ධනයකොට.

454 අවට, හාත්පස; සක්වළගිරි, චක්‍රවාට පර්වතයද; සුනෙරගිරි පිට, සුනෙරුපර්වත මස්තකයෙහි; සිටි, පිහිටියාවූ; සග, ස්වර්ගයද; දියපොළොව, ජලපෘථිවියද; ගිම්කොට, ශිමාකොට; මිහිමඩල, මහීමණ්ඩලය; කම්පාකොට, කම්පිතකොට; රැගත්, ග්‍රහණයකරනලද

455 දිගුබිත්, දිශානැමතිභිත්තීන්; පැහැයෙන්, ප්‍රභාවයෙන්; නුගපලසේ, න්‍යග්‍රෝධඵලමෙන්; සුරත්කරන, අතිරක්තකරන්නාවූ; කිසිකිලුටක්, කිසිම මලිනගතියක්; නොගත්, ග්‍රහණයනොකලාවූ; එසුගත්, ඒ සුගතයන් වහන්සේ; සුගත්මහසිවුර, සුගතමහාචීවරය; ගෙණ, ග්‍රහණයකොට.

---

* ලාරසිනි රැඳුඋඳු. † නාභිය හා දෙදණ.

456 රත්පලසකින් මෙව ර
වටකරනාමෙන් මුනි ත ර
දිලි රන්වන් සිරු ර
වසාගෙණ පෙරව මුනිසිරිඳු ර

457
තුවන් ලද පලවි ද
මලවන තුටුවන ලෙස සො ද
සවන් සිරුරෙන් න ද
මෙමෙස් නික්මුණි සවන් රැස්ක ද

458
ඉඳුනිල් මිණි රැ සි න්
නාළුහම් කරන විල සි න්
නික්මුණු නිල් රැ සි න්
සැදිණි හැමසක්වලම වෙසෙසි න්

459
කිණිහිරි පෙති සම ග
සදන සපුමල් පෙති ර ග
රන්වන් රැස්තර ග
විදු දිවගති දියත එක ර ග

460
බඳුවද පෙතිනි ස රු
සඳෑමවලෙහි සිරිකරඳු රු
රත්පැහැ සර සොඳු රු
දිවි රත්කර දියත නිරතු රු

---

456 මෙවර, මෙරුපර්වතය; මනහර, මනොහරවූ; රත්පලසකින්, රක්ත වර්ණ කම්බිලියකින්; වටකරනමෙන්, පරික්ෂිප්තකරන්නාක් මෙන්; දිලි, බබලන්නාවූ; රන්වන්සිරුර, සුවර්ණවර්ණශරීරය; මුනි, මුනීන්ද්‍රයන් වහන්සේ; වසාගෙණ, ආච්ඡාදනයකොටගෙණ; පෙරව, පාරුපනයකොට; සිවිවර, වැඩසිටිකල්හි

457 තුවන්ලද, නෙත්‍රලාභයාගේ; පල, ඵලය; විඳ, විඳිනය කොට; මලවන්තුටුවනලෙස, ලොකයාතුෂ්ටවන පරිද්දෙන්; සොඳ, සුන්දරවූ; සවන්සරුරෙන්, සර්වඥ ශරීරය කෙරෙන්; නද, නැඟුනී යවූ; සවන්රැස්කඳ, ෂට්වර්ණරශ්මිස්කන්ධය; මෙමෙස්, මෙයාකාරයෙන්; නික්මිණි, නික්මුනේය.

458 ඉඳුනිල්මිණිරැසින්, ඉන්ද්‍රනීලමාණික්‍ය රශ්මීන්ගෙන් නොහොත් සමූහයෙන්; නාළුහම්කරන විලසින්, අභිනව චිත්‍ර කර්ම්මයක් කරන්නාක් මෙන්; නික්මුණු, නික්මුනාවූ; නිල්රැසින්, නීලරශ්මියෙන්; හැමසක්වළම, සකලචක්‍රවාලයම; වෙසෙසින්, විශෙෂයෙන්; සැදිණි, සැජිතවී.

459 කිණිහිරිපෙති සමග, කර්ණිකාර පුෂ්පපත්‍ර හා සමග; සදන, සදන්නාවූ; සපුමල්පෙතිරග, චම්පකපුෂ්පපත්‍රමෙන්; රන්වන්, සුවර්ණ වර්ණවූ; රැස්තරග, රශ්මිතරඞ්ගය; දියත, ලොකයෙහි; එකරග, එකාකාරයෙන්; විදු, විහිණීව; දිවගති, ධාවනයව; පටන්ගත්තේක.

460 බඳුවදපෙතිනි, බන්ධුජීවක පුෂ්පපත්‍රයන්; නිසරු, නිඃසාර කොට; සැඳෑමවලෙහි, සන්ධ්‍යාවලායෙහි; සිරි, ශ්‍රීයාව; දුරුකර, දුරීභූතකොට; සොඳුරු, සුන්දරවූ; රත්පැහැසර, රක්තවර්ණප්‍රභාව; නිරතුරු, නිරන්තරයෙන්; දියත, ලොකය; රත්කර, රක්තවර්ණකොට; දිවි, ධාවනාකළේක.

461 තරුවැල පැහැ පහ ස
කැරසඳ රුසට අපහ ස
නිකුත් සුදු බුදුරු ස
රිදී රුසසේ දිවී දසඳ ස

462
හැමතැන සක්ව ලේ
සලාමගණ ගෙණ උතු ලේ
ලොවතම පැහැකෙ ලේ
මදටවත් රුස්කඳක් පත ලේ

463
සොඳුරු සිතියම් ප ට
පටහරණසේ දිගුකො ට
පබසර රුස් රුව ට
දිවී ලොව තවරමින් *පිට පි ට

464
සක්වල ගිරි සිර ස
පැතමගෙන පැතිර දසඳ ස
දිවී සවණක් රු ස
නගාහැලිසිය දහස් සුවහ ස

465
බෙරසිය ගොස කර ත
වීණානදද නික්මෙ ත
වස්දඹු නද ගනු ත
තොපිඹි සක්හඬ දිගත මැඩගත

---

461 තරුවැල, තාරකාවලියගේ; පැහැ, ප්‍රභාවයට; අපහස, අප හාසකොට; සඳරුසට, චන්ද්‍රරශ්මියටද; අපහසකැර, අපහාසකොට; නිකුත්, නික්මුනාවූ; සුදුබුදුරුස, ශුද්ධබුද්ධරශ්මිය; රිදීරුසසේ, රජත සමූහයක්මෙන්; දසඳස, දශදිසාවෙහි; දිවී, ධාවනයකෙළේය.

462 සක්වලේ, චක්‍රවාටයෙහි; හැමතැන, සකලස්ථානයෙහි; සලාමගණගෙණ, රුලිඳමින්; උතුලේ, ඉතිරිවූ; ලොව, ලොකය; තමපැහැකෙලේ, තමන්ගේවර්ණයමෙන් කළාවූ; මදටවත්, මාඤ්ජිෂ්ඨවර්ණවූ; රුස්කඳක්, රශ්මිසමූහයක්; පතලේ, ව්‍යාප්තවූයේය.

463 සොඳුරු, සුන්දරවූ; සිතියම්පට, චිත්‍රවස්ත්‍රයක්; දිගුකොට දික්කොට; පටහරණසේ, නැමුම්විවරකරන්නාක්මෙන්; පබසරරුස්, ප්‍රභාශ්වරරශ්මිය; රුවට, යහපත්ව; ලොව, ලෝකයෙහි; තවරමින්, තවරාගෙණ; පිටපිට, පිටපිටම; දිවී, ධාවනයකෙළේය.

464 සක්වල ගිරිසිරස, චක්‍රවාටපර්වතශීර්ෂය; පැතමගෙණ, උල්ල ඞ්ඝනයකොට; දසදෙස, දසදිසාවෙහි; පැතිර, ප්‍රසාරිතව; සවණක් රුස්, ෂට්වර්ණරශ්මිය; සියදහස් සුවහස, ශතසහස්‍රලක්ෂප්‍රමාණවූ; හැලි, නිර්ඣරයන්; නගා, නගාගෙණ; දිවී, ධාවනයකෙළේය.

465 බෙරසිය, ශතභෙරීන්; ගොසකරත, ඝොෂාකරනකල්හි; වීණානදද, වීණානාදයද; නික්මෙත, නික්මෙනකල්හි; වස්දඹු, භුජඞ්ගල්; නදගනුත, නාදග්‍රහණයට පටන්ගත්කල්හි; තොපිඹි, තොපිඹිනාලද; සක්හඬ, ශඞ්ඛනාදය; දිගත, දිගාන්තය; මැඩගත, මැඩගත්කල්හි.

---

* පිටතට.

466 මොනරුන් නදකර ත
ගිජිඳුන් කුංච නදදෙ ත
තුරඟුන් හෙ සරව ත
ගමන්නොව රියෙහි සක්හඬල ත

467
පවනක් මග පිසි ත
පවනක් සුවඳ මල් ල ත
පවනක් සම කර ත
වලාපොද විසිර මල් පොබය ත

468
බුදුරැස් වැද දිග ත
තුරුලිය නොයෙක් පැහැව ත
දිය ගොඩ මල් පිපෙ ත
වරල් විදහා මසුන් ඉපිලෙ ත

469
අවිවග සිට දිලෙ ත
පලන් අබරණ නදදෙ ත
දිවසෙන් තුබ සැඟෙද ත
වුහුටු දිවමල් දෙරණ විසිරෙ ත

470
උරඟුන් පෙණ විද ත
මුවන් පෙම් කෙළ කෙළ එ ත
ලිහිණිගණ තුබප ත
පියා විදහා සැදී සිට ග ත

---

466 මොනරුන්, මයුරයන්; නදකරත, නාදකරනකල්හි; ගිජිඳුන්, ගජේන්ද්‍රයන්; කුංචනදදෙත, කුඤ්චනාද කරනකල්හි; තුරඟුන්, තුරංගයන්; (අසුන්) හෙසරවත, හේෂාරවයකරනකල්හි; ගමන්නොව, ගමන්නැතිවම; රියෙහි, රථයන්හි; සක්, චක්‍රයන්; හඬලත, ශබ්දකරන කල්හි.

467 පවනක්,(එක්) සුලඟක්; මගපිසිත, මාර්ගසුද්ධකරනකල්හි; පවනක්, (එක්) සුලඟක්; සුවඳමල්, සුගන්ධපුෂ්පයන්; ලත, හෙලන කල්හි; පවනක්, (එක්) සුලඟක්; සමකරත, සමකරනකල්හි; වලාපොද, වලාබිඳුන්; විසිර, විස්තීර්ණව; මල්, පුෂ්පයන්; පොබයත, ප්‍රබොධකරන කල්හි.

468 බුදුරැස්, බුද්ධරශ්මීන්; දිගත, දිශාන්තයෙහි; වැද, ප්‍රවිෂ්ටව; තුරුලිය, වෘක්ෂලතාවන්; නොයෙක් පැහැවත, අනෙකප්‍රභාවෙන් යුක්තවන කල්හි; දියගොඩමල්, ජලජ ස්ථලජ පුෂ්පයන්; පිපෙත, ප්‍රබොධවන කල්හි; මසුන්, මත්ස්‍යයන්; වරල්විදහා, වරල්විදහා ගෙණ; ඉපිලෙත, උඩාඑන කල්හි.

469 අවිවග, ආයුධවර්ගයන්; සිට, ස්ථිතව; දිලෙත, බබලන කල්හි; පලන්අබරණ, පිලන්ධනආභරණයන්; නදදෙත, නාදදෙන කල්හි; දිවසෙන්, දිව්‍යසේනාව; තුබසැඟෙද, අඟසසජ්ජිතවනකල්හි; වුහුටු, හරනාලද; දිවමල්, දිව්‍යපුෂ්පයන්; දෙරණ, ධරණියෙහි; (පොළොවෙහි) විසිරෙත, විසිරෙනකල්හි.

470 උරඟුන්, සර්පයන්; පෙණවිදත, පෙණවිදහනකල්හි; මුවන් මෘගයන්; පෙම්කෙලකෙළඑත, ප්‍රෙමයෙන් ක්‍රීඩාකොටකොට එන කල්හි; තුබපත, අහසට පැමිණියාවූ; ලිහිණිගණ, පක්ෂිසමූහයා; පියාවිදහා, පියාපත්විහිදුවා; සැදි, සජ්ජිතව; සිවගත, සිටගත්කල්හි.

471 විතරව තම සැප ත
සඳ සළු බරණින් ග ත
මුනි වඩන මග ව ත
දෙපස තරයන් අවුත් රැස්ව ත

472
කාණු කටු මුල් ඉව ත්
වීමෙන් සිනිඳු ගුණ ග ත්
මුනි වඩන මගව ත්
දෙරණ බෙර ඇසසේම සම ව ත්

473
වසාගෙන දිගු බි ත්
සුදුනිල්වලා දිවග ත්
බඳවියනෙව් මග ත්
දිනිඳු මැඩ රැස් නවත් වත් ව ත්

474
මුනි දකුමට මහ ත්
තුටුසිතනවුන් වෙත ප ත්
සුරසෙන් තම රැග ත්
පසඟතුරුඝොස පවත් වත් ව ත්

475
පිපිතුරුවන මහ ත්
සොල්වා කුසුම් රදග ත්
සිහිලැල් ගුණ නුමු ත්
සුවඳ ගෙණ මඳ පවන් එන් එ ත්

---

471 තම, තමන්ගේ; සැපවිතරව, සම්පත්තියෙහි ප්‍රමාණයට; ගත, ශරීරය; සළුබරණින්, සාළුකාභරණයෙන්; සඳ, සැජිතකොට; මුනිවඩන, සර්වඥයන්වහන්සේ වැඩමවන්නාවූ; මගවත, මහාමාර්ගයෙහි; දෙපස, දෙපාර්ශ්වයෙහි; තරයන්, මිනිසුන්; අවුත්, ආගමනයකොට; රැස්වත, රාසිභූතවනකල්හි.

472 කාණුකටුමුල්, බාණුකණ්ටකමූලයන්; ඉවත්වීමෙන්, පහවීමෙන්; සිනිඳුගුණ, ස්නිග්ධවූ ගුණය; ගත්,ග්‍රහණයකළාවූ; මුනිවඩන, සර්වඥයන්වහන්සේ වඩින්නාවූ; මගවත්, මහාමාර්ගයසම්බන්ධවූ; දෙරණ, ධරණිය; බෙරඇසසේම, භේරීඅක්ෂියක්මෙන්; සමවත්, සමතලාවනකල්හි.

473 දිගුබිත්, දිශානැමති භිත්තීන්; වසාගෙණ, ආදිතකොට ගෙණ; දිවගත්, ධාවනයට පටන්ගත්තාවූ; සුදුනිල්වලා, ශෝභනනීල වලාවන්; මගත්, මහත්කොට; බඳවියනෙව්, බඳනාලද විතානයක් මෙන්; දිනිඳු, දිනනාථයා; මැඩ, මර්දනයකොට; රැස්, රශ්මීන්; නවත්වත්වත්, වැලැක්වීම කරන කල්හි.

474 මුනිදකුමට, මුනීන්ද්‍රයා දර්ශනය පිණිස; මහත්, මහත්වූ; තුටුසිතින්, තුෂ්ටචිත්තයෙන්; අවුත්, ආගමනයකොට වෙතපත්, සමීපයට පැමිණියාවූ; සුරසෙන්, දිව්‍යසේනාව; තමරැගත්, තමන් ගත්තාවූ; පසඟතුරුඝොස, පඤ්චාංගික තූර්යඝොෂාව; පවත් වත් වත්, ප්‍රවර්තනය කරන කල්හි.

475 මහත්වන, මහාවනයෙහි; පිපි, පිපුනාවූ (මල්) ඇති; තුරු, වෘක්ෂයන්; සොල්වා, චලනයකොටමින්; ගත්, ගන්නාලද; කුසුම්රද, පුෂ්පමකරන්දයෙන් යුක්තවූ; සිහිලැල්ගුණ, සිසිලගුණයෙන්; නුමුත්, නොමිදුනාවූ; සුවඳගෙණ, සුගන්ධග්‍රහණයකොට; මඳපවන්, මන්දමාරුතය; එන් එත්, අ.ගමනය කරන කල්හි.

476 එකලුකර දිගුබි ත්
රූසිරෙන් දනනුවන් ග ත්
සුරගන සිට දිමු ත්
සුවඳ සුණුගෙන විසුරුවන් ව ත්

477
බුදු සිරුරෙන් නිකු ත්
රිවිරැස් මකා දිවග ත්
බුදුරැස් දක දිමු ත්
විලාසිටි සෙනග වැඳ හෙත්හෙත්

478
මහරැටි ගණ අවු ත්
පිළිවිස නිරිඳු මගව ත්
සදනුව දැඩා තැ ත්
බුදුන් දැකිහිගි කියා යත් ය ත්

479
සුරපුරයෙන් අවු ත්
අතුරුනොව නුබ සිට ග ත්
බුදුපුදට කළ සි ත්
සුරඹගණ සුවඳ දුම් ලත් ල ත්

480
උවන් එක සතෙකු ට
වනවැඩ තකා දුරක ට
දැඹනා බැව්නෙවි ට
නික්මගත් සඳ මුනිඳු ගමන ට

---

476 දිගුබින්, දිශාභිකත්න්; එකලුකර, ඒකාලෝක කොට; රූසිරෙන්, රූපශ්‍රීයාවෙන්; දන, ජනයන්ගේ; නුවන් ගත්, නයනග්‍රහණය කළාවූ; දිමුත්, දීප්තිමත්වූ; සරගන, දිව්‍යාඞ්ගනා සමූහයා; සිට සිටිනව; සුවඳසුණුගෙණ, සුගන්ධචූර්ණග්‍රහණය කොට; විසුරුවත්වත්, විසුරුවනකල්හි.

477 බුදුසිරුරෙන්, බුඩශරීරයෙන්; නිකුත්, නිෂ්ක්‍රාන්තවූ; රිවිරැස් මකා, සූර්‍ය්‍යරශ්මිය පාදවාගෙන; දිවගත්, දිවිට පැත්ගත්තාවූ; දිමුත්, දීප්තිමත්වූ; බුදුරැස්, බුඩරශ්මිය; දක, දර්ශනයකරමින්; විලාසිටිසෙනග, නිරීක්ෂණයකොට සිටියාවූ සමූහයා; වැඳ, නමස්කාරකරමින්; හෙත්හෙත්, එනකල්හි.

478 මහරැටිගණ, මහාරාෂ්ට්‍රසමූහයා; අවුත්, ආගමනයකොට; නිරිඳු, නරේන්‍ද්‍රයන්ගෙන්; පිළිවිස, අසා; මගවත්, මහාවාර්ගීය; සදනුව, සජ්ජිතකිරීමට; තැත්දැඩා, උත්සාහවඞ්නයකොට; බුදුන්, බුදුරජාණන්; දැකිහිගි, වැඩමවනසේක්යයි; කියා, කථනයකොට; යත්යත්, යනකල්හි.

479 සුරපුරයෙන්, දිව්‍යපුරයෙන්; අවුත්, ආගමනයකොට; අතුරුනොව, අන්තර රහිතව; නුබ, ආකාශයෙහි; සිටගත්, සජිතග්‍රහණයකළාවූ; බුදුපුදට, බුඩපූජාපිණිස; කළසිත්, උපදවනලදසිත් ඇති; සුරඹගණ, දිව්‍යාඞ්ගනා සමූහයා; සුවඳදුම්, සුගන්ධධූමය; ලත්ලත්, ගහලනකල්හි.

480 එකසතෙකුට උවන්, එකම්සත්වයෙකුටවූයේ නමුත්; වනවැඩ, වන්නාවූ අභිවෘඞිය; තකා, සලකා; දුරකට, දූරස්ථානයකට උවන්; වඩනාබැව්න්, වැඩමවනහෙයින්; එවිට, එකල්හි; මුනිඳු, සර්වඥයන්වහන්සේ; ගමනට, (විසල්පුර) වඩින්නු සඳහා; නික්මගත් සඳ, නික්මුණුකල්හි.

481 මහබඹ ඉදිරි කො ව
නික්මයන බඹ පිරිස ව
මනාමෙන් සඳ මඬල ව
පසුව පෙළ සැදුණු තුරු විලස ව

482
සක්දෙව් රජ පෙර ව
කර සැදුණු සුර සෙනග ව
මනාමොත් මිණි රුවන ව
පසුවයන *පිළිරුවන් වැලය ව

483
සඳන් ගජ රජ ග ව
පසුවයන ගජ සෙනග ව
මව්සසින් නිසරු කො ව
නිකුත් සගගණ පසුව මුනිඳු ව

484
රජදරුවෝ මහ ත්
ආදර ඇතිව බලව ත්
මුනිඳුට ලොවගප ත්
නැගුවස්සත් පිටම සේස ත්

485
මිනිසත් බවට දි ඩ
මෙමයැයි දමනෝ වන වැ ඩ
සගගණ ගා ගනාක ඩ
නැගු පන්සියයක්ම සුදුකු ඩ

481 මහබඹ, මහ බ්‍රහ්මරාජයා; ඉදිරිකොට, පෙරටුකොට; නික්මයන, නික්මයන්නාවූ; බඹපිරිසට, බ්‍රහ්මපර්ෂත්හුගේ; මනාමොත්, (එසේ) නැත්නම්; සඳමඬලට, චන්ද්‍රමණ්ඩලයට; පසුව, පශ්චාත් භාගයෙහි; පෙළසැදුණු, පඞ්ක්තිවශයෙන් සජ්ජිතවූ; තුරුවිලසට, තාරකාවන්ගේ විලාසයට.

482 සක්දෙව්රජ, ශක්‍රදිව්‍යරාජයා; පෙරටකර, ඉදිරිකොට; සැදුණු, සජ්ජිතවූ; සුරසෙනගට, දිව්‍යසේනාවට; මනාමොත් (එසේ) නැත්නම්; මිණිරුවන, මාණික්‍යරත්නය; පසුවයන, පසුභාගයෙහි ගමන්කරන්නාවූ; පිළිරුවන් වැලයට, ස්ඵටිකමාණික්‍ය වලියට.

483 සඳන්ගජරජහට, †ඡද්දන්තහස්තිරාජයාහට; පසුවයන, පසුභාගයෙහි ගමන්කරන්නාවූ; ගජසෙනගට, හස්තිසේනාවට; මෙව්සසින්, විශේෂයෙන්; නිසරුකොට, නිකුත්කොට; මුනිඳුව, මුනීන්ද්‍රයන්වහන්සේට; පසුව, පසුභාගයෙහි; සගගණ, සඞ්ඝසමූහයා; නිකුත්, නික්මුනුසේක.

484 මහත්, මහත්වූ; රජදරුවෝ, රජවරු; බලවත්, දැඩිවූ; ආදරඇතිව, ආදරාන්විතව; ලොවගපත්, ලොකයාට අග්‍රප්‍රාප්තවූ; මුනිඳුට, මුනීන්ද්‍රයන්වහන්සේට; සේසත්පිටම, ශ්වේතච්ඡත්‍රයන්ගේ මතුභාගයෙහිම; සේසත්, ශ්වේතච්ඡත්‍ර; නැගු, ආරොපනයකළෝ.

485 දිඩ, දැඩිවූ; මිනිසත්බවට, මනුෂ්‍යාත්මභාවයට; වන, වන්නාවූ; වැඩ, වෘද්ධිය; මෙමයයි, මෙමයයි; (කල්පනාකොට) දමනෝ, ජනයෝතුමූ; සගගණහට, සඞ්ඝසමූහයාහට; මනාකඩ, කඩනාකොට; සුදුකුඩ, ශ්වේතච්ඡත්‍රයන්; පන්සියයක්ම, පඤ්චශතකයක්ම; නැගු, ආරොපනය කළෝ.

* මිණිරුවන් වලසට. †මෙමයැයිනාගේ දළ පලනා ෂඩ්වර්ණයක නික්මෙන මෙහිත් හෙයින් - ඡද්දන්තයයි කියත්.

486 දජකුඩ කොඩි ගත් නෙතෝ යා
සොඳ ගඳ දුම් ලත් නෙතෝ යා
පින් පල *බලදත් නෙතෝ යා
මුනි පුදයට වත් නෙතෝ යා

487

අතින් රැගත් කුසුම් දමින්
සිතින් රැගත් මුනි සදමින්
බැතින් අමයක් ඇති පදමින්
නිතින් මුනිඳු යෙති පුදමින්

488

රළි රැගෙන නෙනගිරි පිට
දළි ගගුල් හැළි විලසට
තළි අමයක් මුනි පුදයට
පිළි සිසාරති හිස වට

489

මුනි පුදයට සතොසේ යා
පුදබඹු ගෙණ එමසේ යා
ඔදවැඩි සිඳු රළසේ යා
රැස්වෙති මග අදපසේ යා

490

නැවති ගඟක් සේ සිඳු වැද
කැමතිව සිට රජගෙන් මැද
රුවැතිලියන් සහ ලද සොද
තටනි අමයක් බඹුරු බැද

---

486 දජ, ධ්වජය; කුඩ, ඡත්‍රය; කොඩි, පතාකාය යන මොවුන්; ගත්නෙතෝයා, ගත්තාවූද; සොඳ, සුන්දරවූ; ගඳදුම්, සුගන්ධධූමයන්; ලත්නෙතෝයා, ඔහාලන්තාවූද; පින්පලබල, පුණ්‍යඵලයාගේ බලය; දත්නෙතෝයා, විඥානකලාහුද; මුනිපුදයට, බුද්ධපූජාපිණිස; වත්නෙතෝයා, පැමිණියාහුය.

487 අතින්, හස්තයෙන්; රැගත්, ගත්තාලද; කුසුම්දමින්, පුෂ්පදාමයන්ද; සිතින්, චිත්තයෙන්; රැගත්, ග්‍රහණයකරනලද; මුනි, මුනීන්ද්‍රයන්වහන්සේගේ; සදමින්, සද්ධර්මයන්ද; (පූජාකළාවූ) අමයක්, සමූහයෙක්; බැතින්, භක්තියෙන්; ඇතිපදමින්, ඇතිප්‍රමාණයෙන්; නිතින්, නිරන්තරයෙන්; මුනිඳු, මුනීන්ද්‍රයන්; පුදමින්, පූජාකරමින්; යෙති, ගමනයකෙරෙත්.

488 රළිරැගෙණ, සළාගුහනයකොට; ගිරිපිට, ගල්මුදුන්හි; නෙන, පනිතවන්නාවූ; දළි, බබලන්නාවූ; ගගුල්හැළිවිලසට, නිර්ඣරයන්වූ; පිළි, වස්ත්‍රයන්; මුනිපුදයට, බුද්ධපූජාපිණිස, තිළි, තුෂ්ටවූ; අමයක්, සමූහයෙක්; හිසවට, ශීර්ෂගාත්‍රපස; සසාරති, කරකවත්.

489 මුනිපුදයට, බුද්ධපූජාපිණිස; සතොසේයා, සන්තෝෂයෙන්; එමසේයා, එපරිද්දෙන්ම; පුදබඹුගෙණ, පූජාභාණ්ඩ ග්‍රහණයකොට; ඔදවැඩි, ඕජස්වර්ධිතවූ; සිඳු, මුහුදෙහි; රළසේයා, තරඞ්ගයෙන්; මග, මාර්ගයෙහි; අදපසේයා, උභයපාර්ශ්වයෙහි; රැස්වෙති, රාශිභූතවෙත්.

490 සිඳුවැද, සමුද්‍රයට අනුප්‍රවිෂ්ටව; නැවති, නැවතුනාවූ; ගඟක් සේ, ගංගාවක්මෙන්; රජගෙන්මැද, රාජගේහාභ්‍යන්තරයෙහි; කැමතිව, ආශාවන්තව; සිට, සිටිනාහු; ලද, බොලඳවූ; සොඳ, සුන්දරවූ; රුවැති, රූපවත්වූ; ලියන්සහ, ස්ත්‍රීන්හා; අමයක්, සමූහයෙක්; බඹුරුබැද, බඹුරුපන්ධනයකොටගෙණ; (කෝලන්බැඳගෙණ) තටනි, නෘත්‍යකෙරෙත්.

---

* ලබ්දන්නෙතෝයා.

491 නැණැතිඳමතේ සිට මෙත මෙ න
විමතිමතාවී අදහාමෙග න
කැමති ලෙසින් කව් බැඳමෙ න
කියති බුදුන්ගුණ තැන තැ න

492
තදදුක් දුරල න්තෝ යා
සගමොක්සැප දෙ න්තෝ යා
මොහුවමෙවදුසි ද න්තෝ යා
වැඳ වැඳ බිම මෙහෙ න්තෝ යා

493
මුනිගුණ දසදිග වී දේ
තුටුවූ සතසිත පැ දේ
නොඅසනලෙස අපවා දේ
නොයෙහි පසහතුරු නා දේ

494
අප මුනිඳුන්ගේ අපම ණ
ගුණදනගෙණ රැගෙණ සර ණ
බවදුක්මෙව්වයි නිසර ණ
දමති අගෙක් පලන් බර ණ

495
ලොලාවඩන සිත ලද රූ ව
පලාමනායතලෙස සොඳු රූ ව
කලාසපිරිසඳ අසු රූ ව
බලාමගණමයෙති මුනි රූ ව

---

491 නැණැතිඳමතෝ, ඥානවන්තජනයෝ තුමූ; මෙත මෙන, මෙත්මෙව්වන්සමයන්; සිට, සිටිතිව; විමතිමතාවී, දුම්තියගනාව; අද හාමගෙණ, ශ්‍රද්ධාඇතිකොටගෙණ; කැමතිලෙසින්, සතුටුපරිද්දෙන; කව්බැඳගෙන, කාව්‍යබන්ධනකොටගෙණ; බුදුන්ගුණ, සර්වඥයන්වහන්සේගේගුණයන්; තැනතැන, ඒ ඒ තැනසිටගෙණ; කියති, කථනයකෙරෙත්.

492 තද, දැඩිවූ; දුක්, දුඃඛයන්; දුරලන්නෝයා, දුරුකරන්නාහුද; සගමොක්සැප, ස්වර්ගමෝක්ෂ සම්පත්තිය; දෙන්නෝයා, දෙනය සරන්නාහුද; මොහුමෙවදුසි, මුන්වහන්සේමවේදැයි; දන්නෝයා, දන්නාහු; වැඳ වැඳ, නමස්කාරකොට කොට; බිම, භූමියෙහි; මෙහෙන්නෝයා, පතිතවන්නාහුවෙත්.

493 මුනිගුණ, මුනීන්ද්‍රයන්වහන්සේගේ ගුණය; දසදිග, දශ දිශාවෙහි; වීදේ, විහිදීමෙන්; තුටුවූ, තුෂ්ටවූ; සත, සත්වයෝතුමූ; සත පැදේ, චිත්තප්‍රසන්නව; අපවාදේ, අපවාදය; නොඅසනලෙස, නොඅසනපරිද්දෙන්; පසහතුරුනාදේ, පඤ්චාඞ්ගික තූර්යනාදය; නොකෙරති, පවත්වත්.

494 අපමුනිඳුන්ගේ, අපමුනීන්ද්‍රයන්වහන්සේගේ; අපමණගුණ, අප්‍රමාණවූගුණය; දනගෙණ, ජනතාවගෙකා; සරණරැගෙණ, පිහිට ගෙණ; බවදුක්, සංසාරදුඃඛයන්; නිසරණමෙව්වායි, නිස්සරණයවේවායි; (මදිම පත) අගෙක්, සමහරෙකෙනෙක්; පලන්අබරණ, පිළන්ධන ආභරණයන්; දමති, බහත්.

495 සිත, චිත්තයෙහි; ලොලාවඩන, ආශාවඩිනයනරන්නාවූ; ලදරූව, ලදරුවෙහි; කලාසපිරි, සොළොස්කලාවෙන්පිරුණාවූ; සඳ අසුරූව, චන්ද්‍රයාමෙන්වූ; මුනිරූව, සර්වඥරූපය; පලාමනායතලෙස, පැතමන යතපරිද්දෙන්; සොඳුරූව, මනාව; බලාමගණම, අවලෝකනයකරමින්ම; මෙති, ගමනයකෙරෙත්.

496 මුනි යන මගමෙගෙණ පිරී   බඩ
ගෙණ දරුවන්ගෙන් පිරී   බඩ
සල්පිල් වෙතයිව අග   බඩ
වදිති ලියෝ සිව මග   බඩ

497
වෙනිත් වෙතම පිපිල්සි   ද
රණින් රණමගෙණවුන් සොද
තැනිත් තැනම අහනෝල   ද
වෙනිත්වෙතම කළෝය   පුද

498
බුදුමහිමය දක   පූවෝ
තැන සිටිනා සි   පූවෝ
වැඳ වැඳ අන සැත   පූවෝ
තැන බුදුබව නොපැ   තූවෝ

499
දක මුනිරුව රසවි   න් දේ
*වැඩවෙන සිරිපද වැ   න් දේ
බවසැපතෙහි නොකිම්   න් දේ
†තමවෙත කෙලෙසුන් සි   න් දේ

500
අද මඳකුත් නොකිලි   ටි යෝ
මඳ ළඳ කිරිබොන පැ   ටි යෝ
නඳ මුනිරුව දක අ   ටි යෝ
බැඳ මුදුනත වැඳ සි   ටි යෝ

---

496 ලියෝ, සත්‍රීහු; මුනි, සර්වඥයන්වහන්සේ; යන, වැඩමවන්නාවූ; මග, මාර්ගය; පිරිබඩගෙණ, පරිභණ්ඩග්‍රහණයකොට; දරුවන් ගෙන්, දරුකැටත්ගෙන්; පිරි, පූර්ණවූ; බඩගෙණ, උදරග්‍රහණය කොට; අගබඩ, අග්‍රප්‍රභාණ්ඩ ඇති; සල්පිල්වෙත, වෙළඳ ශාලාසමීප යෙහි; සිවම, සර්වතෝද; මගබඩ, මාර්ගසමීපයෙහි; සිව, සර්වතෝද; වදිති, නමස්කාරකෙරති.

497 වෙනිත්වෙතම, වෙන්වෙන්වශයෙන්ම; පිපි, පුෂ්පිතවූ; මල්, පුෂ්පයන්; සිද, ඡින්දනයකොට; සොද, සුන්දරවූ; රණින් රණම, රේණුයෙන් රේණුවම; ගෙණවුන්, ග්‍රහණයකොට; ලඳ, බොලඳවූ; අහනෝ, අංගනාවෝ; තැනින්තැනම, ඒඒ තන්හි; (සිව) වෙනිත්වෙතම, වෙන්වෙන්වශයෙන්; පුදකළෝය පූජාකළෝය.

498 බුදුමහිමය, බුඩමහිමතාවය; දකපූවෝ, දර්ශනයකළාහු; සිටිවන, සිටිඅකාරයෙන් ; සි:පූවෝ, සිටියාහු; තැන, තැන්හාහු; (තැවප කුමක්කළේදයත්) වැදවැද, වන්දනාකොටකොට; අන; හසනයෙහ; සැතපූවෝය, සන්තර්පණයකළෝය; බුදුබව, බුඩත්වය; නොපැතුවෝ; ප්‍රාර්ථනානොකළාහුනම්; තැන, තැත්තෝය.

499 මුනිරුව, සර්වඥරූපය; දක, දර්ශනයකොට; රසවින්දේ, රසයවින්දාහු; වැඩවෙන, අනාගතාභිවෘඩියවන්නාවූ; සිරිපද, ශ්‍රීපාද යන්; වැනන්දේ, නමස්කාරකළාහු; බවසැපතෙහි, භවසම්පත්තියෙහි; නොකිම්න්දේ, නිඃශඞ්කනොවූවාහු; තමවෙත, තමාසන්තානයෙහිදු; කෙලෙසුන්, කෙලශයන්; සින්දේ, නැසුවාහුය.

500 අද, අද්‍යදවසෙහි; මඳකුත්, සවල්පයකුත්; නොකිලිටියෝ, අකලිෂ්ටගුණඇති; මඳ, මන්දවූ; ලඳ, බොලඳවූ; කිරිබොන, ක්ෂීර පානයකරන්නාවූ; පැටියෝ, උදරුවෝ; නඳ, නන්දනීයවූ; මුනිරුව, සර්වඥරූපය; දක, දර්ශනයකොට; අටියෝ, ආශාවෙන් යුක්තවූවෝ; මුදුනතබැඳ, මස්තකාඤ්ජලිබඩකොට; වැඳසිටියෝ, නමස්කාර කොට සිටියාහුය.

---

* වැදූවෙත.   † තමසිත.

501 දෙ න  දනෑම රට රටි  නී
දූ  න  නිසි බඩු ගැල් පිටි  නී
වෙ න  වෙනරඟ නැවි පිටි  නී
ගෙ ණ  එති සමහරුඳවි  නී

502 වෙ ත්  පත් සුරඹුන් තොම තරඹ  ත් නෝ
නෙ ත්  සිත් මුනිරූ රසෙහි තබ  ත් නෝ
ග ත්  ගත් කුඩකොඩි හැමතොතබත් නෝ
ය ත්  යත් රජසෙන් මුනිඳු පුද  ත් නෝ

503 මොනවට  දිලිමිනි කිරුළු පැලැ  ත් දෙ
මෙර ව ට  එූ කුළගිරි සිරිවි  ත් දෙ
මු නි දු ට  වැඳ මුදුනතැ දිලිබැ  ත් දේ
පුදකොට  කැටුවම යෙති නරනි  ත් දේ

---

501 දෙන, දනයකරණුලබන්නාවූ; දනවම්, දනයවම; නිසි, යොගාවූ; බඩු, භාණ්ඩයන්; දූන, ජනපදයකොට; රටරටිනි, ඒ ඒ රටින්; වෙනවෙනරඟ, අන්‍යඅන්‍යආකාරයෙන්; ගැල්පිටිනි, සකටවලින්ද; නැව්පිටිනි, නෞකාවලින්ද; එවිනී, හාත්පසින්; සමහරු, ඇතැම්කෙනෙක්; ගෙණඑති, ග්‍රහණයකොට එත්ය.

502 වෙත්පත්, සමීපයටපැමිනිනාවූ; සුරඹුන්, දිව්‍යාඞ්ගනාවන්; තොම තරඹත්නෝ, නොබලන්නාවූ; නෙත්සිත්, නෙත්‍රචිත්තයන්; මුනිරූරසෙහි, මුනීන්ද්‍රරූපරසයෙහි; තබත්නෝ, ස්ථාපනයකරන් නාවූ; ගත්ගත්, ග්‍රහණයකරණ කරණලද; කුඩකොඩි, ඡත්‍ර හා කෙතූන්; හැම, සියල්ල; තොතබත්නෝ, ස්ථාපනයනොකරත් නාවූ; රජසෙන්, රාජසේනාවෝ; මුනිඳු, මුනීන්ද්‍රයා; පුදත්නෝ, පූජා කරත්නෝ; යත්යත්, ගමනයකෙරෙත්මය.

503 මොනවව, මනාකොට; දිලි, බබලන්නාවූ; මිණිකිරුළු, මාණික්‍යකිරීටයන්; පැලැත්දෙ, පිලන්ධනයකලාවූ; මෙරවටඑූ, මේරුපර්වතරාජයා හාත්පස්හිවූ; කුළගිරිසිරි, කුලපර්වතයන්ගේ ශ්‍රීයාව; විත්දෙ, විත්දෑවූ; මුනිඳුට, මුනීන්ද්‍රයාණන්ට; වැඳ, නමස්කාර කොට; මුදුනත, මස්තකයෙහි; ඇදිලිබැත්දෙ, අඤ්ජලිබන්ධනය කළාවූ; නරනිත්දෙ, නරේන්ද්‍රයෝතුමූ; පුදකොට, පූජාපවත්වමින්; කැටුවම, එක්විම; යෙති, යෙත්ය.

504 මෙස ත් මෙසත් සෙන් මුනි වද්දෙතමි නෙත්
ග ත් සිත් යුත් පුද වද්දෙ අති නෙත්
*කැ ත් කොත් යුත් පරසිද්දෙ නමි නෙත්
නෙ ත් සිත් ලත් පල ලද්දෙ එදි නෙත්

505 ද න ගණ මුනිසිරි සෙනඟ බ ලෝ යා
තැ න තැන මුනි දුකුමට ඔස ලෝ යා
ම න පිනවන දසනෙහි හස ලෝ යා
වෙ න වෙන †දෙයකට ලොබනොකලෝ යා

506 සව න කිරණ දුලමුනි මෙර වැ ත් තේ
වඩි න එසනඟන කුලගිරි වැ ත් තේ
පන න තුරඟ පෙල සිඳුරළ වැ ත් තේ
එය න සෙනඟ ගොඩනසිඳු වැ ත් තේ

---

504 සෙත්, ශාන්ති (කරනීම්ණසෙදත් නාවූ); මුනි, සර්වඥයන් වහන්සේ; විද්දෙතමිනෙත්, බබලමින්; යෙත් යෙත්, වඩිත් වඩින්ම; සිත්යුත්, චිත්තානුකූලවූ; පුදවත්, පූජාවස්තූන්; දෙ අතිතේ, දෙ අතින්; ‡ගත්, ග්‍රහණයකළාවූ; කැත්කොත්යුත්, ක්‍ෂත්‍රියගොත්‍රයෙන් යුක්තවූ; නමිනෙ, නාමයෙන්; පරසිද්දෙ, ප්‍රසිද්ධවූ; (රජනු) එදිනෙත්, එදවස්හි; නෙත්සිත්ලත්පල, නෙත්‍රචිත්තලාභයාගේඵලය; ලද්දෙ, ලද්දාහුය.

505 මුනිසිරි, සර්වඥයන්වහන්සේගේ ශ්‍රීයාව; සෙනඟබලෝයා, සේනාභයෝතුමූ; දනගණ, වජිත තයකොට; තැනතැන, තත්හි තන්හි; මුනිදුකුමට, මුනීන්ද්‍රයාදශීනයට; ඔසලෝයා, රැස්වූහ; මන පිනවන, සිත්පිනවන්නාවූ; දසනෙහි, දශීනයෙහි; හසලෝයා, ආශ්‍රිතවූහු; වෙන වෙනදෙයකට, අන්‍යඅන්‍යදෙයක්සඳහා; ලොබනොකලෝයා, ලොභනොකළාහුය.

506 මුනි, මුනිඳුතුමා; සවණසිරණ, ෂඩ්වණීරශ්මියෙන්; දුලා බබිලෙනනාවූ; මෙරවැත්තේ, මහාමේරු පර්වතරාජයා වැන්නේය; වඩිනා, වැඩමවන්නාවූ; එසඟනණ, ඒ ඥඩිසසමූහයා; කුලගිරිවැත්තේ, කුලපර්වතවැන්නේය; පනන, (ඒ ඒ) තැනපතින්නාවූ; තුරඟපෙල, තුරඟපඬ්කතිය; සිඳුරලවැත්තේ, සමුද්‍රතරඬ්ගවැන්නේය; එයනසෙනඟ, ඒ යන්නාවූ සමූහයා; ගොඩනන, ගොඩනමත්කරත්නාවූ; සිඳුවැත්තේ, මුහුදවැන්නේය.

---

* කැතකොත්. † දෙසකට සිතනොකලෝයා.
‡ ඉඩ:තාහසනයෙන් කියාද අපිකියනැකිහි.

507 සුර පා මෙන් දිළි වෙහෙරින් වෙහෙ  රා
සත පා සඟගණ සහ මුනි පව  රා
පෙළ පා ප්‍රිය දූත කෙරෙමින් අද  රා
නර පා දන්දී පුදකෙළෙ නිතො  රා

508 සතොසි න් පුදකෙරෙමින් මුනිසඳු  වා
තොලසි න් ගොස්වැද මහගංතෙර  වා
වෙසෙසි න් මුනි පුදකරවනලෙස  වා
මෙලෙ සි න් දින'සුන් එවිසල් පුර  වා

509 අ ප අපගේ බලපමණින් මුනිඳු  ව
සැ ප සපයා කළ පුදලද නිසිතො  ව
සැ පැ මිණියේ මුනිසඳ ගඟ මෙතෙර  ව
තොප තොපගේ බලපමණින් පුදකො  ව

510 කැ ද වා ගෙණගොස් මුනිඳුන් නුවර  ට
සොඳවා මහපුද කරවා නිස කො  ට
මු ද වා උවදුරු කරවයි සෙත ර  ට
යෙදවා අස්නක් මෙහෙයා එම්ව  ට

---

507 සුරපාමෙන්, දිව්‍යප්‍රාසාදයමෙන්; දිළි, බබලන්නාවූ; වෙහෙරින් වෙහෙර, විහාරයෙන් විහාරයෙහි; පවරා, උතුම්වූ; සඟගණ සහ, සංඝසමූහයා සහිතවූ; මුනි, සර්වඥයන් වහන්සේ; සතපා, සන්තර්පණයකොට; පෙළපාප්‍රිය, පාළියෙහි ප්‍රියවූ; දූත, අවබොධ කොට; අදරාකෙරෙමින්, ආදරකොට; නරපා, නරඋතුමා; දන්දී, දන්දෙමින්; නිතොරා, නොරනොව; පුදකෙළෙ, පූජාකෙළේය.

508 මුනිසඳුවා, මුනිඋතුමාහට; සතොසින්, සන්තොෂයෙන්; පුදකෙරෙමින්, පූජාපවත්වමින්, තොලසින්, වහා; මහගංතෙරවා, මහාගංගාතීරයට; ගොස්, ගමනයකොට; වැද, පවිෂ්ටව; වෙසෙසින්, විශෙෂයෙන්; මුනි, මුනිඋතුමාහට; පුදකරවනලෙසවා, පූජාපැවැත්වන පරිද්දෙන්; මෙලෙසින්, මෙආකාරයෙන්; විසල්පුරවා, විශාලාමහ නගරයට; අසුන්දින, ලියුම්දුන්නේය.

509 අප, අසමත්හු; අපගේබල පමණින්, අපගේ ශක්තිපරිද් දෙන්; මුනිඳුව, මුනිඳුහට; සැපසපයාකළ, සුඛසම්පාදනයකොට; නිසිතොව, යොග්‍යපරිද්දෙන්; කළ, කරණලද; පුදලද, පූජාලද්දවූ; මුනිසඳ, මුනිඋතුමා; ගඟමෙතරව, ගංගාවගේ මෙගොඩට; සැපැමිණි යේ, සම්ප්‍රාප්තවූසේක; තොප, යුෂ්මත්හු; තොපගේබලපමණින්, යුෂ්මතුන්ගේ ශක්තිපරිද්දෙන්; පුදකොව, පූජාකරමින්.

510 මුනිඳුන්, මුනීන්ද්‍රයන් වහන්සේ; නුවරට, නගරයට; කැඳවා ගෙණගොස්, වැඩමවාගෙන ගොසින්ලා; සොඳවා, යහපත් කොට; නිසි කොට, යොග්‍යපරිදි; මහපුදකරවා, මහාපූජාපවත්වා; උවදුරු, උපද්‍රව; මුදවා, මුක්තකරවා; රට, ( තොපගේ ) රටේ; සෙතසරවයි, ශාන්තිකරවයි; අස්නක්, සංඥාවක්; යොදවා, යුක්තකොට; එම විට, ඒ ඇසිල්ලෙහි; මෙහෙයා, යවා.

511 සොඳවා ගෙනැවි බැඳගල පා යා
සිටු වා එහි දිලි පෙළ පෙළ පා යා
සඳ වා සුරපග සිරිවෙළ පා යා
කර වා දිගු පුළුලැති මහ පා යා

512 බඳ වා සුරසිඳු බඳු සුදු විය තේ
අඳ වා වට *පවතිර සරසමි තේ
සඳ වා ලඹ ඉඳුවර මල්දමි තේ
සිටුවා එවරත් මැටමිණිපහ තේ

513 කොත් කොත්වල මිණිමුතුලැල් එ ල් ලා
බ ත් †රන් තත් දද පෙනෙලති වෙවු ල් ලා
ග ත් මිත් පිරිබඩ සුවඳ කල ල් ලා
න ත් වන් රන් මිණි සිරණි තුදු ල් ලා

514 වැ ද රත් මිණිමුතු දිග රැස් ව හා වා
සොඳ ‡තිරිකුඩන් මාගැබි ම හා වා
ස ද මඬලෙව් පිරිසත සිත පි හා වා
මැ ද මුනිඳුට නිසි අස්නක් ප හා වා

---

511 සොඳවා, යහපත් කොට; මහනැවී, මහා ශෛලකාවන්; ගල පායා, එක්කොට; බැඳ, බන්ධනය කොට; එහි, ඒ තැනෙහි; දිලි, දැල්වූ; පායා, ප්‍රාසාදයන්; පෙළ පෙළ, පන්ති පන්ති කොට; සිටුවා, ස්ථාපිතකරවා; සඳවා, නිෂ්පන්නවූ; සුරපග සිරි, දිව්‍ය ප්‍රාසාද ශ්‍රියාව; වෙළපායා, විඩම්බනය කොට; දිගුපුළුලැති. දිගින් හා පුළුලින් යුක්තවූ; මහපායා, මහාප්‍රාසාදයක්; කරවා, සජ්ජිතකරවා.

512 සුරසිඳුබඳු, ගඞ්ගානදිය මෙන්; සුදු, ශුභ්‍රවූ; වියතෙන්, වියානයෙන්; බඳවා, බන්ධනය කරවා; වට, හාත්පස; වටතිර, ජවනිකාවන්; අඳවා, අඳ්දවා; සරසමිතෙන්, සජ්ජිතකොට; ලඹ, එල්ලෙන්නාවූ; ඉඳුවරමල්දමිනෙන්, ඉන්දීවරපුෂ්පදාමයෙන්; සඳවා, සජ්ජිතකරවා; වට, හාත්පස; රත්වැටම්ණිපහනෙන්, සුවර්ණරාජිමාණික්‍ය ප්‍රදීපයෙන්; සිටුවා, ස්ථාපිතකරවා.

513 කොත්කොත්වල, අග්‍රාග්‍රහි; මිණිමුතුලැල්, මාණික්‍ය මුක්තාලතිකාවන්; එල්ලා, ඕලම්බනය කරවා; බත්, බඳනාලද; තත් රත්දද, අනෙකසුවර්ණධ්වජයන්; පෙනෙලෙති, සුළඟින්; වෙවුල්ලා, කම්පාකරවා; සුවඳකලල්ලා, සුගන්ධකලලයෙන්; පිරිබඩගත්මින්, පරිභණ්ඩග්‍රහනය කරමින්; නානාවන්, අනෙකවර්ණයෙන් යුක්තාවූ; රත්මිණිසිරනින්, සුවර්ණමාණික්‍යකාන්තියෙන්; උදුල්ලා, උජ්ජ්වලිත කරවා.

514 රත්මිණිමුතු, සුවර්ණමාණික්‍යමුක්තාවෙහි; වැද, හැපී, දිග, (ඒඒ) දිශාවන්හි; රැස්වන, එක්තුවන්නාවූ; වා, වාතයඇති; සොඳ, සුන්දරවූ; මානැගිවනාවා,මහාඝ්වන්නාවූ;තිරිකුඩන්,තදිකුඩාරයෙහි; බැඳ, බන්ධනයකරනලද; පිරිසඳමඬව, පූර්ණචන්ද්‍රමණ්ඩලයමෙන්; සත, සත්වයන්ගේ; සිත, චිත්තය; පිනවා, පිනවයකරවා; මැද,මධ්‍යයෙහි; මුනිඳුටනිසි, සර්වඥයන්වහන්සේට යොග්‍යවූ; අස්නක් ආසනයක; පනවා, පඤ්ඤාපනය කරවා.

---

* පවතිර, † තත්රත්දද, ‡ තිරකුඩනිසි.

515 ශ්‍රී මව ස්වා දූසමින් මල් ඉ    ස් නේ
වැඩහිඳු වා මුනිඳුන් මැද අ    ස් නේ
වට හිඳු වා රහතුන් සිත නො    ස් නේ
සිතපිනවා ලිය ඉන් බුදු ස    ස් නේ

516 ර ත් පලසින් වටකල රත්වැ ම    සේ
ර ත් පියුමුඑමැද පත් රන් *සර    සේ
ර ත් පිළිමිණි මැද දිලි ගිනි කඳ    සේ
ප ත් තුරු වැල මැද දිසි පුන් සඳ    සේ

517 පියුමුළුවට කල රන්පියුමක්    සේ
මෙපනි මැද වැද සිටි කෙසරු සළා    සේ
මහසුමෙරන් පිරිවැරු රන් කෙමියක්    සේ
බබලයි සඟපිරිවැරු මුනි සොඳ    සේ

518 පුදලන් මිණි කිරුලෙන් සුරිඳු    න් නේ
විහිදෙන් සවණක් රැස්මුනිඳු    න් නේ
පලබින්පහ එව වැද දිලිසෙ    න් නේ
නොකලන් සත්‍ව වණින් කල වැ    න් නේ

---

515 දූසමින්මල්ඉස්නේ, ජාතිසුමනපුෂ්ප විසුරුවීමෙන්; හිමි, භූමිය; වස්වා, ශාද්වලකාවා; මැදඅස්නේ, මධ්‍යයෙහිවූ ආසනයෙහි; මුනිඳුන්, මුනීන්ද්‍රයන; වැඩහිඳුවා, වඩාහිඳුවා; වට, හාත්පස; සිත නොහාස්නේ, විසාතසංහාරාශයෙන්; රහතුන්, අර්හත්වහන්සේලා; හිඳුවා, නිසීදනයකරවූයේක; ඉන්, එයින්ම; බුදුසස්නේ, බුද්ධශාසනාලංකාරෙහි; සිත, (සත්ත්වයන්ගේ) චිත්තය; පිනැවලිය, පිනනය කරවූයේක.

516 රත්පලසින්, රක්තකම්බිලියකින්; වටකල, වටකරණලද, රත්වැඹසේ, සුවර්ණස්තම්භයක් මෙන්ද; රත්පියුමුඑමැද, රක්තපද්ම වනමධ්‍යයෙහි; පත්, ප්‍රාප්තවූ; රත්සරසේ, සුවර්ණපද්මයක් මෙන්ද; රත්පිළිමිණිමැද, රක්තස්ඵටිකමාණික්‍යමධ්‍යයෙහි; දිලි, බබලන්නාවූ; ගිනිකඳසේ, අග්නිස්කන්ධයක්මෙන්ද; තුරුවැලමැද, තාරකාවලිය මධ්‍යයෙහි; පත්, පැමිණියාවූ; දිසි, දෘශ්‍යමානවූ; පුන්සඳසේ, පූර්ණ චන්ද්‍රයා මෙන්ද.

517 පියුමුළුවටකල, (ශ්වේත) පද්මසමූහයෙන් පරික්ෂේපකරන ලද; රත්පියුමක්සේ, රක්තපද්මයක් මෙන්ද; මෙපනිමැද, පත්‍ර මධ්‍යයෙහි; වැදසිටි, ප්‍රවේශවසිටියාවූ; කෙසුරුසළාසේ, කරණ්ඩිකාවක් මෙන්ද; මහසුමෙරන්, කෙසරයෙන්; පිරිවැරු, පරිවාරණයකරනලද; රන්කෙමියක්සේ, සුවර්ණකර්ණිකාවක් මෙන්ද; සඟපිරිවැරු, සංඝයා විසින් පිරිවරණලද; මුනි, සර්වඥයන්වහන්සේ; සොඳසේ, යහපත්ව; බබලයි, භ්‍රාජමානවන්නාහුසේක.

518 සුරිඳුන්නේ, සුරේන්ද්‍රයන්ගේ; මිණිකිරුලෙන්, මාණික්‍ය කිරීටයෙන්; පුදලන්, පූජාලද්දාවූ; මුනිඳුන්නේ, මුනීන්ද්‍රයන්ගේ; සවණක්රැස්, ෂඩ්වර්ණරශ්මිය; විහිදෙන්, ව්‍යාප්තවන්මය; එව, ඒ ෂඩ්වර්ණරශ්මිය; වැද, හැපී; පහ, ප්‍රාසාදයන්ගේ; පලබින්, ශුද්ධභිත්තීන්;

---

* පැලසේ.

519 සොඳවා රන් පලු විදුලි සහ ස් සේ
බ ඳ වා දද ඉඳුදනු සුවහ ස් සේ
වැ සු වා මෙන් ගඟ නොව සිඳුර ස් සේ
සොඳවා ලිය නිසි නැවි පසු ප ස් සේ

520 මෙලෙසින් සදමින් නැවිඑකා රඟ වා
රජ ස න් හැම සලසා පිරි වර වා
බ සි මි න් කරපමණක් ගඟ දිය වා
මු නි ඳු න් වැද රජ කී මේ ලෙස වා

521 හැ ම උවදුරු දුරුකර එරදුන් ර ට
ස ම මෙන්මුනි වඩනාතෙක් මෙතැන ට
පෙම වඩමින් ඔබ ගුණ සිහි කොට කො ට
ම ම නොනොසින් ඉඳිමැයි කී නුවර ට

522 ස ඟ පිරිවර මුනි දකුමට එකෙ ණෙ
ල ග දිවනසිකැල පෙණනැල පෙනු ණෙ
ද ග වත මනසුර*හන රඟසැදු ණෙ
ග ග සුරරත් පිපි පියුමෙන් සැදු ණෙ

දිලිසෙන්නේ, බබලනකල්හි; (රත්නාගෙන්) නොකළත්, නොකෙළේ වීනමුත්; සත්රුවනින්, සප්තරත්නයෙන්; කළවැත්තේ, සැදුවාක් මෙන් විය.

519 විදුලිසහස්සේ, සහශ්‍රසඛ්‍යාතවිද්‍යුල්ලතාමෙන්; සොඳවා, සුන්දරකොට; රන්පලු, සුවර්ණපල්ලවයන්ද; ඉඳුදනුසුවහස්සේ, ඉන්ද්‍ර චාපසහශ්‍රයන් මෙන; දද, ධ්වජයන්ද; බඳවා, බන්ධනයකරවා; ගඟ, ගංගාව; සිඳුරස්සේනොව; සිඳුරුපමණකුත් නැත්තේකොට; වැසුවාමෙන්, ඡාදනයකළාක් මෙන්; නිසි, සුදුසුවූ; නැවි, නෞකාවන්; පසුපස්සේ පසුපස්සෙහි; සොඳවාලිය, යෙදවීය.

520 මෙලෙසින්, මේයාකාරයෙන්; නැවි, නෞකාවන්; එක රඟවා, එකාකාරවම; සදමින්, සජ්ජිතකරමින්; හැමරජසන්, සියලු රාජසේනාව; පිරිවරවා, පරිවාරපිණිස; සලසා, සලස්වා; කරපම ණක්, කරපමණවූ; ගඟදියට, ගංගාජලයට; බසිමින්, අවතීර්ණව; රජ, රජයා; මුනිඳුන්, මුනීන්ද්‍රයන් වහන්සේට; වැද, නමස්කාරකොට; මේ ලෙසට, මේ මතුප්‍රකාශවන අන්දමට; කී, කථනය කෙළේය.

521 එරදුන්, ඒ රාජයන්ගේ; රට, රටෙහි; හැමඋවදුරු, සකල උපද්‍රවයන්; දුරුකර, දුරුකොට; සමමෙන්, (සියලුන්කෙරෙහි) සමානමෛත්‍රියෙන් යුක්තවූ; මුනි, සර්වඥයන්වහන්සේ; මෙතැනට, මේ ස්ථානයට; වඩනාතෙක්, වැඩමවනතුරු; පෙමවඩමින්, ප්‍රේමවර්ධනයකරමින්; ඔබගුණ, ඔබවහන්සේගේගුණයන්; සිහිකොට කොට, සම්ස්මරණයකොටකොට; මම, අසමත්තෙමේ, නුවරට, නගරයට; නොනොසින්, නොගොස්; ඉඳිමැයි, නිසීදනයකරමැයි; කී, කථනය කෙළේය.

522 එකෙණෙහි, ඒක්ෂණයෙහි; සඟපිරිවර, සඞ්ඝයාවිසින්පිරිවර ණලද; මුනි, මුනින්ද්‍රයා; දකුමට, දර්ශනයපිණිස; (පැමිණියාවූ) දිව

* ගඟ,

523 කරනුව ලොවට සෙ ත
එඞිතියි අසා එසුග ත
සක්විති රජ සැප ත
සැපැත්වූමෙන් සතොස්වා සි ත

524
කප්කෙළ සුවහ සේ
බුදුන යන නම මෙලෙ සේ
නොඇසෙසි අප මෙ සේ
සිටිනු නොවෙයදෙයි සිතාංමෙලෙස

525
මුනිසඳ වඩි න් තේ
සිතමෛත කුළුණකි න් තේ
මෙඅප හරයි න් තේ
මහත් කළපිණෙක පලදු න් තේ

526
අපිය දුක් වි න් තෝ
උතුමෝය දුර ල න් තෝ
එබුදුය වඩි න් තෝ
කවුදපෙරගමනනොකරන් තෝ

527
එබැවින් අප වෙත ට
වඩනා තිලෝගුරු හ ට
අපගෙ බල පමණ ට
කරම්මැයි මහපුදක් නිසිකො ට

---

නැසියැල, දිව්‍යනාග සමූහයාගේ; පෙණකැල, ඵණසමූහය; ලඟ, සමීපයෙහිම; පෙණුනේ, දෘශ්‍යමානවීය; මනදගවන, මනොබන්ධනය කරන්නාවූ; සුරගන, දෙවගනන්නේ; රඟ, නැටීම; සැදුනේ, පටන් ගත්තේය; ගඟ, ගංගාව; පිපි, පිපුනාවූ; සුදුරත්පියුමෙන්, පුණ්ඩරීක පදුමයන්ගෙන්; සැදුණේ, සජ්ජිතවිය.

523 ලොවට, ලොකයාහට; සෙත, ශාන්තිය; කරනුව, සිද්ධ කරනු පිණිස; එසුගත, ඒ සුගතයන් වහන්සේ; වඩිතියි, වැඩමවත් යයි; අසා, ශ්‍රවනයකොට; සක්විතිරජසැපත, චක්‍රවර්තිරාජසම්පත්තිය; සැපැත්වූමෙන්, සම්ප්‍රාප්තවූවාමෙන්; සිත, චිත්තය; සතොස් වා, සතුටුකොට

524 කප්කෙළසුවහසේ, කල්පකොටිශතසහශ්‍රයන්හි; බුදුන යනනම, බුද්ධයකියන්නාවූ නාමය; මෙලෙසේ මෙයාකාරයෙන්; නොඇසේ, අසනුනොලැබේ; එබැවින්) අප, අසමතුන්; මෙසේ, මෙයාකාරයෙන්; සිටුනු, සිටිම; නොවෙදෙ, සුදුසුනොවේ; මෙලෙසේ, මේ පරිදි; සිතා, චින්තනයකොට.

525 මුනිසඳ, මුනිඳුචන්ද්‍රයා; වඩින්නේ, වැඩමවන්නේ; සිත. චිත්තයෙහි; මෙතකුළුණකින් නේ, මෛත්‍රිකරුණාවන්මය; මෙපල දුන් නේ, මේ විපාකදුන් නේනම්; අපනරයින්නේ, මනුෂ්‍යවූඅපගේ; කල, (පූර්වජාතියෙහි) කරණලද; මහත්පිණෙක, මහාපුණ්‍යයක්මය,

526 දුක්වන්නෝ, දුක්විඳුහුනම්; අපිය, අසමත්හුමවමු; දුර ලන්නෝ, (ඒ) දුක්දුරුකරන්නෝනම්; උතුමෝය, උත්තමයෝමය; වඩින්නෝ, ඒවැඩමකරන්නෝනම්; එබුදුය, ඒසර්වඥයන්වහන්සේමය; පෙරගමනනොකරන්නෝ, (උන්වහන්සේගේ) ඉදිරියට නොයන්නෝ; කවුද, කවරෙක්ද.

527 එබැවින්, ඒහාවයෙන්; අපවෙතට, අපකරා; වඩනා, වැඩමවන්නාවූ; තිලෝගුරුහට, ත්‍රෛලොකාචාර්යයන්වහන්සේට; අප ගෙබලපමණට, අපගේශක්තිප්‍රමාණයෙන්; නිසිකොට, යොග්‍යපරිද්දෙන්; මහපුදක්, මහාපූජාවක්; කරම්මැයි, කරමුයයි.

528 තුන්සිය යොදුන් රට ද
නුවර උන් දන රැස්කො ට
කාරණ මුනි පුදය ට
යොදා මඟ සරසන්ට නසි කො ට

529
අප සිමියෝ අප ට
සැරහුන මග නිවණ ට
එවැනි සුගතිඳු හ ට
සඳහුමග අරැමක්ම මෙමඅප ට

530
එපුරෙහි පටන් කො ට
තුන්යොදුන ගං අතර ට
දමා කණු මුල් කැ ට
තනා බෙරඇස මෙන් සමකො ට

531
වැලි එව බිම අතු ර
රිදීපටමෙන් සුදුකො ට
ඇමතැන මග දෙපි ට
පහන්ලා රන්රිදී මිණි වැ ට

532
බිඟුදල් ගත් බම ණ
සුවඳැති දකුම් අපම ණ
පුරවා මග දෙර ණ
තනා ඇමතැනම කරඅතර ණ

---

528 තුන්සියයොදුන්රට, ත්‍රිශතයොජනප්‍රමාණවූ රාෂ්ට්‍රයෙහිද; නුවර, නගරාන්තද; උන්, උන්නාවූ; දන, ජනයා; රැස්කොට, රාශිකොට; කාරණ, කාරුණ්‍යබන්නාවූ; මුනිපුදයට, බුද්ධපූජාපිණිස; නසිකොට, නොයෙක්පරිද්දෙන; මග, මාර්ගය; සරසන්ට, සරසනු පිණිස; යොදා, යොජනාකොට.

529 අපසිමියෝ, අපගේස්වාමිවූ; (සමිඳුමෙයෝතුමු) අපට, අසමතුන්ට; නිවණට, නිර්වාණයට; මග, මාර්ගය; සැරහුන, සැරසුවහු; එවැනි, එආකාරගුණඇති; සුගතිඳුහට, සුගතනාමධෙයයාහට; මගසදනු, මාර්ගසජ්ජිතකිරීම; මෙඅපට, මේ අපහට; අරුමක්ම, කිනම් අරුමයක්ද

530 එපුරෙහිපටන්කොට; ඒනගරයෙහි සිට; ගංඅතරට, ගංගාව අතරෙහිවූ; තුන්යොදුන, තුන්යොදුන් මාර්ගයෙහි; කණුමුල්කැට, කණුමුලසකබරයන්; දමා, ඉවතලා; බෙරඇසමෙන්, භෙරීමුඛයක් මෙන්; සමකොට, සමතලාකොට; තනා, සදා.

531 වැලිඑව, වැලිගෙණවුත්; බිම, භූමියෙහි; අතුරා, අතුරා. රිදීපටමෙන්, රජතපට්ටයක්මෙන්; සුදුකොට, ශුභ්‍රවර්ණකොට; මගදෙපිට, මාර්ගයෙහි උභයපාර්ශ්වයෙහි; ඇමතැන, සකලස්ථානයෙහි; රන්රිදීමිණිවැට, සුවර්ණරජතමාණික්‍යවෙදිකාවන්හි; පහන්ලා, ප්‍රදීපපිහිටුවා.

532 බිඟුදල්, භෘංගජාලාවන් එසින්; බමණගත්, භ්‍රමණග්‍රහණය කළාවූ; සුවඳැති, සුගන්ධවත්වූ; අපමණකුසුම්, අප්‍රමාණපුෂ්පයන්; මගදෙරණ, මාර්ගධරණියෙහි; පුරවා, පූර්ණයකරවා; ඇමතැන, සකලස්ථානයෙහිම; අතරණකර, අනාවරණයකොට; තනා, සජ්ජිතකරවා.

533 නන්පුන් කුඹු න ඹා
බඹා දිගු කැණ ඔල ඹා
සිටුසිටුවා ර ඹා
ලඹා මල්කැන් අතුරු නොන බා

534
බැඳවට පටසු ශේ
ලඹකෙහෙළි රත් කල ශේ
මගස රසා සො ශේ
දහස් සත්සත් සියක් නිරි ශේ

535
මිහිවදයෙහි ගඳ ව
දිවන බිඟුමෙන් ඉවකො ව
කදගිම්කල දිය ව
දිවනගජසෙන් ලෙසින් විලකා ව

536
ගැසූ මස් ගොදුර ව
දිවඑන මසුන් විලස ව
යාගෙහි කිරිබත ව
දිවන බමුණන් ලෙසින් එකව ව

537
දෙරළ දන්දිම ව
පිරිසත් රුවන් මගයක ව
ඔවුනොවුන් පසුනො ව්
දිවනදිළිඳුන් ලෙසින්මලාබකොව

---

533 නන්, අනේකප්‍රකාරවූ; පුන්කුඹු, පූර්ණකුම්භයන්; නඹා, ස්ථාපනයකොට; බඹ දිගු, බඹක්පමණදික්වූ; කැණ, ඉණිපිරින්; ඔලඹා, එල්ලෙන්නාවූ; රඹා, කෙසෙල්ගස්; සිටුසිටුවා, ඒ ඒ තැන ස්ථාපිතකරවා; අතුරු නොනබා, අතරක් නොදක්වා; මල්කැන්, මල් පොකුරු; ලඹා, එල්ලා.

534 අවට, හාත්පස; සුශේ, ශුභ්‍රවූ; පට, වස්ත්‍රයන්; බැඳ, බන්ධනයකොට; රතකලශේ, සුවර්ණකලශයන; (රත්රිදී) කෙහෙළි, කෙතූන්; (ධජ) ලඹ, ලම්බමානකොට; සොශේ, මනාව; මග, මාර්ගය; සරසා, සැරසීයකරවා; සත්දහස්සත්සියක් නිරිශේ, සත්දස්සත්සිය යක් නරේන්ද්‍රයෝ

535 මිහිවදයෙහි, මධුපටලයෙහි; ගඳට, සුගන්ධයට; ඉවකොට, ඉවකර; දිවන, දුවන්නාවූ; බිඟුමෙන්, භෘංගයන්මෙන්ද; කදගිම් කල, ග්‍රීෂ්මකාලයෙහි; දිය, ජලයසඳහා; විලකාට, තඩාගයකට; දිවන, ධාවනයකරන්නාවූ; ගජසෙන් ලෙසින්, හස්තිසේනාවමෙන්ද.

536 ගැසූ, නඟාදම්කලද; මස්ගොදුරට, මාංසගොචරයට; දිව එන, ධාවනයකොට එන්නාවූ; මසුන්විලසට, මත්ස්‍යයන්මෙන්ද; යාගෙහි, යාගයෙහි; කිරිබතට, ක්ෂීරභක්තය පිණිස; එකාවට, එක්සිල්ලෙහි; දිවන, ධාවනයකරන්නාවූ; බමුණන් ලෙසින්, බ්‍රාහ්මණයන්මෙන්ද.

537 දන්දිමට, දන්දෙනසඳහා; දෙරළ, භරණලදදොරඇති; සත්රුවන්, සප්තරත්නයන්; පිරි, පිරුණාවූ; මගයකට, ගෘහයක්කරා; ඔවුනොවුන්, අන්‍යොන්‍යයන්; පසුනොට, පසුකරගෙණ; මලාබකොට, ආශාමෙන්; දිවන, දුවන්නාවූ; දිළිඳුන් ලෙසින්, දරිද්‍රජනයන්මෙන්ද.

538 තුන් යොදුනම් තො සේ
තුත්පියවරින් යන සේ
සමග මහ පිරි සේ
හොසින් වැද ගංතෙරට එම සේ

539
එන බුදුරැස් බ ලා
පිපෙනා මෙන් විල් කම ලා
වෙසෙසින් තුටුව ලා
නැමද මුනිසිරි දෙසට ඉස ලා

540
මහපුද කටැටි යෝ
රුසිරෙන් සුරන් සැටි යෝ
බුදුගුණ දවටි යෝ
වඩන මුනිදෙස් බලා සිටි යෝ

541
අහස සිරි වි දු මෙන්
සුරසෙන් කාරණ පි දු මෙන්
නැව් සෙනග පැ දු මෙන්
එතරසිරි නරනිඳුන්ගෙ සඳු මෙන්

542
රැස්වතුරේ දුව ටි
නරන් කරරත් රූ සැ ටි
නැව මුනිඳුන් පිහි ටි
නිවන්පුරසේම'වුත් ගොඩ දි ටි

538 තුන්යොදුනම, ත්‍රියොජනයම; තොසේ, තුෂ්ටව; තුත්පියවරින්, තුන්පදවාරයකින්; යනසේ, ගමනයකරන්නාක්මෙන්; මහපිරිසේ සමග, මහපිරිස හා එක්ව; හොසින්, ගමනයකොට; එමසේ, ඒකාලයෙහිම; ගංතෙරට, නදීතීරයට; වැද, පැමිණ.

539 එන, ආගමනයකරන්නාවූ, බුදුරැස්, බුද්ධරශ්මිය; බලා, අවලෝකනයකොට; විල්, තඩාගයන්හි; කමලා, පද්මයන්; පිපෙනා මෙන්, පුෂ්පිතවන්නාක්මෙන්; වෙසෙසින්, විශේෂයෙන්; තුටුවලා, තුෂ්ටව; මුනිසිරිදෙසට, සර්වඥයන්වහන්සේ වැඩසිටි දිශාවට; ඉසලා, ශීර්ෂයකොට; නැමද, නමස්කාරකොට.

540 මහපුදකැටියෝ, මහත්වූපූජාකරණු කැමැත්තාවූ; රුසිරෙන්, රූපශ්‍රීයෙන්; සුරන්සැටියෝ, දෙවියන්සමානවූ; බුදුගුණ, බුද්ධගුණයෙහි; දවටියෝ, ආසක්තවූවාහු; වඩන, වැඩමවන්නාවූ; මුනිදෙස, සර්වඥයන්වහන්සේගේ දිශාව; බලාසිටියෝ, අවලෝකනය කරමින් සිටියාහුය.

541 අහසසිරි, අහස්නිපවන්නාවූ; විදුමෙන්, විද්‍යුත්ආකාරවූ; සුරසෙන්, දිව්‍යසේනාවන්විසින්; කරණ, කරණලද්දාවූ; පිදුමෙන්, පූජාවෙන් යුක්තවූ; එතරසිරි, එගොඩසිටිනාවූ; නරනිඳුන්, නරේන්ද්‍රයන්ගේ; සඳුමෙන්, නිශානාථයෙන්; නැව්සෙනග, නාවිකසමූහයාගේ; පැදුමෙන්, පැදීමෙන්.

542 රැස්වතුරේ, රශ්මිනැමතිජලයෙහි; දුවටි, දවටුනාවූ; නරන්, මනුෂ්‍යයන්; රත්රූසැටිකර, සුවර්ණරූපාකාරකොට; මුනිඳුන්පිහිටි, සර්වඥයන්වහන්සේ වැඩසිටිනාවූ; නැව, නෞකාව; නිවන්පුරසේම, නිර්වාණපුරයමෙන්ම; අවුත්, ආගමනයකොට; ගොඩ දිටි, ගොඩබිම්දුටුවාය,

543 ගලපමණක් දිය ව
බැස නරනිඳුනු එවට ව
නැව ඇදගෙණ ගොඩ ව
බුදුන් බාවාගත්හ එගොඩ ව

544
පියැ නිරිඳු සිරස ව
මිණිබර කිරුළු විලස ව
පත් මල්වට බව ව
කාල දේවල රුසිත් මුදුන ව

545
කොසොල් රද රදහ ස
තුටුකල පිපි පියුම් ලෙ ස
දන පල් ඇතු සිර ස
එගැකිරිසිඳුරු රසපානැ ස

546
උසින් නමහට වැ ඩි
කෙනෙකුන් නැතැයි කල එ ඩි
රිවිසඳ කිරණ මැ ඩි
එබඳු රා අසුරිඳුංග මන්මැ ඩි

547
මොලොක් ගුණයෙන් දු රු
ගලවද තමා සත් දු රු
උදක් සිත් පිත් දු රු
පවා වදවනා නොයෙක් ගිරිතු රු

---

543 එමවිට, එඇසිල්ලෙහි; නරනිඳුහු, නරේන්ද්‍රයෝ තුමූ; ගල පමණක්, ග්‍රීවප්‍රමාණවූ; දියට, ජලයට; බැස, අවතීර්ණව; ගොඩට, ස්ථලස්ථානය ; නැව, නෞකාව; ඇදගෙණ, ඇදලා; බුදුන්, සර්වඥ යන් පහන්සේ; බාවාගත්හ, වැඩම්මවාගත්තාහුය.

544 පියනිරිඳු, පිතෘනරේන්ද්‍රයාගේ; සිරසට, හිසට; මිණිබර, මාණික්‍යයෙන් භාරවූ; කිරුළු විලසට, මොටුන්නක්මෙන්ද; කාල දේවල රුසිත්, කාලදේවල ඍෂියාණන්ගේ; මුදුනට, හිසට; මල්වට බවට, මාලාගුලයක් බවටද; පත්, පැමිණියාවූ.

545 කොසොල්රද, කොශල රාජයා නැමති; රදහස, රාජහංස යා; තුටුකළ, සතුටුකළාවූ; පිපි, ප්‍රබුද්ධවූ; පියුම්ලෙස, පද්මයක් බඳුවූ; දනපල් ඇතු, ධනපාල හස්තියාගේ; සිරස, ශීර්ෂයෙහි; ගෑ, න වරණලද; එකිරිසිඳුරුරස, එ හස්තිසිංහරාජලය; ඇසපාන, අස්වාදට පාත්තාවූ.

546 උසින්, උසබවහේතුකොටගෙණ; නමහටවැඩි, නමාට අධිකවූ; කෙනෙකුන්, යම්කෙනෙක්; නැතැයි, අවිද්‍යමානයයි; එඩිකළ, දර්පකළාවූ; රිවිසඳ කිරණ, සූර්‍ය්‍යචන්ද්‍රකාන්තිය; මැඩි, මර්දනයකළාවූ; එබඳු, එයාකාරවූ ගුණඇති; රාඅසුරිඳුහග, රාහුඅසුරේන්ද්‍රයාගේ; මන් මැඩි, මානමර්දනයකළාවූ.

547 මොලොක්ගුණයෙන්, මෘදුගුණයෙන්; දුරු, දුරුවූ; තම සත්දුරු, තමන්වහන්සේගේ (පා) ලක්‍ෂණදුරුවාවූ; ගලද, පාෂාණය වද; උදක්, කොවලව; සිත්පිත්, චිත්තමනෝධාතුවෙන්; දුරු, දුරුවූ; නොයෙක්ගිරිතුරු, අනේක පර්වත වෘක්ෂයන් ලවා; වදවන, වන්දනය කරවන්නාවූ.

5.9 දික්සල සොත් මෙර ව
උසුලනා නැමිගෙණ සි ව
සක් ලකුණෙන් ලොව ව
රුපු සක්විති බවම දියත ව

549
ගලවුව එරිය න
පුළුතවුර රල් නොමැඬ න
සමලකුණන් සොබ න
සුපිපි සත්බුමු පියුම්පිට ය න

551
බවගිම් හැර එර ව
වස්වන දහම් වැස්ස ව
සැක දුරුකර ලොව ව
පාත පෙරනිමිතිසේ එමවී ව

550
බඹසුර නරමු දුන්
විල පිපි පියුම් සිරි දුන්
සියුමැලි පතන දුන්
තබන සිරිපා සෙදෙරණ මුනි දුන්

552
මුලදුක්බික් දුක ව
තදරිව කිරණම්ය බ ව
එබැවින් ඒ මෙව් ව
වැද්දනොදෙමැයි යනුසෙදෙරණ

---

5ෑර මෙරට, මෙරුපර්වතයට උවත්; දික්කල සොත්, ප්‍රසාරණය කර වදාළ්නම්; නැමිගෙණසිට, නිම්නවගෙන සිට; උසුලනා, උසුලන්නාවූ; සක්ලකුණෙන්, චක්‍රලක්ෂණයෙන්; ලොවට, ලොකයාහට; දියතට, ජගත්‍රයම්; සක්වතිබවම, චක්‍රවර්තිභාවයම්; රුපු, ගෙණහැරදක්වූවාවූ.

549 ගලවුව, පාෂාණයවුවත්; එරියන, නිමග්නවන්නාවූ; පුළුතවුව, පුළුත්පරාදවීතමුත්, රල්නොමැඬන, රලිපෙළඹීනොවන්නාවූ; සමලකුණන්,සම්පාදතාලක්ෂණයෙන්;සොබන,සොභමානවූ; සුපිපි, සුපුෂ්පිතවූ; සත්බුමු, සප්තගුම්කාවූ; පියුම්පිට, පද්ම මස්තකයෙහි; යන, ප.බඳවන්නාවූ.

550 බඹසුරනර, බ්‍රහ්මදෙවමනුෂ්‍යයනමොවුන්ගේ; මුදුන්,මස්තකනැමති; විල, තඩාගයෙහි; පිපි, පිපුනාවූ; පියුම්, පද්මයන්ගේ; සිරි, ශොභාව, දුන්, දනයකලාවූ;සියුමැලිවන, සුකුමාලවූ;තදුන්,තඤතීයවූ; සරිපා, ශ්‍රීපාදයුගලය; මුනිදුන්, මුනීන්ද්‍රයන් වහන්සේ; සෙදෙරණ, ධරණියෙහි; (පොළොවෙහි) තබන, තබාවදාරණකල්හි.

551 එරව, එරාෂවූයෙහි; බවගිම්, සංසාරනැමති ග්‍රීෂ්ම; හැර, දුරුකොට; වස්වන, වර්ෂාකරවන්නාවූ; දහම්, ධර්මනැමති; වැස්සට, වර්ෂාවට; ලොවට, ලොකයාගේ; සැකදුරුකර, සංකාව්නොදන්ය කොට; එමෑට, එඅැසිල්ලෙහි; පාත, ප්‍රකාශකරන්නාවූ; පෙරනිමිති සේ, පූර්වනිමිති පරිද්දෙන්.

552 දුක්බික්දුකට. දුර්භික්ෂදුඃඛයට; මුල, මුල්කාරණය; බව; අවතීර්ණව; තද, දැඩිවූ; රිවිකිරණමය, සූර්යරශ්මියමැයි; එබැවින්, එසේහෙයින්; ඒ, තත්රශ්මිය; මෙවට, මෙකල්හි; සෙදෙරණට,පොළොවට; වැද්දනොදෙමැයි යනුසෙ, ඇතුල්වීමට නොදෙමැයි කියන්නාක් මෙන්.

553 නිල්පැහැ කවදගෙ ණ
මහ ගිරිදුදුළු පැනගෙ ණ
මහමෙසත් මෙත් දිව ණ
වසා නුබගත අඳුරුකොට මග ණ

554
අප මුනිඳු වැඩි දෙ ස
නොහිඹිය යුතුය කුණුරු ස
දම්වැසි කියනා ලෙ ස
පුරාගෙණ ගන ගොසින් දසදෙස

555
විදිනට යක් සෙන ග
දෙවියන් රැගත් දුනුර ග
ගත් නත් පැහැතර ග
සඳ ඉඳුදුනු රැසින් සුරම ග

556
අප හිමි මුනි පුද ව
සිකි නළ රඟන රැගුම ව
හෙළුමලැඳිලි ලෙස ව
සද කොකවැළ නැගෙන අහස ව

557
එළිකර විදුලිද එ
පලාගෙණ ගන ගනකු එ
මුනි පුදයට ලකු එ
විදපත්කරනයේ දිස එ

---

553 නිල්පැහැ, නීලවණිවූ; කවදගෙණ, කවචයන්බඳහාගෙණ; මහගිරිදුදුළු, මහාගිරිදුර්ගීයන්; පැණගෙන, උල්ලංඝණයකොටගෙණ; දිවන, දුවන්නාවූ; මහමෙසත්මෙන්, මහාමේඝයාසේ පරිද්දෙන්; නුබ, ආකාශය; වසා, ඡාදිතකොට; ගනඅඳුරුකොටගෙණ, ඝනාන්ධකාර කොටගෙණ.

554 අප මුනිඳු, අපගේ මුනීන්ද්‍රයාණන්; වැඩිදෙස, වැඩමවූ දිශාවෙහි; කුණුරුස්, කුණපරාශිය; නොහිඹියයුතුය, හිඹිමට අයුතු බව සිත්; දම්වැසි කියනලෙස, ධර්මවර්ෂය කියන්නාක්මෙන්; ගන ගොසින්, මේඝගර්ජනාවෙන්; දසදෙස, දශදිශාවන්; පුරාගෙණ, පූරණය කොටගෙණ.

555 යක්සෙනඟ, යක්ෂසේනාව; විදිනට, විදීමපිණිස; දෙවියන්, දෙවතාවන් විසින්; රැගත්, ගත්තාලද; දුනුරඟ, දුනුමෙන්; නත්, නොයෙක් ආකාරවූ; පැහැතරඟ, ප්‍රභාතරඞ්ගය; ගත්, ගත්තාවූ; ඉඳුදුනුරැසින්, ඉන්ද්‍රධනුසමූහයෙන්; සුරමඟ, අහස; සද, සරසා.

556 අපහිමි, අපගේ ස්වාමිවූ; මුනිපුදව, බුඩපූජා පිණිස; සිකි නළ, මයුර නැට්ටුවා; රඟන, නටන්නාවූ; රැගුමව, නැටීමද; හල, හරණලද; මල්ඇඳිලිලෙසට, මාලාඤ්ජලීමෙන්; සද, සජ්ජිතකොට; කොකවැල, කොක්සමූහයා; අහසට, ආකාශයට; නැගෙන, නගිනා කල්හි.

557 මුනිපුදයට, බුඩපූජාවට; ලකුළු, අලඞ්කෘතවූ; දිවසළු, දිව්‍ය ශාටකයන්; විදපත්කරණයේ, විදහාපාන්නාක්මෙන්; ගන, ඝනවූ; ගනකුළු, මේඝකූටයන්; පලාගෙණ, ප්‍රදලනයකොටගෙණ; විදුලිදළු විදුලි නැමැත්ලාපත්; එළිකර, ආලෝකකොට.

558 හිමවතපෙත නැබු — එ
ඉපිල නැගීමෙන් ගිරිකු — එ
අඳුන් කුළුසේ කා — එ
වසා නුබ පතලේය ගනකු — එ

559
වැසි වැස වතු — රු වි ය
කුණු සකුණු හැමදු — රු වි ය
එපුර පිවිතු — රු වි ය
එරට හැම තුරුලියද’කු — රු වි ය

560
නොහැර විල් — වා පී
ගංහෝද පුර — වා පී
මහ ගි නි — වා පී
සතුත්සිත සතොස කර — වා පී

561
තම තම බල පම — ණ
සෙනඟ සහ මහ රජග — ණ
මුනිඳු සඟ සඟග — ණ
පුද නත් පුදවතින් අපම — ණ

562
සුර බඹ සෙන් සම — ග
පුද යොද යොදා මනර — ග
සැතපි අතර ම — ග
වූය තුන්දවසකින් පුරල — ග

---

558 නැබුළු, මහත්වූ; හිමවතපෙත, හිමාලයවිත පඩකතිංයෙහි; ගිරිකුළු, පර්වතකූටයන්; ඉපිල, උද්ගතව; නැගීමෙන්, නැංගාක්මෙන්; නුබ, අහස්; වසා, ඡාදිතකොට; අඳුන්කුළුසේ, අඤ්ජනකූටමෙන්; කාළ, කාලවර්ණවූ; ගනකුළු, මේඝකූටය; පතලේය, ප්‍රකටවූයේය.

559 වැසිවැස, වර්ෂාකිරිමෙන්; වතුරුවිය, ජලයඇතිවීය; කුණු සකුණු, කුණුකසල; හැම, සියල්ලම; දුරුවිය, පහවූයේය; එපුර, එනගරය; පිවිතුරුවිය, පවිත්‍රවූයේය; එරට, එරටෙහිවූ; හැම තුරුලියද, සියලු වෘක්ෂලතාද; අකුරුවිය, අංකුරසහිතවූයේය.

560 විල්වාපී, විල්හාවැව්ද; ගංහෝද, ගංගා හා ඔයවල්ද; නොහැර, ඉතිරිනොකොට ම; පුරවාපී, පූරණයකරවූසේක; මහගිම්, මහාග්‍රීෂ්මය; නිවාපී, නිවවූසේක; සතුන්, සත්වයන්ගේ; සිත, චිත්තය; සංතොසකරවාපී, සතුටුකරවූසේක.

561 සෙනඟසහ, සේනාසහිතවූ; මහරජගණ, මහාරාජසමූහයා; තමතම, තමතමන්ගේ; බලපමණ, ශක්තිප්‍රමාණයෙන්; මුනිඳුසඟ, මුනීන්ද්‍රයන් සහිතවූ; සඟගණ, සඞ්ඝසමූහයා; අපමණ, අප්‍රමාණවූ; නත්පුදවතින්, අනේකපූජාවස්තුවෙන්; පුදා, පූජාකොට.

562 සුර බඹ සෙන් සමග, දිව්‍යබ්‍රහ්මසේනාවන් හා; මනරඟ, මනොහරවූ; පුද, පූජාවන්; යොදා යොදා, යොජිත කාරමින්; අතරම්ඟ, අන්තරමාර්ගයෙහි; සැතපි, සන්තර්පිතව; තුන්දවසකින්, දවස් තුනකින්; පුරලඟවූය, නගරයට ළඟාවූහ.

563 මත මුනිඳු පුරවෙත
පුදකොට සුර සෙනහ එත
උන් දුක බියව සිත
දිවු යක්සෙන් නොසිට දස අත

564
හැම රෝදුක් පසුන්
එන ගත යකුන් පිසසුන්
මුනිඳුන් බුදුසසුන්
නිසා සුවපත්වන මිනිසුන්

565
පත්මෙන් එපුර මැද
දහස් සුවහස් රිවිසද
දිගු එළිකර එසද
පැමිණ පුර දොරට සුගතිඳු සද

566
තඹගට අඹගෙහ පතා
කලපින් කමින් සැපතා
වෙතසිටි නිති පතා
අහඳ මහ තෙරිඳු සඳ අමතා

567
යක් බූ පිසස් කළ
උපදුරු දුරින් දුරු කළ
අණසක නිති වතළ
නොහැර කෙළ සුවහසක් සක්වළ

---

563 මුනිඳු, මුනීන්‍ද්‍රතුමා; පුරවෙත, නගරය සමීපය...; එත, පැමිණි කල්හි; පුදකොට, (උන්වහන්සේ) පුජාකරමින්; සුරසෙනහ, දිව්‍ය සේනාව; එත, පැමිණෙනකල්හි; උන්දුක, ඒ දෙවියන් දුටුකලා; සිත බියව, චිත්තභීතියට පැමිණ; යක්සෙන්, යක්ෂසේනාව; නොසිට, සිටි තමනාව; දසඅත, දශදිශාවන්හි; දිවූය, දිව්වෝය.

564 යකුන් පිසසුන්, යක්ෂයන්හා පිශාචයන්; යන, යනකල්හි; හැමරෝදුක්, සියලුරෝගදුඃඛයන්; පසුන්වන, සුවවනකල්හි; මුනිඳුන්, සර්වඥයන් වහන්සේගේ; බුදුසසුන්, බුද්ධශාසනය; නිසා, හේතුකොටගෙණ; මිනිසුන්, මනුෂ්‍යයන්; සුවපත්වයන, සුවපත්බවට පැමිණෙන කල්හි.

565 එපුරමැද, ඒ නගරමධ්‍යයට; දහස්සුවහස් රිවිසඳ, සහශ්‍ර ලක්ෂසඞ්ඛ්‍යාත සූර්‍ය්‍යබිම්බයන්; පත්මෙන්, පහලවූවාක්මෙන්; එසද, එකල්හි; දිගු, දිශාවන්; එළිකර, ආලෝකකොට; සුගතිඳුසඳ, සුගත නැමති චන්ද්‍රයා; පුරදොරට, නගරද්වාරයට; පැමිණ, ප්‍රාප්තව.

566 තඹගට, තමන්වහන්සේට; මෙහෙපතා, උපස්ථාන කිරීම් ප්‍රාර්ථනාකොට; කලපින්කමින්, කරණලදපුණ්‍යකර්මයෙන්; සැපතා, පැමිණියාවූ; නිතිපතා, නිරන්තරයෙන්; වෙතසිටි, සමීපයෙහි සිටියාවූ; අහඳමහ තෙරිඳු සඳ, ආනන්දමහාස්ථවිරේන්ද්‍රයා; අමතා, ආමන්ත්‍රණයකොට.

567 යක්බූපිසස්, යක්ෂභූතපිසාචයන් විසින්; කළ, කරණලද; උවදුරු, උපද්‍රවයන්; දුරින්දුරුකළ, දුරින්මදුරුකළාවූ; කෙළ සුවහසක් සක්වළ, කොටිශතසහශ්‍රචක්‍රවාලය; නොහැරම, අත්නොහැරම; නිති, නිරන්තරයෙන්; අණසක, ආඥචක්‍රය; වතළ, පැතුරුණාවූ.

568 පවතිනා සත සෙත ට
මෙලොව පස්වා දහස ට
කියා පුර පිරිත ට
රුවන් මහසුතුර ඒ සෙතරිඳු ට

569
මිණිපය දිය පු රා
මෙපිරිත දෙසා සපු රා
එදිය ඉසැ මෙපු රා
පිරිත් කරවයි කියා ඉදු රා

570
සිටිසඳ මුනිඳු ස ද
නිරිඳු මෙවෙන් මනන ද
සිවුරඟසෙන් නොම ද
රැගෙණ එපුරෙහි යොද මහපු ද

571
නොනැගෙණ ලෙස රජ ස
බිම නොනෙගෙන ලෙස රිවි රැ ස
සිතුවම් ලෙස දෙප ස
යොගා මාහැගි වතින් නිසිලෙ ස

572
ලඹමල් විදු ලෙස ට
සඳ බිම සුදු මල් ප ට
පුර මහවේ දෙපි ට
පහන් ලා රන්රිදී මිණිවැ ට

---

568 මෙලොව, මේලොකයෙහි; සත, සත්වයන්ගේ; සෙතට, ශාන්තියට; පස්වාදහසට, අවුරුදුපන්දහස් මුළුල්ලෙහි; පවතිනා, පවතින්නාවූ; රුවන්මහසුතුර, රතනමහාසූත්‍රය; පුර, නගරයාගේ; පිරිතට, ආරක්‍ෂාව පිණිස; එසෙතරිඳුට, ඒ(අනඳමහ)සත්විරයාණන්ට; කියා, වදරා.

569 මිණිපය, මාණික්‍යපාත්‍රයෙහි; දියපුරා, ජලයෙන් පූරණය කොට; සපුරා, සම්පූර්ණකොට; මෙපිරිත, මේ පරිත්‍රාණය; දෙසා, දේශනාකොට; මෙපුරා, මේ නගරයෙහි; එදිය, එ (පිරිත්) පැන්; ඉසැ, ඉසීමින්; ඉදුරා, සෘජුව; පිරිත්කරවයි, ආරක්‍ෂාකරවයි; කියා, වදරා.

570 මුනිඳුසඳ, මුනිඳුතුමා; සිටිසඳ, වැඩසිටිකල්හි; නිරිඳු, නරේන්ද්‍රයෝ; මනනදවෙමින්, සිත්සතුටුව; නොමද, බොහෝවූ; සිවුරඟසෙන්, චතුරඞ්ගිනී සේනාව; රැගෙණ, ග්‍රහණයකොට; එපුරෙහි, ඒ නගරයෙහි; මහපුද, උළාරපූජාවන්; යොද, යුක්තකොට.

571 රජස, ධූලීන්; නොනැගෙණලෙස, නොනැගෙණ පරිද්දෙන්ද; රිවිරැස, සූර්‍යරශ්මිය; බිමනොනෙගෙනලෙස, බිමනොවැටෙන පරිද්දෙන්; දෙපස, උභයපාර්ශ්වයෙහි; සිතුවම්ලෙස, චිත්‍රකර්ම පරිද්දෙන්; නිසිලෙස, යොග්‍යාකාරයෙන්; මාහැගි වතින්, මහාර්ඝවස්ත්‍රයෙන්; යොගා, ශෝභනයකොට.

572 විදුලෙසට, විදුලි පරිද්දෙන්; මල්, පුෂ්පයන්; ලඹ, එල්ලා; බිම, භූමියෙහි; සුදු, ශුභ්‍රවූ; මල්පට, පුෂ්පපට්ටයෙන්; සඳ, සැරසීනකොට; පුර, නගරය සම්බන්ධවූ; මහවේදෙපිට, මහාවීථි උභයපාර්ශ්වයෙහි; රන්රිදීමිණිවැට, ස්වර්ණරජතමාණික්‍යමයපාත්‍රයන්හි; පහන්, ප්‍රදීපයන්; ලා, බහා.

573 පුර පෙරහර සකස්
කර සරහමින් නොසරස්
බුදුන් සහ සඟ රැස්
ඇතුළු නුවරට වඩාගෙණ ගොස්

574
දහස් සිය සත් සත්
තිරිදුන් ඉඳිත මැති යුත්
දිගුපුළුලැති මහත්
සුරිඳු වෙජයොත්පාය සිරිගත්

575
සුරත් ලෙස මෙරගේ
රත්දද ලෙලෙන සුළගේ
නුබ සිතුයම් රගේ
පැතිරි මිණිකොත් කිරණතරගේ

576
හිමිසඳ මුදුනදුත්
රන්කිරුළු මිණි සිරිදුත්
සත සිත කළ නදුත්
නුවරමැද මහපහය තිරිදුත්

577
සිටිසුර සිඳුසෙ වැද
පිරිසිදු සුදු වියන් බැද
දිලෙන රන් තරු මැද
*මලෙන්ලොඹු මුතුලැලින් කැරැද

573 පුර, නගරයෙහි; පෙරහර, පාරිහාරිය; සකස්කර, සකස්කොට; නොසරස්, ඉක්මන්ව; සරහමින්, සජ්ජිතකෙරෙමින්; බුදුන් සහ, සර්වඥයන්වහන්සේ සහිතවූ; සඟරැස්, සඞ්ඝසමූහයා; ඇතුළු නුවරට, අභ්‍යන්තර නගරයට; වඩාගෙණගොස්, වැඩම්වාගෙණගොස්.

574 සත්දහස් සත්සිය තිරිඳුන්, හත්දහස්හත්සියයක්පමණනරෙන්ද්‍රයන්; මැතියුත්, මන්ත්‍රීන්හාඑක්ව; ඉඳිත, ඉන්නාවූ; දිගුපුළුලැති, දිගින් හා පළලින් යුක්තවූ; මහත්, විශාලවූ; සුරිඳු, ශක්‍රයාගේ; වෙජයොත්පාය, වෛජයන්ත ප්‍රාසාදයාගේ; සිරිගත්, සොභාග්‍යගණය කළාවූ.

575 මෙරගේ, මෙරුඅග්‍රයෙහි; සුරත්ලෙස, දෙව්යන් මෙන්; සුළගේ, හුළඟින්; ලෙලෙන, ලීලාදුනයකරන්නාවූ; රන්දද, ස්වර්ණ ධ්වජයෑති; නුබ, අහස්හි; සිතුයම් රගේ, චිත්‍රකර්මයමෙන්; පැතිරි, පැතිරපවත්නාවූ; මිණිකොත්, මාණික්‍යකොතුන්ගේ; කිරණතරගේ, රශ්මි තරඞ්ගඇති.

576 හිමිසඳ, ස්වාමීස්ථානමයාහට; මුදුනදුත්, මස්තකය දුන්නාකළාවූ; රන්කිරුළු, ස්වර්ණකිරීටයන්ගේ; මිණි, මැණික්වල; සිරිදුත්, ශෝභාදුනය කළාවූ; සත, සත්වයන්ගේ; සිත, චිත්තය; නදුත්, සන්තුෂ්ටකළාවූ; නුවරමැද, නගර මධ්‍යයෙහිවූ; මහපාය, මහා ප්‍රාසාදයෙහි.

577 වැදසිටි, ප්‍රවේශව සිටියාවූ; සුරසිඳුසෙ, මන්දාකිණියමෙන්; පිරිසිදු, පරිශුද්ධවූ; සුදුවියන්, ශුභ්‍රවිතානයන්; බැද, බන්ධනයකොට; දිලෙන, බබලන්නාවූ; රන්තරුමැද, ස්වර්ණතාරකා මධ්‍යයෙහි; මලෙන්ලොඹු, මාලාවලම්බයන්හා; මුතුලැලින්, මුක්තාලතිකාවෙන්ද; සැදකර, සාදනයකොට.

* මලෝලඹු.

578 දූරලත නහදු — රා
ගත් රිවිරශසෙව් උදු — රා
රශගත් නෙත් පැහැ — රා
අවට *රත්වැට හිරෙන් අවු — රා

579
සිවුදැහද කල — ල්
පිරිබඩ රශගෙන මිණිව — ල්
සිතුයම් කල තිම — ල්
අනගි බුමුතුරුණු ලා මතක — ල්

580
ලෙල මුතුදල් නොම — ද
බිද සේසනින් මත න — ද
අස්නක් එම්බු බැ — ද
සඳ වැඩ ඉඳිය ලෙස මුනිස — ද

581
සක්රුවත ල — දුවා
ලෙස තමසිත පුබු — දුවා
ගුණෙන් පිරිසු — දුවා
මුනිඳු අස්නෙහි වඩා හි — දුවං

582
ඉදිරිකර සිතු මි — ණ
පෙල සඳනමෙන් මිණි ග — ණ
සත සිත පියකර — ණ
උඩ හිඳුවා රහත් සගන — ණ

578 ගඟ දුරා, සන්ධකාරය; දූරලත, දුරලන්නාවූ; රිවිරශ, සූර්යරශ්මිය; උදුරාගත්එව්, උඩරණයකොට ගත්තාක් වැනිවූ; නෙත්, නෙත්‍රය; පැහැරාරශගත්, ප්‍රහරණයකොට ගත්තාවූ; රත්වැට, සවණ්ණ‍තන්ත්‍ර හා; හිරෙන්, ජවනිකාවෙන්; අවට, හාත්පස; අවුරා, ආවරණයකොට.

579 සිවුදැගදකලල්, චතුර්ජාතිසුගන්ධපංකියෙන්; තිල්බිම, නීල වර්ණමදිනිය; පිරිබඩරශගෙණ, පරිභණ්ඩ ග්‍රහණයකොටගෙණ; තිමල්, නිම්ලවූ; සිතුයම්කල, චිත්‍රකර්මයකරනලද්දාවූ; අනගි, මාහැගිවූ; මත කල්, මනොකල්‍යවූ; බුමුතුරුණු, භූම්‍යස්තරණයක්; ලා, එලා.

580 මුනිසඳ, මුනීන්ද්‍රයානන්ට; වැඩඉඳිනලෙස, වැඩඉඳීමට යෝග්‍යපරිද්දෙන්; නොම්ද, අමන්‍දව; ලෙල, ලෙලදෙන්නාවූ; මුතුදල්, මුක්තාජාලාවෙන්යුක්තාවූ; බිඳ, බැඳනාලද; මනනඳ, මනොනන්‍දනවූ; සේසනින්, සෙවතච්ඡත්‍රයෙන් යුක්තාවූ; අස්නක්, ආසනයක්; එම්බු බැද, එම්ණ්ඩපම්ඩපයෙහි; සඳ, සාදා.

581 සක්රුවතලදුවාලෙස, චක්‍රරත්නය ලැබූවාක්මෙන්; තම සිත, තමන්ගේ චිත්තය; පුබුදුවා, ප්‍රබෝධකොට; ගුණෙන්, (ශීලාදී) ගුණයෙන්; පිරිසුදුවා, පරිශුද්ධවූ; මුනිඳු, මුනීන්ද්‍රයන් වහන්සේ; අස් නෙහි, (ඒ) ආසනයෙහි; වඩාහිඳුවා, ගරුඅඳුමින් නිසිදනයකරවා.

582 සිතුමිණ, චින්තාමාණික්‍යය; ඉදිරිකර, පෙරටුකර; මිණි ගණ, මාණික්‍යසමූහයේ; පෙල, පංක්තිය; සඳනමෙන, සඳනාක් මෙන්: සත, සත්වයන්ගේ; සිත, චිත්තය; පියකරන, ප්‍රියකරන්නාවූ; රහත්සගනණ, අර්හත්සංඝසමූහයා; උඩාහිඳුවා, ගරුඅඳුමින් නිසිද නයකළා.

* රතපට. † ලෑල්. ‡ කොසුම්, යොත්පුජ්, තුවාලා, තුරුක්පෙල්, යන සතරයි.

583 තමමිණි කිරුළු — දේ
සිලිලෙලත් සරණ කර — දේ
තබා මුදුනත — දේ
මුනිඳු වැඳ උත්තෝය නිරි — දෝ

| 584 | | 586 | |
|---|---|---|---|
| රත් මිණි මුතු පබ | ළු | දෙනෙත් සුපිහිටි | යෝ |
| අබරණ පැළඳ සුලකු | ළු | සිවුහතුරෙහි සිටි | යෝ |
| ඇඳ නිසි කසීය | ළු | වෙසින් නොකිලිටි | යෝ |
| පසෙක* උත්තුය එරජ මැතිමුළු | | බුදුන්වැඳ එක්පසක සිටි | යෝ |

| 585 | | 587 | |
|---|---|---|---|
| සව්සතර නිපු | ණෝ | නැතෙකත් තොල | ස් වූ |
| පෙරළුදුරු බසිනි නිපු | ණෝ | මුනිරූ දසුම තො | ස් වූ |
| කුලසිරිනි† දපු | ණෝ | තොකොට නැත්හි | ස් වූ |
| මුනිඳු වැඳ උත්තෝය බමු | ණෝ | සෙනග මහ වතුරැසේ රැ | ස් වූ |

583 තමමිණිකිරුළුදේ, තමන්ගේ මාණික්‍යකිරීට රශ්මි නැමැති; සිලිලෙලත්, ජලයෙන්; සරණ, පාදයන්; දේකර, ධෞතය කොට; දෙඅත, අත්දෙක; මුදුන, මස්තකයෙහි; තබා, ස්ථාපනය කොට; නිරිඳෝ, නරේන්ද්‍රයෝතුමූ; මුනිඳු, මුනීන්ද්‍රයන්ට; වැඳ, නමස්කාරකොට; උත්තෝය, නිසීදනයකළෝය.

584 රත්මිණිමුතුපබළු, රක්තමාණික්‍යමුක්තාප්‍රවාල යන මෙයින්; සුලකුළු, අත්‍යාලංකාරවූ; අබරණ, ආභරණයන්; පැළඳ, පිළන්ධිතව; නිසි, යෝග්‍යවූ; කසීසළු, කසීසාටකයන්; ඇඳ, අඳනය කොට; එරජමැතිමුළු, එරාජඅමාත්‍යසමූහයෝද; පසෙක, එක්පාර්ශ්වයෙක්හි; උත්තුය, උත්තෝය.

585 සව්සතර, සකලශාස්ත්‍රයෙහි; නිපුණෝ, නිපුණවූ; පෙරළුදුරුබසිනි; පූර්වාචාර්‍ය්‍යවචනයෙන්; නිපුණෝ, දක්ෂවූ; කුලසිරිනි, කුලචාරිත්‍රයෙන්; දපුණෝ, දර්පිතවූ; බමුණෝ, බ්‍රාහ්මණයෝද; මුනිඳු වැඳ, මුනීන්ද්‍රයන්වන්දනයකොට; උත්තෝය, නිසීදනයකළෝය.

586 දෙනෙත්, ධනයකරණකොටගෙණ; සුපිහිටියෝ, සුප්‍රතිෂ්ඨිතවූ; සිවුහතුරෙහි, සෙසිව්‍යානාන්තරයෙහි; සිටියෝ, සිටියාවූ; වෙසින්, වෙශයෙන්; නොකිලිටියෝ, කිලුටුනුවූවාහුද; බුදුන්වැඳ, සර්වඥයන්වහන්සේට නමස්කාරකොට; එකත්පසෙක, එක්පාර්ශ්වයෙක්හි; සිටියෝ, සිටගත්හ.

587 නැතෙකත්, (කොටි) ස්ථානයෙක්හිවත්; තොලස්වූ, අප්‍රමාදවූ; මුනිරූ, මුනීන්ද්‍රරූපයාගේ; දසුම, දර්ශනයෙහි; තොස්වූ, තුෂ්ටවූ; සෙනග, සේනාංගයෝ; හිස්වූ, අවකාශවූ; නැත්, ස්ථානයක්; තොකොට, තොතබා; මහවතුරැසේ, මහාජලයක්මෙන්; රැස්වූ, රැස්වූහ.

† උත්තෝයරජ † සුරුදුරු ලෙසින් දපුනෝ † දමුසෙට්.

588 අහසත් අටදිග ත්
සක්වල ගිරත් ඇතුල ත්
නොහැර'තුරු මදකු ත්
අවුත් රැස්වූය දිවසෙනග ත්

589

සියුම් ඉදිකටු මු න
පමණක ඔබාලන තැ න
සැටසැත්තෑ බැගි න
එමුරු සිටියහ සියුම් වෙස්ගෙන න

590

එපුර පිරි* පිරිස ට
කළතුන් පවුරකින් ව ට
යතිඳුන් ගොස් අව ට
පිරිත්පැන් ඉසි සඳදී මොනවට

591

එපිරිත් පැන් ඇඟ ට
වැද ලෙඩරෝග එමවි ට
දුරුවත කිසි නොසි ට
නිදා පුබුදින ලෙසින් නැගිසි ට

592

දනයෝ එපුර ව ර
සැරහී රැගෙණ පිරිව ර
තෙරිඳුත් සහ එව ර
ගොසින්වත්නුය ඇතුළු පුරව ර

---

588 අහසත්, අවකාශයෙහිත්; අටදිගත්, අටදිශාවෙහිත්; සක්වළගිරත් චක්‍රවාටපර්වතයෙහිත්; ඇතුලත්, එහි අභ්‍යන්තරයෙහිත්; මදකුත්,සව ලපයකුත්; අතුරු නොහැර, අන්තරයක්නොතබා; දිවසෙනගත්, දිව්‍යසේනාවත්; අවුත්, ආගමනයකොට, රැස්වූය; රැසිවූහ.

589 සියුම්, සුබුම්වූ; ඉදිකටුමුවපමණක්ඔබාලනතැන, හිදිවිදක්එලාලනපමණතැනෙක්හි; සැටසැත්තෑබැගින, හැටහැත්තෑ සමණවශයෙන්; එමුරු, ඒ දෙවතාවෝ; සියුම්වෙස්ගෙණ, සුබුම් වෙසධාරිව; සිටියහ, සිටගත්හ.

590 තුන්පවුරකින්, ප්‍රාකාරත්‍රයකින්; වටකළ, පරික්ෂෙපකර ණලද්දවූ; එපුර, ඒනගරයෙහි; පිරි, පූණිවූ; පිරිසට, පර්ෂත්හට; යතිඳුන්, යතීන්ද්‍රයන්; අවට, හාත්පස්හි; ගොස්, ගමනයකොට; මොනවට, යහපත්ව; පිරිත්පැන්, පරිත්‍රාණජලය; ඉසියසඳහි, සෙචනය කළකල්හි.

591 එපිරිත්පැන්, ඒපරිත්‍රානපානීය; ඇඟට, ශරීරයට; වැද, සපර්ශව; ලෙඩරෝග, ව්‍යාධිරොගයන්; එමවිට, ඒ ඇසිල්ලෙහි; කිසි, නොසිට, මඳකුත්ඉතිරිනොව; දුරුවත, දූරීභූතවූකල්හි; නිදාපුබුදින ලෙසින්, නින්දෙන්ප්‍රබුධවූවාක්මෙන්; නැගිටසිට, නැගිටලා.

592 එපුරවර, ඒපුරප්‍රවරයෙහි; දනයෝ ජනයෝතුමූ; සැරහී, සජ්ජිතව; පිරිවරරැගෙණ, පරිවාරග්‍රහණයකොටගෙණ; තෙරිඳුන් හා, ස්ථවිරෙන්ද්‍රයන්හා; එවර, එකල්හි; ඇතුළුපුරවර, අභ්‍යන්තරනගරවරයට; ගොසින්, ගමනයකොට; වත්නුය, වැඳූහෝයි.

593 නුවරුන් සමඟ වැ ද
මුනිඳුන් සිරිසරණ වැ ඳ
අනඳ තෙරහිමි ස ද
එසබතුල එක්පසෙක උන්ස ඳ

594

රැස්වූ මහ පිරි ස
වෙන වෙනම සිත අදහ ස
යොදමින් තම දිවැ ස
තොලොස්රණකින් බලා තතු ලෙස

595

රැඳිදත් කෙසරබ ර
දිලිදිව් කෙමිත් මනහ ර
පොබයා මුවතඹ ර
සුවඳකර මුළු * දෙරණඹර තු ර

596

සලාමහ දඹග ස
අඹුලා සියලු පලර ස
යොදුගෙණ දඹර ස
බෙදුදෙනමෙන් ලොවට තීසි ලෙස

597

දෙරණ පෙරළාය ට
මතුකොට එරස රැස්කො ට
වැඩිවන මීහිරස ට
එමීරසදෙන ලෙසින් †මෙලොවට

---

593 නුවරුන්සමඟ, නාගරිකයන්හා; වැද, ප්‍රවිෂ්ටව; මුනිඳුන්, මුනීන්‍ද්‍රයන්ගේ; සිරිසරණ, ශ්‍රීචරණය; වැඳ, නමස්කාරකොට, අනඳ තෙරහිමිසඳ, ආනන්දස්ථවිරස්වාමීන්ද්‍රයා; එසබතුල, ඒ සභාව ඇතුලත; එක්පසෙක, එක්පාර්ශ්වයෙක්හි; උන්සඳ, වැඩඋන්කල්හි.

594 රැස්වූ, එක්වූ; මහපිරිස, මහත්සමූහයාගේ; සිත, චිත්තයෙහි; අදහස, අධ්‍යාශය; වෙනවෙනම, වෙන්වෙන්වසයෙන්; තම, තමන්වහන්සේගේ; දිවැසයොදමින්, දිව්‍යචක්ෂුසයොමුකරමින්; තතුලෙස, තත්වූපරිද්දෙන්; තොලොස්රණකින්, තොඩශාකාරයකින්; බලා, අවලොකනයකොට;

595 දත්, දන්තපඞ්ක්තීන්නැමති; කෙසරබර, කෙශරභාරයෙන්; රැඳි, රඤ්ජමානවූ; දිලි, බබලන්නාවූ; දිව්, ජිව්හානැමති; කෙමිත්, කර්ණිකාවෙන්; මනහර, මනොහරවූ; මුවතඹර, මුඛනැමතිතාම්‍රසය; පොබයා, ප්‍රබොධකොට; මුළුදෙරණ, සකලධරණියහා; අඹරතුර, ආකාශාභ්‍යන්තරය; සුවඳකර, සුගන්ධකොට;

596 මහදඹගස, මහාජම්බුවෘක්ෂය; සලා, සොලවා; සියලුපලරස, සකලඵලරසය; අඹුලා, ඇහිඳගෙණ; දඹරස, ජම්බුරසය; යොදුගෙණ, යුක්තකොටගෙණ; ලොවට, ලොකයාහට; තීසිලෙස,යොග්‍ය පරිද්දෙන්; බෙදුදෙනමෙන්, විභාගකොටදෙන්නාක්මෙන්;

597 දෙරණ, ධරණිය; පෙරළා, පරිවර්තනයකොට; යට, අධොභාගය;මතුකොට, මතුකර; එරස, ඒ (පෘථිවි) රසය; රැස්කොට, රාශිකොට; මීහිරසව, මධුරසයවත්; වැඩිවන, අධිකවූ; එමීරස, ඒ මධුරසය; මෙලොවව, මෙලොකයාහට; දෙනමෙන්, දනයකරන් නාක්මෙන්.

---

* දෙරණ අඹතුර. † ලෙව්හට.

598 වන්සවණ මිහිබි ඳු
සත * සිතට අමරසබ ඳු
බඹගොසකර සිති ඳු
රුවන් මඟසුත දෙසත මුනිස ඳු

599
බඹසුර නර එවි ට
පැහැදී දෙසූ දහම ට
පැමිණියහ එකවි ට
සුවාසූදහසක්ම නිවණ ට

600
මෙම සුතම් සහියෙ ක
මුනි සඳුදෙසතලොව රැ ක
තුවුසත නිවන් දූ ක
අටාසූ පන්සියක් දහසෙ ක

601
මෙමලෙසින් මුනිලොව ට
පිහිටව සිටිය දෙලොව ට
සැබවින් ඉන්තොප ට
එමුනිමය පිළිසරණ හැමවි ට

602
ඉන් එබුදුන් ව ඳු ව
උන් ගුණ කදට පහ ඳු ව
උන්සරණට ව ඳු ව
ඔවුන් සදහම් අසව පුරු ඳු ව

---

598 සවණ, කණියට; මිහිබිඳුවන්, මධුබිඳුවැනිවූ; සත, සත්ත්වයන්ගේ; සිතට, චිත්තයට; අමරසබඳු, අමෘතරසාකාරවූ; සිහිඳු, මාදුවූ; බඹගොසකර, බ්‍රහ්මඝොෂාවිසිදුවා; මුනිසඳු, මුනිඋතුමා; රුවන්මඟසුත, රත්නමහාසූත්‍රය; දෙසත, දෙශනාකරවදාරනකල්හි.

599 බඹ, බ්‍රහ්මය; සුර, දෙවය; නර, මිනිස්ය යන මොවුන්; එවිට, එකල්හි; දෙසුදහමට, දෙශනාකරණලද ධර්මයට; පැහැදී, ප්‍රසන්නව; එකවිට, එකඇසිල්ලෙහිම; සුවාසූදහසක්ම; අසූහාර දහක්ම; නිවණට, නිර්වාණයට; පැමිණියහ, පැමිණියාහ.

600 මෙමසුතම, මේසූත්‍රයම; සහියෙක, සතියක්ම; (සද්දව සක්ම) මුනිසඳ, මුනිඋතුමා; ලොවරැක, ලෝකයා ආරක්ෂාකොට; දෙසත, දෙශනාකරත්ම; නිවන්දූක, නිර්වාණ දර්ශනයකොට; තුවුසත, තුණටවූ සත්වයෝ; අටාසූපන්සියක්දහසෙක, පන්සියයක් අධිකකොටඇති අසූඅටදහක්පමණවූහ.

601 මෙමලෙසින්, මෙයාකාරයෙන්; මුනි, මුනීන්ද්‍රයන්වහන්සේ; ලොවට, ලොකයාගේ; දෙලොවට, උභයලොකාපිසිබිය සඳහා; පිහිටව, ආධාරව; සිටිය, වැඩසිටිසේක; ඉන්, එහෙයින්; සැබවින්, සත්‍යයෙන්; තොපට, නුඹලාහට; හැමවිට, සියලුකල්හි; පිළිසරණ, පිහිටවූයේ; එමුනිමය, ඒ සර්වඥයන්වහන්සේමය.

602 ඉන්, එහෙබැවින්; එබුදුන්, ඒසර්වඥයන්වහන්සේට; වඳුව, නමස්කාරකරව්; උන්, උන්වහන්සේගේ; ගුණකදට, ගුණසමූහයට; පහඳුව, ප්‍රසන්නවව්; උන්සරණට, උන්වහන්සේගේවරණ යටද; වඳුව, නමස්කාරකරව්; ඔවුන්සදහම්, උන්වහන්සේගේ සද්ධර්මය; පුරුදුව, පරිචයව; අසව, ශ්‍රවණයකරව්.

---

* සත අමාරස.

603 උත්කළ වැඩ සි ත ව
සසර දුක්දුක වර ත ව
උත් දුකුමට ප ත ව
නොගොස් මිසදිටු කිලුටුපති ත ව

604
පේවව පෝදව ස
පන්සිල් රකුව දිවිලෙ ස
නොකොට අකුසල් ද ස
පුරව නිති පින්කිරිය වත් ද ස

605
තුන්සිතම පිවි තු රු
කරපුදවනින් විසි තු රු
කරවපුද නිර තු රු
දතු දළද පිළිම බෝ තු රු

606
හිත අහිත සතමෙව ත
එඩමින් කුළුණු මෙත් සි ත
දෙන සගමොක් සැප ත
පවතු මුනිඳුන් දෙසූ පිළිවෙ ත

607
මෙමෙලෙසින් හැම දව ස
හැමපින් පුරා නිසිලෙ ස
බුදුවන එන දව ස
මෙමෙත් මුනි රජතුමන් දැක නො ස

---

603 උත්කළ, උත්වහන්සේවිසින් කරණලද්දාවූ; වැඩ, අභිවෘද්ධිය; සිතව, චින්තනයකරව්; සසරදුක්දුක, සංසාරදුඃඛය දශීනය කොට; විරතව, නොඇලී; මිසදිටුකිලුටු, මිථ්‍යාදෘෂ්ටිනැමති මලිනයෙහි, පතිතවනොගොස්, වැටීනොගොස්; උත්, උත්වහන්සේ; දුකුමට, දශීනයට; පතව, ප්‍රාර්ථනාකරව්

604 පෝදවස, උපෝසථදිනයෙහි; පේවව, උපොසථයෙහිහැසිරෙව්; දිවිලෙස, ජීවිතයමෙන්; පන්සිල්, පංචසීලය; රකුව, රක්ෂාකරව්; දසඅකුසල්, දසවිධ අකුසලකර්මයන්; නොකොට, නොකර; නිති, නිත්‍යයෙන්; පින්කිරියවත්දස, දශවිධපුණ්‍යක්‍රියාවස්තූන්; පුරව, පූරණයකරව්.

605 තුන්සිතම, ත්‍රිවිධචිත්තයෙම; පිවිතුරුකර, පවිත්‍රකොට; විසිතුරු, විචිත්‍රවූ; වනින්, වස්ත්‍රවෙන්; පුදකර, පූජාකරව; දතු, (අවශෙෂ) ධාතූන්ද; දළද, දංෂ්ට්‍රාධාතූන්ද; පිළිම, පටිමාවන්ද; බෝතුරු, බෝධිවෘක්ෂයන්ද; නිරතුරු, නිරන්තරයෙන්; පුදකරව, පූජාකරව්.

606 හිතඅහිත, හිතාහිතවූ; සතමෙවත, සත්වයන්කෙරෙහි; මෙත්කුළුණුසිත, මෛත්‍රීකරුණාචිත්තය; වඩමින්, වඩිනයකරමින්; සගමොක්සැපත, ස්වර්ගමොක්ෂසම්පත්තිය; දෙන, දෙනයකරන්නාවූ; මුනිඳුන්දෙසූ, මුනීන්ද්‍රයන්වහන්සේවිසින් දෙශනාකරණලද; පිළිවෙත, පටිපත්තියෙහි; පවතු, පවතිව්.

607 මෙමෙලෙසින්, මෙයාකාරයෙන්; හැමදවස, සියළුදිනයන්හි; නිසිලෙස, යොග්‍යපරිද්දෙන්; හැමපින්, සකලපුණ්‍යයන්; පුරා, පූරණයකොට; එනදවස, අනාගතකාලයෙහි; බුදුවන, බුද්ධරාජ්‍යයට පැමිණ වදරන්නාවූ; මෙමෙත්මුනිරජතුමන්, මෛත්‍රී සර්වඥරාජෝත්තමයාණන්වහන්සේ; දක, දශීනයකොට; නොස, තුෂ්ටව.

608 පුදකෙරෙමින් නොම ද
බණ'සා උත්සසුන් වැ ද
හැමකෙලෙසුන් පසි ද
වසවසැ තැනී නිවන් පුරවැ ද

609 සමතැස් මුනිඳු පිරිනිවිවස පවත්ල ල
දෙදහස් පසලොසක් හවුරුදු පිරුණු ස ද
දියගොස් පැතිරි බුවනෙක බුජ නිරිඳු ස ද
පිරිවස්තුනෙහි සිරිලක රජ බිසෙව් ල ද

610 දින දින නොඅඩුදින පුදපැවති මනහ ර
දනම නරදන සැදිගෙවුයත් සිරින්ස ර
වැජඹෙන පසිදු මහරසිගම්පුර අතු ර
බබලන සොඳුරු වීදගම මහවෙහෙ ර

---

608 නොමද, අමඳව; පුදකෙරෙමින්, පූජාවත්වමින්; බණ සා, ධර්මශ්‍රවණයකොට; උත්, උත්වහන්සේගේ; සසුන්වැද, සාසන යට පැමිණ (ඇතුලත්ව) හැමකෙලෙසුන්, සකලක්ලේශයන්; පසිද, ප්‍රවර්ජනනකොට; නිවන්පුරවැද, නිර්වාණපුරප්‍රවෙශව; සැතනී, සන්තර්පිතව; වසව, වාසයකරව්.

609 සමතැස්, සමන්තචක්ෂුවූ; මුනිඳු, මුනීන්ද්‍රයන්වහන්සේ; පිරිනිවි, පරිනිර්වාණයකලාවූ; වසපවත්, වර්ෂයෙහිපවත්; ලද, ලැබුවාවූ; දෙදහස්පසලොසක්හවුරුදු, හවුරුදුදෙදහස්පහලවක්; පිරුණු සද, පුණිවූකල්හි; දියගොස්පැතිරි, පැතුරුනාවූ ජයඝොෂා ඇති; බුවනෙකබුජනිරිඳුසද, බුවනෙකබාහුනරෙන්ද්‍රොත්තමයා; සිරිලක, ශ්‍රීලංකාවිපයෙහි; රජබිසෙව්ලද, රාජාභිෂෙකයලැබීමෙන්; පිරි, පූණිවූ; වස්තුනෙහි, තුන්අවුරුද්දක්වූකල්හි.

610 දිනදින, දවසක්පාසා; නොඅඩු, ඌනනොනාවූ; මනහර, මනොහරවූ; දිනපුදපැවති, සර්වදාපූජා පැවැත්තාවූ; සර, සාරවූ; සිරින්, ශ්‍රීසෞභාග්‍යයෙන්යුක්තවූ; සැදි, සජ්ජිතවූ; ගෙවුයත්, ගෘහොද්‍යාන යන් කාරණකොටගෙණ; දන, ජනයන්ගේ මනරදන, මනොරඤ්ජනයකරන්නාවූ; පසිදු, ප්‍රසිද්ධවූ; මහරසිගම්පුරඅතුර, මහාරසිග්‍රාම පුරාභ්‍යන්තරයෙහි; වැජඹෙන, විජෘම්භමානවූ; බබලන, බබලන්නාවූ; සොඳුරු, සුන්දරවූ; වීදගම මහවෙහෙර, වීදගම මහාවිහාර යෙහි.

611 කි ත් යසකොත් දසදික් * දිගුයව පබ ද
මෙ ත් මහතෙත් පාමුල මහතෙරිඳු ස ද
සෙ ත් කල † මුනිඳු සඳගුණකව් පෙදෙස් බැ ද
ස ත් වැඩ ‡ පිණිස මෙදකෙළෙ මෙත් සිතින් නා ද

———o———

612 ගි ලි කුළුණු සයුරේ සත්සෙතට ස රු
ඇ ලි පෙරුම් කෙරෙ පුදමින් වෙමින් සු රු
බ ලි එ මරසෙන් බිඳුහරිමින් කු රු
මෙලි පිණෙන් බුදුවෙම්වා තිලෝගු රු

---

611 දසදික්, දශදිසානැමති; දිගුයව, දීර්ඝවූ ඡවිහි (බඳනාලද) පබඳ, ප්‍රසිද්ධවූ; යස, යශපත්වූ; කිත්කොත්, කීර්තිනැමතිකොතුන් ඇත්තාවූ; මහතෙත්පාමුල, මහානෙත්‍රප්‍රසාදමූලයනනාමැත්විතවූ; මෙත්මහතෙරිඳුසඳ, මෛත්‍රේයමහාස්ථවිරෙන්ද්‍රනාමතෙම; සෙත් කල, ශාන්තිදනයකලාවූ; මුනිඳුසඳ, සර්වඥයාණන්වහන්සේගේ; ගුණ, ගුණය; කව්පෙදෙන්, කාව්‍යපදයෙන්; බැඳ, බන්ධනය කොට; සත්වැඩපිණිස, සත්වාභිවෘද්ධියපිණිස; නද, නන්දනීයවූ; මෙද, මේ (බුදුගුණඅලංකාරය) ද; මෙත්සිතින්, මෛත්‍රීචිත්තයෙන්; කෙළේ, රචනාකෙළේය.

———o———

612 මෙලිපිණෙන්, මේ (බුදුගුණඅලංකාරය) ලියනලද පුණ්‍යයෙන්; සත්, සත්වයන්ගේ; සෙතට, ශාන්තියට; සරු, සාරවූ; කුළුණු, කරුණානමැති; සයුරෙ, සාගරයෙහි; ගිලි, ගැලී; පෙරුම්කෙරේ, පාරමී (ධර්මයන්) කෙරෙහි; ඇලී, ආලයෙන්; සුරුවෙමින්, ශූරත්වයට පැමිණ; පුදමින්, (ශිෂ්‍යාදී) දනවසතුන් පූජාකිරීමෙන්; බලි, බලවත්වූ; කුරිරු, ක්‍රෑරවූ; එමරසෙන්, ඒ මාරසේනාවන්; බිඳහරිමින්, භග්නකොට; පන්නාහරිමින්; තිලෝගුරු, ත්‍රෛලෝක්‍යාචාර්යවූ; බුදුවෙම්වා, බුද්ධරාජ්‍යශ්‍රීයට පැමිණෙම්වා.

— නිමි.

---

* දිගුසටගබඳ † මුනිසඳ. ‡ වය්.

# අරහාදි බුදුගුණ විස්තරය.

**262 රහසත් පව් නොකො** ම

අප බුදුහු රහසිනුදු පව් නොකළ පරිදි කිසේද යත්?

නොහරනලද රාගාදී කෙලෙස්ඇති තමා පණ්ඩිතයෙකැයි ගත්තාලද හිස්වූ මානය ඇති කිසියම් බාලවූ පුද්ගලයෙක් යම් යම් වැරදිද්දකොට මෙයින් තමහට මහත් අපකීර්තියෙක් වන්නේයයි සලකා ඒ ඒ දූ කිසිවෙක්හට නොදන්වා සඟවා රහසෙහිම තබාගන්නේය. බුදුවරයින්වහන්සේලා වනාහී මෙසේ නොවන බැවින් හා රාගාදී කෙලෙස් රහසිනුදු සිත්සතනි නූපදනා බැවින්ද අර්හන් නම් වනසේක.

**2 කෙලෙසරයනුත් දුරුකො** ම

සසර සක කෙලෙස් අර නැසූ පරිදි කිසේද යත්?

අග්මුල් නැති සසර සත්වයා ජාතියෙන් ජාතිය උත්පත්ති වශයෙන් භ්‍රමනයකරවනබැවින් සංසාරය චක්‍රයකට බඳු උපමා ඇත්තේය. එව සංසාර චක්‍රයාගේ නොදූනීමයයි කියනලද අවිද්‍යාව හා සංසාරොත්පත්තියට හේතුවූ භවතෘෂ්ණාමය නාභි ඇති සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන භව, ජාති, යන මෙකී දශධර්මනමැති අරඇති, ජරාමරණ, නමැති නිම්වලලුඇති, කාමාදී ආශ්‍රව නමැති අකුරෙන් විද කාම, රූප, අරූප, යන භවත්‍රය නමැති, රථයෙහි යොදනලද අනන්තාපරිමාන කාලයක් මුළුල්ලෙහි නොසිඳ පවත්නාවූ සංසාරචක්‍රයාගේ අරයෝ දුරුනැසූ බැවින්ද අර්හත්නම් වනසේක.

**3 නිසිබූයෙන් පුද** ම

පුදයට නිසිවූ පරිදි කිසේද යත්?

සියල්ලෝවැසි දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය නාග සුපර්ණ යක්ෂ රාක්ෂාදීන් විසින් ඉතා ආදරයෙන් අපබුදුහු පුදනුලැබූහ, එහෙයින් අර්හන්නම් වනසේක.

**263 හුන්කල්හිම පැම** නි

අප බුදුහු සම්මාසම්බුදුවූ පරිදි කිසේද යත්?

අතීත අනාගත වර්තමාන යන කාලත්‍රය පිළිබඳ සියලු ධර්මයන් ගුරූපදෙශ රහිතව තමන්වහන්සේගේම ඥාණයෙන් අත්ලෙහි

තබනලද තෙල්ලි ඵලයක් මෙන්දෙහෝ නොහොත් දූරග මිණි රුවනක් මෙන් සර්වාකාරයෙන් මනාකොටම අවබොධකළ හෙයින් සම්මාසම්බුදුනම් වනසේක. සලිදු අනිත්‍යාදීන්ගේ වශයෙන් දැනීනයයි කියනලද විශිෂ්ටඥාණයෙන් දතයුතුවූ චතුස්සත්‍ය ධර්මයන් පූර්වභාගයෙහි විදසුන් නැණින්ද අවබොධ කාලයෙහි මගනැණින්ද අපරභාගයෙහි සියල්දත් නැණින්දයි මෙවෙසසින් දැනවදල හෙයින් සම්මාසම්බුදුනම් වනසේක,

තවද සියලු ආකාරයෙන් දතයුතුවූ දුක්ඛසත්‍යය සියලු ආකාරයෙන්ම දැනවදළ හෙයින්ද දුරුකලයුතු සමුදය සඞ්ඛ්‍යාත තෘෂ්ණාව දුරුකල හෙයින්ද සිඩකලයුතුවූ නිර්වාණධාතුව සියලුආකාරයෙන්ම ශාන්තාදී දැන අවබොධකළ හෙයින්ද තෘෂ්ණා සඞ්ඛ්‍යාත සමුදය නසා නිර්වාණ ධර්මයාගේ අවබොධය පිණිස වැඩියයුතුවූ මාර්ගසත්‍ය යයි කියනලද ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය පරොපදෙශ රහිතව ස්වයම්භූඥානයෙන් දැනවදළ හෙයින්දයි යන මෙතෙක් කාරණයෙන් සම්මාසම්බුදුනම් වනසේක.

### 264 විද්ද නැණ අට ද

අප බුදුහු විජ්ජාචරණ ගුණයෙන් යුක්තවූපරිදි කෙසේදයත්?

විඳයුතුවූ නිර්වාණ ධර්මරස ඇතිපරිදි විඳගන්නා අර්ථයෙන්ද තමහට විපක්ෂවූ අවිද්‍යානමැති මහගනඳුර විශෙෂයෙන්ම ප්‍රදලනය කරණ අර්ථයෙන්ද විද්‍යානම්වූ ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යාවෙන්හා පසළොස් චරණ ධර්මයෙන් සම්පූර්ණ බැවින්ද විකල්පනොවූ බැවින්දයි යන මෙතෙක් කාරණයෙන් විජ්ජාචරණ සම්පන්නනම් වනසේක. එහි විද්‍යාධර්මයෝනම් විදර්ශනාඥානය, මනොමය ඍද්ධිඥානය, ඍද්ධිවිකුර්වණඥානය, දිව්‍යශ්‍රොත්‍රඥානය, චෙතොපරියායඥානය පූර්වේනිවාසානුස්මෘතිඥානය, දිව්‍යචක්ෂුරභිඥානය, ආශ්‍රවක්ෂයකරඥානය, යන මොහුවෙත්.

චරණ ධර්මයෝනම් ප්‍රාතිමොක්ෂ සංවරශීලය, ඉන්ද්‍රියසංවර ශීලය, භොජනයෙහි පමණදන්නාබව, ජාගරණ ප්‍රතිපදාව, ශ්‍රද්ධාව, පව්ලජ්ජාවිම්වශයෙන් පවත්නාහිරිය, පවටභයවීම්වශයෙන් පවත්නා ඔත්තප්පය, බොහෝ ඇසූපිරූතැන් ඇතිබව්ය, සතරසම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යය, සතරසතිපට්ඨානගත සම්‍ෘතිය, ප්‍රඥාව, ප්‍රථමධ්‍යානාදී සතරධ්‍යානයෝය, යන මොහුවෙත්.

### 265 යහපත්කොට සෙනැ සි

අප බුදුහු සුගත්වූ පරිදි කිසේය යත්?

යහපත් ගමන් ඇතිහෙයින්ද යහපත්තැනට පැමිණි හෙයින්ද යහපත් වචනයක්ම දෙශනාකරණ හෙයින්ද සුගත් නම් වනසේක.

සහපත් ගමන්ඇති පරිදි කීසේද යත්?

ආත්මක්ලමථනයයි කියනලද අත්තකිලමථානුයෝගය, රූපාදී පස්කම් සැපෙහි ඇලීම් සංඛ්‍යාත කාමසුඛල්ලිකානුයෝගයයි කියනලද අන්තවයට නොපැමිණ සියලු බුදුවරයින් වහන්සේලා විසින් නිදුකින් වැඩමකළ වදාළාවූ ආර්යමාර්ගධර්ම ප්‍රතිපදා සංඛ්‍යාත ඒකායන මාර්ගයෙහි වැඩමකරවදාළ බැවින් සුගත්නම් වනසේක.

2 සුන්දර තැනට සැපතා යි

සොඳුරු තැනට පැමිණි පරිදි කීසේද යත්?

රාගාදී කෙලෙශයන් හරගිය බැවින් සිහිල්වූ ඉතා භයංකරවූ සංසාර දුක්ඛයයි කියනලද ජාති ජරා මරණාදී දුක්ඛ ධර්මයන්ගෙන් නිදහස්වූ හෙයින් නිර්භයවූ කාමාදී ආශ්‍රවයන්ගෙන් මිදුනුහෙයින් ශාන්තවූ සමුදය සංඛ්‍යාත තෘෂ්ණාවගේ ක්ෂයකිරීමෙන් අවබෝධ කරයුතුවූ පරමරමණීය ශාන්තසුඛස්වරූප නිර්වාණ ධාතුවට පැමිණ වදාළහෙයින්ද සුගත්නම් වනසේක.

3 සොඳුරු බස් කියනා යි

සොඳුරු බස් ඇතිපරිදි කීසේද යත්?

තථාගතයන් වහන්සේ යම් වචනයක් දන්නාසේක්ද ඒ වචනය අභූතවූත් නැත්තාවූ හෝ අන්පරිද්දකින් ඇත්තාවූ හෝ මෙලොව පරලොව දෙක්හිම වැඩක් නැත්තේවේද ඒවචනය අන්නට ප්‍රිය නොවේද එබඳු වචන තථාගතයන් වහන්සේ නොවදාරනසේක්මය.

තවද තථාගතයන් වහන්සේ යම් වචනයක් දන්නාසේක්ද ඒ වචනය අභූතවත්වූ හෝ ඒ ප්‍රකාරයෙන්මවූ හෝ මෙලොව පරලොව අවැඩෙන් යුක්තවූයේ හෝවේද ඒ වචනය අන්නට ප්‍රියනොවේද එබඳු වචන තථාගතයන් වහන්සේ නොවදාරණ සේක්මය.

තවද තථාගතයන් වහන්සේ යම් වචනයක් දන්නාසේක්ද ඒ වචනය අභූතවත්වූහෝ එයාකාරයෙන්වූහෝ මෙලෝ පරලෝ අහිතසාධකවූහෝ වේද ඉදින් ඒ වචනය අනනට ප්‍රියනොවේද තථාගතයන් වහන්සේ එබඳු වචන ප්‍රකාශකිරීමෙහි සුදුසුකල් දන්නාසේක්මය.

තවද තථාගතයන් වහන්සේ යම් වචනයක් දන්නාසේක්ද ඒ වචනය අභූතනැත්තාවූහෝ අන්ප්‍රකාරයකින්වූහෝ මෙලෝ පරලෝ අනර්ථසාධකවූහෝ වේද ඒ වචනය අන්නට ප්‍රියවූයේ වේද තථාගතයන් වහන්සේ නොවදාරණ සේක්මය.

තවද තථාගතයන් වහන්සේ යම් වචනයක් දන්නාසේක්ද ඒ වචනය අභූතවූයේහෝ වේද එයාකාරයෙන්ම ඇත්තාවූහෝ මෙලෝ පරලෝ අනභිවෘද්ධියකවූහෝ වේද ඒ වචනය අන්හට ප්‍රියවූවද තථාගතයන් වහන්සේ නොවදාරණ සේක්මය.

තවද තථාගතයන් වහන්සේ යම් වචනයක් දන්නාසේක්ද ඒ වචනය අභූතවත්වූහෝ එයාකාරයෙන්වූහෝ මෙලෝ පරලෝ අභිවෘද්ධියකවූහෝවේද ඒ වචනය අන්හට ප්‍රියවූයේද තථාගතයන් වහන්සේ ප්‍රකාශකිරීමෙහි සුදුසුකල් දන්නාසේක්මය මෙයාකාර අප බුදුහු සර්වතොභද්‍රවශයෙන්ම යහපත් වචනයක්ම වදාරණ බැවින් සුගත්නම් වනසේක.

**266 තුන්ලොව තතු ලෙස ම**

අප බුදුහු ලොකවිදූවූ පරිදි කිසේද යත්?

සියලු ආකාරයෙන් අවබෝධ කරණලද කාම, රූප, අරූපා දීවූ ලොක ඇතිබැවින් ලොකවිදූනම් වනසේක. ඒ මෙසේමැයි. භාග්‍යවතුන් වහන්සේ සියලුම පඤ්චුපාදනස්කන්ධයයි කියනලද ලොකය දුක්වශයෙන්ද යම් තෘෂ්ණාවක්නිසා ඒ පඤ්චුපාදනස්කන්ධයාගේ හටගැනීමක්වේද ඒ තෘෂ්ණාව ඉපදීමට කාරණාහෙයින් සමුදය වශයෙන්ද යම් නිර්වාණ ධර්මයෙක්හි ඒ පඤ්චුපාදනස්කන්ධ සංඛ්‍යාත ලොකය නිරුද්ධවේද ඒ නිරොධ වශයෙන්ද යම් පිළිපැදීමක් හේතුකොටගෙණ ඒ පඤ්චුපාදනස්කන්ධ සංඛ්‍යාත ලොකයාගේ නිරුද්ධයට පැමිණිය යුතුවේනම් ඒ ආර්‍ය්‍යමාර්ගී වශයෙන්දැයි යන සතරාකාරයෙන් හැර අන්පරිද්දක් නැතිහෙයින් මෙසේ සර්ව ප්‍රකාරයෙන්ම ලොකය දැන වදාළසේක.

තවද මෙසේ දැනවදාළාවූ භාග්‍යවතුන් වහන්සේ සියලු ආකාරයෙන්ම ලොකයාගේ කෙළවර දැන මෙලෝ පරලෝවයයි කියනලද උපාදනස්කන්ධ පඤ්චකයහා මතුභවයෙහිවූ උපාදනස්කන්ධ පඤ්චකය නොපතන සේක්මය මෙසේ සර්වප්‍රකාරයෙන්ම ලොකය අනිත්‍ය වශයෙන්ද දුක් වශයෙන්ද අනාත්ම වශයෙන්ද මනාකොටම දැනවදාළ හෙයින් ලොකවිදූනම් වනසේක.

**267 හැම ගුණයෙන් න ද**

අප බුදුහු අනුත්තරවූ පරිදි කිසේද යත්?

ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥාන දර්ශනාදීන්ගේ වශයෙන් උන්වහන්සේට වැඩිතරම්වූවෙක් තබා සමවූවෙක්වත් කාම රූප

අරූප යන ලෝකත්‍රය වාසීවූ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදී සත්ත්වයන් අතුරෙහි නැති බැවින්ම අනුත්තරනම් වනසේක.

### 268 බඹසුර යකුන් හ ද

අප බුදුහු පුරිසදම්ම සාරථිවූ පරිදි කිසේද යත්?

හික්මවියයුතු පුරුෂයන් හික්මවන අර්ථයෙන් පුරිසදම්ම සාරථිනම් වනසේක. ඒ පුරුෂදම්‍යයෝ නම් නොදැමුනාවූ දමනයට සුදුසුවූ හෙවත් හික්මීමට සුදුසුවූ මහානුභාවසම්පන්න උග්‍රවිෂ තේජස් ඇති අපලාල, චූලෝදර, මහෝදර, අග්නිසිඛ, ධූමසිඛ, අරවාල, යන නාගරාජයෝය, ධනපාලනම් ඇත්රජුය යනාදීවූ තිරිසන්ගත පුරුෂයෝද සච්චක නිවටහුය අම්බට්ඨමාණවකය පොක්ඛරසාතිකය, සොණදණ්ඩය, කූටදන්තය යනමේ බ්‍රාහ්මණයෝද උපාලිනම් ගෘහපතිය යනාදී මනුෂ්‍ය පුරුෂයෝද ආලවක සූචිලොම, ඛරලොම, අජකලාප යනමේ යක්ෂයෝද සක්දෙව්රජය බකබ්‍රහ්මයා යනාදී අමනුෂ්‍ය පුරුෂයෝද යනමේ සියල්ලෝ විසිතුරුවූ හික්මවන උපායෙන් හික්මවා තමන්වහන්සේගේ ලබ්ධියෙහි පිහිටුවා වදාළබැවින් පුරිසදම්මසාරථිනම් වනසේක.

### 26) බවකාන්තින් එත ර

අප බුදුහු දෙව්මිනිසුනට ශාස්තෘවූ පරිදි කිසේදයත්?

මෙලොව පරලොව දෙකින් සිඩවන්නාවූ අර්ථයහා නිර්වාණ සංඛ්‍යාත පරමාර්ථය යන මේතුන්ප්‍රකාර අර්ථයන් අතුරෙන් යමෙක් යමෙක් යම් යම් අර්ථයකට සුදුසුවන්නේද ඒ ඒ අයවලුන්ට ඒ ඒ අර්ථයෙන් අනුශාසනාකරණහෙයින්ද ඒ ඒ අර්ථයෙහි පිහිටුවන අර්ථයෙන්ද ශාස්තෘනම් වනසේක. තවද ශාස්තෘ යන මෙහි භාග්‍යවත්හුව ශාස්තෘ නම් වෙයි. ඒ අර්ථයම කරණකොටගෙණ සාර්ථවාහනම්ද වන්නේයි. යම්සේ බඩුමිළ රැගෙණ වෙළඳම් පිණිස දේශාන්තරයට යන සාර්ථවාහනම් ජනසමූහයතමේ හිතොපදේශ වශයෙන් රක්ෂාකටයුතු වෙළඳම් මිළ ඇතිහෙයින් සාර්ථක නම් වෙයි ඒ සාර්ථකනම්වූ ජනයන් නිරුදකාදී සිව්වැදෑරුම්වූ කාන්තාරයන් එතරකෙරේද නිර්භයස්ථානයට පමුණුවාද භය සහිත ස්ථානය ඉක්මවාද අතින් අල්වාගෙණ සිටුවන්නාක්මෙන් එතරකෙරේද ක්ෂේම භූමියට පමුණුවාද එපරිද්දෙන්ම භාග්‍යවත් තෙමේ විනෙය ජනසමූහයා හෙවත් නිර්වාණාවබෝධයට සුදුසුවූවාහු ජාතිකාන්තාරාදියෙන් එතරකොට නිර්වාණ ක්ෂේම භූමියට පමුණුවනහෙයින් සාර්ථවාහනම් වනසේක.

මෙහි වනාහි කවරෙක්හට අනුශාසක වනසේක්දයත්? දෙව් මිනිසුන්ට අනුශාසනාකරණ අර්ථයෙන්ද ශාස්තෘ නම්වනසේක. සත්වයන් අතුරෙන් දෙව්මිනිසුන්ගේ විශෙෂ ගති ඇතිබැවින් උතුම් පරිච්ඡෙදවශයෙන්ද චතුරාර්‍ය්‍ය සත්‍යාවබොධයට යොග්‍ය පුද්ගලයන් පිරිසිඳීම් වශයෙන්ද දෙව්මිනිසුන්ට අනුශාසනාකරණ අර්ථයෙන්ද ශාස්තෘනම්වනසේක. තිරිසන්ගත සත්වයන්ට අනුශාසනාකරණ අර්ථයෙන්ද ශාස්තෘනම් වනසේක. ඒ තිරිසන්ගති ඇත්තවුන්ද උන්වහන්සේ සමීපයෙහි බණ අසා ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත මාර්ග ඵලාධිගමයට බලවත් කාරණයට පැමිණි හෙතු සම්පත්තියෙන් ඒ තිරිසන්ගත ආත්මභාවයට දෙවෙනි තුන්වෙනි ආත්මභාවයෙහි මාර්ගඵලාධිගමයට පැමිණෙන්නාහුමැයි; මීට මණ්ඩූක දිව්‍ය පුත්‍රයාගේ කථාව සාධකවේයි.

**270 ශිව්සස් සියනෑ** ණ් න්

අප බුදුහු බුද්ධ නම්වූ පරිදි කිසේය යත්?

යම්කිසි ධර්ම සමූහයක්වීනම් ඒ සියලුම ධර්මයන් අවබොධකළ බැවින් විමොක්ෂාන්තික ඥානවශයෙන් බුද්ධනම්වනසේක. මෙහි වනාහි තථාගතයන්වහන්සේගේ චතුස්සත්‍යාවබොධය ප්‍රකාශකරණලද්දේවෙයි. සම්මාසම්බුද්ධ යන පදයෙන් කොටිනුදු විස්තර වශයෙනුදු ශාස්තෘන් වහන්සේගේ චතුරාර්‍ය්‍ය සත්‍යාවබොධය ප්‍රකාශකරණලද්දේය. බුද්ධ යන පදයෙන් එයින් අන්‍යවූ දතයුතු ධර්ම සමූහයාගේ අවබොධය ප්‍රකාශකරණලද්දේය නොහොත් සම්මාසම්බුද්ධ යන පදයෙන් ශාස්තෘන් වහන්සේගේ ප්‍රතිවෙධ ඥානානුභාවය ප්‍රකාශකරණලද්දේය. බුද්ධ යන පදයෙන් දෙශනා ඥානානුභාවය ප්‍රකාශකරණලද්දේය. මෙහි වනාහි අර්හත්මාර්ග ඥානයට ප්‍රතිපක්ෂවූ රාගාදී සියලු කෙලෙසුන් කෙරෙන් මිදුනුහෙයින් විමොක්ෂනම්වෙයි, ඒ මාර්ග ඥානාවසානයෙහි ලැබියයුතු අර්ථයෙන් අර්හත්ඵල ඥානය විමොක්ෂාන්තික ඥාන නම්වෙයි. භාග්‍යවත්හුගේ සර්වඥත ඥානය ඇතුළුවූ සියලු බුද්ධ ඥානය වනාහි ඒ අර්හත්ඵල ඵලඥානය සමග ලැබියයුතුහෙයින් විමොක්ෂාන්තික ඥානනම් වන්නේයි. බුද්ධ යන මේ නාමයද බොධි මූලයෙහි ලබනලද ඒ විමොක්ෂාන්තික ඥානය සමග ලබනලදැයි දතයුතු. යම්හෙයකින් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය තමන් වහන්සේත් අවබොධ කරනසේක්ද සෙසු ලොක සත්වයාන් අවබොධකරවූසේක්දැයි යනමේ ආදී කාරණයෙනුදු බුද්ධනාමවත්වෙත්යි. මෙසේ මේ චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය තමන්වහන්සේ දත්හෙයිනුදු අනුන් අවබොධකරවූහෙයිනුදු බුද්ධ නම් වෙයි යන අර්ථය හඟවන පිණිස චතුරාර්‍ය්‍ය සත්‍යය තමන්

අවබෝධ කළහෙයිනුදු බුද්ධ නම් වෙයි. ලෝක සත්වයා අවබෝධ කරවූ හෙයිනුදු සියල්ලදත් හෙයිනුදු සියල්ල දක්නා සුලුහෙයිනුදු අනිකෙකුන්සින් අවබෝධ නොකරවන හෙයිනුදු කෙලශ නිද්‍රාවෙන් පිබිදිහෙයිනුදු ආශ්‍රවක්ෂය කළහෙයිනුදු කෙලශ නමැති ලෙපනැති හෙයිනුදු එකාන්තයෙන් වීතරාගවූ හෙයිනුදු ඒකාන්තයෙන් වීත මෝහී හෙයිනුදු ඒකාන්තයෙන් නිඃක්ලෙශවූහෙයිනුදු එකායන මාර්ගයට පිළිපන්හෙයිනුදු හුදකලාව නිරූත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කළහෙයිනුදු අබුද්ධි විගමනයකොට බුද්ධි ප්‍රතිලාභයට පැමිණිහෙයිනුදු යන ආදී මෙතෙක් කාරණයෙනුදු බුද්ධ නම් වන සේක.

## 271 බෙදුයෙන් දහම්කා ද

අප බුදුහු භගවත්වූ පරිදි කිසේද යත්?

සත්තිස්බෝධිපාක්ෂික ධර්මයන්ට ඇතුළත්වූ සකලම ධර්ම ස්කන්ධය බෙදූහෙයින්ද සකල ගුණ සමූහය භජනයකළහෙයින්ද සකල භාග්‍ය ධර්මයන්ගෙන් යුක්තවූහෙයින්ද භගවත්නම්වනසේක.

දහම්කද බෙදූපරිදි කිසේද යත්?–සියලු දුකාතිකපදසංග්‍රහිත ප්‍රභෙද වශයෙන් සියලු ධර්මයන්ද ස්කන්ධ ආයතන ධාතු ඉන්ද්‍රිය සත්‍යප්‍රතීත්‍යසමුත්පාදදී ප්‍රභෙද වශයෙන් කුශලාදී ධර්මයන්ද වෙහෙසව පැමිණීම හෝ අවිජ්ජමානිකා බව හෝ කිරීමයයි කියනලද පීඩනාර්ථයෙන්ද ප්‍රත්‍යයන් විසින් එක්ව කරණලද බවයයි කියනලද සංඛත අර්ථයෙන්ද ජාතිජරාමරණාදි දුකින් තැවීමහෝ දැවීමයයි කියනලද සන්තාපාර්ථයෙන්ද ජරා මරණ දෙකින් දෙපරිද්දකින් පෙරළීමට යායුතුබවයයි කියනලද විපරිණාමාර්ථයෙන්ද යන සතරාකාරයෙන් දුක්ඛාර්‍ය සත්‍යයද දුක්උපදවන අදහසින් එක රැස්වීමයයි කියනලද ආයූහනාර්ථයෙන්ද ඒ මේ දුකයයි දක්වන් තක්හුමෙන් නැගිටුවීමයයි කියනලද නිදානාර්ථයෙන්ද සසර දුකෙහි රැඳීමයයි කියනලද සංයොගාර්ථයෙන්ද සෝවාන් ආදී මාර්ගාධිගමය වැළැක්වීමයයි කියනලද පළිබෝධාර්ථයෙන්ද යන සතරාකාරයෙන් දුක්ඛසමුදයාර්‍ය සත්‍යයද සියලු කෙලශොපද්‍රවයන් නසන ස්වභාවහෙයින් ඒ කෙලෙසුන් කෙරෙන් පහවීම ඒ කෙලෙසුන්ගෙන් පහවීමට හෙතුබවයයි කියනලද නිස්සරණාර්ථයෙන්ද සියලු සංස්කාර ධර්මයෙන් වෙන්වීමයයි කියනලද විවේකාර්ථයෙන්ද කිසිප්‍රත්‍යයකෙනකු විසිනුදු නොකරනලද බවයයි කියනලද අසංස්කෘතාර්ථයෙන්ද තමා නිත්‍යස්වභාවහෙයින් මරණයක් නැතිබවයයි කියනලද අමෘතාර්ථයෙන්ද යන සතරාකාරයෙන්

නිරෝධාර්ය සත්‍යයද සසරදුකින් නික්මීමයයි කියනලද නිර්‍යාණාර්ථයෙන්ද නිවන්පුර පැමිණීමයයි කියනලද හේත්වර්ථයෙන්ද අතිශයින් සියුම්වූ නිර්වාණ ධර්මය ප්‍රත්‍යක්ෂ කිරීමයයි කියනලද දර්ශනාර්ථයෙන්ද චතුරාර්‍ය්‍යසත්‍යය දක්නෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ට අධිපතිබව කිරීම හෝ ආලම්බනාධිපතිබව කිරීමයයි කියනලද ආධිපත්‍යාර්ථයෙන්ද යන සතරාකාර මාර්‍ගසත්‍යයද යන මෙතෙක් ධර්මයන් නොයෙක් අයින් බෙද විස්තරකළහෙයින් භගවත්නම් වන සේක.

### 2 භජනය කොලෙන් ගුණක ද

ගුණස්කන්ධය භජනය කළපරිදි කිසේයත්?

කසිණ භාවනාදී අරමුණකින් උපදවාගන්නාලද රූපාවචර ධ්‍යානයන්ට සමවැදීමයයි කියනලද දිව්‍ය විහාරය මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂාදියෙන් උපදවාගන්නාලද ධ්‍යානයන්ට සමවැදීමයයි කියනලද බ්‍රහ්මවිහාරය සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතරඵල සමාපත්තීන්ට සමවැදීමයයි කියනලද ආර්‍ය්‍යවිහාරය යන මේ ත්‍රිවිධ විහාරය පස්කම්සැපයෙන් වෙන්වීමෙන් ලැබියයුතු හුදකලාබවයයි කියනලද කායවිවේකය ප්‍රථමධ්‍යානාදීන් ඉපදවීමෙන් හා පඤ්චනීවරණාදී කෙලෙසුන් කෙරෙන් වෙන්වීමෙන් ලැබියයුතු සිත්හුගේ හුදකලා බවයයි කියනලද චිත්ත විවේකය ස්කන්ධොපධි ආදී සියලු කෙලෙසුන් නැසීමෙන් ලැබියයුතු නිර්වාණ ධර්ම සංඛ්‍යාතවූ උපධිවිවේකය යන මේ ත්‍රිවිධ විවේකයද ශූන්‍යතා විමොක්ෂය අප්‍රණිහිත විමොක්ෂය අනිමිත්ත විමොක්ෂය යන ත්‍රිවිධ විමොක්ෂයද සෙසු ලෞකික ලොකොත්තරාභිඥාදී උත්තරි මනුෂ්‍ය ධර්මයන්ද යන මෙතෙක් ධර්මයන් සේවනයකළ බැවින්ද භජනය කළබැවින්ද නැවත නැවත භාවිතාකළබැවින්ද භගවත්නම් වන සේක.

### 3 භග දහමින් සස ද

භග ධර්මයන්ගෙන් සංසක්තවූ පරිදි කිසේය යත්?

භාග සංඛ්‍යාත ශීල සමාධි ආදී ගුණධර්ම කොටස්‍ය ඇති හෙයින්ද භග සංඛ්‍යාත දානශීල නෛෂ්ක්‍රම්‍යාදී දශපාරමී ධර්මයන් පූරණය කළහෙයින්ද දවස්පතා සමවදනා සූවිසි කෙළලක්ෂයක් පමණ සමවත්වලට සමවදනාහෙයින්ද බෝසත්කලැ ලැබූවාවූ භග සංඛ්‍යාත චක්‍රවර්ති රාජ්‍යශ්‍රී සම්පත් ආදිවූ ලෞකික සම්පත් හා බුද්ධත්වයට පැමිණිකලැ ලැබූවාවූ මාර්ගඵලාදී ලොකොත්තර සම්පත්තීන්ට පැමිණිහෙයින්ද තමන් වහන්සේ කෙරෙහි භක්තිවන්ත

ජනයා ඇතිහෙයින්ද සතියකින් ලැබීමට හිබුනාවූ සප්තවිධ රත්නයෙන් යුක්තවූ සතරමහා ද්වීපයටම අගරජවූ චක්‍රවර්ති රාජ්‍යය ආදිකොට ඇති භග සඞ්ඛ්‍යාත ඓශ්වර්යයන් උදුසන දුමු කෙල පිඬක්මෙන් ආලය නොකොට වමනයකළ බැවින්ද දුරුකළ බැවින්ද භාග සංඛ්‍යාත ස්කන්ධ ධාතු ආයතනාදිය වමනයකළ හෙයින්ද දුරුකළ හෙයින්දයි යන මෙනෙක් කාරණයෙන් භගවත් නම් වනසේක.

604 නොකොට අකුසල්ද ස

මෙහි දස අකුසල් නම් :-

පාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුනාවාචා, ඵරුසවාචා, සම්ඵප්පලාප, අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡාදිට්ඨි යනමොහුයි.

604 පුරව නිති පින් කිරියවත් ද ස

දසපින් කිරියවත් නම් :-

දානං සීලංච භාවනා — පත්තිපත්තානුමෝදනා
වෙය්‍යාවච්චා'පචායංච — දෙසනා සුති දිට්ඨුජු.

යන මොවුහුයි.

60 තුන්සිතම පිදිතු රැ

පූර්වචේතනා, අපරචේතනා, මුඤ්චනචේතනා යන අවස්ථාත්‍රයෙහිවූ සිත තුන්සිත නමි.

---

මෙහි කවිවලින් ප්‍රකාශකරණ පද පමණක්ම කෙටියෙන් ඉතා සැකෙවින් විස්තර කෙළෙමු. වැඩිවිස්තර කැමැත්තෝ විසුද්ධිමාර්ග මහා අර්ථ ව්‍යාඛ්‍යානය හෝ එගොඩ උයනේ, පී. ඒ. ධම්මබන්ධු මහත්මයාගේ ලෝවැඩ සඟරා විස්තරාර්ථ ව්‍යාඛ්‍යානය හෝ බලත්වා.



